# සිංහල

# 5

## මූලික පිරිවෙණ

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

පළමුවන මුද්‍රණය - 2017
දෙවන මුද්‍රණය - 2018
තෙවන මුද්‍රණය - 2019
සිව්වන මුද්‍රණය - 2020

සියලු හිමිකම් ඇවිරිණි

ISBN 978-955-25-0461-7

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
වාසනාවත්ත පාර, මත්තෙගොඩ, අංක 90 දරන
ස්ථානයෙහි පිහිටි විශ්ව ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by : Educational Publications Department
Printed by : Vishwa Graphics (Pvt) Ltd.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

සියවස් ගණනාවක කීර්තිමත් ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය වූ කලී සිරිලක අධ්‍යාපනයේ ස්වර්ණමය සලකුණකි. මහින්දාගමනයත් සමඟින් වඩාත් ශිෂ්ට සම්පන්න සංස්කෘතියක් වෙත අප ගමන් කළේ සුවිශේෂ වූ ශාස්ත්‍රීය දියුණුවක් ද අත්පත් කරගනිමිනි. එහිදී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස වෙතම ප්‍රභාෂ්වර ශාස්ත්‍රාලෝකය දායාද කළ ප්‍රදීපස්තම්භය වූයේ පිරිවෙනයි.

අපේ සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය, ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය වෙනුවෙන් කැපවන සුපසන් යතිපරපුරක් නිර්මාණය කරන අතර සම්භාව්‍ය භාෂා මෙන්ම අනේක ශිල්ප ශාස්ත්‍ර පිරිසිඳ දත් වියතුන් ලොවට දායාද කිරීමෙහිලා මූලික වූ බැව් සිහිපත් කළ යුතු ය. එසේම මෙරට විවිධ උවදුරු පිරි අඳුරු සමයන්හි පිරිහී ගිය පිරිවෙන් අධ්‍යාපනය යළි නගා සිටුවීමට දිවිහිමියෙන් ඇප කැප වූ, වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමිපාණන්ගේ අපරිමිත සේවාව ද කෘතවේදීත්වයෙන් යුතුව මේ මොහොතේ සිහිපත් කළ යුතු ය.

අතීත සම්භාවනීය අධ්‍යාපන උරුමය ද එකලෙසින් සුරකිමින් නව ලොවට අනුගත වූ පිරිවෙන් විද්‍යස්ථාන නිර්මාණය කිරීමේ කාර්යය වෙත අපි සැම අවතීර්ණ වී සිටින්නෙමු. විශ්ව ගම්මානයෙහි හුදකලා නොවී වර්තමාන පිරිවෙන් ශිෂ්‍ය ගණයා දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කරගනිමින් අධ්‍යාපන සයුරෙහි කිමිදෙමින් සිටිනු දැකීම සන්තුෂ්ටිය උපදවන්නකි. විවිධ ගැටලු හේතුවෙන් විධිමත් පාසල් පද්ධතියෙන් බැහැර වූ ඇතැම් සිසුන් ද යළි පිරිවෙන් විදුබිම් වෙත පැමිණ ස්වකීය දිවිමඟ යළි එළිය කරගත් අවස්ථා සඳහා නිදසුන් අපමණ බව සඳහන් කළ යුතු ය. සැමට අධ්‍යාපනය ලබාදීමේ උත්කෘෂ්ට කර්තව්‍යය වෙනුවෙන් පිරිවෙන් විද්‍යස්ථාන ද ඇප කැප වී සිටින බවට එය කදිම සාක්ෂ්‍යයකි.

මෙම පොත් මැනවින් පරිශීලනය කරමින් ඒ ඔස්සේ තව තවත් පුළුල් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත පිවිසෙන්නට ද ඔබ සැමට ඇරයුම් කරමි. මනා ඉගෙනුමක් ලැබූ හා ආධ්‍යාත්මික සුවපත් භාවයෙන් පිරිපුන් සුපසන් සිසු පරපුරක් බිහිවනු දැකීම රජයේ ඒකායන අරමුණයි. ඒ සඳහා ඇප කැපවන්නට හැකිවේවායි සියලු දෙනා වෙත ආශීර්වාද කරමි. මේ සත්කාර්යය වෙනුවෙන් නොමසුරු දායකත්වයක් සැපයූ සියලු පිරිවර වෙත ද මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

**නියාමනය හා අධීක්ෂණය :**

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම :**

**පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

**ඩබ්. ඒ. නිර්මලා පියසීලි**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සම්බන්ධීකරණය :**

**ඩී. එම්. ජේ. පුෂ්පකුමාර**
නියෝජ්‍ය කොමසාරිස් (පාලන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**එල්. ඒ. එස්. ප්‍රේමරත්න**
සමස්ත ලංකා සිංහල විෂය උපදේශක
අධ්‍යාපන අමාත්‍යාංශය (පිරිවෙන්)

**උපදේශක මණ්ඩලය :**

1. **පූජ්‍ය ඔක්කම්පිටියේ පඤ්ඤාසාර ස්වාමීන් වහන්සේ**
   මහාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
2. **පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල ස්වාමීන් වහන්සේ**
   කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

**සංස්කාරක මණ්ඩලය :**

1. **පූජ්‍ය මල්වානේ චන්ද්‍රරතන ස්වාමීන් වහන්සේ**
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

2. **අනුරින් ඉන්දිකා දිවාකාර**
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

3. **එච්. එල්. එස්. අභයසිංහ**
   විශ්‍රාමික කථිකාචාර්ය, සීතාවක ගුරු අභ්‍යාස විද්‍යාලය

**ලේඛක මණ්ඩලය :**

1. **පී. එල්. ලලිත් අබේසේකර (සභාපති)**
   ගුරු උපදේශක, මහනුවර දිස්ත්‍රික්කය

2. **අයි. ජී. ඩී. ආර්. ඉලුක්ගොඩ**
   ගුරු උපදේශක, කෑගල්ල දිස්ත්‍රික්කය

3. **ටී. එස්. සී. ජයවර්ධන**
   ගුරු උපදේශක, කළුතර දිස්ත්‍රික්කය

4. **විජේරත්න වනසුන්දර**
   විශ්‍රාමික ගුරු උපදේශක, කෑගල්ල දිස්ත්‍රික්කය

**සෝදුපත් කියවීම :**

1. **පූජ්‍ය මාතලේ සුමනවංශ ස්වාමීන් වහන්සේ**
   ගුරු උපදේශක, ගම්පහ දිස්ත්‍රික්කය

2. **හීන්බණ්ඩා ජයසේකර**
   විශ්‍රාමික ගුරු උපදේශක, කළුතර දිස්ත්‍රික්කය

**පරිගණක ගත කිරීම, පිටකවරය සහ පිටු නිර්මාණය :**

**පී. ඒ. ශයිනි ඉමල්ෂා විජේවර්ධන**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# පටුන


| | | |
|---|---|---|
| 01. | සිංහල අක්ෂර මාලාව | 1 |
| 02. | පද විභාගය | 31 |
| 03. | සන්ධි | 81 |
| 04. | සමාස | 104 |
| 05. | ආඛ්‍යාත පද | 121 |
| 06. | ප්‍රත්‍යයාර්ථ නාම | 136 |
| 07. | නෛපාතික කෘදන්ත | 156 |
| 08. | කාරක | 170 |
| 09. | වාක්‍ය නිර්මාණය | 179 |
| 10. | අර්ථාවබෝධය | 195 |
| 11. | විරාම ලක්ෂණ | 203 |
| 12. | ප්‍රායෝගික ලේඛන | 214 |
| 13. | වාක්‍ය රචනය | 222 |
| 14. | සාරාංශකරණය | 228 |
| 15. | සාම්ප්‍රදායික යෙදුම් | 232 |
| 16. | සාහිත්‍ය රසාස්වාදය හා විචාරය | 242 |
| 17. | වාක්කෝෂය පෝෂණය | 258 |
| 18. | සිංහල සාහිත්‍ය ඉතිහාසය | 267 |

# 01

# සිංහල අක්ෂර මාලාව

ලෝකයේ ජීවත් වන සමස්ත ජීවී ප්‍රජාවෙන් මිනිසා සුවිශේෂ වීමට බලපෑ ප්‍රධානතම සාධකය වනාහි ඔහු පරිහරණය කරන භාෂාව යි. එය කවදා කෙසේ ඇතිවූවක් ද යන්න නිශ්චිත ව ප්‍රකාශ කළ නොහැකි ය. අදහස් සන්නිවේදනය සඳහා මිනිසාට උපකාර වන ප්‍රධානතම මෙවලම භාෂාව යි. මානව භාෂාව සතු සුවිශේෂතාව වන්නේ එය නිර්මාණාත්මක වීම යි. සිතට දැනෙන ඕනෑම හැඟීමක් වචන මගින් ප්‍රකාශ කිරීමේ ශක්තිය මිනිසා සතු ය. එසේ ජනිත වන සිතිවිලි ලියා දැක්වීම සඳහා අක්ෂර යොදා ගැනෙයි.

ලොව භාවිත වන සෑම භාෂාවකට ම ආවේණික අක්ෂර මාලාවක් නැත. එසේ අනන්‍ය අක්ෂර මාලාවක් නොමැති භාෂා පරිපූර්ණත්වයෙන් තොර ය. ක්‍රමික ව විකාසනය වෙමින් එන දියුණු අක්ෂර මාලාවකට උරුමකම් කීමට සිංහලයෝ භාග්‍යවන්තයෝ ය. ලෝකයේ පවතින, පැවැත්මක් ඇති සියලු ම දේ කාලානුරූප ව විවිධ විපර්යාසයන්ට ගොදුරු වනවා සේ ම ජීව භාෂාවක් වන සිංහලය ද විවිධ වෙනස්වීම්වලට භාජනය වන බව භාෂා ව්‍යවහාරයෙන් පෙනේ. එසේ නොවෙනස් වන දෙයක පැවැත්මක් ද නැත. භාෂාව ක්‍රමික ව විකාසනය වීමේදී අක්ෂර මාලාව ද විවිධ වෙනස්වීම්වලට භාජනය වීම නිරායාසයෙන් ම සිදු වන්නකි.

# අක්ෂර මාලාව

අප අදහස් ප්‍රකාශ කිරීම සඳහාත්, අදහස් හුවමාරු කරගැනීම සඳහාත්, අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වා ගැනීම සඳහාත් උපයෝගී කර ගන්නා ප්‍රධාන මාධ්‍යය භාෂාව යි. අප තුළ පවත්නා අදහස් සන්නිවේදනයේදී භාෂාව උපදියි. එය ලියා දැක්වීම සඳහා යම්කිසි සංකේත මාලාවක් භාවිත කෙරෙයි. ඒවා අක්ෂර හෙවත් අකුරු නම් වේ. මේ අනුව භාෂාවක මූලික ලක්ෂණ ශබ්ද වන බවත් ඒවා ලියා දැක්වීමට සංකේත උපයෝගී කරගනු ලබන බවත් වටහා ගත යුතු ය.

භාෂාව වනාහි සන්නිවේදනය සඳහා උපයෝගී කරගනු ලබන ප්‍රධාන උපකරණය යි. භාෂාවෙන් සිදු වන සන්නිවේදනය ආකාර දෙකකට සිදු වෙයි. එනම් භාෂණය සහ ලේඛනය වශයෙනි. මෙම ක්‍රම දෙකට සන්නිවේදන කාර්යය සිදු වීම පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

**සන්නිවේදනය**

**භාෂාව**

**භාෂණය**
- ශබ්ද
- පද
- වාගාලාප

**ලේඛනය**
- අක්ෂර
- වචන (පද)
- වාක්‍ය
- ඡේද
- පරිච්ඡේද
- ග්‍රන්ථ

ඉහත දැක්වුණු එක් එක් අංග, අදහසක් සන්නිවේදනය වන ආකාරයට එකිනෙක සංයෝග වීම භාෂා සන්නිවේදනය යි. භාෂණයේ මූලික ඒකකය **ශබ්ද** වන අතර ලේඛනයේ මූලික ම ඒකකය **අක්ෂර** යි. මුවින් පිටවන, කනට ඇසෙන භාෂණ ශබ්ද ඇසට පෙනෙන රූප ලෙස ලියා දැක්වීමට භාවිත වන දෘෂ්ටිමය සංකේතය අක්ෂරය හෙවත් අකුර ලෙස හැඳින්වේ.

එබැවින් අක්ෂරයක් යනු **ශබ්ද සංකේතයකි.** සමහර ශබ්ද, ලෝකයේ සෑම භාෂාවකට ම පොදු වන අතර අක්ෂර ඒ ඒ භාෂාවට අනන්‍ය, ආවේණික සංකේත පද්ධතියකි. "අ"ශබ්දය ලිවීම සඳහා විවිධ භාෂාවන්ට අනන්‍ය සංකේත මෙසේ ය.

| | | |
|---|---|---|
| අ | සිංහල | - අ |
| | සංස්කෘත | - अ |
| | දෙමළ | - அ |
| | ඉංග්‍රීසි | - A / E / I / O / U |
| | හින්දී | - अ |

මෙලෙස යම් භාෂාවකට අනන්‍ය වූ ශබ්ද සංකේත පද්ධතිය ඒ භාෂාවේ අක්ෂර මාලාව ලෙස හැඳින්වේ. වර්ණමාලාව, අකාරාදිය, හෝඩිය යනු ද මීට ම පර්යාය පදයෝ ය.

සිංහලය ජීව භාෂාවකි. ජීව භාෂාවක් කාලානුරූප ව විවිධ විපර්යාසයන්ට ලක්වේ. අක්ෂර මාලාව ද පරිමාණය, හැඩය සහ අක්ෂර සංඛ්‍යාව ආදි වශයෙන් කාලාන්තරයක් තිස්සේ විවිධ වූ විපර්යාසයන්ට බඳුන් වී ඇති ආකාරය ඔබ මූලික ශ්‍රේණිවලදී අධ්‍යයනය කරන්නට ඇත. දැනට විද්‍යමාන ආදිතම ලිඛිත අක්ෂර මාලාව ඇතුළත් වන්නේ දහතුන්වැනි සියවසේදී පමණ (දඹදෙණි යුගයේ) රචනා වුණු සිදත් සඟරාවෙහි ය. එය 03 වැනි ශ්‍රේණියේදී අධ්‍යයනය කරන්නට ඇත. මෙය සිංහල වර්ණ මාලා අතර කෙටි ම වර්ණ මාලාව ද වේ. **සිදත් සඟරා හෝඩිය** ලෙස නම් කරන්නේ එය යි.

සිදත් සඟරාව පද්‍ය සිංහලයට අනුගත වූවකි. පද්‍යකරණයෙහි නිරත වුණු පැරණි සිංහල කිවිහු තත්සම පද සිය නිර්මාණවල නොයෙදූහ. එබැවින් සිදත් සඟරා හෝඩිය තත්සම පද ලිවීමට අවශ්‍ය අක්ෂර රූපවලින් තොර විය. එහෙත් එවක භාවිත වුණු සිදත් සඟරාවේ ම යෙදී ඇති "ඇ" සහ "ඈ" අක්ෂර දෙක එහි අක්ෂර මාලාවට ඇතුළත් වී නැත්තේ "ඇ" යනු "අ" යන්නේ ම මාත්‍රා වෘද්ධියක් ලෙස සැලකූ නිසා විය හැකි ය. එහෙත් මේ මතය සාවද්‍ය වන්නේ ඒ අක්ෂර දෙකෙහි මාත්‍රා වෙනසක් නොපෙනෙන බැවිනි.

අ - **මාත්‍රා 01 කි**
ඇ - **මාත්‍රා 01 කි**

මෙම අක්ෂර දෙක එතෙක් පැවති කිසිදු භාෂාවක අක්ෂර මාලාවකට ඇතුළත් නොවූ නිසා අමුතුවෙන් ම අකුරක් අක්ෂර මාලාවට ඇතුළත් කිරීමට තිබූ පසුබට වීම හේතුවෙන් "ඇ" "ඈ" අක්ෂර සිදත් සඟරාවෙන් බැහැර වන්නට ඇත.

## සිදත් සඟරා හෝඩිය

**"පණකුරු පසෙකි එ ද - ලුහුගුරු බෙයින් දස වේ**
**ගතකුරු ද වේ විස්සෙක් - වහරට යුහු සියබසැ"**

ඒ අනුව,

| | |
|---|---|
| ප්‍රාණාක්ෂර | **අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ** |
| ගාත්‍රාක්ෂර | **ක ග ජ**<br>**ට ඩ ණ**<br>**ත ද න**<br>**ප බ ම**<br>**ය ර ල ව**<br>**ස හ ළ (අ)ං** |

සිංහල අක්ෂරමාලාවේ තවත් ප්‍රභේදයක් වන්නේ ශුද්ධ සිංහල අක්ෂර මාලාව යි. නුමුසු හෙළ හෝඩිය, අමිශ්‍ර සිංහල අක්ෂර මාලාව යනු මීට ම පර්යාය නම් ය. වෙනත් භාෂාවක තත්සම ශබ්දවලින් තොර සිංහලය ශුද්ධ සිංහලය හෙවත් අමිශ්‍ර සිංහලය නම් විය. එය ලියා දැක්වීමට උපයෝගී කර ගත් අක්ෂර මාලාව මෙනමින් හැඳින්විණි.

සිදත් සඟරා හෝඩියට ම "ඇ" "ඈ" අක්ෂර දෙක එක් වී මෙම අක්ෂර මාලාව සෑදී ඇත. එහි ස්වරාක්ෂර 12ක් සහ ව්‍යඤ්ජනාක්ෂර 20ක් වේ.

## ශුද්ධ සිංහල අක්ෂර මාලාව

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ

ක ග ජ

ට ඩ ණ

ත ද න

ප බ ම

ය ර ල ව

ස හ ළ (අ)ං

භාෂාව තවත් සංවර්ධනය වීමේදී විවිධ භාෂා සිංහලයට සම්මිශ්‍රණය වන්නට විය. ගද්‍ය මාධ්‍යයේදී පාලි, සංස්කෘත තත්සම පද ලිවිය යුතු විය. එබැවින් බොහෝ විට පද්‍ය රචනය සඳහා උපකාරී වූ ශුද්ධ සිංහල අක්ෂර මාලාව ඊට ප්‍රමාණවත් නොවී ය. ඒ සඳහා සම්මත වූ අක්ෂර මාලාව මිශ්‍ර සිංහල හෝඩිය යි. (මිශ්‍ර සිංහලය නමින් හඳුන්වන්නේ වෙනත් භාෂාවන්හි තත්සම පද යෙදුණු බැවිනි). මෙහි ස්වර දහඅට (18) ක් හා ව්‍යඤ්ජනාක්ෂර තිස්හය (36) කි.

## මිශ්‍ර සිංහල අක්ෂර මාලාව

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ ඍ ඎ

ඏ ඐ එ ඒ ඓ ඔ ඕ ඖ

ක ඛ ග ඝ ඞ

ච ඡ ජ ඣ ඤ

ට ඨ ඩ ඪ ණ

ත ථ ද ධ න

ප ඵ බ භ ම

ය ර ල ව

ශ ෂ ස හ ළ

(අ)ං (අ)ඃ


භාෂාව අඛණ්ඩ ව සංවර්ධනය වීමේදී ඉංග්‍රීසි, පෘතුගීසි, ලන්දේසි, අරාබි ආදි භාෂාවන්හි තත්සම ශබ්ද ලිවිය යුතු විය. එහි එන "F","ph" ශබ්ද ලිවීමට ආවේණික සංකේතයක් අවශ්‍ය විය. තව ද සඤ්ඤකාක්ෂර ලිවිය යුතු විය. මේ සඳහා අක්ෂර රූප පනස්හතර (54)කින් යුතු මිශ්‍ර සිංහල අක්ෂර මාලාව ප්‍රමාණවත් නොවී ය. මේ සියලු අවශ්‍යතා සපුරාලමින් වර්තමානයේ භාවිත වන්නේ අක්ෂර රූප හැට (60)කින් යුතු අක්ෂර මාලාව යි. එය නූතන සිංහල අක්ෂර මාලාව නමින් හඳුන්වමු. මෙහි ස්වරාක්ෂර දහඅට (18)ක් සහ ව්‍යඤ්ජනාක්ෂර හතළිස්දෙක (42) කි.

## නූතන සිංහල අක්ෂර මාලාව

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ | උ | ඌ |
| ඍ | ඎ | ඏ | ඐ | එ | ඒ | ඓ | |
| ඔ | ඕ | ඖ | | | | | |
| (අ)ං | (අ)ඃ | | | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ | | |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ | | |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ | | |
| ත | ථ | ද | ධ | න | ඳ | | |
| ප | ඵ | බ | භ | ම | ඹ | | |
| ය | ර | ල | ව | | | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ | | |

## අක්ෂර වර්ගීකරණය හෙවත් අක්ෂර මාලාවේ බෙදීම්

අක්ෂරමාලාවේ වර්ගීකරණය වාග්විද්‍යාත්මක පදනමක් මත සැකසුණකි. ඊට පාදක වී ඇත්තේ අක්ෂර උච්චාරණ ස්වභාවය යි. ඒ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා ශබ්දෝච්චාරණය පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතු ය. එබැවින් උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අවධානය යොමු කළ යුතු වෙයි.




උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය

ඉහත සටහනෙහි දැක්වෙන්නේ උච්චාරණයේදී ක්‍රියාත්මක වන ඉන්ද්‍රිය සමූහය යි. උච්චාරණ ක්‍රියාවලියේදී මේවා කොටස් දෙකකට වෙන් කළ හැකි ය. ඒ ස්ථාන සහ කරණ යනුවෙනි. ස්ථාන යනු චලනය නොවන අවයව යි. ඒ ස්ථානයක් කරා නැඹුරු වී එහි ස්පර්ශ වෙමින් පෙනහැල්ලේ සිට එන වායු ධාරාවට බාධා පමුණුවන අවයවය කරණය යි.

| ස්ථාන | කරණ |
|---|---|
| කණ්ඨය (උගුර) | දිව මුල |
| තාලුව (ඉදිරිතල්ල) | දිව ඉදිරිමැද |
| මූර්ධය (තල්ල මුදුන) | දිවි තුඩ |
| දන්ත (දත්වැටි) | දිවි තුඩ |
| ඕෂ්ඨ (උඩුතොල) | යටි තොල |

## ස්වර අකුරු

උච්චාරණයේදී ස්ථාන, කරණ ගැටීමකින් තොර ව ශබ්ද වන අකුරු මීට අයත් වේ. මේවා ශබ්ද කිරීමේදී පෙනහැල්ලේ සිට එන වායු ධාරාව බාධාවකින් තොර ව පිට වන නිසා තනි ව ශබ්ද කළ හැකි ය. ස්ව + ර > ස්වර යන්නෙහි වචනාර්ථය තනි ව ශබ්ද වන යන්න යි. නූතන සිංහල අක්ෂරමාලාවේ "අ" සිට "ඖ" දක්වා ඇති අක්ෂර රූප දහඅට (18) ස්වර නම් වේ.

ප්‍රාණාක්ෂර, පණකුරු, සර, සරකුරු සොරකුරු, නිශ්‍රයාක්ෂර, නිසකුරු යනුවෙන් හැඳින්වෙන්නේ ද මේවා ම ය.

ලේඛනයේදී ස්වරයක් කේවල ස්වරූපයෙන් යෙදෙන්නේ එය වචනයක මුලට යෙදෙන්නේ නම් පමණි.

උදා අම්බලම
ආලින්දය
ඇතුළ
ඉඳුවර
ඊප්සිත ආදි වශයෙනි. වචනයක මැදට හෝ අගට යෙදෙන ස්වරයක් සෑම විට ම ව්‍යඤ්ජනාක්ෂරයක් සමග බැඳී පවතියි. "අ" ස්වරය හැරුණු විට එය පිල්ලමක් මගින් සංකේතවත් කෙරෙයි.

උදා - අ + ම් + බ් + අ + ල් + අ + ම් + අ
බ ල ම

ඉ + ඳ් + උ + ව් + අ + ර් + අ
ඳු ව ර

## ස්වරාක්ෂරවල බෙදීම්

උච්චාරණ ස්වරූපය අනුව ස්වර ප්‍රභේද දෙකකට වෙන් කළ හැකි ය. එනම් ශබ්ද කිරීමට ගතවන කාලය අනුව යි. ස්වරයක් ශබ්ද කළ හැකි අඩු ම කාලය මාත්‍රා එකකි. (හ්‍රස්ව මාත්‍රාව “—”) එලෙස එක් මාත්‍රාවකට වැඩි කාලයක් සමහර ස්වර සඳහා වැය වේ. ඒ අනුව වර්ග කිරීමේදී හ්‍රස්ව ස්වර හා දීර්ඝ ස්වර ලෙස වර්ග කළ හැකි ය.

### හ්‍රස්ව ස්වර

එක් මාත්‍රාවකින් ශබ්ද වන ස්වර මෙනමින් හැඳින්වේ. මේවා ඇදීමකින් තොර ව උච්චාරණය වේ. ලඝු ස්වර, ලුහු සර යනු ද මේවා ම ය. ගණනින් එය අටකි (8) කි.

අ ඇ ඉ උ ඍ ඏ එ ඔ

### දීර්ඝ ස්වර

මාත්‍රා දෙකකින් ශබ්ද වන ස්වර මෙනමින් හැඳින්වෙයි. ගුරු ස්වර යනු ද මේවාට තවත් නමකි. (දීර්ඝ මාත්‍රාව “◡”) එය ගණනින් දහය (10) කි.

ආ ඈ ඊ ඌ ඎ ඐ ඒ ඓ ඕ ඖ

මෙයින් ඓ සහ ඖ අක්ෂර දෙක නිත්‍ය දීර්ඝ ලෙස හැඳින්වෙයි.

හ්‍රස්ව ස්වර සංකේතයකට අමතර සලකුණක් එකතු කිරීමෙන් දීර්ඝ ස්වරය සංකේතවත් වේ. එහෙත් “ඉ” ස්වරය “ඊ” වීමේදී අක්ෂර රූපය ම වෙනස් වී ඇත. සෙසු දීර්ඝ ස්වර සංකේතවත් වී ඇති ආකාරය බලන්න.

| | |
|---|---|
| හ්‍රස්ව ස්වරය | අ ඇ උ ඍ ඏ එ ඔ |
| දීර්ඝ ස්වරය | ආ ඈ ඌ ඎ ඐ ඒ ඕ |
| එක් වී ඇති සලකුණ | ා ැ ෟ ෳ ෟ ් ් (මේවා කේවල පිල්ලම් ලෙස නොසැලකේ. ඒවා දීර්ඝත්ව ලකුණු ය.) |

### සන්ධ්‍යක්ෂර

සංයුක්ත ස්වර හෙවත් සන්ධ්‍යක්ෂර යනු ස්වරවල තවත් ප්‍රභේදයකි. මේවා මෙසේ හැඳින්වෙන්නේ ස්වර දෙකක සංයෝගයෙන් සෑදුණු ස්වර බැවිනි.

| සන්ධ්‍යක්ෂරය | | සෑදෙන ආකාරය |
|---|---|---|
| එ | ⟶ | අ + ඉ > එ |
| ඒ | ⟶ | අ + ඊ > ඒ |
| ඓ | ⟶ | අ + එ > ඓ |
| ඔ | ⟶ | අ + උ > ඔ |
| ඕ | ⟶ | අ + ඌ > ඕ |
| ඖ | ⟶ | අ + ඔ > ඖ |

## නම්‍ය සහ අනම්‍ය ස්වර

නම්‍ය යනු නැමෙනසුලු යන්න යි. වෙනත් ස්වරයක ස්වභාවයට නැමෙන හෙවත් වෙනස්වනසුලු ස්වර 'නම්‍ය' වන අතර එසේ නොවන්නේ 'අනම්‍ය' ස්වර යි. පද සාධනයේදී අනම්‍යකරණය සිදුවන්නේ මේ ස්වර ආශ්‍රයෙනි. බොහෝ විට ම නම්‍ය ස්වරයක් අනම්‍ය ස්වරයක් බවට පත් වේ.

| උදා:- නම්‍ය ස්වර | අනම්‍ය ස්වරය | අනම්‍යකරණය වීම |
|---|---|---|
| අ | ඇ | කවුඩු - කැවිඩි<br>අ උ උ   ඇ ඉ ඉ |
| උ | ඉ | කුකුළු - කිකිළි<br>උ උ උ   ඉ ඉ ඉ |
| ඔ | එ | සොර - සෙර<br>ඔ   එ |

## ඒකජ ස්වර සහ ද්විජ ස්වර

එක් ස්ථානයක් ආශ්‍රය කරගෙන උපදින ස්වර ඒකජ ස්වර නම් වේ.

| ස්වර | උත්පත්ති ස්ථානය | අක්ෂර වර්ගය |
|---|---|---|
| අ ආ | කණ්ඨය | කණ්ඨජ |
| ඉ ඊ | තාලුව | තාලුජ |
| ඍ ඎ | මූර්ධය | මූර්ධජ |
| ඏ ඐ | දන්ත | දන්තජ |
| උ ඌ | ඕෂ්ඨ | ඕෂ්ඨජ |

ස්ථාන දෙකක් ආශ්‍රයෙන් උපදින ස්වර අකුරු ද්විජ ස්වර ලෙස හැඳින්වෙයි.

| ස්වර | උත්පත්ති ස්ථානය | අක්ෂර වර්ගය |
|---|---|---|
| ඇ ඈ | කණ්ඨය - තාලුව | කණ්ඨතාලුජ |
| එ ඒ ඓ | කණ්ඨය - තාලුව | කණ්ඨතාලුජ |
| ඔ ඕ ඖ | කණ්ඨ - ඕෂ්ඨය | කණ්ඨෝ/කණ්ඨෞ |

## ව්‍යඤ්ජනාක්ෂර

උච්චාරණයේදී ස්ථාන හා කරණ ගැටීමක් සිදුවේ නම් එලෙස ශබ්දවන්නේ ව්‍යඤ්ජනාක්ෂර යි. මේවායේ ප්‍රකෘති ස්වරූපය වන්නේ හල් ස්වභාවය යි. හල් ලකුණු ඉවත් කොට ඇත්තේ අක්ෂර මාලාව උච්චාරණය පහසුවට යි. ගාත්‍රාක්ෂර, ගතකුරු, හසකුරු, හල් අකුරු, මළකුරු, මෘතාක්ෂර, නිශ්‍රිතාක්ෂර යනු ද මේවා හැඳින්වීමට යෙදෙන විවිධ නම් ය. නූතන අක්ෂර මාලාවේ (අ)ං සිට ෆ දක්වා ඇති අක්ෂර රූප 42 මීට අයත් වේ.

මේවා පදයක ප්‍රකෘති ස්වරූපයෙන් යෙදෙන්නේ නම් කේවල ව්‍යඤ්ජන ලෙස හැඳින්විය හැකි ය.

උදා අම්මා යන්නෙහි 'ම්' කේවල ව්‍යඤ්ජනාක්ෂරයකි.

ස්වරාරූඪ වී පිල්ලමක් සහිත ව යෙදී ඇති විට ඒවා ස්වරාරූඪ ව්‍යඤ්ජන යි. ඉහත පදයේ 'මා' යන්න එවැන්නකි. ම් + ආ > මා මෙහි "ආ" ස්වරය එක් වීම සංකේතවත් වන්නේ ඇලපිල්ලෙනි ("ා").

**ව්‍යඤ්ජනාක්ෂරයක් ප්‍රකෘති ස්වරූපයෙන් පදයක මුලට, මැදට, අගට යෙදිය හැකි ය.**

මුලට - ස්වභාවය
මැදට - අනුස්වාරය
අගට - රැඟුම්

**ශුද්ධ සිංහල (තත්භව හෝ නිෂ්පන්න) පදවල කේවල ව්‍යඤ්ජනාක්ෂරයක් මුලට නොයෙදේ.**

ව්‍යඤ්ජනාක්ෂරයක් තනි ව උච්චාරණය කරන විට ස්ථාන හා කරණ ගැටීම නිසා, පිටවන ශබ්දයේ නිමාවක් ඇති නොවේ. එබැවින් මේවා තනි ව ශබ්ද කළ නොහැකි අතර ශබ්දය නිමා වීමට නම් ස්වරයක සංයෝගය අවශ්‍ය වේ.

(අ)ං (අ)ඃ

| | | | | | |
|---|---|---|---|---|---|
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

## ව්‍යඤ්ජනාක්ෂරවල බෙදීම්

ව්‍යඤ්ජනාක්ෂර ස්වර පූර්ව ව්‍යඤ්ජන සහ ස්වර අපර ව්‍යඤ්ජන ලෙස වෙන් කළ හැකි ය. 'ක' සිට 'ෆ' දක්වා ඇති ව්‍යඤ්ජනාක්ෂර 40 ට ස්වරයක් එකතු වන්නේ පසුපසින් වීම නිසා ඒවා ස්වර අපර ව්‍යඤ්ජන නම් වේ.

උදා - ග් + අ > ග
ප් + ඉ > පි
න් + උ > නු

ස්වර අපර ව්‍යඤ්ජනවලට ස්වරාරූඪ වූ බව හැඳින්වීමට පිල්ලමක් යොදා ගැනෙයි.

බිංදුව (ං) සහ විසර්ගය (ඃ) ස්වර පූර්ව ව්‍යඤ්ජන ලෙස හැඳින්විය හැකි ය. මේවා ස්වරයක් හා සම්බන්ධ වන්නේ එම ස්වරය ඊට ඉදිරියෙන් යෙදෙන විට යි.

කං → ක් + අ + ං > කං
දුඃඛ → ද් + උ + ඃ + ඛ් + අ > දුඃඛ

## අනුස්වාරය

බිංදුව, නිග්ගහිතය යනු ද මෙය ම ය. සෑම විට ම මෙය උච්චාරණය වන්නේ ස්වරයට අනුව වන බැවින් අනුස්වාරය ලෙස ද හැඳින්වේ. (ස්වර පූර්ව ව්‍යඤ්ජන යටතේ විස්තර විය.)

"ං"

මෙහි ව්‍යඤ්ජන ප්‍රකෘතිය "ං" වන අතර ස්වර පූර්ව යෙදීමේ දී (අ)ං ලෙස යෙදෙයි. මෙය පූර්ණ නාසික්‍යයකි.

## විසර්ගය

විසර්ජනිය, විසර්ජනී යනු ද මෙය ම ය. උච්චාරණයේදී පෙනහැල්ලේ සිට එන වායුධාරාව වේගයෙන් බැහැරට මුදාහැරෙන හෙවත් විසර්ජනය වන නිසා මේ නම යෙදී ඇත. සංස්කෘත භාෂාවේ තත්සම ශබ්ද ලිවීමට උපකාරී වේ. විසර්ගය ද ස්වර පූර්ව ව්‍යඤ්ජනයක් වන අතර ස්වරයකට පිටුපසින් ම යෙදේ.

අන්තඃපුර ⟶ ත් + අ + ඃ ⟶ තඃ

## වර්ගාක්ෂර

ක - ඹ දක්වා ඇති අකුරු 30 වර්ගාක්ෂර ලෙස හැඳින්වේ. වර්ග යනු කාණ්ඩ යන අර්ථය දෙයි. එබැවින් වර්ගවලට හෙවත් කාණ්ඩවලට අයත් අකුරු යන අර්ථය ගෙන දේ. අක්ෂර මාලාව පෙළගස්වා ඇති ආකාරය අනුව එම අකුරු අයත් එක් තිරස් පේළියක් එක් වර්ගයක් වේ. එම වර්ගයේ පළමුවන අකුරේ නමින් ඒ වර්ගය හැඳින්වේ. මේ අකුරු 30 හැර සෙසු සියලු ම අකුරු අවර්ගාක්ෂර වේ.

| වර්ගයේ නම | අදාළ අක්ෂර |
|---|---|
| ක වර්ගය | ක ඛ ග ඝ ඞ ඟ |
| ච වර්ගය | ච ඡ ජ ඣ ඤ ඦ |
| ට වර්ගය | ට ඨ ඩ ඪ ණ ඬ |
| ත වර්ගය | ත ථ ද ධ න ඳ |
| ප වර්ගය | ප ඵ බ භ ම ඹ |

## වර්ගාක්ෂරවල බෙදීම්

## අල්පප්‍රාණාක්ෂර

උච්චාරණයේදී අඩු ආයාසයක් හෙවත් අඩු පණක් වැය වන අකුරු මෙනමින් හැඳින්වේ. සෑම වර්ගයක ම පළමු සහ තෙවන අකුරු මේ ගණයට අයත් ය.

ක ග ච ජ ට ඩ ත ද ප බ

## මහාප්‍රාණාක්ෂර

උච්චාරණයේදී වැඩි ආයාසයක් හෙවත් වැඩි පණක් වැය වන බැවින් මෙ නමින් හැඳින්වේ. සෑම වර්ගයක ම දෙවන සහ හතරවන අකුරු මීට අයත් වේ.

ඛ ඝ ඡ ඣ ඨ ඪ ථ ධ ඵ භ

## නාසික්‍යාක්ෂර

අනුනාසික්‍ය, සානුනාසික යනු ද මේවා ම ය. උච්චාරණයේදී පෙනහැල්ලේ සිට එන වායු ධාරාව නාසය ද ආශ්‍රයෙන් පිටවන නිසා මේ නම යෙදී ඇත.

ඞ ඤ ණ න ම

✶ මෙම අකුරු මිශ්‍ර සිංහල වර්ණමාලාවේ (අකුරු 54) වර්ග අවසානයේ පිහිටීම නිසා වර්ගාන්තාක්ෂර ලෙස හැඳින්වුව ද නූතන අක්ෂරමාලාවේ වර්ගාන්තය සඤ්ඤක අකුරු වන නිසා වර්තමානයේ මේවා වර්ගාන්ත ලෙස හැඳින්විය නොහැකි ය.

## සඤ්ඤකාක්ෂර

මේවා ද සංයුක්තාක්ෂර ප්‍රභේදයකි. නාසික්‍ය පූර්ව ව්‍යඤ්ජනාක්ෂර, නාසිකීකෘත ව්‍යඤ්ජන ලෙස ද මේවා හැඳින්විය හැකි ය. අක්ෂර කීපයක සමවායෙන් මේවා නිර්මාණය වේ. එනම් සෑම වර්ගයක ම තුන්වැනි අකුරට එම වර්ගයේ ම නාසික්‍යාක්ෂරයේ භාගයක් හෙවත් අර්ධ නාසික්‍යයක් එක් වී එම වර්ගයේ සඤ්ඤකාක්ෂරය සෑදේ. නූතන අක්ෂර මාලාවේ පෙළගැස්ම අනුව සඤ්ඤකාක්ෂර, වර්ගාන්තාක්ෂර ලෙස හැඳින්විය හැකි ය.

| සඤ්ඤකාක්ෂරය | | අර්ධනාසික්‍යය | | තුන්වැනි ගාත්‍රාක්ෂරය | | ‘අ’ ස්වරාරූඪ වීම |
|---|---|---|---|---|---|---|
| ඟ | < | ඞ් $\frac{1}{2}$ | + | ග් | > | ඟ |
| ඦ | < | ඤ් $\frac{1}{2}$ | + | ජ් | > | ඦ |
| ඬ | < | ණ් $\frac{1}{2}$ | + | ඩ් | > | ඬ |
| ඳ | < | න් $\frac{1}{2}$ | + | ද් | > | ඳ |
| ඹ | < | ම් $\frac{1}{2}$ | + | බ් | > | ඹ |

මෙහිදී සඤ්ඤක “ඹ” හැරුණු විට සෙසු අක්ෂරවලට සංයෝග වන අර්ධ නාසික්‍යය “(” යන සඤ්ඤක ලකුණින් සංකේතවත් වේ.

මෙම අකුරු ආරම්භ වන්නේ එම ලකුණින් ය.

ඟ ඦ

ඬ ඳ

“ඹ” පමණක් අක්ෂර කොටස් දෙකින් ම සංකේතවත් කරයි.

| | | |
|---|---|---|
| ම් | - | ම් අර්ධය |
| බ් | - | වර්ගයේ 3 වැනි අකුර |

ඉහත කොටස් දෙක සංයෝග වූ විට ‘ඹ’ අක්ෂරය සෑදේ.

ඹ (ම්බ)

## අන්තඃස්ථාක්ෂර

අන්තඃ + ස්ථ + අක්ෂර > අන්තඃස්ථාක්ෂර, යන්නෙහි වචනාර්ථය වන්නේ අතර පිහිටි අකුරු යන්න යි. එනම් මේවා උච්චාරණයේ දී ස්වර උච්චාරණ ස්වභාවයත් ව්‍යඤ්ජන උච්චාරණ ස්වභාවයත් යන දෙකෙහි අතරමැදි ලක්ෂණ පෙන්වයි. ස්වරයක් ස්ථාන හා කරණ ගැටීමකින් තොර ව උච්චාරණය වීම නිසා පෙනහැල්ලේ සිට එන වායුධාරාවට බාධා නොවන බැවින් තනි ව, පහසුවෙන් ශබ්ද කළ හැකි ය.

අන්තඃස්ථාක්ෂර උච්චාරණයේ දී ස්ථාන හා කරණ ගැටී ව්‍යඤ්ජන ස්වරූපය පෙන්වූවත් සෙසු ව්‍යඤ්ජනාක්ෂර ශබ්ද කිරීමේ දී තරම් බාධාවක් ඇති නොවේ. එබැවින් මේවා ස්වර ස්වභාවයට සමීප වේ. එසේ වන්නේ මෙම ශබ්දවලට අනුරූප ස්වර ශබ්ද පවතින නිසා ය.

| අන්තඃස්ථාක්ෂර | අනුරූප ස්වර |
|---|---|
| ය් | ඉ |
| ර් | ඍ |
| ළ්/ල් | ඏ |
| ව් | උ |

මෙසේ ස්වරවලට ඇති අනුරූපතාව නිසා මෙම අකුරු අර්ධස්වර ලෙස ද හඳුන්වයි.

මිශ්‍ර සිංහල සන්ධි ක්‍රමයක් වන අර්ධස්වරාදේශ (අන්තඃස්ථාදේශ) සන්ධියේදී සිදුවන්නේ පූර්ව වර්ණයේ ඇති ස්වරය වෙනුවට ඊට අනුරූප අන්තඃස්ථාක්ෂරය ආදේශ වීම යි.

උදා -

අති + අවශ්‍ය
අත් + ඉ + අවශ්‍ය
↓
ය්
අත් + ය් + අවශ්‍ය
\ /
ය
අත්යවශ්‍ය > අත්‍යවශ්‍ය

බහු + අර්ථ
බහ් + උ + අර්ථ
↓
ව්
බහ් + ව් + අර්ථ
\ /
බහ්වර්ථ

කර්තෘ + අර්ථ
කර්ත් + ඍ + අර්ථ
↓
ර්
කර්ත් + ර් + අර්ථ
ර
කර්ත්රර්ථ > කර්ත්‍රුර්ථ

'ළ' අක්ෂරය ද උච්චාරණ ස්වභාවය අනුව අන්තඃස්ථාක්ෂර ගණයට ම අයත් සේ සැලකිය හැකි ය.

## ඌෂ්මාක්ෂර

මේවා උච්චාරණයේදී පෙනහැල්ලේ සිට එන වායු ධාරාව අන් ශබ්දවලට වඩා සාපේක්ෂ වැඩි උණුසුමකින් පිටවීම නිසා මේ නම යෙදී ඇත.

**ශ, ෂ, ස, හ, ෆ, (අ)ඃ**

## උත්පත්ති ස්ථාන අනුව අක්ෂර වර්ගීකරණය

පස් (5) වැනි පිටුවේ සඳහන් උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධයක් ලැබෙන්නට ඇත. අක්ෂර උත්පත්ති ස්ථානයකට අදාළ කරණයක් ස්පර්ශ වීමෙන් අකුරක් උපදියි. එම අකුරු එයට සම්බන්ධ ස්ථානයේ නමින් හැඳින්වෙයි. එසේ එක් ස්ථානයකින් උපදින අක්ෂර **ඒකජාක්ෂර** වන අතර ස්ථාන දෙකක් ආශ්‍රයෙන් උපදින අකුරු **ද්විජාක්ෂර** වේ.

### ඒකජාක්ෂර

| ස්ථානය | කරණය | නම | අක්ෂර |
|---|---|---|---|
| කණ්ඨය | දිවමුල | කණ්ඨජ | අ ආ (අ)ං (අ)ඃ ක ඛ ග ඝ ඞ ඟ හ |
| තාලුව | දිව ඉදිරිමැද | තාලුජ | ඉ ඊ ච ඡ ජ ඣ ඤ ඦ ය ශ |
| මූර්ධය | දිව්තුඩ | මූර්ධජ | ඍ ඎ ට ඨ ඩ ඪ ණ ඬ ර ළ ෂ |
| දන්තය | දිව්තුඩ | දන්තජ | ඏ ඐ ත ථ ද ධ න ඳ ල ස |
| ඕෂ්ඨය | යටිතොල | ඕෂ්ඨජ | උ ඌ ප ඵ බ භ ම ඹ |

### ද්විජාක්ෂර

කණ්ඨ තාලුජාක්ෂර - එ ඒ ඓ ඇ ඈ - කණ්ඨය හා තාලුව ආශ්‍රයෙන් උපදින අකුරු
කණ්ඨෞෂ්ඨජාක්ෂර - ඔ ඕ ඖ - කණ්ඨය හා ඕෂ්ඨය ආශ්‍රයෙන් උපදින අකුරු
දන්තෞෂ්ඨජාක්ෂර - ව ෆ - දන්ත හා ඕෂ්ඨය ආශ්‍රයෙන් උපදින අකුරු

## ඝෝෂ සහ අඝෝෂ භේදය

ඝෝෂාක්ෂර සහ අඝෝෂාක්ෂර යනු අක්ෂර මාලාවේ තවත් වර්ගීකරණයකි.

උච්චාරණයේදී ස්වරතන්තු කම්පනයට පත්වීමෙන් කණ්ඨයේ කිසියම් හඬක් හෙවත් නාදයක් උපදියි. වාග්විද්‍යාවේ මේ හඬ ඝෝෂය නමින් හඳුන්වයි. ඇතැම් ශබ්ද පිටවීමේදී ඒ සමග ම ඝෝෂයක් උපදින අතර ඇතැම් ශබ්දවලට එසේ නොවේ. ඒ අනුව ඝෝෂයක් සහිත ශබ්ද ඝෝෂ ශබ්ද ලෙසත්, ඝෝෂයක් රහිත ශබ්ද අඝෝෂ ලෙසත් හැඳින්වේ. ඝෝෂ ශබ්ද ලියා දක්වන සංකේත ඝෝෂාක්ෂර වන අතර අඝෝෂ ශබ්ද ලියා දක්වන සංකේත අඝෝෂාක්ෂර යි.

**ඝෝෂාක්ෂර**

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| (අ)ං | | | | | |
| ග | ඝ | ඞ | ඟ | | |
| ජ | ඣ | ඤ | ඦ | | |
| ඩ | ඪ | ණ | ඬ | | |
| ද | ධ | න | ඳ | | |
| බ | භ | ම | ඹ | | |
| ය | ර | ල | ව | | |
| හ | ළ | | | | |

**අඝෝෂාක්ෂර**

| | | | |
|---|---|---|---|
| (අ)ඃ | | | |
| ක | ඛ | | |
| ච | ඡ | | |
| ට | ඨ | | |
| ත | ථ | | |
| ප | ඵ | | |
| ශ | ෂ | ස | ෆ |

## පිල්ලම් භාවිතය

ලේඛන කාර්යයේ දී ඒ සඳහා උපයෝගී කරගන්නා ප්‍රධාන උපාංග දෙක වනාහි කේවලාක්ෂර සහ පිල්ලම් ය. ස්වරාක්ෂරයක් කේවල ස්වරූපයෙන් යෙදෙන්නේ වචනයක මුලට යෙදුණු විට පමණි. ව්‍යඤ්ජනාක්ෂරයක් එහි ප්‍රකෘති ස්වරූපයෙන් මෙන් ම ස්වරාරූඪ ව ද යෙදේ. එලෙස යම් ව්‍යඤ්ජනාක්ෂරයකට ස්වරයක් ආරූඪ වී ඇති බව සංකේතවත් කිරීමට යොදා ගනු ලබන සංකේත පිල්ලම් ලෙස හැඳින්වේ.

## ස්වර සංකේත හෙවත් පිල්ලම්

ව්‍යඤ්ජනාක්ෂරයකට ස්වරයක් ආරූඪ වී ඇති බව සංකේතවත් කිරීමට යොදා ගනු ලබන පිල්ලම් ස්වර සංකේත ලෙස ද නම් කරයි. ඒ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට පහත වගුව අධ්‍යයනය කරන්න.

| හල් අකුර | ස්වරය | සංයෝග වීමෙන් සෑදෙන අක්ෂරය | පිල්ලම | නම | උදාහරණ |
|---|---|---|---|---|---|
| ක් | අ | ක | - | (හල් ලකුණ ඉවත් වීම පමණක් සිදු වේ) | සමහර |
| ක් | ආ | කා | ා | ඇලපිල්ල | තාරාවා |
| ක් / ර් | ඇ | කැ / රැ | ැ | ඇදය / ඇක්ම / ඇකාරාංශය | පැහැය / රැය |
| ක් / ර් | ඈ | කෑ / රෑ | ෑ | දීර්ඝ ඇදය | නෑබඩ / රෑන |
| ක් | ඉ | කි | ි | ඉස්පිල්ල / හිස්පිල්ල | කිහිරි |
| ක් | ඊ | කී | ී | දීර්ඝ ඉස්පිල්ල | පීදීම |
| ක් / ර් | උ | කු / රු | ු | කෙටි වක් පාපිල්ල | තුරු |
| ප් | උ | පු | ු | කෙටි කොන් පාපිල්ල | නුසුදුසු |
| ක් / ර් | ඌ | කූ / රූ | ූ | දීර්ඝ වක් පාපිල්ල | කූර / රූස්ස |
| ප් | ඌ | පූ | ූ | දීර්ඝ කොන් පාපිල්ල | පූර්ව |
| ක් | ඍ | කෘ | ෘ | ගැටය සහිත ඇලපිල්ල / ගැට ඇලපිල්ල | කෘමියා |
| ක් | ඎ | කෲ | ෲ | ගැටය සහිත ඇලපිලි දෙක | පිතෲන් |
| ක් | ඏ | කෟ | ෟ | ගයනුකිත්ත | - |
| ක් | ඐ | කෟ | ෟ | ගැටය සහිත ගයනුකිත්ත | - |
| ක් | එ | කෙ | ෙ | කොම්බුව | කෙසෙල් |
| ක් / ම් | ඒ | කේ/මේ | ෙ ් ෙ | කොම්බුව සහ දීර්ඝත්ව ලකුණ | පේර /මේරූ |
| ක් | ඓ | කෛ | ෛ | කොම්බු දෙක | වෛද්‍ය |
| ක් | ඔ | කො | ෙ ා | කොම්බුව සහ ඇලපිල්ල | පොහොර |
| ක් | ඕ | කෝ | ෙ ෝ | කොම්බුව සහ දීර්ඝ ඇලපිල්ල | සෝදිසි |
| ක් | ඖ | කෞ | ෙ ෟ | කොම්බුව සහ ගයනුකිත්ත | කෞශල්‍යය |

## පිල්ලම් භාවිතයේදී අවධානයට

- ස්වරාක්ෂරවල ඇති සලකුණු පිල්ලම් ලෙස වෙන් කළ නොහැකි ය. එනම් ඒ ස්වරාක්ෂර, කේවල අක්ෂර රූප වන බැවිනි. (ඇ කාරයේ ැ සහ ඍ කාරයේ ෘ හැර මෙම සලකුණු දීර්ඝත්ව සංකේත වේ)

උදා

| ආ | ඇ | ඈ | ඌ | ඍ | ඎ | ඏ | ඒ | ඓ | ඕ | ඖ |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ා | ැ | ෑ | ෟ | ෘ | ෲ | ෟ | ් | ෙ | ් | ෟ |

මෙම සංකේත කිසිවිටෙකත් අදාළ අක්ෂරයෙන් වෙන් වන්නේ නැත. පිල්ලමක් යෙදෙන්නේ මේ සමස්ත අක්ෂර රූපයට ම සංකේතයක් වශයෙනි.

ක් + ආ ⟶ කා
ක් + ඖ ⟶ කෞ

- ඉහත අක්ෂරවල “ ා ” හා “ ෙ ෟ ” යන පිල්ලම් යෙදී ඇත්තේ පිළිවෙළින් “ආ” සහ “ඖ” සම්පූර්ණ අක්ෂර සඳහා යෙදෙන සංකේත වශයෙනි.

- ව්‍යඤ්ජනාක්ෂරයක ප්‍රකෘති ස්වරූපය හල් අකුරක් ලෙස පැවතීම නිසා කේවල ව්‍යඤ්ජනාක්ෂරයක යෙදෙන හල් ලකුණ ( ් ් ) පිල්ලම් නොවේ.

- ව්‍යඤ්ජනාක්ෂරයකට ආරූඪ වන “අ” කාරය සඳහා පමණක් විශේෂිත වූ පිල්ලමක් නැත. එහිදී “අ” ව්‍යඤ්ජනාරූඪ වීම සංකේතවත් කරන්නේ හල් ලකුණ ඉවත් කිරීමෙනි.

උදා - ක් + අ ⟶ ක
ප් + අ ⟶ ප } ් ඉවත් වී ඇත.

ච් + අ ⟶ ච
බ් + අ ⟶ බ } ් ඉවත් වී ඇත.


- ‘ ර් ’ කාරයට පාපිල්ල යෙදෙන්නේ අක්ෂර මධ්‍යයෙනි.

ර් + උ > රු - රුපියල
ර් + ඌ > රූ - රූස්ස

- ‘ ර් ’ කාරයට යෙදෙන ඇදය / ඇකාරාංශය /ඇක්ම අක්ෂරයේ ඉහළ කෙළවරෙන් යෙදෙයි.

ර් + ඇ > රැ - රැය
ර් + ඈ > රෑ - රෑන

- වක් පාපිල්ල සහ ඇදයේ ස්වරූප වශයෙන් සමරූපතාවක් පෙනුණ ද එහි පැහැදිලි වෙනසක් ඇත. එනම් ඇදය ඍජු ව යෙදෙන අතර පාපිල්ල මඳක් ඉදිරියට නැඹුරු වී ඇත. පහත සටහන බලන්න.




- ‘ ද් ’ කාරයට උ, ඌ ස්වර එක්වීමේදී අකුරේ අර්ධයක් ඉවත් වීම සිදු වේ.

ද් + උ ⟶ දු
ද් + ඌ ⟶ දූ

- ස්වරයක් ආරූඪ වූ විට අකුරේ සම්පූර්ණ ස්වරූපය ම වෙනස් වන එක ම අකුර 'ළ්' කාරය යි. එනම්, උ, ඌ ස්වර එක්වීමේදී ය.

ළ් + උ ⟶ ළු
ළ් + ඌ ⟶ ළූ

- දීර්ඝ ස්වරයක් සංකේතවත් කිරීමට කෙටි සංකේතයක් යෙදෙන්නේ ළූ කාරයේදී පමණි. හ්‍රස්ව ස්වර දෙකක් එකතු වූ විට එහි දීර්ඝ ස්වරය සෑදේ. ඒ අනුව, ළ් + උ > ළු කාරයේ එක් "උ" ස්වරයක් ඇත. එය සංකේතවත් කිරීමට පිල්ලමක් නොයෙදෙනමුත් 'ළු' කාරයේ 'උ' කාරයක් ඇත. එය දීර්ඝ කිරීමට තවත් හ්‍රස්ව 'උ' කාරයක් ප්‍රමාණවත් වේ. හ්‍රස්ව උ කාරය සංකේතවත් කරන පිල්ලම පාපිල්ල යි. මෙහිදී ඊට සම්බන්ධ වන්නේ වක් පාපිල්ල නිසාත් එක් 'උ' කාර සංකේතයක් ළු යන්නෙහි අභ්‍යන්තර ව ඇති නිසාත් ළු කාරයේ දීර්ඝය සඳහා හ්‍රස්ව "උ" කාර සංකේතය ප්‍රමාණවත් ය.

ඒ අනුව,

ළ් + ඌ > ළූ

ලෙස යෙදීම නිවැරැදි ය. එය 'ළූ' වශයෙන් යෙදීම සාවද්‍ය වන අතර එය අනවශ්‍ය දීර්ඝයකි.

- බහුශ්‍රැත, විශ්‍රැත ආදි තැන්වල ශ කාරයට පාර්ශ්වීය ව යෙදී ඇත්තේ ඇදය නොව කෙටි වක් පාපිල්ල යි. එයින් සංකේතවත් වන්නේ 'උ' කාරය යි.

ශ් + ර් + උ > ශ්‍රු
ශ් + ර් + ඌ > ශ්‍රූ

යම් අක්ෂරයකට පිල්ලමක් සමග තවත් සංකේතයක් එක ම තැනකින් සම්බන්ධ වන්නේ නැත. එබැවින් "ශ්" කාරයට මුලින් ම යෙදෙන්නේ රකාරාංශය යි. ඒ ශ් කාරයේ දකුණු පහළ කෙළවරින් ය. [ශ්‍ර] අනතුරු ව උ කාරය සංකේතවත් කරන කෙටි වක් පාපිල්ල (ශ් + උ > ශු) යෙදීමට එතැන අවස්ථාවක් නොමැති නිසා එය මඳක් ඉහළට සම්බන්ධ වී ඇත. එබැවින් මෙවැනි තැන්වල ඇත්තේ ඇදය නොව පාපිල්ල ම ය.

## ව්‍යඤ්ජන සංයුක්ත සංකේත

ව්‍යඤ්ජනාක්ෂරයක් තවත් ව්‍යඤ්ජනාක්ෂරයකට සම්බන්ධ වූ බව ඇඟවීම සඳහා යෙදෙන සංකේත ව්‍යඤ්ජන සංයුක්ත සංකේත නම් වේ. එලෙස යෙදෙන සංකේත 3 කි. එනම්,

1. යංශය - ්‍ය
2. රකාරාංශය - ්‍ර
3. රේඵය - ර්‍

### යංශය

ය + අංශ > යංශ යන්නෙහි වචනාර්ථය 'ය' කාරයේ අංශයක් හෙවත් භාගයක් යන්න යි. සංකේතයට ද එය අන්වර්ථ වේ. යකාරාංශය යනු ද මෙයට නමකි.



ව්‍යඤ්ජනාක්ෂරයකට පසුව යෙදෙන ය් කාරය වෙනුවට "්‍ය" යෙදිය යුතු ය. එහිදී ය් කාරයට සම්බන්ධ ව තිබූ ස්වරය එලෙස ම පවතියි.

ත් + ය් + ආ > ත්‍යා
ත් + ය් + ඕ > ත්‍යෝ

**භාවිතය** - පදයක් ශබ්ද වීමේදී හල් අකුරකට පසුව ශබ්ද වන "ය" ශබ්දය (ය, යා, යු, යෙ ආදි වශයෙන්) වෙනුවට යංශය යොදා එම ය කාරය හා සම්බන්ධ පිල්ලම් යංශය යෙදූ අකුරට සම්බන්ධ කරයි. එවිට පෙර හල් අකුරේ හල් ලකුණ ඉවත් වේ.

**ශබ්ද වන ආකාරය**

ත්යා → ත්‍ය → ත්‍යා

ය වෙනුවට ්‍ය යෙදීම

ය කාරයේ තිබූ පිල්ලම සම්බන්ධ වීම

ත්යැ → ත්‍ය → ත්‍යැ
ත්යු → ත්‍ය → ත්‍යු ආදි වශයෙන්
ත්යෝ → ත්‍ය → ත්‍යෝ

- ර් කාරයට පසුව යෙදෙන "ය්" වෙනුවට "්‍ය" යෙදෙන්නේ නැත. එය ශබ්ද වන ආකාරයට ලිවිය හැකි ය. කාර්ය, භාර්යා, තූර්ය ආදි වශයෙනි.

## රකාරාංශය

රකාර + අංශ > රකාරාංශ යන්නෙහි වචනාර්ථය රකාරයේ අංශය හෙවත් භාගය යන්න යි. සංකේතයට ද මෙය අන්වර්ථ වේ.

ර → ර → ්‍ර

ව්‍යඤ්ජනාක්ෂරයකට පසු ව යෙදෙන ර් කාරය වෙනුවට ්‍ර යෙදිය යුතු ය. එහිදී ර් කාරයට සම්බන්ධ ව තිබූ ස්වරය එලෙස ම පවතියි.

ක් + ර් + ආ > ක්‍රා
ක් + ර් + ඕ > ක්‍රෝ

**භාවිතය** - පදයක් ශබ්ද වීමේදී හල් අකුරකට පසු වූ ශබ්ද වන ර ශබ්දය (ර, රා, රැ, රෑ, රි ආදි වශයෙන්) වෙනුවට රකාරාංශය යොදා එම ර කාරය හා සම්බන්ධ පිල්ලම් රකාරාංශය යෙදූ අකුරට සම්බන්ධ කෙරේ. එවිට පෙර හල් අකුරේ හල් ලකුණ ඉවත් වේ.

ක්රා → ක්‍ර → ක්‍රා

ර වෙනුවට ්‍ර යෙදීම

ර කාරයේ තිබූ පිල්ලම සම්බන්ධ වීම

ක්රැ → ක්‍ර → ක්‍රැ
ක්රෝ → ක්‍ර → ක්‍රෝ

## රේඵය

හල් අකුරට පෙර ශබ්ද වන ර් කාරය වෙනුවට රේඵය යෙදිය හැකි ය. මෙහිදී රේඵය සහිත ව හෝ රහිත ව යන දෙයාකාරයට ම ලිවීම නිවැරදි වේ.


ධර්ම → ධර්‍ම
කර්ම → කර්‍ම
වාර්තා → වාර්‍තා

- ‘ය්’ කාරයට පෙර යෙදෙන ර් කාරය වෙනුවට රේඵය යෙදෙන්නේ ය කාරයට සම්බන්ධ වන යංශයක් මත වීම සම්මත ක්‍රමය යි.

කාර්ය → කාර්‍ය
භාර්යා → භාර්‍යා
සූර්යෝදය → සූර්‍යෝදය

### පිල්ලම් කුසුම

හල් අකුරකට පිල්ලම් සම්බන්ධ ස්ථාන මෙම රූප සටහනින් අවබෝධ කර ගත හැකි ය.



| අක්ෂර උත්පත්ති ස්වභාවය | අක්ෂර උත්පත්ති ස්ථානය | උත්පත්ති ස්ථාන අනුව අක්ෂර වර්ගය | ස්වරාක්ෂර | | | | ව්‍යඤ්ජනාක්ෂර | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | හ්‍රස්ව | | දීර්ඝ | | අඝෝෂ | | | ඝෝෂ | | | | | | |
| | | | ශුද්ධ | සංයුක්ත | ශුද්ධ | සංයුක්ත | අල්පප්‍රාණ | මහාප්‍රාණ | ඌෂ්මාක්ෂර | අල්පප්‍රාණ | මහාප්‍රාණ | අනුනාසික | නාසික | සඤ්ඤක | අන්තඃස්ථ | ඌෂ්මාක්ෂර |
| ඒකජාක්ෂර | කණ්ඨය | කණ්ඨජාක්ෂර | අ | | ආ | | ක | ඛ | (අ)ඃ | ග | ඝ | ඞ | (අ)ං | ඟ | | හ |
| | තාලුව | තාලුජාක්ෂර | ඉ | | ඊ | | ච | ඡ | ශ | ජ | ඣ | ඤ | | ඦ | ය | |
| | මූර්ධය | මූර්ධජාක්ෂර | ඍ | | ඎ | | ට | ඨ | ෂ | ඩ | ඪ | ණ | | ඬ | ර ළ | |
| | දන්ත | දන්තජාක්ෂර | ඏ | | ඐ | | ත | ථ | ස | ද | ධ | න | | ඳ | ල | |
| | ඕෂ්ඨ | ඕෂ්ඨජාක්ෂර | උ | | ඌ | | ප | ඵ | | බ | භ | ම | | ඹ | | |
| ද්විජාක්ෂර | කණ්ඨය සහ තාලුව | කණ්ඨතාලුජාක්ෂර | ඇ | එ | ඈ | ඒ ඓ | | | | | | | | | | |
| | කණ්ඨය සහ ඕෂ්ඨ | කණ්ඨෝෂ්ඨජාක්ෂර | | ඔ | | ඕ ඖ | | | | | | | | | | |
| | දන්ත සහ ඕෂ්ඨ | දන්තෝෂ්ඨජාක්ෂර | | | | | | | ෆ | | | | | | ව | |

★ සියලු ම ස්වරාක්ෂර ඝෝෂ ශබ්ද වේ.

# අක්ෂර වින්‍යාසය

භාෂාව මගින් සිදුවන ලේඛන සන්නිවේදනයේදී මුඛ්‍ය අපේක්ෂාව වන්නේ ඉදිරිපත් කරන පණිවුඩය නිරවද්‍ය ලෙස අර්ථකථනය කර ගැනීමට හැකි වන පරිදි එය ඉදිරිපත් කිරීම යි. ඒ සඳහා නිවැරැදි අක්ෂර භාවිතයක් අවශ්‍ය වේ. එයට පිළිගත් සම්මතයක් වෙයි. ඒ අනුව,

> ලේඛන ව්‍යවහාරයේදී නිරවද්‍ය අර්ථ ප්‍රකාශනය සඳහා උපයෝගී කර ගනු ලබන අක්ෂර භාවිතයේ සම්මත ක්‍රමය අක්ෂර වින්‍යාසය ලෙස හැඳින්විය හැකි ය.

සිංහල අක්ෂරමාලාවේ සමානරූපී ලෙස ශබ්දවන අක්ෂර කීපයක් වෙයි.

| එනම්, | | | | | | |
|---|---|---|---|---|---|---|
| ල් | ළ් | ග් | ඝ් | ඩ් | ඪ් | |
| ශ් | ෂ් | ච් | ඡ් | ත් | ථ් | |
| ණ් | න් | ජ් | ඣ් | ප් | ඵ් | |
| ක් | ඛ් | ට් | ඨ් | ඞ් | ඥ් | ං |

ඒ අනුව දන්තජ, මූර්ධජ, තාලුජ, නාසික්‍ය, සඤ්ඤක යන උච්චාරණ ස්වභාවයන් පදනම් කරගෙන අක්ෂර භාවිතයේ සම්මතයන් සැකසී ඇත. උච්චාරණ ස්වභාවය අතින් බලන විට භාෂණයේදී සමානරූපී ලෙස ශබ්ද වන අක්ෂරයන්ගේ විශේෂ වෙනසක් නැතත් ලේඛනයේදී මෙම අක්ෂර භේදය අත්‍යවශ්‍ය සාධකයකි. මෙහිදී එම නිවැරැදි අක්ෂර වින්‍යාසය දෙයාකාරයකට අවබෝධ කරගත හැකි ය.

1. සාම්ප්‍රදායික සම්මත රීතියකට අනුව
2. භාවිතයට අනුව

පහත සඳහන් නිදසුන් අනුව එය පැහැදිලි කර ගත හැකි ය. 'කණ්ඩුල' යන පදයෙහි මූර්ධජ 'ණ' කාරය යෙදී ඇත්තේ 'ඩ' කාරයට පෙර යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරය යි යන රීතියට අනුව යි. නමුත් "මුහුණ" යන පදයෙහි මූර්ධජ 'ණ' කාරය යෙදීම එවැනි රීතියකට හසු නොවේ. එය ව්‍යවහාරයෙන් ම දත යුත්තකි.

අක්ෂර වින්‍යාසයේ රීති කිහිපයක් සහ නිවැරැදි සම්මතයන් කිහිපයක් පහත දැක්වේ.

## ණ් භාවිතය

- මූර්ධජ අකුරකට පෙර යෙදෙන්නේ මූර්ධජ "ණ්" කාරය යි. (මෙහිදී ඞ, ඪ යන අක්ෂරවල පෙර 'ණ්'යෙදුණු තැන් හමු නොවේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| ණ් ට | සණ්ටාර | ණ් ඨ | කණ්ඨජ | ණ් ඩ | රණ්ඩුව |
| | කණ්ටක | | ගණ්ඨිය | | මණ්ඩිය |
| | | | නිගණ්ඨයා | | භාණ්ඩ |
| | | | | | හෙණ්ඩුව |

ණ් ණ - මෙලෙස යෙදෙන්නේ පාලි හෝ දෙමළ තත්සම පදවල ය.

- සංස්කෘතයේ "ර්ණ" අක්ෂර සංයෝගය පාලියට යෙදෙන්නේ ණ්ණ යනුවෙනි. එනම් 'ර්' මූර්ධජ නිසා එය වෙනත් භාෂාවකට යෙදෙන්නේ මූර්ධජ අකුරකින් ම වන බැවිනි.

| **සංස්කෘත** | **පාලි** |
|---|---|
| පර්ණ | පණ්ණ |
| වර්ණ | වණ්ණ |
| ස්වර්ණ | සොණ්ණ/සුවණ්ණ |
| කර්ණ | කණ්ණ |
| පූර්ණ | පුණ්ණ |
| ජීර්ණ | ජිණ්ණ |

- දෙමළ "ණ්ණ" ශබ්දය එහි තත්සම පද ලිවීමේදී එලෙස ම භාවිත වේ.

  **කණ්ණාඩි**, **වණ්ණම්**

(මෙම ශබ්ද දෙක ම කන්නාඩි, වන්නම් ලෙස ද ලිවිය හැකි ය.)

### ඉහත රීතින්ගෙන් පරිබාහිර අවස්ථා

- ඉංග්‍රීසි තත්සම පද සඳහා - කැන්ටින්
  ටෙන්ඩර්
  ලන්ඩන්

- සම්ප්‍රදාන විභක්ති රූපයේදී

  ළමයින්ට
  ගුරුන්ට
  ගායිකාවන්ට

- විධි ක්‍රියා රූපයේදී

| | |
|---|---|
| කන්න | ලියන්ඩ |
| කරන්න | කරන්ඩ |
| ලියන්න | කන්ඩ |

## ණ/න භාවිතය

- තත්සම පදවල එන "ර්" කාරයට පසුව යෙදෙන්නේ මූර්ධජ "ණ" කාරය යි.

  කර්ණ
  ස්වර්ණ
  චූර්ණ
  නිර්ණය

- සිංහලයේ යෙදෙන නාම පදවල 'ර' කාරයට පසුව යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරය යි.
  ආභරණ, අබරණ, තරුණ, පරණ, උපකරණ, අධිකරණ, රේණු, සරණ (පිහිට)

- වර්තමාන සම්මතයට අනුව වර්තමාන කාල කෘදන්ත පද සඳහා මෙම රීතිය අදාළ නොවේ. එවිට යෙදෙන්නේ දන්තජ 'න' කාරය යි.

  කරන, මරන, අරින, සූරන, උරන, සරන (සංචාරය)

- යම් පදයක අවසානයේ යෙදෙන හල් න කාරය දන්තජ වේ.

  පුරන්, රන්, පන්, රෑන්, බාන්

තොරණ, සඳකඩ පහණ, පිරිවෙණ යන පදවල නාම ප්‍රකෘතිය හෝ බහු වචන රූපය ලිවීමේදී දන්තජ 'න්' කාරය යෙදීම උක්ත රීතියට අනුව වරදක් නොපෙනේ.

- උපසර්ග පදයක අවසානය, ර කාරය වන විට ඊට සම්බන්ධ වන අනෙක් පදයේ මුල් න කාරය දන්තජ වේ.

  නිර්නාමික        පිරිනැමීම
  පරිනිර්වාණ        නිර්නාල

- රකාරාංශයට පර ව යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරය යි.

  මුද්‍රණ        මන්ත්‍රණ
  ප්‍රාණ        ද්‍රෝණි
  ශ්‍රේණි        භ්‍රෑණ

- 'ඍ' කාරයට පර ව යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරය යි.

  තෘණ
  ඝෘණ

- මූර්ධජ 'ෂ' කාරයට පර ව යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරය යි.

  අධීක්ෂණ
  සංරක්ෂණ
  විෂ්ණු
  භාෂණ
  හර්ෂණ

- රකාරාංශය, ඍ කාරය, රේඵය යෙදී ඊට පර ව යෙදෙන 'ප', 'ව', 'ම' අක්ෂරවලින් පසු ව යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරය යි.

- "ප්‍රමාණ, ශ්‍රමණ, ප්‍රවණතා, කෘපණ, ප්‍රවීණ, අභිනිෂ්ක්‍රමණ, දර්පණ, අතික්‍රමණ, උදාහරණ වේ. ආණ, අණු, අණි, ණ්ඩ, ණ්ඩි" යන ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යවල යෙදෙන්නේ ද මූර්ධජ ණ කාරය යි.

  පියාණෝ        දියණියෝ        අම්මණ්ඩි
  පුතණුවෝ        මලණ්ඩ

- අතීත කාල අකර්මක ක්‍රියා පදවල යෙදෙන්නේ මූර්ධජ ණ කාරය යි.

  ඇරඹිණි        වැපිරුණි        පිරිහිණ
  කැඩිණ        සිතිණ        හැඳින්විණි

- අතීත කාල කෘදන්ත පදවල යෙදෙන්නේ මූර්ධජ ණ කාරය යි.

    තැවරුණු, ඇඹරුණු, නැගුණ, කැඩුණු
    වැටුණු, යෙදුණු, බැඳුණු

## ණ, න යෙදීම නිසා අර්ථ ප්‍රකාශනය

කරන - කෘදන්ත පදය
කරණ - කරණ කොට ගෙන

උරන - ඉරීම
උරණ - කේන්තිය

කන - කෘදන්ත පදය / සවන
කණ - ඇස් නොපෙනෙන

ගන - ඝන
ගණ - සමූහය

තන - පියයුරු
තණ - තණකොළ / තෘෂ්ණාව

දන - ධනය / දැවීම / ජනතාව
දණ - දණ(හිස)

දරන - දැරීම් අර්ථයේ වර්තමාන කෘදන්තය
දරණ - දඟරය (නාග දරණය)

දෙන - දීම් අර්ථයේ වර්තමාන කෘදන්ත පදය / ස්ත්‍රී වාචී පදය
දෙණ - පෙට්ටිය

නුවන - ඇස
නුවණ - ඥාණය

පහන - ප්‍රදීපය
පහණ - පාෂාණය

මරන - මැරීම් අර්ථයේ වර්තමාන කෘදන්තය
මරණ - (විශේෂණ පදය / නාම පදය)

වන - වනය / වර්තමාන කෘදන්තය
වණ - තුවාලය / වර්ණය

වෙන - වෙනත්
වෙණ - වීණාව

සරන - හැසිරෙන
සරණ - පිහිට

කිරන - කිරනවා
කිරණ - රශ්මිය

## 'ළ' භාවිතය

උච්චාරණ ස්වභාවය අනුව ල සහ ළ අක්ෂර දෙකෙහි එතරම් වෙනසක් දක්නට නැතත් ලේඛනයේදී එය යොදන ආකාරය පිළිබඳ ව පිළිගත් සම්මතයෝ වෙති. අන් අක්ෂරවල නොමැති විශේෂ ලක්ෂණයක් 'ළ' කාරයේ ඇත. එනම් ළ් කාරයට උ, ඌ ස්වර ආරූඪ වීමේ දී සම්පූර්ණ අක්ෂරයේ ම ස්වරූපය වෙනස් වන බැවිනි.

    ළ් + උ > ළු (කෙටි කොන් පාපිල්ල)
    ළ් + ඌ > ළූ (දීර්ඝ කොන් පාපිල්ල)

නමුත් මූර්ධජ ළ් කාරයට උ, ඌ ස්වර එක්වීමේ දී එය වෙනම ම අක්ෂර රූපයක් ලෙස ලියා දැක්වීම සම්මතය යි.

ළ් + උ > ළු
ළ් + ඌ > ළූ (කෙටි වක් පාපිල්ල)

ළු අක්ෂරයේ 'උ' කාරයක් ඇති බැවින් එම අක්ෂරය දීර්ඝ වීම සඳහා දීර්ඝ පිල්ලමක් අවශ්‍ය නොවේ. මන්ද යත් හ්‍රස්ව ස්වර දෙකක් එක් වීමෙන් දීර්ඝ ස්වරයක් යෙදෙන බැවිනි. එබැවින්,

- ස්වරයක් එක්වන විට අක්ෂරයේ රූපය මුළුමනින් ම වෙනස් වන අක්ෂරය ළ් කාරය යි.

- දීර්ඝ ස්වරයක් සංකේතවත් කිරීමට කෙටි පිල්ලමක් යෙදෙන එකම අක්ෂරය ද ළ් කාරය යි. (ළූ)

- මූර්ධජ ළ් කාරයට කිසිවිටෙක හල් ස්වරූපයෙන් වචනවල නොයෙදේ. එබැවින් යම් පදයක හල් වී යෙදෙන්නේ දන්තජ ල කාරය යි.

  කකුල්　　රුවල්
  පළල්　　කුරුල්ලා

- සිංහල අක්ෂරමාලාවට ළ කාරය ඇතුළත් වූයේ පාලි භාෂාවේ ආභාසයෙන් යැයි මතයක් පවතියි. සංස්කෘතයෙහි මූර්ධජ ළ කාරයක් නොමැත. එබැවින් පාලි භාෂාවෙන් නිපන් තත්භව පදවලදී පාලියේ යෙදුණු ට, ඩ, ඨ, ඪ, ණ අක්ෂර සිංහලයට පැමිණීමේදී එය මූර්ධජ ළ කාරය විය.

  උදා - භට → බළ (සෙබළා)
  දාඨා → දළ (දත්)
  කූඨ → කුළු (මුදුන)
  බිඩාල → බළල්
  වාණිජ → වෙළෙඳ

- ර කාරාන්ත ධාතු අතීත කෘදන්ත පද ලෙස ලිවීමේදී ධාතුවේ ර කාරය මූර්ධජ ළ කාරය බවට පත් වේ.

  කර → කළ
  මර → මළ
  මතුර → මතුළ
  විසුර → විසුළ
  හඳුර → හඳුළ
  වපුර → වපුළ
  වදුර → වදාළ

- හදවත, පපුව, සිත, හෘදය යන අර්ථ අඟවන පදවල යෙදෙන්නේ මූර්ධජ ළ කාරය යි.

  ළය　　ළගන්නා
  ළැම　　ළකල්
  ළපැත්ත

- බාල, නොමේරූ යන අර්ථය අඟවන පදවල යෙදෙන්නේ ළ කාරය යි.

  ළදරුවා　　ළා රතු
  ළපටි　　ළපලු
  ළහිරු

- ආසන්න, නුදුරු, සමීප යන අර්ථය අඟවන පදවල යෙදෙන්නේ මූර්ධජ ළ කාරය යි.

ළඟ — ළඟා වෙනවා
ළඟට

- ඇතැම් පදවල යෙදෙන මූර්ධජ ළ කාරය ව්‍යවහාරයෙන් දත යුතු ය.

කළය — තුළ
ළිහිණියා — ඇතුළ
ළැහැබ
යළි

- බොහෝ විට සඤ්ඤකාක්ෂරයකට පූර්වයෙන් යෙදෙන්නේ "ළ" කාරය යි.

ළිඳ — සළඹ
ළඟ — විළඳ
ළඳ — වෙළඹ
කොළඹ

## ල / ළ යෙදීම නිසා අර්ථ ප්‍රකාශනය

කල - කාලය
කළ - කරන ලද / කළ ගෙඩිය

අලු - ආලෝකය
අළු - භස්ම

පල - ගෙඩිය
පළ - ස්ථානය / ප්‍රකට

පතල - ආකරය (මැණික් පතල)
පතළ - පැතිරුණු / ප්‍රකට

කුල - කුලය
කුළ - පර්වතය / කන්ද / මුදුන

ඇල - පැත්ත
ඇළ - දිය පහර

කුලු - කුල්ල
කුළු - මුදුන

රල - රැල්ල
රළ - සමූහය

නල - සුළඟ
නළ - බටය

පැල - කුඩා නිවස
පැළ - පැළෑටි

මල - කුසුම
මළ - මැරුණු

බල - බලය
බළ - සෙබළා

පිලි - පිල්ලම්
පිළි - ඇඳුම් / එනම් උපසර්ගය

වල - කැළෑව
වළ - ආවාටය

මුලු - මුල්ල
මුළු - සම්පූර්ණ / සමූහය

දල - ජලය
දළ - දැඩි / දත් / ජටාව

කලු - කාන්ත
කළු - වර්ණය

## ශ, ෂ, ස අක්ෂර යෙදීම

- තාලුජ අක්ෂරයක් සමග සංයුක්ත වන්නේ තාලුජ ශ කාරය යි.

    දුශ්චරිත
    දුශ්ශීල
    දෘශ්‍යාබාධ

- මූර්ධජාක්ෂරයකට පෙර යෙදෙන්නේ මූර්ධජ ෂ කාරය යි.

    ශිෂ්ටාචාරය
    අෂ්ටාංග
    විෂ්ණු
    නෂ්ටාවශේෂ

- දන්තජාක්ෂරයකට පෙර යෙදෙන්නේ දන්තජ ස කාරය යි.

    ශාස්ත්‍රය
    ප්‍රස්තාව
    ස්තූප
    ලස්සන

## අල්පප්‍රාණ මහාප්‍රාණ භාවිතය

මෙය භාෂා ව්‍යවහාරයෙන් ම දත යුතු ය. බහුල ව භාවිත වන එවන් පද කීපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ත්‍යාග ප්‍රදානය | මර්දනය | සමස්ත |
| ප්‍රධාන දේශනය | වර්ධනය | පුස්තකාලය |
| සම්ප්‍රදය | වාර්තාව | සජ්ඣායනය |
| වීරෝදර | ප්‍රස්තාවනාව | කොට්ඨාසය |
| | ප්‍රතිඵල | කනිෂ්ඨ |
| | | ජ්‍යෙෂ්ඨ |

## අනුනාසික්‍යාක්ෂර භාවිතය

- යම් පදයක මැද අනුනාසික්‍යාක්ෂරයක් යෙදෙන්නේ නම් ඊට පසුව ඇති අකුර අයත් වර්ගයේ ම අනුනාසික අක්ෂරය එහි යෙදිය යුතු ය.

| | | |
|---|---|---|
| අනු | පන්තිය | තුණ්ඩිල |
| | බණ්ඩාර | පණ්ඩිත |
| | කණ්ඩායම | කන්ද |
| | මහින්ද | කොන්ද |

මෙහි දී ඞ සහ ඤ වෙනුවට වර්තමාන භාවිතයේ "ං" ද ආදේශ විය හැකි ය.

සඞ්ඝ - සංඝ
ලඞ්කා - ලංකා
ව්‍යඤ්ජන - ව්‍යංජන
වඤ්චාව - වංචාව

## ක්‍රියාකාරකම 1

**පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1. නූතන සිංහල අක්ෂර මාලාවේ ඇතිමුත් භාවිතයේ නැති අක්ෂර කීය ද? ඒ මොනවා ද?
2. භාවිතයේ ඇති අක්ෂර මාලාවේ නැති අක්ෂර රූප මොනවා ද?
   එම අක්ෂර රූප හෝඩියට ඇතුළත් නොවූයේ ඇයි?
3. "ස්වර" එනමින් හඳුන්වන්නේ ඇයි?
4. ස්වරාක්ෂර ඔබ දන්නා පරිදි ප්‍රභේද කොට දක්වන්න.
5. සඤ්ඤකාක්ෂර සෑදෙන ආකාරය පැහැදිලි කරන්න.
6. හෝඩියට අවසන්වරට එක් වූ අක්ෂරය කුමක් ද?

**පහත සඳහන් අක්ෂර කාණ්ඩ නම් කරන්න.**

1. ක ඛ ග ඝ ඞ ඟ - ..........................................................
2. ඛ ඡ ඨ ථ ඵ - ..........................................................
3. ඞ ඤ ණ න ම - ..........................................................
4. ය ර ල ව ළ - ..........................................................
5. (අ)ඃ ශ ෂ ස හ ෆ - ..........................................................
6. ඝ ඣ ඪ ධ භ - ..........................................................
7. ඍ ඎ ට ඨ ඩ ඪ ණ ර ළ ෂ - ..........................................................
8. එ ඒ ඓ ඔ ඕ ඖ - ..........................................................
9. ඟ ඦ ඬ ඳ ඹ - ..........................................................

## ❀ කෙටි සටහන් ලියන්න.

- අන්තඃස්ථාක්ෂර
- ඌෂ්මාක්ෂර
- අනුස්වාරය සහ විසර්ගය
- පාපිල්ල භාවිතය
- මූර්ධජාක්ෂර

## ❀ පහත සඳහන් පදවල යෙදී ඇති පිල්ලම් සහ සංකේත නම් කරන්න.

1. ගමනාගමනය
2. ජාතිකානුරාගය
3. බහුශ්‍රැත
4. නුසුදුසු
5. ඇඳුරාපොත
6. අවිනිශ්චිත
7. බෝධි
8. ද්‍රවාංකය
9. රුක්රෝපණය
10. සාමර්ථ්‍යය
11. මෛත්‍රී
12. අන්‍යෝන්‍ය
13. වික්‍රමාරච්චි
14. ඖෂධීය
15. කෞශල්‍යා
16. ඊප්සිතා
17. තරීන්ද්‍ර
18. ඓතිහාසික
19. සෞන්දර්යය
20. දේවාලේගම

## ❀ පහත දැක්වෙන අක්ෂර යෙදුණු වචන සොයා ලයිස්තු ගත කරන්න.

1. ඣ
2. ඟ
3. ශ
4. ඥ
5. ඨ
6. (අ)ඃ
7. (අ)ං
8. ළු
9. ළූ

## ❀ පහත සඳහන් පිල්ලම් සහ සංකේත නම් කරන්න. ඒවා යෙදී ඇති වචන සොයා ලියන්න.

1. ි ු
2. ෙ ෟ
3. ෙ ්
4. ෙ ු ැ
5. ්‍යා
6. ූ
7. ෙ ා
8. ෙ ්
9. ු
10. ෘ

## ❀ අක්ෂර වින්‍යාසය සදොස් නම් නිදොස් කර ලියන්න.

- කොට්ඨාශ
- කණිෂ්ට
- ශිශ්ටාචාරය
- නිස්ශබ්ද
- කරනවැමියා
- කලාපය
- පලාත
- සෞබාග්‍ය
- ලේඛම්
- දියනියෝ
- ප්‍රස්ථාවනාව
- ග්‍රන්තය
- පුස්ථකාලය
- ආස්වාෂ
- ප්‍රාෂ්වාශ
- පරිඝනකය
- ශීග්‍රගාමී
- ප්‍රදර්ෂනය
- ත්‍යාගප්‍රධාණෝත්සවය
- විරෝධාර සෙබලා

පහත සඳහන් පද යොදා අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය නිර්මාණය කරන්න.

i.

1. පතල
2. පතළ
3. සරණ
4. සරන
5. දරණ
6. දරන
7. කන
8. කණ
9. උරණ
10. උරන

ii.

1. නල
2. නළ
3. කුල
4. කුළ
5. අලු
6. අළු
7. කළු
8. කලු
9. මුළු
10. මුලු

## i|N|Is;

**"සීලෙන අනුපෙතස්ස සුතෙනත්‍ථො නවිජ්ජති"**

මනා චර්යාවෙන් තොර තැනැත්තාගේ උගත් කමින් පලක් නැත.

## i|Ñka; k

කමිසයේ පළමු බොත්තම වැරදුණොත් සෙසු සියලු බොත්තම් වැරැදියට පියවෙනු ඇත. ඔබේ ජීවිතයේ පළමු පියවර ගැන සැලකිලිමත් වන්න.

# 02

# පද විභාගය

භාෂණයේදී යෙදෙන කිසියම් අර්ථයක් දෙන ශබ්දය හෝ ශබ්ද සමූහය හෝ ලේඛනයේදී යෙදෙන අකුර හෝ අකුරු සමූහය හෝ පද ලෙස හැඳින්වේ. භාෂාවේ යෙදෙන එබඳු පද ලෙස නාම පද, ක්‍රියා පද, අව්‍යය පද, විශේෂණ පද ආදිය දැක්විය හැකි ය.

මෙම පාඩමේදී ඔබට නාම පද, ලිංග භේදය, සර්වනාම, විභක්ති ආදිය පිළිබඳ අර්ථ නිරූපණය, ප්‍රභේද හා වරනැඟීම් ඇතුළත් සවිස්තරාත්මක දැනුමක් ලද හැකි ය.

# පද විභාගය

අදහස් ප්‍රකාශ කිරීමේ ප්‍රධාන ක්‍රම දෙක වන්නේ,

1. භාෂණය හා
2. ලේඛනය යි.

භාෂණයේදී වැදගත් වන මූලික ඒකකය වන්නේ ශබ්ද යි. ලේඛනයේදී ශබ්ද සංකේත හෙවත් අකුරු මූලික ඒකකය වෙයි. සන්නිවේදන කාර්යයේ දී ශබ්ද හෙවත් අකුරු එකතු වී වචන ද වචන එකතු වී වාක්‍ය ද ගොඩනගා ගෙන අදහස් ප්‍රකාශ කිරීම සිදුවේ.

**වාක්‍ය නිර්මාණය**

| ශබ්ද/අකුරු > | වචන | වාක්‍ය |
|---|---|---|
| ප් + ඔ + ත් + අ | පොත | පොත බිම වැටෙයි |
| ම් + ඉ + න් + ඉ + ස් + ආ | මිනිසා | මිනිසා පොත කියවයි |

මේ අනුව වචන හෙවත් පද යනු කිසියම් ශබ්ද හෝ අකුරු හෝ සමූහයක් පිළිවෙළකට අර්ථවත් ව ගැළපීමෙන් සාදා ගනු ලබන භාෂා ඒකකයකි.

අවස්ථාවට උචිත පරිදි, නිරවුල් ව හා නිවැරැදි ව අදහස් ප්‍රකාශ කිරීමට නම් පුළුල් වාක්කෝෂයක් පුද්ගලයෙකු සතු විය යුතු ය. එය භාෂා වෛශාරද්‍යය නමින් හැඳින්වේ. ඊට පද සාධනය හා පද විභාගය පිළිබඳ දැනුම ද ඇතුළත් වේ නම් ඒ විශාරද බව වඩාත් අර්ථපූර්ණ වේ.

## පද

පද හෙවත් වචන (වදන්) යනු ඉහත සඳහන් කළ පරිදි පිළිවෙළකට ගැළපුණු ශබ්ද සංයුතියකින් යුත් අර්ථාන්විත ඒකකයකි. සිංහල භාෂාවේ එසේ සැකසුණු පද ප්‍රභේද තුනකි.

1. නාම පද
2. ක්‍රියා පද
3. අව්‍යය පද (නිපාත/උපසර්ග)

මේවා නැවත
1. වරනැගෙන පද හා
2. වර නොනැගෙන පද වශයෙන් වර්ග දෙකකට බෙදා දැක්විය හැක.

## වරනැගෙන පද

වරනැගෙන පද වශයෙන් නාමපද හා ක්‍රියා පද දැක්විය හැකි ය. මේ පද දෙවර්ගය ම තැනෙන්නේ ප්‍රකෘතිවලට ප්‍රත්‍යයන් එකතු වීමෙනි. නාම පදයක මූලික ස්වභාවය නාම ප්‍රකෘතිය නමින් හැඳින්වෙන අතර එහි ප්‍රකෘති අර්ථය ලිංගාර්ථය ලෙස දැක්වේ. නාම ප්‍රකෘතියකට ප්‍රත්‍ය එකතු වීමෙන් නාම පද තැනෙන අතර එම නාම පද විවිධාර්ථවත් වන්නේ විභක්ති, ලිංග, වචන, පුරුෂ භේද අනුව වරනැගෙන නිසා ය.

| නාම ප්‍රකෘතිය | ප්‍රත්‍යය | නාමපදය |
|---|---|---|
| දරු | ආ | දරුවා |
| දූරි | අ | දූරිය |
| දරු | ඕ | දරුවෝ |
| දූරි | ඕ | දූරියෝ |

ක්‍රියා පදයක මූලික ස්වභාවය ධාතු ප්‍රකෘතිය නමින් හැඳින්වෙන අතර එහි ප්‍රකෘති අර්ථය ධාත්වර්ථය ලෙස දැක්වේ. ධාතු ප්‍රකෘතියකට ප්‍රත්‍යයන් එකතු වීමෙන් ක්‍රියා පද තැනේ. ක්‍රියා පද විවිධාර්ථවත් වන්නේ කාල, පුරුෂ, වචන හා කාරක භේද අනුව වරනැගෙන නිසා ය.

| ධාතු ප්‍රකෘතිය | ප්‍රත්‍යය | ක්‍රියාපදය |
|---|---|---|
| බල | ඉ | බලයි |
| බල | ති | බලති |
| බල | එයි | බැලෙයි |
| බල | එති | බැලෙති |
| බල | ඊ | බැලී |
| බල | ඌ | බැලූ |

## වරනොනැගෙන පද

වරනොනැගෙන පද ලෙස නිපාත හා උපසර්ග දැක්විය හැකි ය. ප්‍රකෘති ස්වභාවය හෝ ප්‍රත්‍ය ස්වභාවය හෝ නොගන්නා නිසා නිපාත හා උපසර්ග වරනොනැගේ. නිපාත පූර්ණ අර්ථ සහිත ස්වාධීන පද විශේෂයකි. එහෙත් නාම පදවලට හා ක්‍රියා පදවලට මුලින් යෙදී ඒවායේ අර්ථයන්ට බලපෑමක් කරන උපසර්ග යනු පද විශේෂයක් නොවෙතැ යි ඇතැම් ව්‍යාකරණඥයෝ දක්වති. (මේ පිළිබඳ වැඩි විස්තර ඉදිරියේදී ඔබට ලැබෙනු ඇත.)

## ක්‍රියාකාරකම 1

✿ පහත සඳහන් ස්වර හා ව්‍යඤ්ජන රූපවලින් නිර්මාණය වන පද අදාළ කොටු තුළ ලියන්න.

1. බ් + ඉ + න් + අ + ර් + අ + ම් + අ + ල් + ඊ
2. ප් + ආ + ර් + අ + ද් + ඍ + ශ් + ය් + අ
3. ව් + ඓ + ද් + ය් + ඕ + ප් + අ + ද් + ඒ + ශ් + අ
4. ශ් + ර් + ආ + ව් + අ + ස් + ත් + ඉ
5. ම් + ඖ + ල් + ඉ + ම් + අ + ං + ග් + අ + ල් + ය් + අ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |
| 5 | | | | | | | |

## ක්‍රියාකාරකම 2

✿ පහත දැක්වෙන පද සෑදී ඇති ව්‍යඤ්ජන රූපවලට ඇතුළත් ස්වර රූප අදාළ කොටු තුළ ලියන්න.

1. නෛපුණ්‍ය
2. පෞරාණික
3. ප්‍රත්‍යුත්තර
4. ත්‍රෛනිකායික
5. ප්‍රවෘත්ති

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| න් | | ප් | | ණ් | ය් | | | | | |
| ප් | | ර් | | ණ් | | ක් | | | | |
| ප් | ර් | | ත් | ය් | | ත් | ත් | | ර් | |
| ත් | ර් | | න් | | ක් | | ය් | | ක් | |
| ප් | ර් | | ව් | | ත් | ත් | | | | |

## ක්‍රියාකාරකම 3

- පහත දක්වෙන වරනැගෙන පදවල ඇතුළත් වරනැගීම ප්‍රභේද දක්වමින් වගු සම්පූර්ණ කරන්න.

| | පුරුෂය | වචනය | ලිංගය | විභක්තිය |
|---|---|---|---|---|
| උදා: අඟනෝ | ප්‍රථම පුරුෂ | බහු වචන | ස්ත්‍රී ලිංග | ප්‍රථමා විභක්තිය |
| 1. තරුණියාට | | | | |
| 2. නගරයෙහි | | | | |
| 3. අපගේ | | | - | |
| 4. නුඹගෙන් | | | - | |
| 5. ප්‍රතිඵලය | | | | |

| | පුරුෂය | වචනය | කාලය | කාරකය |
|---|---|---|---|---|
| උදා: දක්නා ලදහු | මධ්‍යම පුරුෂ | බහු වචන | අතීත | කර්ම කාරක |
| වපුරති | | | | |
| දවයි | | | | |
| කැඳවිණිමු | | | - | |
| ලියන ලදි | | | - | |
| ලබහි | | | | |

## නාම පද

සිංහල භාෂා දිනය යෙදෙන මාර්තු දෙවෙනි ද එනම් අද දින අපට ඉතා සුවිශේෂ දිනයක්. අප පිරිවෙනේ සිංහල භාෂා හා සාහිත්‍ය සංගමය මගින් ඒ නිමිත්තෙන් සංවිධානය කරන ලද ශාස්ත්‍රීය දේශනය සඳහා අපගේ ගෞරවාන්විත ආරාධනය ලැබ මෙහි පැමිණ සිටින දිස්ත්‍රික් පිරිවෙන් ගුරු උපදේශක මහානාම දිසාසේකර මහතා එහි සභාපති වශයෙන් මා ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. දැන් මා ඒ මහතාට ආරාධනා කර සිටිනවා එතුමාගේ දේශනය ඔබ හමුවේ ඉදිරිපත් කරන ලෙස.

අද මාගේ දේශනයේ මාතෘකාව වන්නේ "නාම පද" යන්න යි. අප දන්නවා නාම- පද කියන්නේ කිසියම් පුද්ගලයෙකු සත්ත්වයෙකු, කිසියම් ද්‍රව්‍යයක්, හැඟීමක්, සංකල්පයක් හෝ ස්ථානයක් ප්‍රකාශ කරන පද කියල, කොටින් ම අචේතනික හෝ සචේතනික හෝ සියල්ල හැඳින්වීමට නාම පද යැයි කියන්න පුළුවන්.

මෙහිදී අප හඳුනාගත යුතු යි නාම හා නාම පද කියන්නෙ දෙවර්ගයක් බව, මුලින් ම නාම ගැන කතා කළොත් ඕනෑ ම නාම පදයක් හැදීමට මුල් වන්නේ නාම යි. ඒවාට නාම ප්‍රකෘති, ශබ්ද ප්‍රකෘති කියලත් කියනවා. විවිධ අතට නැමෙන බැවින් නාම ලෙස හඳුන්වනවා. නාම, අර්ථ වශයෙන් විවිධ අතට නැමෙන්නේ විභක්ති ප්‍රත්‍යයන් එකතු වීමෙනු යි. එසේ විභක්ති ප්‍රත්‍යයන් එකතු වීමෙන් සැදෙන පද තමයි නාම පද කියන්නේ. ලේඛනයේ දී හෝ භාෂණයේ දී අපට උපකාරී වෙන්නෙ නාම පදනෙ. ඒ නිසා නාම ප්‍රකෘති පිළිබඳ අප එතරම් සැලකිලිමත් වෙන්නේ නැහැ.

අපි දැන් බලමු නාම පදයක් ගත්තහම ඒකෙ ශබ්ද ප්‍රකෘතිය හොයා ගන්නෙ කොහොමද කියල. කිසියම් නාම පදයක් විභක්ති සමාසයේ යෙදීමෙන් එහෙම නැත්නම් වෙනත් ආකාරයකින් කියතොත් කිසියම් නාමපදයක් විශේෂණ පදයක් ලෙස ඊට ගැළපෙන විශේෂ්‍ය පදයක් සමග එකතු කිරීමෙන් ශබ්ද ප්‍රකෘතිය පහසුවෙන් වෙන් කර ගත හැකි යි. මේ උදාහරණ දෙස බලන්න.

| **නාම පදය** | **විභක්ති සමාසය** | **ශබ්ද ප්‍රකෘතිය** |
|---|---|---|
| උදුල්ල | උදුලු මිට | උදුලු |
| තරුණයා | තරුණ පරපුර | තරුණ |
| කරුණාව | කරුණා නිධාන | කරුණා |

මෙසේ හඳුනාගත් නාමවලට තමයි අප විභක්ති ප්‍රත්‍යයන් එකතු කරල විවිධාර්ථ-වත් නාම පද තනාගන්නෙ.

| **ශබ්ද ප්‍රකෘතිය** | **විභක්ති ප්‍රත්‍යය** | **නාම පදය** |
|---|---|---|
| උදුලු | අ | උදැල්ල |
| උදුලු | එන් | උදුල්ලෙන් |
| උදුලු | අට | උදුල්ලට |
| තරුණ | ආ | තරුණයා |
| තරුණ | අන් | තරුණයන් |
| තරුණ | ආට | තරුණයාට |

මේ විදියට නාම පද විවිධාර්ථ ගන්නා ආකාර හතරක් අපට හඳුනාගත හැකි යි. නාම පද

1. විභක්ති භේදයෙන් යුක්ත වීම
2. ලිංග භේදයෙන් යුක්ත වීම
3. වචන භේදයෙන් යුක්ත වීම හා
4. පුරුෂ භේදයෙන් යුක්ත වීම යි

විභක්ති නව (9) ආකාරයකටත් ඒක වචන හා බහු වචන වශයෙන් දහ අට (18) ආකාරයකටත් ප්‍රභේද වෙනවා. නාම පදවල ලිංග භේදයක් ද දක්නට ලැබෙනවා. ඒ අනුව ලිංග හතර (4)කට නාම පද වෙන් කරන්න පුළුවන්.

1. පුරුෂ ලිංග නාම - මිනිස්, පුත්, පිය, ඇත්
2. ස්ත්‍රී ලිංග නාම - ගැහැනු, දූ, මව්, ඇතිනි
3. නපුංසක ලිංග නාම - ගස්, ගල්, කඳු, පොත්

4. සාධාරණ ලිංග හෙවත් අලිංගික නාම - ළමා, ද්‍රෝහි, ඥාති, කම්කරු, ආගන්තුක, සත්, අසල්වැසි

වචන භේදය අනුව ඒක වචන හා බහු වචන වශයෙන් නාම පද වරනැගෙන අයුරු ඔබට පැහැදිලි ඇති. පුරුෂභේදය අනුව ද නාම පද වර්ග තුනකට බෙදෙනවා.

ප්‍රථම පුරුෂ හෙවත් අන්‍යකාරක නාම - ඔහු, ඇ, ඔවුහු
මධ්‍යම පුරුෂ හෙවත් ත ශබ්දකාරක නාම - තෝ, තී, තෙපි, තොපි
උත්තම පුරුෂ හෙවත් ම ශබ්දකාරක නාම - මම, අපි

මේ ආකාරයේ ප්‍රධාන ප්‍රභේද හැරුණු විට නාම පදවල තවත් වර්ගීකරණ තියෙනවා. එකක් තමයි

## ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද

ප්‍රාණවාචී නාම පද ලෙස සියලු පණ ඇති සත්ත්ව හා පුද්ගල ශබ්ද ද අප්‍රාණවාචී නාම පද ලෙස පණ නැති සියලු ද්‍රව්‍යමය දේවල් හා සංකල්ප ආදිය ද අයත් වෙනවා. මේවා සචේතනික හා අචේතනික නාම පද ලෙස ද හඳුන්වනවා. තවත් ප්‍රභේදයක් තමයි

## මූල නාම හා සංග්‍රහ නාම

මේ වර්ග දෙකින් මූල නාම සිද්ධ නාම, ලෙසත් හැඳින්වෙනවා. ශබ්ද ප්‍රකෘතියට විභක්ති ප්‍රත්‍යයන් එකතු වී සෑදෙන මූලික නාම පද ඊට අයත් වෙනවා. උදාහරණ විදියට

| ශබ්ද ප්‍රකෘතිය | විභක්ති ප්‍රත්‍යය | මූලනාම පදය |
|---|---|---|
| ගම් | අ | ගම |
| පිය | ආ | පියා |
| බුද්ධි | අ | බුද්ධිය |
| චන්ද්‍ර | ආ | චන්ද්‍රයා |

මේවා විභක්ති ප්‍රත්‍යයන් පමණක් එකතුවීමෙන් සෑදෙන නාම පද යි. සිද්ධ නාම පද හෙවත් මූල නාම පද ලෙස හඳුන්වන්නේ ඒ නිසා ය.

සංග්‍රහ නාම කියන්නෙ නාම ප්‍රකෘතියටත් විභක්ති ප්‍රත්‍යයටත් අතර වෙනත් ප්‍රත්‍යයන් යෙදී සෑදෙන නාම යි. විශේෂයෙන් තද්ධිත ප්‍රත්‍යයන් යෙදී මෙසේ සංග්‍රහ නාම සකස් වෙනවා. බලන්න මේ නිදසුන් දෙස,

| ශබ්ද ප්‍රකෘතිය | තද්ධිත ප්‍රත්‍යය | සාධ්‍ය නාමය | විභක්ති ප්‍රත්‍යය | සාධ්‍ය නාමපදය |
|---|---|---|---|---|
| ගම් | ඉ | ගැමි | ආ | ගැමියා |
| පිය | ආණ | පියාණ | ඕ | පියාණෝ |
| බුද්ධි | මත් | බුද්ධිමත් | ආ | බුද්ධිමතා |
| චන්ද්‍ර | ඉකා | චන්ද්‍රිකා | අ | චන්ද්‍රිකාව |

## භින්න නාම හා අභින්න නාම

මේ නාම පද පිළිබඳ තවත් ප්‍රභේදයක්, භින්න නාම කියන්නෙ අචේතනික හා සචේතනික නාම එක එකක් සඳහා වෙන් වූ අර්ථ ඇති නාම යි. ප්‍රථම පුරුෂයට ඇතුළත් සර්ව නාම නොවන නාමත් නාම නාම වර්ගයට ඇතුළත් නාමත් සමාස, තද්ධිත, කෘදන්ත යන සියලු නාමත් භින්න නාම ලෙස හැඳින්වෙනවා. අභින්න නාම කියන්නෙ පුරුෂත්‍රයේ යෙදෙන සර්වනාමත් උස්, මිටි, තරුණ, මහලු, සුදු, රතු ආදි විශේෂණ නාමත් කියන දෙවර්ගය යි.

සිංහල භාෂාවේ තියෙන සියලු ම නාම නැවත මේ විදියට වර්ග පහ (5)කට බෙදා දක්වන්න පුළුවන්.


1. නාම නාම
2. සර්ව නාම
3. සමාස නාම
4. තද්ධිත නාම
5. කෘදන්ත නාම

මේවායින් අපේ මාතෘකාවට අදාළ වූ නාම නාම ගැන පමණක් මා මෙහිදී ඔබට හඳුන්වා දෙන්න බලාපොරොත්තු වෙනවා. නාම නාමත් නැවත වර්ග පහකට බෙදා දැක්විය හැකි ය.

1. ජාති නාම
2. ද්‍රව්‍ය නාම
3. ගුණ නාම
4. ක්‍රියා නාම
5. සංඥා නාම

මේවා පිළිබඳ මීට ඉහත ශ්‍රේණිවලදී ඔබ අධ්‍යයනය කරන්න ඇතැ යි සිතනවා.


මා මෙතෙක් වේලා විස්තර කළ කරුණු අනුව නාම පද යන්න හා එහි ප්‍රභේද පිළිබඳ හොඳ වැටහීමක් ඔබට ලැබෙන්න ඇති කියල හිතනවා. මගේ දේශනයට සවන් දුන් ඔබ සියලු දෙනාට ම එම වර්ගීකරණයන් පහසුවෙන් තේරුම් ගන්න පුළුවන් රූප සටහනක් මා දැන් ඉදිරිපත් කරනවා.





මගේ දේශනය සම්බන්ධයෙන් කිසියම් ගැටලු සහගත දෙයක් තියෙනවා නම් ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමට දුන් මා අවස්ථාව ලබා දෙනවා. දේශනයට සවන් දුන් සියලු දෙනාට ම තෙරුවන් සරණ යි.

## ක්‍රියාකාරකම 4

❀ පහත සඳහන් රූප සටහනේ දැක්වෙන නාම වර්ග සඳහා නිදසුන් නාම 1 බැගින් එල්ලෙන ඵලකයේ ලියන්න.



## ක්‍රියාකාරකම 5

i. දේශකයාගෙන් ඇසීම සඳහා දේශනයට අදාළ මාතෘකාව ඇසුරින් ප්‍රශ්න පහක් ගොඩනගන්න.

ii. ඒ ප්‍රශ්න සඳහා ලැබෙතැ යි අපේක්ෂා කළ හැකි පිළිතුරු ලියන්න.

## ක්‍රියාකාරකම 6

✿ **පහත දක්වා ඇති නාම පද විශේෂණ වන සේ ගැළපෙන විශේෂ්‍ය පද සමග එක් කොට ඒවායේ නාම ප්‍රකෘති ලියන්න.**

| | නාමපදය | විශේෂණ විශේෂ්‍ය පද | නාම ප්‍රකෘතිය |
|---|---|---|---|
| උදා: | සිංහයා | සිංහ පෝතකයා | සිංහ |
| | පහනින් | | |
| | දවස | | |
| | කිරෙන් | | |
| | කැටපතෙහි | | |
| | කාන්තාවෝ | | |
| | බැංකුව | | |
| | ගොවියෝ | | |
| | ශිෂ්‍යයින් | | |
| | දෙවියන්ට | | |
| | පොත් | | |

## ක්‍රියාකාරකම 7

❁ දී ඇති නාම ප්‍රකෘතිවලට ඔබ කැමැති විභක්ති ප්‍රත්‍යයන් යොදා නාම පද සාදන්න.

| | ශබ්ද ප්‍රකෘතිය | විභක්ති ප්‍රත්‍යය | නාමපදය |
|---|---|---|---|
| උදා: | අක්ෂර | එන් | අක්ෂරයෙන් |
| | අශ්ව | | |
| | ලේඛිකා | | |
| | ලිපිකරු | | |
| | සෙබළ | | |
| | මිතුරු | | |
| | භික්ෂු | | |
| | අඟන | | |
| | පුටු | | |
| | සිවුරු | | |
| | ගිරා | | |
| | බුලත් | | |

## ක්‍රියාකාරකම 8

ගසට කෙටුම ගස මුල පැයුමෙන් දූනේ
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දූනේ
අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දූනේ
හානා හීය පානා අඬහැරෙන් දූනේ

1. ඉහත කවියේ දක්වෙන නාම පද උපුටා දක්වන්න.
2. ඒවායේ ශබ්ද ප්‍රකෘති සොයා ස්වරාන්ත, හලන්ත වශයෙන් වෙන් කරන්න.
3. ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා නාමවලට උදාහරණය බැගින් කවියෙන් උපුටා දක්වන්න.

## ලිංග භේදය

"සකුසත් අනුසරෙන් - ඇත ද සදනට ලිඟු බෙ
නොපැනේ වහර වෙසෙසෙක් - පුම ඉතිරි ලිඟු දෙක විනා"

යනුවෙන් සිදත් සඟරාවෙහි, සංස්කෘත භාෂාවට අනුව ශබ්දවලට ලිංග භේදය ඇතත් පුරුෂ ලිංග හා ස්ත්‍රී ලිංග දෙක හැර වෙනත් ව්‍යවහාරයේ විශේෂයක් විද්‍යමාන නොවේ යැ යි දැක්වෙතත් භාවිත සිංහලයෙහි ප්‍රධාන ලිංග තුනක් පැහැදිලිව ම දක්නට ලැබේ.

1. පුරුෂ ලිංග
2. ස්ත්‍රී ලිංග
3. නපුංසක ලිංග

ඒ හැර විශේෂ ලිංගාර්ථයක් නොයෙදෙන ඉහත කී ලිඟු තුනට ම හෝ ස්ත්‍රී ලිංග, පුරුෂ ලිංග දෙකට ම හෝ පොදු නාම පද ද තිබේ. ඒවා අලිංගික හෙවත් සාධාරණ ලිංග ලෙස හැඳින්විය හැකි යි. ඒ අනුව සිංහල භාෂාවේ ලිංග හතරක් (4) හඳුනා ගත හැකි යි.

1. පුරුෂ ලිංග - සචේතනික පුරුෂවාචී නාම පද
   උදා - මිනිසා, කොලුවා, ඇතා, කුරුල්ලා
2. ස්ත්‍රී ලිංග - සචේතනික ස්ත්‍රීවාචී නාම පද
   උදා - ගැහැනිය, කෙල්ල, ඇතින්න, කිරිල්ලී
3. නපුංසක ලිංග - සියලු අචේතනික නාම පද
   උදා - ගස, කන්ද, පොත, පෑන, මේසය
4. සාධාරණ ලිංග - i. විශේෂණ පද
   උදා - උස්, මිටි, රතු, සුදු, වියළි, සුමුදු

   ii. ලිංග දෙකට ම පොදු නාම පද
   උදා - ළමයා, ඥාතියා, රෝගියා, ලෙඩා, කලත්‍රයා, පුද්ගලයා, සතා, ප්‍රාණියා, මගියා, පක්ෂියා

   iii. සර්ව නාම පද
   උදා - නුඹ, ඔබ, තෙපි, ඔවුහු, මම, අපි

## ලිංග භේදයේ විශේෂතා

i. මේ හැර ස්ත්‍රී ලිංගයට හෝ පුරුෂ ලිංගයට හෝ අනන්‍ය වූ නාම පද විශේෂයක් ද ව්‍යවහාරයෙහි පවතී. ඒවා ඒක ලිංගික වන අතර ඇතැම් පද ස්ත්‍රීවාචී හෝ පුරුෂවාචී හෝ පදයක් එකතු කොට ස්ත්‍රී ලිංග හෝ පුරුෂ ලිංග හෝ බවට පත් කර ගත හැකි වුවත් ඇතැම් පද එසේ වෙනස් කර ගත නොහැකි ය.

## පුරුෂ ලිංගාර්ථයට ම අනන්‍ය වූ නාම පද

බුදුරජ, හාමුදුරුවෝ, බෝධිසත්ත්වයෝ, කරනවැමියා, කම්කරුවා, ආගන්තුකයා, වඩුවා, පණ්ඩිතයා, භටයා, සර්පයා, පණුවා, අනංගයා, පුරෝහිතයා, බ්‍රහ්මයා, අරක්කැමියා, ද්‍රෝහියා, සත්පුරුෂයා, අන්ධයා, මදුරුවා, වේයා, නියමුවා, නාවිකයා

## ස්ත්‍රී ලිංගාර්ථයට ම අනන්‍ය වූ නාම පද

මාගම, වෛශ්‍යාව, ගණිකාව, වැන්දඹුව, වින්නඹුව, බවලතා, වනිතාව, කන්‍යාව. සිරිකත

ii. ඇතැම් නපුංසක ලිංග නාම පද අචේතනික වුවත් සචේතනික පද සේ ව්‍යවහාර කෙරේ. එහෙත් ඒවා අචේතනික නාම සේ සලකා වාක්‍ය නිර්මාණයේදී උක්තාඛ්‍යාත රීති අනුගමනය කෙරේ.

චන්ද්‍රයා, ග්‍රහයා, සූර්යයා, පඹයා, බෝනික්කා, බට්ටා, ගිනිකඳයා, ඉබ්බා (අගුල), කාලයා (කාලයාගේ ඇවෑමෙන්), ධර්මයා (ස්වභාවධර්මයා), පාත්‍රවර්ගයා (චරිත), හේමලයා, ඉපියා

iii. ඇතැම් නපුංසක ලිංග (අචේතනික) නාම පද සඳහා වහන්සේ, තෙමේ, තොමෝ, තුමූ වැනි නාම පද හෝ 'ඕ' 'හු' වැනි විභක්ති ප්‍රත්‍යයන් හෝ යොදා ස්ත්‍රී ලිංග හෝ පුරුෂ ලිංග හෝ නාම පද සේ භාවිත කෙරේ. එවිට ඒවා පුරුෂ ලිංග හෝ ස්ත්‍රී ලිංග හෝ සචේතනික නාම පද සේ සලකා උක්තාඛ්‍යාත රීතිවලට අනුගත කෙරේ.

පිරුවානා පොත් වහන්සේ, බෝධීන් වහන්සේ, සභා තොමෝ, නදීහු තුමූ, මේසය තෙමේ, වෘක්ෂයෝ, රීතීහු, බෙරහු

## ස්ත්‍රී ලිංග පද සාධනය

සිංහල භාෂාවේ ලිංගභේදය යන මාතෘකාව යටතේ විශේෂයෙන් හැදෑරිය යුත්තේ ස්ත්‍රී ලිංග පද සාධනය පිළිබඳව ය. පද සිද්ධ ක්‍රමය අනුව ස්ත්‍රී ලිංග නාම වර්ග දෙකකි.

1. සිද්ධ නාම
2. සාධ්‍ය නාම

### 1. සිද්ධ නාම

මේවා ප්‍රකෘති නාම හෙවත් මූල නාම ලෙස ද හැඳින්වේ. පුරුෂ ලිංග නාම ප්‍රකෘතියට කිසිදු සම්බන්ධයක් නැති වෙන ම නාම විශේෂයක් ලෙස සිද්ධ නාම දැක්විය හැක.

| **පුරුෂ ලිංග නාම** | **ස්ත්‍රී ලිංග නාම** |
| --- | --- |
| මිනිස් | ගැහැනු |
| පිය | මව් |
| මාමා (මයිල්) | නැන්දා (නැඳි) |
| තාත්තා | අම්මා |
| පුත් | දූ |
| මල්ලී | නංගී |
| බෑණා | ලේලි |
| සැමි | අඹු |
| පුරුෂ | ස්ත්‍රී |
| සීයා | ආච්චි |
| මස්සිනා | නෑනා |
| අයියා | අක්කා |
| මොනර | සෙබඩ |
| අශ්ව | වෙළඹ |
| බාප්පා | පුංචි අම්මා |
| රාලහාමි | ළමා එතනී/ ළමා තැනී |

## 2. සාධ්‍ය නාම

එනම් පුරුෂ ලිංගාර්ථ ශබ්ද ප්‍රකෘති ඇසුරින් සාදා ගනු ලබන නාම යි. එසේ සාදා ගනු ලබන ක්‍රම හතරකි.

1. ස්වර විපර්යාසය
2. ස්ත්‍රී ලිංගාර්ථ ප්‍රත්‍ය යෝගය
3. ප්‍රකෘතියට පරව ස්ත්‍රීවාචී පදයක් යෙදීම
4. අලිංගික ශබ්දවලට පූර්වයෙන් ස්ත්‍රීවාචී පදයක් යෙදීම

### 1. ස්වර විපර්යාසය (අනමාකරණය)

පුරුෂවාචී ප්‍රකෘතියේ ඇති ස්වර විවිධාකාරයෙන් වෙනස් වීමට භාජනය වී ස්ත්‍රී ලිංග නාම සෑදේ. ඒවා මීට ඉහත දක්වන ලද ස්ත්‍රීවාචී සිද්ධ නාම මෙන් නොව සාධ්‍ය නාම ය. එනම් තද්ධිත නාම ය. ස්වර විපර්යාසය සිදු වන ක්‍රම :

| | |
|---|---|
| සොර | සෙර |
| මොනර | මෙනෙර |
| මහණ | මෙහෙණ |
| මනවු | මෙනෙවි |
| බලු | බැලි |
| වඳුරු | වැඳිරි |
| බමුණු | බැමිණි |
| නාම්බා | නෑම්බි |
| උකුණු | ඉකිණි |
| උකුසු | ඉකිසි |
| කොවුලු | කෙවිලි |
| ගොපලු | ගෙපලි |

### 2. ස්ත්‍රී ප්‍රත්‍ය යෝගය

පුරුෂ ලිංග නාම ප්‍රකෘතියට ඉ, ඊ, ඉනි, නි, ආ, ඉකා ඉච්චි, ඉස්සි, ඉක්කි ප්‍රත්‍යයන් යෙදේ.

'ඉ' ස්වරය (පූර්වස්වර ලෝප විධියෙන්)

| | | | | |
|---|---|---|---|---|
| කුමර | + | ඉ | = | කුමරි |
| තරුණ | + | ඉ | = | තරුණි |

(ව් ආගම සන්ධි විධියෙන්)

| | | | | |
|---|---|---|---|---|
| සිත්තර | + | ඉ | = | සිත්තරාවි |
| ගොළු | + | ඉ | = | ගොළුවි |

(ද්විත්වරූප විධියෙන්)

| | | | | |
|---|---|---|---|---|
| මැසි | + | ඉ | = | මැස්සි |
| වැදි | + | ඉ | = | වැද්දි |

‘ඊ’ ප්‍රත්‍යය (පූර්ව ස්වර ලෝපයෙන්)

මිතුරු + ඊ = මිතුරී
කුමර + ඊ = කුමරී

‘ඉනි’ ප්‍රත්‍යය (ස්වරාරෝහණයෙන්)

වලස් + ඉනි = වැලසිනි / වැලහිනි
යක් + ඉනි = යකිනි

‘නි’ ප්‍රත්‍යය

පති + නි = පතිනි
ඇමති + නි = ඇමතිනි

‘ආ’ ප්‍රත්‍යය (පූර්ව ස්වර ලෝපයෙන්)

කෝකිල + ආ = කෝකිලා
රසික + ආ = රසිකා

‘ඉකා’ ප්‍රත්‍යය (පූර්ව ස්වර ලෝපයෙන්)

රස + ඉකා = රසිකා
මානව + ඉකා = මානවිකා

‘ඉච්චි’ ප්‍රත්‍යය (පූර්ව ස්වර ලෝපයෙන්)

එළු + ඉච්චි = එළිච්චි
නාකි + ඉච්චි = නාකිච්චි

‘ඉස්සි’ ප්‍රත්‍යය (පූර්ව ස්වර ලෝපයෙන්)

ළමා + ඉස්සි = ළමිස්සි
ගැට + ඉස්සි = ගැටිස්සි

‘ඉක්කි’ ප්‍රත්‍යය

පැටි + ඉක්කි = පැටික්කි
චූටි + ඉක්කි = චූටික්කි

**3. පුරුෂ වාචී ප්‍රකෘතියකට පරව ස්ත්‍රීවාචී පදයක් යෙදීම.**

එහිදී යෙදෙන උපකාරක පද ලෙස ධේනුව, දෙන, ලිය, දුව, දූ, අඟන, දේවි, ඇත්ති ආදිය යෙදේ.

සිංහ + ධේනුව = සිංහධේනුව
කොටි + දෙන = කොටිදෙන
දෙව් + ලිය = දෙව්ලිය
සිටු + දුව = සිටුදුව
දෙව් + දූ = දෙව්දූ
මර + අඟන = මරඟන
සිටු + දේවි = සිටුදේවි
මුව + ඇත්තී = මුවැත්තී

**4. අලිංගික (සාධාරණ ලිංග) ශබ්දවලට පූර්වයෙන් ස්ත්‍රීවාචී පදයක් යෙදීම**

ගැහැනු ළමයි
කාන්තා රෝගීන්
කෙලි පැටියා

මෙතෙක් විස්තර කරන ලද්දේ නාම ප්‍රකෘතිවලට ප්‍රත්‍යයන් යෙදී සෑදෙන ස්ත්‍රී ලිංග පදයන් ය.

## ක්‍රියාකාරකම 9

**“අ” වෘත්තයේ ඇති නාම ප්‍රකෘති, “ආ” වෘත්තයේ ඇති ගැළපෙන ප්‍රත්‍යයන් හා එක්කොට ස්ත්‍රී ලිංග නාම තනන්න.**

“අ”
නපුරු
මැකි, තෙමනු, බකුසු,
මවනු, මන්ත්‍රී, දක්ෂ
ආර්ය, යක්ෂ, පුරපති,
නාඹු, කටුසු, ආචාර
සප්, විලාස, ප්‍රිය,
බාල

“ආ”
ඉනි, ආ, ඉනි
ඉකා, ඉ, ඉ
නි, ඉනි, නි
ආ, ඊ, ඉනි, ඉකා
ඉ, ඊ, ඉ, ඉ

1. ..........................................
2. ..........................................
3. ..........................................
4. ..........................................
5. ..........................................
6. ..........................................
7. ..........................................
8. ..........................................
9. ..........................................
10. ..........................................
11. ..........................................
12. ..........................................
13. ..........................................
14. ..........................................
15. ..........................................
16. ..........................................
17. ..........................................

## ක්‍රියාකාරකම 10

* පහත සඳහන් පුරුෂ ලිංග නාමපද සඳහා ස්ත්‍රී ලිංග නාම පද ලියන්න.

| පුරුෂ ලිංග නාම පද | ස්ත්‍රී ලිංග නාම පද |
|---|---|
| 1. තෙරණුවෝ | 1. ........................................ |
| 2. සංගීතවේදියා | 2. ........................................ |
| 3. එකෙක් | 3. ........................................ |
| 4. කරන්නා | 4. ........................................ |
| 5. භික්ෂුව | 5. ........................................ |
| 6. මස්සිනා | 6. ........................................ |
| 7. බෑනා | 7. ........................................ |
| 8. සභාපති | 8. ........................................ |
| 9. ශ්‍රාවකයා | 9. ........................................ |
| 10. රාක්ෂසයා | 10. ........................................ |
| 11. වහලා | 11. ........................................ |
| 12. අශ්වයා | 12. ........................................ |
| 13. ගොවියා | 13. ........................................ |
| 14. මහණ | 14. ........................................ |
| 15. ස්වාමියා | 15. ........................................ |

## සර්ව නාම

සියල්ලන්ට ම හෝ සියල්ලට ම හෝ පොදුවේ යෙදිය හැකි නාම සර්ව නාම ලෙසින් හැඳින්වේ. නාම පදයක් වෙනුවට යෙදිය හැකි නාම ලෙසින් ද සර්ව නාම හඳුන්වනු ලැබේ. සියලු සර්ව නාම වර්ග තුනකට බෙදේ.

1. ප්‍රථම පුරුෂ හෙවත් අන්‍යාකාරක සර්ව නාම
   හේ, ඔහු, ඈ, ඕ, ඔවුහු, එය, ඒවා, උන් වහන්සේ
2. මධ්‍යම පුරුෂ හෙවත් ත ශබ්දකාරක සර්ව නාම
   තෝ, තී, තෙපි, තොපි, ඔබ, නුඹ, නුඹලා, තමුන්නාන්සේ, ඔබ වහන්සේ
3. උත්තම පුරුෂ හෙවත් ම ශබ්දකාරක සර්ව නාම
   මම, අපි

## සර්ව නාම වරනැඟීම

ප්‍රථම පුරුෂ සර්ව නාම ලිංගත්‍රයෙහි වරනැඟෙන අයුරු

| පුරුෂ ලිංගයෙහි | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථමා | හේ, හෙතෙම, ඔහු | ඔවුහු/ ඔවුහු තුමූ |
| කර්ම | ඔහු | ඔවුන් |
| කර්තෘ | ඔහු විසින් | ඔවුන් විසින් |
| කරණ | ඔහු (කරණ කොට) | ඔවුන් (කරණ කොට) |
| සම්ප්‍රදාන | ඔහුට | ඔවුන්ට |
| අවධි | ඔහුගෙන් | ඔවුන්ගෙන් |
| සම්බන්ධ | ඔහුගේ | ඔවුන්ගේ |
| ආධාර | ඔහු කෙරෙහි | ඔවුන් කෙරෙහි |

සර්ව නාම ආලපන විභක්තියෙහි වරනොනැගේ. එසේ ම සර්ව නාමවල ප්‍රථම පුරුෂ බහු වචන විභක්ති රූප, ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග දෙකට ම පොදු ය.

**ස්ත්‍රී ලිංගයෙහි**

| | **ඒක වචන** | **බහු වචන** |
|---|---|---|
| ප්‍රථමා | ඈ, ඕ, ඕ තොමෝ | ඔවුහු /ඔවුහුතුමූ |
| කර්ම | ඇය | ඔවුන් |
| කර්තෘ | ඇය විසින් | ඔවුන් විසින් |
| කරණ | ඇය (කරණ කොට) | ඔවුන් (කරණ කොට) |
| සම්ප්‍රදාන | ඇයට | ඔවුන්ට |
| අවධි | ඇයගෙන් | ඔවුන්ගෙන් |
| සම්බන්ධ | ඇයගේ | ඔවුන්ගේ |
| ආධාර | ඇය කෙරෙහි | ඔවුන් කෙරෙහි |

**නපුංසක ලිංගයෙහි**

| | **ඒක වචන** | **බහු වචන** |
|---|---|---|
| ප්‍රථමා | එය / මෙය | ඒවා / මේවා |
| කර්ම | එය / මෙය | ඒවා / මේවා |
| කර්තෘ | එයින් / මෙයින් | ඒවායින් / මේවායින් |
| කරණ | එයින් / මෙයින් | ඒවායින් / මේවායින් |
| සම්ප්‍රදාන | එයට / ඊට / මෙයට මීට | ඒවාට / මේවාට |
| අවධි | එයින් / ඉන් / මෙයින් / මින් | ඒවායින් /මේවායින් |
| සම්බන්ධ | එහි / මෙහි | ඒවායෙහි / මේවායෙහි |
| ආධාර | එහි / මෙහි | ඒවායෙහි / මේවායෙහි |

මධ්‍යම පුරුෂ

මධ්‍යම පුරුෂයෙහි ද පුරුෂ ලිංගයෙහි හා ස්ත්‍රී ලිංගයෙහි බහු වචන රූප සමාන වේ.

| | **ඒක වචන** | **බහු වචන** |
|---|---|---|
| ප්‍රථමා | ඔබ/ නුඹ/ තෝ/ තී | ඔබලා/ නුඹලා/ තෙපි/ තොපි |
| කර්ම | ඔබ/ නුඹ/ තා/ තී | ඔබලා/ නුඹලා/ තොප |
| කර්තෘ | ඔබ විසින්/ නුඹ විසින්<br>තා විසින්/ තී විසින් | ඔබලා විසින්/ නුඹලා විසින්/<br>තොප විසින් |
| කරණ | ඔබ/ නුඹ (කරණ කොට)<br>තා/ තී (කරණ කොට) | ඔබලා/නුඹලා (කරණ කොට)<br>(තොප කරණ කොට) |
| සම්ප්‍රදාන | ඔබට/ නුඹට<br>තට/ තිට | ඔබලාට/ නුඹලාට<br>තොපට |
| අවධි | ඔබගෙන්/ නුඹගෙන්<br>තාගෙන්/ තීගෙන්/ තිගෙන් | ඔබලාගෙන්/ නුඹලාගෙන්<br>තොපගෙන් |
| සම්බන්ධ | ඔබගේ/ නුඹගේ/ තාගේ/<br>තගේ/ තීගේ/ තිගේ | ඔබලාගේ/ නුඹලාගේ/ තොපගේ |
| ආධාර | ඔබ කෙරෙහි/ නුඹ කෙරෙහි/<br>තා කෙරෙහි/ තී කෙරෙහි | ඔබලා කෙරෙහි/ නුඹලා කෙරෙහි/<br>තොප කෙරෙහි |

**උත්තම පුරුෂ**

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථමා | මම | අපි |
| කර්ම | මා | අප |
| කර්තෘ | මා විසින් / මවිසින් | අප විසින් |
| කරණ | මා (කරණ කොට) | අප (කරණ කොට) |
| සම්ප්‍රදාන | මට | අපට |
| අවධි | මගෙන් / මා ගෙන් | අපගෙන් / අපෙන් |
| සම්බන්ධ | මගේ / මාගේ | අපගේ / අපේ |
| ආධාර | මා කෙරෙහි | අප කෙරෙහි |

ප්‍රථම පුරුෂ ප්‍රථමා විභක්තියෙහි ඒකවචන, තෙමේ, තොමෝ යන පදවල ස්ත්‍රී ලිංග පුරුෂ ලිංග දෙකටම පොදු බහු වචනාර්ථය තුමූ යන්න යි.

උදා - ඒක වචන	මානවක තෙමේ නුවරට සැපත් විය.
මානවිකා තොමෝ උයනට යයි.

බහු වචන	මානවකයෝ තුමූ නුවරට සැපත් වූහ.
මානවිකාවෝ තුමූ උයනට යති.

තොමෝ යනු ගෞරවාර්ථ බහු වචන පදයක් ලෙස ඇතැම් ශිෂ්‍යයන් තුළ වැරැදි අවබෝධයක් ඇත. තොමෝ යනු තෙමේ යන්න මෙන් ම ඒක වචන පදයකි. එහෙයින් ඊට අනුරූප ව යෙදෙන ආඛ්‍යාතය ඒක වචන වේ. එහෙත් ස්ත්‍රී ලිංග අතීත කාල ශුද්ධ ආඛ්‍යාතය බහු වචනයෙන් තැබීමේ පැරණි රීතිය අනුව ඊට අනුරූප ආඛ්‍යාතය බහුවචනයෙන් තිබිය හැකි ය.

බිසව් තොමෝ පුත් රුවනක් වැදූහ.
දියණි තොමෝ සතුට ප්‍රකාශ කළහ.
සභා තොමෝ සතුටින් විසිර ගියහ.

**එහෙත් වර්තමානයේ මෙම රීතිය භාවිත නොවේ.**

## සර්ව නාම වර්ගීකරණය

### 1. පුරුෂාර්ථ සර්ව නාම හෙවත් පෞරුෂවාචී සර්ව නාම

අන්‍ය පුද්ගලයන් හෝ වස්තූන් හෝ සම්බන්ධයෙන් යෙදෙන සර්ව නාම ප්‍රථම පුරුෂ (අන්‍යකාරක හෙවත් එ ශබ්දකාරක) සර්ව නාම ලෙස හැඳින්වේ.

**ප්‍රථම පුරුෂ සර්වනාම**

| ඒකවචන | බහු වචන |
|---|---|
| හේ/ හෙතෙම/ ඔහු | ඔවුහු |
| ඈ/ ඕ/ ඕ තොමෝ | |
| එය | ඒවා |
| මෙය | මේවා |

ඇමතුම් කරන පුද්ගලයා හෝ පුද්ගලයන් හෝ හැඳින්වෙන සර්ව නාම මධ්‍යම පුරුෂ (ත ශබ්දකාරක) සර්ව නාම යි.

මධ්‍යම පුරුෂ

| ඒක වචන | බහු වචන |
|---|---|
| තෝ/ තී | තෙපි/ තොපි |
| තා | තොප |
| උඹ/ නුඹ/ ඔබ | උඹලා/ නුඹලා/ ඔබලා |
| යුෂ්මතා/ යුෂ්මතී | යුෂ්මත්හ/ යුෂ්මතුන් |
| ඔබ වහන්සේ | ඔබ වහන්සේ(ලා) |
| තමුන්නාන්සේ | තමුන්නාන්සේ(ලා) |

පැරණි ව්‍යවහාරයේ ඔබ/ ඔබ වහන්සේ/ තමුන්නාන්සේ/ යන්න බහු වචනාර්ථව යෙදුණ ද වර්තමාන ව්‍යවහාරයේ ඒ සඳහා "ලා" ප්‍රත්‍යය යොදා බහු වචන රූප ගැන්වෙයි.

**උත්තම පුරුෂ සර්වනාම**

තමා පිළිබඳ දක්වෙන සර්ව නාම උත්තම පුරුෂ (ම ශබ්දකාරක) සර්ව නාම ලෙස හැඳින්වේ.

| ඒක වචන | බහු වචන |
|---|---|
| මම | අපි |

## 2. නිර්දේශාර්ථ සර්ව නාම හෙවත් සූචක සර්ව නාම

යමක් පෙන්නුම් කිරීම සඳහා යෙදෙන සර්ව නාම මෙනමින් හැඳින්වේ. කලින් සඳහන් කළ පුද්ගලයෙකු හෝ දෙයක් නැවත පෙන්වා දීම සඳහා මෙම සර්ව නාම යෙදේ.

පුරුෂ ලිංගයෙහි හේ, ඒ, මේ
ස්ත්‍රී ලිංගයෙහි ඈ, ඕ, මෝ
නපුංසක ලිංගයෙහි ඒ/එය, මේ/ මෙය

මේ හැර පොදුවේ තෙල, අර, ඔය යන සර්ව නාම ලිංගත්‍රයෙහි ම යෙදේ.

## 3. ප්‍රශ්නාර්ථ සර්ව නාම

ප්‍රශ්න කිරීම සඳහා යොදා ගැනෙන මෙම සර්ව නාම පුද්ගලයන් හා වස්තූන් සම්බන්ධයෙන් භාවිත වේ.

කවුද?
කුමක් ද?
කිමෙක් ද?
මොකාද?/ මොකී ද?/ මොකද්ද?/ මොකෙද්ද?

සමූහයකින් එකක් හෝ එකෙකු හෝ වෙන් කර දැක්වීම සඳහා (නිර්ධාරණාර්ථයෙහි) යෙදෙන ප්‍රශ්න කිරීම් වෙනුවෙන්,

කවරේ ද?
කවර?
කෝක ද?
කෝකා ද?
කෝකි ද?

සංඛ්‍යා සම්බන්ධ ප්‍රශ්න කිරීම් වෙනුවෙන්

කී දෙනා ද?, කීයද?

ප්‍රමාණාත්මක බව දැක්වීම සඳහා කො, කෙ යන සර්ව නාම ශබ්ද ප්‍රමාණවාචී නිපාත පද සමග යෙදී ප්‍රශ්නාර්ථය සකස් වේ.

කොපමණ ද?, කොතරම් ද?, කොච්චර ද?, කෙතරම් ද?

### 4. අනියතාර්ථ සර්ව නාම

අවිනිශ්චිත භාවය දැක්වීම සඳහා මෙම සර්ව නාම යෙදේ.

කිසි, ඇතැම්, සමහර, අය, යම්, එක, මොක, කවර වැනි පද සමග එක් හෝ අක් ප්‍රත්‍යය යෙදී අනියතාර්ථ සර්වනාම සෑදේ.

කිසිවෙක්, ඇතැමෙක්, සමහරෙක්, සමහරක්, යමෙක්, යමක්, එකෙක්, මොකෙක්, මොකක්, කවරෙක්, කවරක්

### 5. ස්වාර්ථ සර්ව නාම

"තමා" යන අර්ථය හැඟවෙන සර්ව නාම මෙනමින් දැක්වේ. 'තම' යන ශබ්ද ප්‍රකෘතියෙන් පුරුෂ ලිංගයෙහි "තෙමේ" යන්න ද ස්ත්‍රී ලිංගයෙහි "තොමෝ" යන්න ද බහු වචනයෙහි 'තුමූ' යන්න ද ප්‍රථම පුරුෂයෙහි යෙදේ.

### 6. අන්‍යාර්ථ සර්ව නාම

අන්‍ය හෙවත් වෙනත් පුද්ගලයන් හා වස්තූන් දැක්වීම සඳහා අන්, අන්‍ය, වෙන යන සර්ව නාම යෙදේ. අන්‍ය පුද්ගලයන්, අන් අය, වෙන කෙනෙක්, වෙන දෙයක්, අන් දෙයක් ආදිය නිදසුන් ය.

### 7. සමුදාය සර්ව නාම

සියල්ල, සැවොම, මුළු යන අර්ථයෙහි මෙම සර්ව නාම යෙදේ. සියලු, මුළු, සැම, හැම, සේරම, ඔක්කොම ආදි පද විශේෂණ වශයෙන් යෙදේ.

## ක්‍රියාකාරකම 11

- **දී ඇති සර්ව නාම පද පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන්වලට ගැළපෙන සේ යොදා අර්ථවත් වාක්‍ය නිර්මාණය කරන්න.**

i. (සියලු, කොයි, ඔහු, කිසිවකු, එයින්, එය, ඔවුහු, කවරෙකු)

පොලිස් නිලධාරීන් සැකකටයුතු ගොඩනැගිල්ලෙන් ........................... ........................ වෙලාවක හෝ බැහැරට පැමිණියහොත් ..................................................... අත්අඩංගුවට ගැනීමට ................................................ රැකවල් ලා සිටියත් ............................................ හෝ ............................................... පිටතට නොපැමිණි හෙයින් ............................................ ............................................... වැටලීමට තීරණය කළහ.

ii. (ඔහුගේ, ඒවාට, සිය, යමෙකුට, කොතරම්, යම්)

............................................ කටයුත්තකදී ............................................ අභියෝග පැමිණියත් ............................................ නොපැකිළ ව මුහුණ දී ............................................ අභිමතාර්ථය සපුරා ගැනීමට ............................................ ඇති හැකියාව ........................ ........................ ජයග්‍රහණයේ රහසයි.

## ක්‍රියාකාරකම 12

**නිවැරැදි පදය වරහන් තුළින් ගෙන වාක්‍ය සම්පූර්ණ කරන්න.**

1. උපාසක තෙමේ තෙරුවන් නැමැද මහ තෙරුන් ............................................ (බැහැදකිති/ බැහැදකී)
2. බිසෝවරු ............................................ සහ පිරිවරින් උයනට පිවිසුණහ. (තොමෝ/ තුමූ)
3. කුමාරිකා තොමෝ රථයෙන් බැස උයනට ............................................ (පිවිසෙයි/ පිවිසෙති)
4. ඇතැමෙක් සිදු වූ විපත ගැන කටකතා ............................................ (පැතිරවී ය/ පැතිරවූහ)
5. ............................................ මේ පැනයට පිළිතුර දනිතියි මම නොසිතමි (කිසිවෙකු/ කිසිවෙක්)
6. ............................................ විසින් අමුත්තෝ පිළිගන්නා ලදහ. (ඔහු/ හෙතෙම)
7. ඕ තොමෝ සාරියකින් ............................................ (සැරසෙන්නාහ/ සැරසෙන්නීය)
8. ඔහු සිය දරුවන් වෙනුවෙන් ............................................ සේසතම වියදම් කළේ ය. (ඔහුගේ/ තමාගේ)
9. ............................................ විසින් පිළිගැනීමේ ගීතය රචනා කරන ලදි. (ඕ/ ඇය)
10. වන්දනා නඩයේ ............................................ රාත්‍රී ආහාර ගෙන නින්දට ගියහ. (සියල්ලෝ ම/ සියල්ලන් ම)

## විභක්ති

නාම ප්‍රකෘති විවිධාර්ථවත් නාම පද බවට පත් කිරීම සඳහා උපකාර වන්නේ විභක්ති ප්‍රත්‍යයන් ය. **"නමින් පරවැ බෙදනු ලබනුයේ විබත් නම්"** යනුවෙන් සිදත් සඟරාවේ නාමයෙන් පරව බෙදනු ලබන්නේ විභක්ති යැයි එම අදහස දක්වා ඇත.

| නාමය | විභක්ති ප්‍රත්‍යය | නාම පද රූප |
|---|---|---|
| දෙවි | ආ | දෙවියා |
| දෙවි | අන් | දෙවියන් |
| දෙවි | ඕ | දෙවියෝ |
| දෙවි | අන්ගේ | දෙවියන්ගේ |

මෙසේ ශබ්ද ප්‍රකෘතිය විවිධ විභක්ති ප්‍රත්‍යයන් යෙදී විවිධාර්ථවත් නාමපද රූප තැනේ. සිංහල භාෂාවේ ප්‍රකෘතිවලට ප්‍රත්‍යය ගැන්වීමේ ක්‍රම කීපයක් පහත දැක්වේ.

i. ස්වර සන්ධි විධිය

ගොන් + ආ = ගොනා
කත් + අ = කත

ii. පූර්වස්වර ලෝප විධිය

බමුණු + ආ = බමුණා
වඳුරු + ආ = වඳුරා

iii. පූර්වරූප විධිය

මිනිස් + හු = මිනිස්සු
යක් + හු = යක්කු

iv. ආගම විධිය ('ය්' හා 'ව්' ආගමය)

මිටි + අ = මිටිය (මිටි + ය් + අ)
දරු + ආ = දරුවා (දරු + ව් + ආ)

v. ද්විත්ව රූප විධිය

කුරුලු + ආ = කුරුල්ලා (කුරුල් + ∅ + ල් + ආ)
බලු + ආ = බල්ලා (බල් + ∅ + ල් + ආ)

## ක්‍රියාකාරකම 13

**පහත සඳහන් නාම ප්‍රකෘතිවලින් තැනුණු නාම පද සඳහා යෙදුණු විභක්ති ප්‍රත්‍ය දක්වා වගුව සම්පූර්ණ කරන්න.**

| නාම ප්‍රකෘතිය | අදාළ ප්‍රත්‍යය | නාමපදය |
|---|---|---|
| උදා - කුලු | අ | කුල්ල |
| කොත් | | කොත |
| කැරලි | | කැරැල්ල |
| ඇත් | | ඇත්තු |
| ගොන් | | ගොනා |
| ගොවි | | ගොවියා |
| පොලු | | පොල්ල |
| යහළු | | යහළුවෝ |
| බලි | | බලිය |
| අතු | | අත්ත |
| මදුරු | | මදුරුවා |
| වලස් | | වලස්සු |
| කුකුළු | | කුකුළා |

## නාම වරනැඟීම

විභක්ති අර්ථ වශයෙන් එකොළොස් ආකාර වන අතර විභක්ති රූප වශයෙන් නව ආකාර වේ. එය වගුවක ආකාරයෙන් මෙසේ ඉදිරිපත් කළ හැක.

| විභක්ති | විභක්ති අර්ථ | නාම ප්‍රකෘතිය | ප්‍රත්‍යය | නාම පදය |
|---|---|---|---|---|
| ප්‍රථමා | 1. ලිංගාර්ථය<br>2. උක්ත කර්තෘ අර්ථය<br>3. උක්ත කර්මාර්ථය | මිනිස්<br>මිනිස්<br>මනිස් | ආ<br>හු<br>ආ/ හු | මිනිසා<br>මිනිස්සු<br>මිනිසා/ මිනිස්සු |
| කර්ම | 4. අනුක්ත කර්මාර්ථය | මිනිස්<br>මිනිස් | ආ<br>උන් | මිනිසා<br>මිනිසුන් |
| කර්තෘ | 5. අනුක්ත කර්තෘ අර්ථය | මිනිස්<br>මිනිස් | ආ<br>උන් | මිනිසා (විසින්)<br>මිනිසුන් (විසින්) |
| කරණ | 6. කරණාර්ථය | මිනිස්<br>මිනිස් | ආ<br>උන් | මිනිසා<br>(කරණකොට)<br>මිනිසුන් (කරණකොට) |
| සම්ප්‍රදාන | 7. සම්ප්‍රදානාර්ථය | මිනිස්<br>මිනිස් | ආට<br>උන්ට | මිනිසාට<br>මිනිසුන්ට |
| අවධි | 8. අවධි අර්ථය | මිනිස්<br>මිනිස් | ආගෙන්<br>උන්ගෙන් | මිනිසාගෙන්<br>මිනිසුන්ගෙන් |
| සම්බන්ධ | 9. සම්බන්ධාර්ථය | මිනිස්<br>මිනිස් | ආගේ<br>උන්ගේ | මිනිසාගේ<br>මිනිසුන්ගේ |
| ආධාර | 10. ආධාරාර්ථය | මිනිස්<br>මිනිස් | ආ<br>උන් | මිනිසා (කෙරෙහි)<br>මිනිසුන් (කෙරෙහි) |
| ආලපන | 11. ආලපනාර්ථය | මිනිස්<br>මිනිස් | අ<br>උනි | මිනිස<br>මිනිසුනි |

## ප්‍රථමා විභක්තිය

මෙහි ප්‍රථමා විභක්තිය අර්ථ වශයෙන් තුන් ආකාර වේ. උක්ත කර්තෘ අර්ථය යනු අවසාන ක්‍රියාවෙන් කර්තෘ උක්ත වීම යි හෙවත් කියැවීම යි.

බල්ලෝ හඬට බුරති.
දෙවියෝ සාදුකාර දෙති.

ඉහත වාක්‍ය දෙකේ ම බුරති, දෙති යන අවසාන ක්‍රියාවලින් උක්තවන්නේ හෙවත් කියැවෙන්නේ පිළිවෙළින් **බල්ලෝ, දෙවියෝ** යන පද යි. අවසාන ක්‍රියාවෙන් උක්තවන පදය ප්‍රථමා විභක්තියෙන් තැබීම සිංහල රීතිය යි. එබැවින් **බල්ලෝ, දෙවියෝ** යන පද උක්ත කර්තෘ අර්ථය ගනී. ඒවා කර්තෘ කාරක වාක්‍ය වශයෙන් හැඳින්වෙන්නේ එබැවිනි.

උක්ත කර්මාර්ථය යනු අවසාන ක්‍රියාවෙන් කර්මය උක්ත වීම යි. ඇතැම් වාක්‍යවල අවසාන ක්‍රියාවෙන් කර්මය උක්ත වේ. එබැවින් ඒවා කර්ම කාරක වාක්‍ය ලෙස හැඳින්වේ.

උදා:- වැද්දන් විසින් මුවෝ මැරෙති./ මරනු ලබති.
විදුහල්පතිවරයා විසින් ගුරුවරු ඇමතුණහ./ අමතන ලදහ./ අමතනු ලැබූහ
ආගන්තුකයකු විසින් අපි කැඳවුණෙමු./ කැඳවන ලද්දෙමු./ කැඳවනු ලදුමු

මෙහි පළමු වාක්‍යයේ වැද්දන් විසින් මැරුණෝ/ මරනු ලැබුවෝ මුවෝ ය. දෙවන වාක්‍යයේ ඇමතුණෝ/ අමතනු ලැබුවෝ ගුරුවරු ය. තුන්වන වාක්‍යයේ කැඳවුණෝ/ කැඳවනු ලැබුවෝ අපි ය.

ඉහත උදාහරණවල කර්ම කාරක ක්‍රියාවලින් උක්ත වන්නේ කර්ම පද යි. එබැවින් උක්ත කර්ම පද ප්‍රථමා විභක්තිය ගනී.

මෙසේ අවසාන ක්‍රියාවෙන් කර්තෘ හෝ කර්මය උක්ත නොවී තනි ව යෙදී හුදු නාම පද වශයෙන් සිට උක්තාර්ථය ප්‍රකාශ වේ නම් ඒවා ලිංගාර්ථයේ ප්‍රථමා විභක්තිය නමින් හැඳින්වේ. නිදසුන් ලෙස නාම පදවලට උදාහරණ වශයෙන් මිනිසා, බල්ලා, ගස, ආදි නාමපද දැක්වීමේ දී හෝ 'කරුණාදාස සහ සහෝදරයෝ' 'ගුණපාල සහ පුත්‍රයෝ' යනුවෙන් වෙළෙඳ ආයතනවල නාම දැක්වීමේදී හෝ 'කරුමක්කාරයෝ', 'දෙපා නොලද්දෝ', අමාවතුර, මුවදෙව්දාවත ආදි පොත්වල නම් දැක්වීමේදී හෝ ඒවා ප්‍රථමා විභක්ති රූප ගන්නා බැවින් එබඳු ප්‍රථමා විභක්ති අර්ථ සහිත පද ලිංගාර්ථයේ ප්‍රථමා යනුවෙන් හැඳින්වේ. පාලි ව්‍යාකරණයෙහි "ලිඞ්ගත්ථෙ පඨමා" ලෙස ද දැක්වෙන්නේ එය යි. කෙසේ වුව ද උක්තාර්ථය ප්‍රකාශ වන්නේ ප්‍රථමා විභක්තියේ පමණි. සෙසු සෑම විභක්තියක් ම අනුක්තාර්ථ ගනී.

## ප්‍රථමා විභක්ති විශේෂ යෝග

උක්ත කර්තෘ, උක්ත කර්ම හා ලිංගාර්ථය හැරුණුවිට පහත සඳහන් විශේෂ අවස්ථාවලදී ද වාක්‍යවල යෙදෙන්නේ ප්‍රථමා විභක්තිය යි.

### 1. සමාන කිරීමෙහි

ශිෂ්‍යයෝ දක්ෂයෝ ය
ඔවුහු ගොවියෝ ය

### 2. "ව" ධාතුවෙන් යුක්ත ක්‍රියාවට ආඛ්‍යාත පූර්ණයක් ලෙස

ශිෂ්‍යයෝ දක්ෂයෝ වෙති
ඔවුහු ගොවියෝ වෙති

### 3. ප්‍රමාණවාචී පද සමග

මිනිස්සු වැඩි දෙනෙක් රැස්වීමට පැමිණ සිටියහ.
සාමාජිකයෝ සියල්ලෝ ම යෝජනාවට පක්ෂව ඡන්දය දුන්හ.

### 4. ප්‍රථමා විභක්ති ප්‍රත්‍යයන් නොගෙන උපකාරක පදයක් සමග උක්ත වන අවස්ථා ද වෙයි.

එහිදී තෙමේ, තොමෝ යන උපකාරක පද යොදා ගැනේ.

උදා - පුත්‍ර තෙමේ දෙමව්පියන් බැහැ දකී.
වනිතා තොමෝ ප්‍රශංසා ලබයි.

එහෙත් "තුමූ" යන බහු වචන රූපයේදී උක්ත පදය ප්‍රථමා විභක්ති ප්‍රත්‍යයන් සහිත ව යෙදේ.

උදා - මානවිකාවෝ තුමූ උයනෙහි මල් නෙළති.
සිටුවරයෝ තුමූ රජු නමදිති.

## ප්‍රථමා විභක්ති ප්‍රත්‍යයන්

ඒක වචන - ඒ, අ, ආ, උ
බහු වචන - ඕ, හු, වල්, උ

**ඒක වචන ප්‍රත්‍යයෝ**

ඒ - බෙළේ බළාම් කෙරේ (බළ + ඒ)
අ - කෙල්ල ගෙය අමදියි (කෙලි + අ)
ආ - ළමයා අකුරු උගනී (ළමා + ආ)
උ - කුමරු ශිල්ප දක්වයි (කුමර + උ)

**බහු වචන ප්‍රත්‍යයෝ**

ඕ - දරුවෝ සෙල්ලම් කරති (දරු + ඕ)
හු - මිනිස්සු උද්ඝෝෂණය කරති (මිනිස් + හු)
උ - සොරු ගෙය බිඳ බඩු පැහැර ගත්හ (සොර + උ)
වල් - ගෙවල් ගිනි ගනී (ගෙ + වල්)

ඇතැම් නපුංසක ලිංග ප්‍රථමා විභක්ති බහු වචන රූප නාම ප්‍රකෘති ස්වරූපයෙන් ම සිටී.

උදා - ගස් සුළඟට සෙලවෙයි
කොඩි සුළඟට ලෙළදෙයි

## අනියතාර්ථ ප්‍රත්‍යය

අනියතාර්ථ ප්‍රත්‍ය ලිංගත්‍රයෙහි ම ප්‍රථමා විභක්ති ඒක වචනයෙහි පමණක් යෙදේ.

පුරුෂ ලිංග අනියතාර්ථ ප්‍රත්‍යය - එක්
ස්ත්‍රී ලිංග අනියතාර්ථ ප්‍රත්‍යය - අක්
නපුංසක ලිංග අනියතාර්ථ ප්‍රත්‍යය - එක්/ අක්

මිනිසෙක් ඔරුව පදී. (මිනිස් + එක්)
ගැහැනියක් මල් නෙළයි. (ගැහැනු + අක්)
මාර්ගය අසල ගසෙක් විය. (ගස් + එක්)
නගර ශාලාවේ ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වේ. (ප්‍රදර්ශන + අක්)

## ක්‍රියාකාරකම 14

❀ වරහන් තුළ ඇති නිවැරැදි පදය ගෙන පහත දී ඇති වාක්‍යවල හිස්තැන් පුරවන්න.

1. වෙළෙන්දන් විසින් .......................... රවටන ලදහ. (පාරිභෝගිකයන්/ පාරිභෝගිකයෝ)
2. ඕ තොමෝ මුසාවක් ම ......................... (තෙපලයි/ තෙපලති)
3. ඈ .......................... වූවා ය. (නිවේදිකාවක/ නිවේදිකාවක්)
4. සිංහලයෝ ......................... බෞද්ධයෝ නොවෙති. (සියල්ලෝ ම/ සියල්ලන් ම)
5. විචාරකයෝ ......................... (බුද්ධිමතුන් ය/ බුද්ධිමත්හු ය)

### කර්ම විභක්තිය

**'යුතු කතු කිරිය හා පදරුත් බෙජේ කම් නම්'** කර්තෘගේ ක්‍රියාව හා යුක්ත වූ පදාර්ථය කර්ම විභක්තිය භජනය කෙරේ යන්න සිදත් සඟරාවේ කර්ම විභක්තිය හැඳින් වූ විධිය යි. එයින් අදහස් කරන ලද්දේ කර්තෘගේ ක්‍රියාව විඳින පදය කර්ම විභක්ති ගන්නා බව යි. ඒ අනුව කර්තෘකාරක වාක්‍යයක කර්මය කර්ම විභක්තියෙන් සිටී.

උදා - ගොනා තණකොළ කයි.
බළලා මීයන් අල්ලයි.

### කර්ම විභක්ති ප්‍රත්‍යයෝ

ඒක වචන - අ, ආ, උ, හු, ට
බහු වචන - අන්, උන්, න්, වල්, ආන, නට, න

**ඒක වචන ප්‍රත්‍යයෝ**

අ - වඩුවා පුටුව සාදයි. (පුටු + අ)
ආ - මව දරුවා නළවයි. (දරු + ආ)
උ - පියා පුතු සනසයි. (පුත් + උ)

**බහු වචන ප්‍රත්‍යයෝ**

අන් - නාට්‍ය ශිල්පියා නළුවන් අමතයි. (නළු + අන්)
උන් - අපි සතුන් නොමරමු (සත් + උන්)
න් - සත්පුරුෂයෝ දුදනන් පිටු දකිති (දුදන + න්)
වල් - කම්කරුවෝ පාරවල් තනති. (පාර + වල්)
ආන - නටන මොනරාන නරඹන්න. (මොනර + ආන)

### කර්ම විභක්ති ප්‍රයෝග

i. කර්ම විභක්තිය අනියතාර්ථයෙහි ද යෙදේ.

පුරුෂ ලිංග ප්‍රත්‍යය - අකු/ එකු
ස්ත්‍රී ලිංග ප්‍රත්‍යය - අක
නපුංසක ප්‍රත්‍යය - අක්

කුඩා හිමි නම ලේනෙකු ඇති දැඩි කරයි (ලේන් + එකු)
සිවලා සාවකු ලුහුබඳියි (සාවා + අකු)

ගුරුතුමිය ශිෂ්‍යාවක කැඳවයි (ශිෂ්‍යා + අක)
රියදුරා රථයක් පදවයි (රථ + අක්)

ii. වාක්‍යාංශයක කෘදන්තයකින් උක්ත වන ක්‍රියාව කරන තැනැත්තා දැක්වෙන්නේ කර්ම විභක්තියෙනි.

දරුවන් යන්නේ පාසලට ය.
සොරුන් පලා යනු අපි දුටුවෙමු.

iii. ආඛ්‍යාත ක්‍රියාවක් සහිත වාක්‍යාංශයක එම ක්‍රියාවෙන් උක්ත වන කර්තෘ කර්ම විභක්ති ගනී.

අප ටෙලිනාට්‍යය නරඹද්දී විදුලිය ඇන හිටියේ ය.
සංචාරකයන් සීගිරිය නගිද්දී බමරු ඇවිස්සුණහ.

iv. නිපාත යෝගයෙහි,

බොහෝ නිපාතවලට පූර්වයෙන් යෙදෙන නාමපද කර්ම විභක්තියෙන් සිටී.

විනා, මිස, මුත්, හැර, මෙන්, සේ, වැනි, එව්, බඳු, අයුරු
වෙත, කරා, අරබයා/ අරභයා, ගැන, පිළිබඳ, සම්බන්ධයෙන්, වෙනුවට, වෙනුවෙන්, අනුව, මත ආදිය එසේ යෙදෙන නිපාතවලින් සමහරකි.
මෙහි සඳහන් විනා, මිස, මුත්, සේ, වැනි නිපාත වෙනත් විභක්තිවල ද ඇතැම් විට යෙදේ.

උදා - ගණිතඥයෙකු විනා මේ ගැටලුව විසඳාලන සමතෙක් නැත.
රජ සිටුවරයා වෙත එළඹ සුවදුක් විචාළේ ය.

v. සංශයාර්ථය දැක්වෙන වාක්‍යාංශයක ක්‍රියාවෙන් උක්ත වන කර්තෘ කර්ම විභක්තිය ගනී.

ඇඳුර, අප තුටු නොවෙති යි නොසිත
විරෝධතා දැක්වීමේදී මිනිසුන් කලබල වෙති' යි රජය විසින් පොලිසිය කැඳවනු ලැබී ය.

vi. ප්‍රයෝජ්‍ය ක්‍රියාව සහිත වාක්‍යයක ක්‍රියාව කරන කර්තෘ (ප්‍රයෝජක කර්තෘ) කර්ම විභක්තියෙන් සිටී.

ඇත්ගොව්වා ඇතුන් ලවා කොට අද්දවයි.
ගුරුවරයා සිසුන් ලවා රචනා ලියවයි.

vii. 'යුතු ය', යන උපකාරක ක්‍රියාව සහිත වාක්‍යවල කර්තෘ දැක්වීම සඳහා

පදිකයන් පාරේ දකුණු පසින් යා යුතු ය.

viii. අත්‍යන්ත සංයෝගයෙහි කර්ම විභක්තිය

අත්‍යන්ත සංයෝගය යනු නිරතුරු පවත්නා සම්බන්ධතාව යි. කාල, මාර්ග යන ප්‍රමාණවාචී ශබ්ද ගුණ, ක්‍රියා, ද්‍රව්‍ය වාචක ශබ්ද සමග පවත්නා නිරන්තර සම්බන්ධතාව ප්‍රකාශ කරන කල්හි ප්‍රමාණවාචී ශබ්ද අත්‍යන්ත සංයෝගයෙහි කර්ම විභක්ති ගනී.

"තිලෝගුරු තෙමස් මුරුනට අබිදම් දෙසී"

මෙහි 'තෙමස්' යන ප්‍රමාණවාචී (කාල) පදය 'දෙසී' යන ක්‍රියාව සමග නිරතුරු

බැඳී සිටි බැවින් එය කර්ම විභක්තියෙන් සිටී.

උදා - 1. අවුරුද්දේ මුල හා අග දෙමස සීතල යි (කාල, ගුණ)
2. ධාවකයා වරුවක් දුවයි (කාල, ක්‍රියා)
3. රෝගියාට සතියක් කැඳ ය (කාල, ද්‍රව්‍ය)
4. ගඟ පස් යොදුනක් වංගු යි (මාර්ග, ගුණ)
5. මම සැතපුමක් පයින් යමි (මාර්ග, ක්‍රියා)
6. මේ මාර්ගයේ සැතපුමක් බොරලු යි (මාර්ග, ද්‍රව්‍ය)

ix. ඉත්ථම්භූතාර්ථයෙහි කර්ම විභක්තිය

ඉත්ථම්භූත යනු මෙසේ සිදු විය යන අරුත යි. එනම් පැවති යම්කිසි තත්ත්වයක් වෙනස් තත්ත්වයකට පත් වීම යි. "දෙව්දත් මවට මැනවි" යන්නෙහි වෙනත් අයට අයහපත් වූ දෙව්දත් මවට යහපත් වූ බව පැවසෙයි. එබැවින් 'මවට' යන්න ඉත්ථම්භූතාර්ථයෙහි කර්ම විභක්තිය ගනී.

අප්‍රිය වූ විෂයය නවක ගුරුවරයාගේ පැමිණීමෙන් පසු ශිෂ්‍යයන්ට ප්‍රියතම විෂයය විය. හදිසි කෝපය නිසා කළ වරදේ බරපතළකම ඔහුට අවබෝධ වූයේ සිරගත වූ පසු ය.

## ක්‍රියාකාරකම 15

❀ **වරහන් තුළ දී ඇති නිවැරැදි පදය යොදා වාක්‍යවල හිස්තැන් පුරවන්න.**

1. ගොවියා ......................... බඳියි. (එළදෙනෙකු/ එළදෙනක)
2. ............................ වෙත පැමිණි දෙමාපියෝ පැමිණිල්ලක් ඉදිරිපත් කළහ. (ගුරුවරු/ ගුරුවරුන්)
3. ........................ පාසලේ උගනිතියි දෙමාපියෝ සිතති. (දරුවෝ/ දරුවන්)
4. ....................... නිවැරැදි ව බස හැසිරවිය යුතු ය. (නිවේදකයන්/ නිවේදකයෝ)
5. තව මොහොතකින් ..................... නගරය වටලනු ඇත. (සතුරෝ/ සතුරන්)
6. උපාසිකාව ........................ ලවා මල් කඩවයි. (දරුවෙක්/ දරුවෙකු)
7. වැද්දා හීයෙන් විද ......................... මැරී ය. (මුවෙකු/ මුවෙක්)
8. අද වේලාසනින් ...................... නිවසට යා යුතු ය. (මා/ මම)
9. ඔහු බෙබද්දෙකැ යි ........................ අසා නැත. (මම/ මා)
10. ......................... පැමිණ ඇතැ යි ලේකම් සභාපතිවරයාට දැන්වී ය. (සාමාජිකයෝ/ සාමාජිකයන්)

## කර්තෘ විභක්තිය

සිදත් සඟරාවේ "මෙහෙයුම් ලද නොලද කිරිය කරනුයේ කතු නම්" යනුවෙන් මෙහෙයීමක් ලබා හෝ නොලබා හෝ ක්‍රියාව කරන්නේ කර්තෘ යැයි දක්වා තිබේ.

කර්ම කාරක වාක්‍යයක අනුක්ත කර්තෘ කර්ම විභක්තියෙන් සිටී.

උදා - **පාලකයා විසින්** සේවකයෝ රවටන ලදහ.

මෙහි ක්‍රියාවෙන් උක්ත වන්නේ **සේවකයෝ** යන පදය යි. එවිට එසේ උක්ත නොවන කර්තෘ 'පාලකයා විසින්' යනුවෙන් කර්තෘ විභක්තියෙන් සිටී.

## කර්තෘ විභක්ති ප්‍රත්‍යයෝ

ඒක වචන - අ, ආ, උ, හු, එකු, අකු, අක
බහු වචන - අන්, උන්, න්, ආන

**ඒක වචන ප්‍රත්‍යයෝ**

අ - කාන්තාව දුන් ලිපිනය වැරැදි ය (කාන්තා + අ)
ආ - සතුරා ලුහුබඳින බව සෙබළා නොදැන සිටියේ ය. (සතුරු + ආ)
උ - ගොනු ගිය මග කෑ තණපත්වලින් හඳුනා ගත හැකි ය. (ගොන් + උ)

| | | | |
|---|---|---|---|
| අනියතාර්ථයෙහි | පුරුෂ ලිංග | - | එකු/ අකු |
| | ස්ත්‍රී ලිංග | - | අක |
| | නපුංසක ලිංග | - | අක් |

එකු - කිසිවෙකු නඟන හඬ ඇතින් ඇසේ. (කිසි + එකු)
අකු - තවුසකු විසින් දරුවා රැගෙන එන ලදි. (තවුස + අකු)
අක - දුප්පත් උපාසිකාවක විසින් පුදන ලද සිවුර යි මේ (උපාසිකා + අක)
අක් - ගසක් වැටී පාර අවහිර විය. (ගස් + අක්)

**බහු වචන ප්‍රත්‍යයෝ**

අන් - දරුවන් කළ වරද සිතට නොගන්න. (දරු + අන්)
උන් - නිදන් හොරුන් විනාශ කළ පිළිමය මෙය යි. (හොර + උන්)
න් - කුලඟනන් පිහිටු වූ සමිතිය කුලඟන සමිතිය වේ. (කුලඟන + න්)
ආන - නරාන කළ කමට ඉඳුරෝ දෙස් (නර + ආන)
(මිනිසුන් කළා වූ කර්මය මේ යැයි ඉන්ද්‍රියයෝ සාක්ෂි සපයති.)

## කර්තෘ විභක්ති ප්‍රයෝග

සහ අර්ථයෙහි සමග, සහ, කැටුව, ඉහි යන නිපාතවලට පූර්වයෙන් යෙදෙන නාම පද කර්තෘ විභක්තිය ගනී.

උදා - පියා දරුවන් සමග කුඹුරට යයි.
සුරන් සහ සහසැස් නොකර සිටියේ අහස් කුස හිස්.
මව දියණියන් කැටුව ගමනට සහභාගී වූවා ය.
සැරද සියනි'හි සැලළිහිණි සඳ (සියන් + ඉහි) (ස්වකීයයන් සමග)

## ක්‍රියාකාරකම 16

✿ **පහත දැක්වෙන වාක්‍යවල කර්තෘ විභක්තියට අදාළ පද තෝරා ලියන්න.**

1. මා ලියූ ලියුම ලියාපදිංචි තැපෑලෙන් ඔබ වෙත එවා ඇත.
2. කලාකරුවෝ සහෘදයන් විසින් ඇගයුණහ./ අගයනු ලැබූහ.
3. වෙසතුරු රජ දරුවන් හා වනයට නික්මිණි.
4. අප විසින් දියුණුවට මග සලසා ගත යුතු ය.
5. ඔබ ඔවුන් සමග උරණ නොවන්න.

### කරණ විභක්තිය

යම් ක්‍රියාවක් කිරීම සඳහා කර්තෘට උපකාරී වන නාම පදය තබන්නේ කරණ විභක්තියෙනි.

**"කිරිය සැපයීමෙහි ඉවහල් කතු කරණ නම්"**

"ක්‍රියාවන් කිරීමෙහි කර්තෘහට උපකාරී වන්නේ කරණ (විභක්ති) නම් වේ" යනුවෙන් සිදත් සඟරාවේ එය හඳුන්වා දී ඇත.

උදා - අපි සුවඳ මලින් මුනිඳු පුදමු. මෙහි මුනිඳුන් පිදීමට අපට උපකාරී වී ඇත්තේ සුවඳ මල් ය. එබැවින් එය කරණ විභක්ති ගනී.

### කරණ විභක්ති ප්‍රත්‍යයෝ

ඒක වචන - ඉන්, එන්, නෙන්, ඉනි, එනි, නෙනි, නි

බහුවචනයෙහි ද මෙම ප්‍රත්‍ය එකසේ යෙදේ.

ඉන් - ඔහු කටින් බතල සිටුවන්නෙකි (කට + ඉන්)
එන් - වඩුවා කියතෙන් ලී ඉරයි (කියත් + එන්)
නෙන් - මෙත්නෙන් වෙර පරයනු (මෙත් + නෙන්)
(මෛත්‍රියෙන් වෛරය පරදවනු)
ඉනි - ඇය තෙරුවන් නමදින්නේ සැදැහැ සිතිනි (සිත් + ඉනි)
එනි - බිම තෙත් වූයේ වැසි දියෙනි. (දිය + එනි)
නි - සිරිනි සරු සාර වීලා - නීල ගොයම්පැසී (සිරි + නි)

කරණ විභක්ති බහු වචන රූප තැනෙන්නේ බොහෝවිට "වල්" ප්‍රත්‍යය සමග "ඉන්" ප්‍රත්‍යය සන්ධි වීමෙනි.

කඩවලින් + (කඩ + වල් + ඉන්)
අපි කඩවලින් යැපෙන්නේ නැති ව ගෙවත්තේ එළවළු වගාකර ගනිමු.

කරණ කොට, නිසා යනු කරණ විභක්ති රූපය සෑදීමෙහි ලා යෙදෙන උපකාරී පදයි.

මහලු දෙමව්පියෝ දරුවන් නිසා රැකෙති
මහලු දෙමව්පියෝ දරුවන් කරණකොට රැකෙති

## කරණ විභක්ති ප්‍රයෝග

i. උපලක්ෂණාර්ථයෙහි කරණ විභක්තිය

ක්‍රියාවේ ලක්ෂණය කරණ විභක්ත්‍යර්ථ පදයෙන් ප්‍රකාශ වේ නම් එය උපලක්ෂණාර්ථයෙහි කරණ විභක්ති නම් වේ.

සිංහල අලුත් අවුරුද්ද උදාවත් ම මුළු රට රතිඤ්ඤා හඬින් ගිගුම් දෙයි.
පැසුණු හිසින් බුහුමන් ලබව.

ii. හේතු අර්ථයෙහි

ඔබ දකුමෙන් අප පින් කළ බව දැනිණි.
ඉවසීමෙන් සැනසීම ලැබේ.

iii. යුක්තාර්ථයෙහි (යමකින් යුක්ත බව)

රට සහලින් ස්වයංපෝෂිත විය.
අපි අසීමිත ශ්‍රද්ධාවෙන් තෙරුවන් පිදුවෙමු.

iv. නාම විශේෂණ අර්ථයෙහි

ඈ ගායනයෙන් කෝකිලාවකි.
වියත්කමෙන් සිරිරහල් හිමියෝ මහ සමුදුරකි.

v. ක්‍රියා විශේෂණ අර්ථයෙහි

යානය වේගයෙන් ගුවනට ඇදෙයි.
දරුවෝ සිංහල අලුත් අවුරුද්ද උදාවන තෙක් නොඉවසිල්ලෙන් බලා සිටිති.

vi. කාලාර්ථයෙහි

මම මොහොතකින් ආපසු එන්නෙමි.
දරුවෝ පාන්දරින් අවදි ව පාසල් යාමට සූදානම් වෙති.

### ක්‍රියාකාරකම 17

**පහත දී ඇති කරණ විභක්ත්‍යන්ත පද යොදා වාක්‍ය තනන්න.**

බෙහෙතින්, නගුලෙන්, උදැසනින්, පලබරින්, දයාවෙන්, වන සතුන් නිසා, පද්‍යයෙන්, රටාවකින්, ඉගෙනීමෙන්, දෙමසකින්

## සම්ප්‍රදාන විභක්තිය

යම් කිසිවක් ලබන තැනැත්තා හෝ වස්තුව හෝ සම්ප්‍රදාන විභක්තිය ගනී. සම්ප්‍රදාන යන්නෙහි අර්ථය ද 'මනා කොට දීම' යනු යි. සිදත් සඟරාවෙහි **'දන් ඈ ලබනුයේ පිණිස නිසි හා සපදන්'** දන් ආදිය ලබන්නේ ද පිණිස යන්න යෙදීමට නිසි වූයේ ද සම්ප්‍රදාන යි' යනුවෙන් දක්වා ඇත්තේ එය යි.

## සම්ප්‍රදාන විභක්ති ප්‍රත්‍යයෝ

ඒක වචන - හට, අට, ආට, උට, ට
බහු වචන - අන්ට, අනට, ආනට, අන්හට, උන්ට, උන්හට, න්ට, න් හට, නට, වලට

**ඒක වචන ප්‍රත්‍ය**

හට - කොතැන වුණත් නැත මරුහට බාදා. (මරු + හට)
අට - පුතා මවට බෙහෙත් පෙව්වේ ය. (මව් + අට)
ආට - මව දරුවාට කිරිදෙයි. (දරු + ආට)
උට - පියා විභාගයෙන් සමත් වූ පුතුට ඔරලෝසුවක් තෑගි දුන්නේ ය. (පුත් + උට)
ට - ඇමතිවරයා ගත්කරුට තිළිණයක් ප්‍රදානය කළේ ය. (ගත්කරු + ට)

**බහු වචන ප්‍රත්‍ය**

අන්ට - දරුවන්ට ආදරය හා රැකවරණය දිය යුතු ය. (දරු + අන්ට)
අනට - සිටුදුව යදියනට දන් වැටක් පැවැත්වූවා ය. (යදි + අනට)
ආනට - දිසාපාමොක් ඇදුරුතුමා කුමරානට ගුරු මුෂ්ටි තොතබා සිප්සත ලබාදෙයි. (කුමර + ආනට)
අන්හට - යදියන්හට ආහාරයෙන් පමණක් නො ව වස්ත්‍රවලින් ද සංග්‍රහ ලැබුණි. (යදි + අන්හට)
උන්ට - රජවාසලේ දී වියතුන්ට තිළිණ ප්‍රදානය කෙරිණි. (වියත් + උන්ට)
උන්හට - මහතුන්හට නිසි ගෞරවය දක්වනු. (මහත් + උන්හට)
න්ට - සිසුවෝ ගුරුන්ට බුහුමන් දක්වති. (ගුරු + න්ට)
න්හට - බැතිමත්හු සුරන්හට පුද පූජා පවත්වති. (සුර + න්හට)
නට - ගුරුවරු සිසුනට ඔවා දෙති. (සිසු + නට)
වලට - ආහාරවලට විෂ මිශ්‍ර වීමෙන් කතක් රෝගී වූවා ය. (ආහාර + වලට)

## සම්ප්‍රදාන විභක්ති ප්‍රයෝග

i. පිණිසාර්ථයෙහි නිපාත වන පිණිස, සඳහා, උදෙසා, වස්, නිසි යන පදවලට මුලින් සිටින නාමපදය සම්ප්‍රදාන විභක්තිය ගනී.

ළඳහු දර පිණිස වනයට පිවිසුණහ.
වියපත් වූවන් සඳහා වෙන් වූ නිවාස මහලු නිවාස නමින් හැඳින්වේ.
රණවිරුවෝ රට, ජාතිය, ආගම උදෙසා දිවි පිදූහ.
සිප්සතර හදාරනු වස් කුමරු තක්සලාව බලා පිටත් විය.
භික්ෂුව පිඬු පිණිස හැසිරේ.

ඉහත නිපාත වෙනුවට 'ට', 'අට' ප්‍රත්‍යය යෙදීමෙන් ද සම්ප්‍රදාන විභක්ති අර්ථය ප්‍රකාශ කළ හැක.

දර පිණිස - දරට
වියපත් වූවන් සඳහා - වියපත් වූවන්ට
හදාරනු වස් - හදාරන්නට
රට, ජාතිය, ආගම උදෙසා - රටට ජාතියට ආගමට
පිඬු පිණිස - පිඬුවට (පිඬු සිඟීමට)

ii. ක්‍රියාවේ අපර සීමාව දැක්වීමෙහි

සියලු ගංගාවෝ මුහුදට ගලා බසිති.
පාසල නිම වූ පසු දරුවෝ නිවසට පැමිණෙති.

iii. ක්‍රියා විශේෂණ අර්ථයෙහි

බත හොඳට ඉදී ඇත.
ගොයම යසට පීදී ඇත.

iv. කරණ විභක්ත්‍යර්ථයෙහි

පිහියට අත කැපේ.
පොල් හිග කාලයට ගෘහණියෝ මිරිසට මාළුපිණි උයති.

v. ප්‍රමාණාර්ථයෙහි

සේවකයෙකුට දිනකට වැටුප රුපියල් දාහකි.
රුපියලකට ශත සියයකි.

vi. හේත්වර්ථයෙහි (ක්‍රියාවට හේතුව දැක්වීමෙහි)

නියඟයට ජලය හිඟ වේ.
ගංවතුරට ගෙවල් යට විය.

vii. පූර්ව සීමා අර්ථයෙහි

කොළඹට නුදුරින් වත්තල නගරය පිහිටා ඇත.
නගරයට දකුණින් ගඟක් ගලා බසී.

viii. නිර්ධාරණාර්ථයෙහි (සමූහයකින් එකක් වෙන් කර දක්වීමෙහි)

සිරුරෙහි තුනෙන් දෙකක් ජලය යි.
පන්තියෙහි වැඩිදෙනෙක් ශිෂ්‍යාවෝ ය.

ix. භාවකාරක කර්තෘ අර්ථයෙහි

ඇයට හැඬේ.
ආහාර සමග අපට නොදැනුවත්ව ම වස කැවේ.

## ක්‍රියාකාරකම 18

**පහත දී ඇති සම්ප්‍රදාන විභක්ත්‍යන්ත පද යොදා වාක්‍යවල හිස්තැන් පුරවන්න.**

1. ගොවියා ...................... වැට බඳී.
2. සෙබළු ......................... එරෙහිව සටන් කළහ.
3. නියඟය නිසා .................... ජලය සොයා ගැනීම දුෂ්කර ය.
4. බෙහෙත් පෙති ..................... දෙවරක් උදේ සවස කෑමට පෙර ගන්න.

5. කඳවුරෙහි ...................... ප්‍රමාණවත් ආහාර ඇත.
6. අප හැදෑරිය යුත්තේ ...................... අදාළ කරුණු පමණි.
7. .................... දකුණින් පන්සල පිහිටා ඇත.
8. රෝගියා .................... ගෙනයනු ලැබීය.

(තෙදිනකට, විෂයයට, පාසලට, හරකුන්ට, සතුරන්ට, බීමට, දවසට, රෝහලට)

## අවධි විභක්තිය

වෙන් වීම්, ඉවත් වීම්, පහ වීම් අර්ථයෙහි වූ ක්‍රියවන්හි පූර්ව සීමාව දක්වෙන්නේ අවධි විභක්තියෙනි. අවධි යනු සීමා යන අර්ථය යි. සිදත් සඟරාවේ ''පද අත් පැවැත්මට හිම් වූයේ අවදි නම්'' යනුවෙන් දක් වූයේ එය යි.

ගසින් ගෙඩියක් වැටෙයි. මෙහි ගෙඩිය වෙන් වීමේ පූර්ව සීමාව දක්වෙන්නේ ගසින් ය. එබැවින් එය අවධි විභක්ති ගනී.

## අවධි විභක්ති ප්‍රත්‍යයෝ

ඒක වචන - ඉන්, එන්, නෙන්, අගෙන්, ආගෙන්, උගෙන්, හුගෙන්
බහු වචන - අන්ගෙන්, න්ගෙන්, උන්ගෙන්, වලින්

**ඒක වචන ප්‍රත්‍ය**

ඉන් - බඹරා මලින් රොන් ගනී. (මල් + ඉන්)
එන් - තවුසා දැහැනෙන් පිරිහිණි. (දැහැන් + එන්)
නෙන් - මෙත්නෙන් වෛරය දුරුවේ. (මෙත් + නෙන්)
අගෙන් - මවගෙන් දරුවාට රැකවරණයය සැලසේ. (මව් + අගෙන්)
ආගෙන් - අධිකරණය වෙළෙන්දාගෙන් නිදහසට කරුණු විමසයි. (වෙළෙඳ + ආගෙන්)
උගෙන් - මරුගෙන් අපට ගැළවීමක් නැත. (මර + උගෙන්)
හුගෙන් - මුනිඳුහුගෙන් සවණක් රැස් විහිදේ. (මුනිඳු + හුගෙන්)

**බහු වචන ප්‍රත්‍ය**

අන්ගෙන් - දරුවන්ගෙන් අප උගත යුතු දේ බොහෝ ය. (දරු + අන්ගෙන්)
න්ගෙන් - භික්ෂූන්ගෙන් ගිහියන්ට අනුශාසනා ලැබේ. (භික්ෂු + න්ගෙන්)
උන්ගෙන් - විදේශ සේවයේ නියුක්ත කතුන්ගෙන් රටට විදේශ විනිමය ලැබේ. (කත් + උන්ගෙන්)
වලින් - ගස්වැල්වලින් පරිසරය සුරැකේ (ගස්වැල් + වලින්)

## අවධි විභක්ති ප්‍රයෝග

i. නිර්ධාරණාර්ථයෙහි (සමූහයකින් එකක් හෝ එකෙකු වෙන් කොට දැක්වීමෙහි)

ජාති - මල්වලින් රෝස මල වඩා ප්‍රියකරු යි.
ද්‍රව්‍ය - මැණික් අතුරින් රතු මැණික අගනේ ය.
ගුණ - රසයන්ගෙන් මිහිරිතම වන්නේ මීපැණි ය.
ක්‍රියා - යන්නන්ගෙන් දුවන්නා ශීඝ්‍රගාමී ය.

ii. පෙර, පසු, ඉහත, ඉහළ, පහළ ආදි පද සම්බන්ධයෙහි

එදුයින් පෙර කිසි දිනක ඇය මට හමු වී නැත.
අදින් පසු අප කිසිවකු හමු නොවනු ඇත.
මැතිවරණයෙන් ඉහත දිනක ද ඔහු ජය ගෙන ඇත.
බෙල්ලෙන් ඉහළ රෝගී තත්ත්වයක් දුනේ.
අගලෙන් පහළ කොටසෙහි වල් වැවී ඇත.

iii. දිශා දැක්වීමෙහි

කොළඹින් උතුරට වාහන ගමනාගමනය සීමා කර තිබේ.
නගරයෙන් මෙපිටට වායු දූෂණය සිදු වී නැත.

## ක්‍රියාකාරකම 19

❀ දී ඇති අවධි විභක්ත්‍යර්ථ පද යොදු වාක්‍යවල හිස්තැන් පුරවන්න.

1. ගොවියා .............................. එතෙර හේනක් කොටයි.
2. පියල් .............................. සමත් ව කොළඹ රැකියාවට ගියේ ය.
3. .............................. තොර උගත්කම නිෂ්ඵල ය.
4. .............................. පරෙස්සම් වන්න.
5. .............................. පසු මා අමතන්න.
6. .............................. පැරදී මන්ත්‍රීතුමා දේශපාලනයෙන් සමු ගත්තේ ය.
7. .............................. එකෙක් එක් දෙයකට වෙයි සමත.
8. .............................. පහළ සංඛ්‍යාවක් කියන්න.

(පැයකින්, ලොවින්, ගඟින්, හික්මීමෙන්, බල්ලාගෙන්, දහයෙන්, ඡන්දයෙන්, විභාගයෙන්)

### සම්බන්ධ විභක්තිය

යමෙකුට හෝ යමකට ඇති සම්බන්ධතාව, අයිතිය දක්වන පද සම්බන්ධ විභක්ති ගනී.

සිදත් පාඨය **"සබඳ වෙසෙසන වත උනුන් පිළිබඳ වත්නෙන්"** "ඒ ඒ අයට අයත් බැවින් විශේෂ කරන්නා වූ වස්තුව සම්බන්ධ අර්ථයෙහි වේ ය" යනු එහි අර්ථය යි.

### සම්බන්ධ විභක්ති ප්‍රත්‍යයෝ

ඒක වචන - ගේ, අගේ, ආගේ, උගේ, ඒ
බහු වචන - අන්ගේ, උන්ගේ, න්ගේ, වල

**ඒක වචන ප්‍රත්‍යයෝ**

ගේ - ඔහුගේ මතය විද්වතුන් පිළිගන්නේ නැත. (ඔහු + ගේ)
අගේ - ගෘහණියගේ අගය දනෙන්නේ ඇය නිවසින් බැහැර වූ විට ය. (ගෘහණී + අගේ)
ආගේ - මිනිසාගේ යුතුකම මිනිසාට සේවය කිරීම යි. (මිනිස් + ආගේ)
උගේ - පුතුගේ සෙනෙහස මවට සම්පතකි. (පුතා + උගේ)
ඒ - මලේ රුව බලන් අතු අග පිපෙන කොට (මල් + ඒ)

**බහු වචන ප්‍රත්‍ය**

අන්ගේ - මේ කාගේ දෝ කමතා.
සැම දෙවියන්ගේ කමතා. (දෙවි + අන්ගේ)
උන්ගේ - මිනිසුන්ගේ නායකයා යන අරුතින් රජුට නරපති යැයි පැවසේ.
(මිනිස් + උන්ගේ)
න්ගේ - කපටින්ගේ බසින් දනෝ මුලා වෙති. (කපටි + න්ගේ)
වල - සැඬ සුළඟින් ගෙවල පියසි බිමට ඇද වැටුණි. (ගෙ + වල)

විභක්ති ප්‍රත්‍ය නොගෙන ද සම්බන්ධාර්ථය ප්‍රකාශ කෙරේ.

පියසෙනෙහස - (පියාගේ සෙනෙහස)
නළඟනරැඟුම - (නළඟනන්ගේ රැඟුම)
මල්සුවඳ - (මලේ සුවඳ)

## සම්බන්ධ විභක්ති ප්‍රයෝග

i. සම්ප්‍රදානාර්ථයෙහි සම්බන්ධ විභක්තිය

කිරිඅම්මාවරුන්ගේ දානය (කිරිඅම්මාවරුන්ට දෙන දානය)
මළවුන්ගේ දානය (මළවුන් සඳහා දෙන දානය)

ii. ප්‍රමාණාර්ථයෙහි

රුපියලේ කාසිය
වී බුසලක වපසරිය

iii. යුක්තාර්ථයෙහි

තට්ටු දෙකේ බස් එකක්
පල දෙකේ වහලය

## ක්‍රියාකාරකම 20

**පහත සඳහන් වාක්‍යවල ඇති සම්බන්ධ විභක්ත්‍යර්ථ පද උපුටා දක්වන්න.**

1. ගොවි පුතා උදයෙන් ම හේනට ගියේ ය.
2. අඩි හතරේ වළක් කණින්න.
3. ඤාතීහු හත් දවසේ දානය දීමට සැරසෙති.
4. රජ පිරිස මාලිගයෙන් නික්මුණහ.
5. කෝට්ටේ යුගය පද්‍ය සාහිත්‍යයෙහි දීප්තිමත් අවධිය විය.

## ආධාර විභක්තිය

යම් දැරීමක් හෝ ඉසිලීමක් අඟවන නාමය ආධාර විභක්තිය ගනී.

"කතු කම් බැරි කිරිය දරනුයෙ අදර නම් වේ"

යනු සිදත් සඟරා පාඨය යි. "කර්තෘහට හෝ කර්මයට හෝ බාර ක්‍රියාව දරන්නේ ආධාර නම් වේ" යනු එහි අර්ථය යි.

උදා - ළමයා පුටුවේ හිඳී.
හැළියේ බත් ඇත.

**ආධාර විභක්ති ප්‍රත්‍යයෝ**

ඒක වචන - ඒ, එහි, හි, ඇ
බහු වචන - අන්හි, වල, වලැ

**ඒක වචන ප්‍රත්‍ය**

ඒ - ගමේ වසන්නෝ ගම් වැසියෝ ය. (ගම් + ඒ)
එහි - පියුමෙහි පැණි බොති වන බමරු (පියුම් + එහි)
හි - හිරු නැගෙන කල්හි පිනි නොතිබේ. (කල් + හි)
ඇ - බිසව තම සිතැ උපන් දෙළ රජුට පැවසුවා ය. (සිත් + ඇ)

**බහුවචන ප්‍රත්‍ය**

අන්හි - පදයන්හි අරුත් ශබ්ද කෝෂය බලා ඉගෙන ගන්න. (පද + අන්හි)
වල - පොත්වල පරිච්ඡේද බෙදා ඇත. (පොත් + වල)
වලැ - බඳුන්වලැ පැන් පුරවා ඇත. (බඳුන්+ වලැ)

## ආධාර විභක්ති ප්‍රයෝග

i. සමීපාර්ථයෙහි නිපාත වන වෙත, කෙරෙහි, කෙරේ යන පද සමග යෙදෙන නාම පද ආධාර විභක්ති ගනී.

වෙත - නොවසව තෙපි මවෙත
කෙරේ - සුරාසොඬුන් කෙරේ සබවසක් කොහි ද?
කෙරෙහි - කලණ මිතුරන් කෙරෙහි විශ්වාසය රඳවන්න

ii. නිර්ධාණාර්ථයෙහි ආධාර විභක්ති

ඉන්ධන ප්‍රභවයන් අතර විදුලිය පරිසර හිතකාමී ය.
මිනිසුන් අතරෙහි නොමිනිස්සු ද වෙති.
දේශපාලනඥයන් අතරේ ද අවංක පුද්ගලයෝ වෙති.

## ක්‍රියාකාරකම 21

* පහත දී ඇති වාක්‍යවල යෙදුණු ආධාරාර්ථවත් පද උපුටා දක්වන්න.

1. දරුවෝ නිදහසේ දුව පැන ඇවිදිති.
2. එළදෙන කණුවෙහි බැඳ ඇත.
3. වස්සාන සමයෙහි භික්ෂූන් වස් විසිය යුතු ය.
4. සීත කරයි උඳුවප් මහ දුරුත්තේ.
5. මම ලබන අවුරුද්දේ විභාගයට පෙනී සිටිමි.

### ආලපන විභක්තිය

ආමන්ත්‍රණයෙහි යෙදෙන පද ආලපන විභක්තිය ගනී.

**"එවියූ අලප් නම් ඇමතුම් තමා අමුකැරැ"**

"තමා අභිමුඛ කොට ආමන්ත්‍රණය කිරීමක් වෙයි නම් එය ආලපන නම්" යනුවෙන් සිදත් සඟරාවේ ආලපන විභක්තිය හඳුන්වා ඇත.

### ආලපන විභක්ති ප්‍රත්‍යයෝ

ඒක වචන - අ, ඇ, ආ, එ, ඒ, ඔ, ඕ
බහුවචන - ඉනි, එනි, නෙනි, නි, අනි, උනි

#### ඒක වචන ප්‍රත්‍යයෝ

අ - දරුව, පමා නොවන්න. (දරු + අ)
ඇ - පුතැ, සිහි එළවා ගන්න. (පුත් + ඇ)
ආ - මහත්මයා, කරුණාකර සන්සුන් වන්න. (මහත්ම + ආ)
එ - තාත්තෙ, බොන්න එපා. (තාත්ත + එ)
ඒ - අයියණ්ඩියේ බිය නොවන්න. මැරෙන හැටි මම පෙන්වන්නම්. (අයියණ්ඩි + ඒ)
ඔ - කොලුවො ඔහොම කාල නම් මදි. (කොලු + ඔ)
ඕ - පවු කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා. (ගොන් + ඕ)

#### බහු වචන ප්‍රත්‍ය

ඉනි - සිංහලයිනි අවදි වව්. බුද්ධගයාව බේරා ගනිව්. (සිංහල + ඉනි)
එනි - දරුවෙනි, මේ ගැනත් සිතන්න. (දරු + එනි)
නෙනි - වත්නෙනි, ඉසුරුමත් නොවව්. (වත් + නෙනි)
(පොහොසතුනි ඉසුරින් මත් නොවව්)
නි - සැදැහැවත්නි, පන්සිල් සමාදන් වීමට පෙර නමස්කාර පාඨය කියන්න.
(සැදැහැවත් + නි)

අනි - කාන්තාවනි, පෙරට එන්න. (කාන්තා + අනි)
උනි - සෙබළුනි, සතුරන් ගැන අවදියෙන් සිටින්න. (සෙබළ + උනි)

සංඥා නාම ආමන්ත්‍රණයේදී ප්‍රත්‍යයන් සහිත ව හෝ රහිත ව හෝ යෙදේ.

| | |
|---|---|
| උදා - මලණ්ඩ තිස්සයෙනි, (එනි) | නිශ්ශංක, (ප්‍රත්‍ය රහිත ව) |
| ශාරිපුත්‍රය, (අ) | අශෝක, (ප්‍රත්‍ය රහිත ව) |
| මාලිනියේ, (ඒ) | ගුණපාල, (ප්‍රත්‍ය රහිත ව) |
| නන්දවතියෙ, (එ) | රූපවතී, (ප්‍රත්‍ය රහිත ව) |

ආමන්ත්‍රණ පදවලට පෙරටුව බොල, කොල, එම්බා, හෙම්බා, එම්බල, පින්වත්, වැනි පද යෙදේ.

උදා - බොල පවිටු තැනැත්ත,
කොල අඥානය,
එම්බා දරුවනි,
හෙම්බා නරය,
එම්බල රාජ පුරුෂය,
පින්වත් මහණෙනි,

## අව්‍යය පද

ව්‍යය නොවනුයේ හෙවත් වෙනස් නොවනුයේ 'අවිය' හෙවත් 'අව්‍යය' යන්නෙහි අදහස යි. එබඳු වෙනස් නොවන හෙවත් වර නොනැගෙන ශබ්ද විශේෂ දෙකකි. එනම්
නිපාත හා
උපසර්ග යි.

නාම හා ක්‍රියා; විභක්ති සංඛ්‍යා, ලිංග ආදිය නිසා වෙනස් වෙතත් නිපාත හා උපසර්ග එසේ වෙනස් නොවේ; හෙවත් වරනොනැගේ. එම නිපාත හා උපසර්ග යනු කවරේ ද, ඒවායින් භාෂාවට සිදු වන මෙහෙය කුමක් ද, ඒවායේ ප්‍රභේද ආදිය පිළිබඳ ප්‍රමාණාත්මක අවබෝධයක් මෙම පාඩමෙන් ඔබට ලද හැකි ය.

### නිපාත

අර්ථවත් වාක්‍ය නිර්මාණය කිරීමෙහිලා නාම පද හා ආඛ්‍යාත පද අතර හෝ වාක්‍යාංශ අතර හෝ නිසි ලෙස වැටෙන එහෙත් නාම පද හෝ ආඛ්‍යාත පද ගණයට අයත් නොවන පද විශේෂයක් ලෙස නිපාත හැඳින්විය හැකි ය. "නිපාත" යන්නෙහි අර්ථය වන්නේ (නිපාත) නිසි ලෙස පතනය වීම හෙවත් නිපතනය වීම යි. නිපාත පදවලින් කෙරෙන්නේ වාක්‍යයක් තුළ පද අතරේ සම්බන්ධතා දැක්වීමත් සංකීර්ණ වාක්‍යයක් තුළ වාක්‍යාංශ අතරේ සම්බන්ධතා දැක්වීමත් ය. ඒවා මගින් වාක්‍ය අර්ථවත් කිරීම සිදු වේ.

මව දර සොයනු අසල්වැසි කාන්තාවක කැලයට ගිය ඇදහැළුණු මහ වැස්ස ඔවුන්ට ඒමට සිදු විය.

මෙම අර්ථවත් නොවූ වචන සමූහය නිපාත යෙදූවිට අර්ථවත් වාක්‍යයක් වන ආකාරය බලන්න.

මව දර සොයනු පිණිස අසල්වැසි කාන්තාවක සමග කැලයට ගිය නමුත් හදිසියේ ම ඇදහැළුණු මහ වැස්ස නිසා ඔවුන්ට ආපසු ඒමට සිදුවිය.

ඉහත දක්වා ඇති නිදසුන මගින් පද අතර හා වාක්‍යාංශ අතර නිසි ලෙස නිපාත යෙදීම නිසා වාක්‍යයක් අර්ථ පූර්ණ වන ආකාරය පැහැදිලි වේ. එසේ ම පද අතර හා වාක්‍යාංශ අතර සම්බන්ධතා ඇති වන අයුරු ද පැහැදිලි වේ.

### 1. විභක්ත්‍යර්ථ නිපාත/ විභක්ති සූචක නිපාත

විසින්, කෙරෙන්, කෙරෙහි, තුළ, මත

උදා - මිනිසුන් විසින් කරන ලද වැඩ (කර්තෘ විභක්ති)
දුදනන් කෙරෙන් (අවධි විභක්ති)
අප කෙරෙහි (ආධාර විභක්ති)
මිතුරන් තුළ (ආධාර විභක්ති)
දෙමාපියන් මත (ආධාර විභක්ති)

### 2. උපමා වාචක නිපාත

මෙන්, සේ, වැනි, බඳු, එව්, වගේ, වන්, අයුරු, ලෙස, විලස

උදා - සුළඟ වගේ
සතුරන් මෙන්

### 3. කාලාර්ථයේ නිපාත

නිති, නිතර, ඉක්බිති, අනතුරු, දැන්, යළි, යළ, පුන, නිරතුරු, ඉතින්, පැසුළු, පසු, තව, නැවත

උදා - එ හසුන් පැසුළු පවසමි රස නුසුන් කොට

### 4. සහ අර්ථයෙහි නිපාත

සහ, සමග, හා, කැටුව, ඉහි

උදා - සුරන් සහ සහසැස්
ශිෂ්‍යයන් සමග

**5. සමුච්චයාර්ථයෙහි නිපාත**

ද, ත්, සහ, හා, යි

උදා - මව සහ දරුවා
මව ද පියා ද
ඔබ යි මම යි

**6. භාවාර්ථයේ නිපාත (හැඟීම් දැනවීමේ)**

විස්මාර්ථයෙහි - හා, අහා, ඔහෝ
ඛේදාර්ථයෙහි - අහෝ, අනේ, අඳෝ, අපොයි, අය්යෝ
වේදනාර්ථයෙහි - ආයි, ඌයි, ආ
කුප්සිතාර්ථයෙහි - චී චී, චිඃ, සී සී, ඊ, ඉකේ, චිකේ
(පිළිකුල දැනවීමේ)

උදා - අහෝ දෙව්දත් නොදුටි මොක්පුර

**7. අවධාරණාර්ථයේ නිපාත**

නම්, යත්, වනාහී, වූ කලී, ම, කැලම

උදා - කෝට්ටේ යුගය වනාහී පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය යි.

**8. ප්‍රශ්න වාචක අර්ථයේ නිපාත**

ඇයි, මන්ද, කුමක්ද, කෙසේද, කවදාද, ද

උදා - ඔහු මිලදී ගත්තේ කුමක්ද?

**9. විකල්පාර්ථයේ නිපාත**

හෝ, නොහොත්, හොත

උදා - සභාපති නොහොත් ලේකම් සභාව අමතනු ඇත. (දෙදෙනාගෙන් කෙනෙකු)

**10. ප්‍රමාණාර්ථයෙහි නිපාත**

ඒ සා, ඒ තාක් මෙතුවක්, තරම්, විතර, අච්චර, මෙච්චර

උදා - මෙතුවක් කල් මුව මඬල වසා සිටි අන්ධකාර සළු පටින් මුදා

**11. විනාර්ථයෙහි නිපාත**

විනා, මිස, මුත්, හැර

උදා - නැත අන් සරණා ඔබ හැර මෙමටා

## 12. ලක්ෂ්‍යාර්ථයෙහි නිපාත

අන්න, ඔන්න, මෙන්න, තෙල, තෙලේ, අර, ඒ, මේ

උදා - අන්න, අන්න ඇතා කුලප්පු වෙලා

## 13. ශ්‍රැති සූචනාර්ථයෙහි නිපාත

ල, ලු

උදා - ඔවුහු සත්‍යය ම පවසත් ලු
අපි අයහපත ම දකින්නමෝ ලු
මම පිළිතුර දනිම් ලු
මා පිළිතුර දන්නවා ලු

## 14. හේත්වර්ථයෙහි නිපාත

පිණිස, සඳහා, උදෙසා. අරබයා, අරභයා, ඇරබ, නිසා, බැවින්, හෙයින්, හේතුවෙන්

උදා - බුදුසසුනෙහි උකටලී වූ භික්ෂුවක් අරබයා මේ ජාතකය දේශනා කළ සේක.

## 15. සීමාර්ථයෙහි නිපාත

පූර්ව සීමා - සිට, පටන්
අපර සීමා - තෙක්, දක්වා, ට, තුරු

උදා - පැළලුප් නුවර තෙක් (පැළලුප් නුවර ඇතුළත් ව)
පැළලුප් නුවර දක්වා (පැළලුප් නුවර හැර ඉන් මෙහා සීමාව තෙක්)

## 16. නිෂේධනාර්ථයෙහි නිපාත

එපා, තහනම්, නහමක්, නො

උදා - වාහන ඇතුළු කිරීම තහනම්

## 17. විරුද්ධාර්ථයෙහි නිපාත

නො, නි, අ

උදා - මිනිස් - නොමිනිස්
අවුල් - නිරවුල්
වහල් - නිවහල්

උදා - නිවහල් සමාජයක් බිහි කරමු.

## 18. ආමන්ත්‍රණාර්ථයෙහි නිපාත

එම්බා, එම්බල, බොල, කොල හෙම්බා, හෙම්බල, ඒයි, ඕයි, පින්වත්

උදා - එම්බා පාපිෂ්ඨය,
පින්වත් මහණෙනි,

### 19. වාක්‍ය සමාප්ති වාචක නිපාත

ඉ, ය, යි, යැ, හ

උදා - ඈ ශිෂ්‍යාවකි.
ඕ ගියා ය.
ඔවුහු තරුණය හ.

### 20. ශීඝ්‍රාර්ථයෙහි නිපාත

වහා, හනික, සහස, සෙද, සැණින්, තුමුටු, විස්සල්

උදා - වහා ගිනි ඇවිළෙන සුලු ය.
හනික එන්න.

### 21. ප්‍රමාදාර්ථයෙහි නිපාත

හෙමින්/ සෙමින් -

උදා - දොර හෙමින් වසන්න.

### 22. අනුකූලාර්ථයෙහි නිපාත

අනුව, පරිදි

උදා - මේ අනුව
ඉහත දැක්වූ පරිදි

### 23. අනියමාර්ථයෙහි නිපාත

හොත්, නම්, ද

උදා - ණය වුවහොත් ජීවිතය දුෂ්කර වනු ඇත. (වුව + හොත්) මුදල් ලැබේ නම් ණය වීමත් ජීවිතය දුෂ්කර වීමත් සිදු නොවනු ඇත.
ණය ලැබුණ ද කාර්ය ය නිම කළ නොහැකි යි.

## ක්‍රියාකාරකම 22

**වරහන් තුළ ඇති නිපාත අතුරින් ගැළපෙන නිපාතය ගෙන හිස්තැන් පුරවන්න.**

1. කම්කරුවන් ........................ පාලකයා අතර සාකච්ඡාවක් පැවැත්වේ. (හෝ/ හා)
2. ඔවුන් ........................ මගේ අමනාපයක් නැත. (සමග/ හෝ)
3. දෙවියෝ ...................... සාදුකාර දුන්හ. (හැර/ පවා)
4. අද මට මිතුරා ....................... සතුරා මුණ ගැසෙනු ඇත. (හෙවත්/ නොහොත්)
5. යාචකයෝ ......................... හිඟන්නෝ නගරයේ බොහෝ වෙති. (හෙවත්/ නොහොත්)
6. ආහාර ........................ ජීවත් වෙනවා මිස ආහාර .................... ජීවත් නොවිය යුතු ය. (සඳහා/ නිසා)

7. පෙළපාළිකරුවන් නගරයට ඇතුළු වීම වළක්වනු ලැබූ නිසා ඔවුන්ට නගරය ............................ ගමන් කිරීමට හැකි විය. (තෙක්/ දක්වා)
8. රෑ වැටුණු වළේ ඔවුන් .......................... දවල් වැටෙනු නැත. (යළි/ විනා)
9. මම ඒ ............................ වැඩි විස්තර නොදනිමි. (පිණිස/ පිළිබඳ)
10. සැණකෙළිය නිමා විය. .......................... හෙට දිනය තෙක් එය දීර්ඝ කරන ලෙස බොහෝ ඉල්ලීම් ඉදිරිපත් වී තිබේ. (එහෙත්/ නමුත්)
11. සැණකෙළිය නිමා වූ ............................ හෙට දිනය තෙක් එය දීඝී කරන ලෙස බොහෝ ඉල්ලීම් ඉදිරිපත් වී තිබේ. (එහෙත්/ නමුත්)
12. සාමාජිකයන් .......................... බාහිර අයට මෙහි ඇතුළු විය නොහැකි ය. (යළි/ විනා)

## ක්‍රියාකාරකම 23

**පහත සඳහන් කවි කතාවේ දක්වෙන නිපාත පද උපුටා දක්වන්න.**

ගෙයිමුල්ලේ අල්මාරිය මුදුනේ
දෙවියන්ගේ රූපය වැඩ ඉඳුවා
උදේට හවසට දවසක් ගානේ
ඒ රූපෙට ගමරාල වඳිනවා

දෙවියන් හට වැඩි ලොක්කෙකු ලෝකේ
ඇති වූයෙත් නෑ ඇති වන්නෙත් නෑ
මැරෙන තුරුත් මැරුණායින් පස්සෙත්
දෙවියන්ගේ ඇර වෙන පිහිටක් නෑ

දවසක් දා අල්මාරිය මුදුනින්
මීයෙකු දුවගෙන දුවගෙන එද්දී
දෙවි රූපය බිම ඇදගෙන වැටුණා
දෙවියන්ටත් වැඩි ලොක්කෙකි මීයා

ඊට පසුව මීයකු අල්ලා ගෙන
ඌට වඳියි ගමරාල සිරිත් ලෙස
ගෙදර හිටිය බළලා එක් දවසක්
ඒ මීයා ගොදුරට අරගත්තා

දෙවියන්ටත් මීයාටත් වැඩියෙන්
ලොක්කෙකු නොවැ බළලා ඇන්නැවේ
බළලාහට ගමරාලගෙ සැලකුම්
වැඳුම් පිදුම්වල අඩුවක් නම් නැනේ

දවසක් ගෙයි බත් මුට්ටිය ඇතුළට
හොට දමලා ගම බිරිඳට අසුවී
බළලා ඉලපත් පාරක් කනු දුටු
ගමරාලට හරියට සන්තෝස යි

දෙවියන්ටත් වැඩි ලොක්කෙකි මීයා
මීයාටත් වැඩි ලොක්කෙකි බළලා
බළලාටත් වැඩි ලොක්කා දෙයියෝ !
මගේ හාමිනේ මගේ හාමිනේ

හාමිනේට වැඩි ලොක්කෙකු ලෝකේ
ඇති වූයෙත් නෑ ඇති වන්නෙත් නෑ
මැරෙන තුරුත් මැරුණායින් පස්සෙත්
හාමිනේගෙ ඇර වෙන පිහිටක් නෑ

උදේට හවසට දවසක් ගානේ
හාමිනේට ගමරාල වඳිනවා

- පුංචි අයට කයිකතන්දර
මහගමසේකර -

## උපසර්ග

පදයක මුලින් වැටීම හෙවත් ළංව වැලඳ ගැනීම යන අර්ථයෙන් බොහෝ ව්‍යාකරණ ග්‍රන්ථවල උපසර්ග හඳුන්වා දී තිබේ. එසේ ම උපසර්ග, පද විශේෂයක් ලෙස ද දක්වා තිබේ. නාමයකට හෝ ධාතුවකට පූර්වයෙන් ඒ හා බැඳී පවතින පද අණු විශේෂයක් ලෙස උපසර්ග හැඳින්වීම යෝග්‍ය ය. එසේ ම ඒවා නාම ප්‍රකෘතිවලින් හා ධාතු ප්‍රකෘතිවලින් වෙන් කොට නොදැක්වෙන බැවින් ද කේවල පද වශයෙන් යෙදෙන විට ඒවායින් වෙන ම අර්ථ නොසැපයෙන බැවින් උපසර්ග, පද විශේෂයක් කොට දැක්විය නොහැකි ය. නාම ප්‍රකෘති හා ධාතු ප්‍රකෘති අගට යෙදෙන ප්‍රත්‍ය, පද විශේෂයක් කොට නොසලකන්නා සේ ම ඒවාට පූර්වයෙන් යෙදෙන උපසර්ග ද, පද අණු විශේෂයක් වන බැවින් ඒවා පද ලෙස සැලකීම නුසුදුසු ය.

නාම ප්‍රකෘතිවලට හා ධාතු ප්‍රකෘතිවලට මුලින් යෙදී ඒවායේ අර්ථයට කිසියම් බලපෑමක් කිරීම උපසර්ගවලින් කෙරෙන කාර්‍ය්‍ය යි. එසේ සිදු වන බලපෑම විවිධාකාර වෙයි.

1. පවත්නා අර්ථය තීව්‍ර කිරීම
2. පවත්නා අර්ථයට සමාන අර්ථයක් දීම
3. පවත්නා අර්ථයට වෙනස් අර්ථයක් දීම
4. පවත්නා අර්ථයට විරුද්ධ අර්ථයක් දීම

### 1. පවත්නා අර්ථය තීව්‍ර කිරීම

| | |
|---|---|
| උත්තම - අත්‍යුත්තම | ධාවන - අතිධාවන |
| ශුද්ධ - පාරිශුද්ධ | පිරිසිදු - සුපිරිසිදු |
| බල - පබල | සංයෝජන - සුසංයෝජන |

### 2. පවත්නා අර්ථයට සමාන අර්ථයක් දීම

| | |
|---|---|
| දොස් - සදොස් | සල - සසල |
| තොස - සතොස | බඳ - සබඳ |
| අල්ප - ස්වල්ප | බාධක - සම්බාධක |
| යැදීම් - අයැදීම් | |

## 3. පවත්නා අර්ථයට වෙනස් අර්ථයක් දීම

| | |
|---|---|
| අර්ථ - අන්වර්ථ | මාන - අනුමාන |
| වදන් - පිළිවදන් | ගන් - පිළිගන් |
| වදන් - ඔවදන් | නිපාත - සන්නිපාත |

## 4. පවත්නා අර්ථයට විරුද්ධ අර්ථයක් දීම

| | |
|---|---|
| පක්ෂ - ප්‍රතිපක්ෂ/ විපක්ෂ | කුසල් - අකුසල් |
| නුවණ - අනුවණ | ආර්ය - අනාර්ය |
| වැරැදි - නිවැරැදි | මඟ - නොමඟ |

සිදත් සඟරාවේ උපසර්ග 20ක් දක්වා ඇතත් භාවිතයේ පවත්නා උපසර්ග ප්‍රමාණය ඊට අධික ය.

| | |
|---|---|
| 1. ප - පබල | 2. පර - පරදෙස් |
| 3. අව - අවගුණ | 4. ස - සබඳ |
| 5. අනු - අනුරූ | 6. නි - නිරොද (ඕජස්/ කෙලෙස් රහිත) |
| 7. දු - දුබල | 8. වි - විමල |
| 9. අ - අයැදීම් | 10. අදි - අදිපති |
| 11. සු - සුදන | 12. උ - උදුල |
| 13. අබි - අබිමන් | 14. පිරි - පිරිපුන්(මනාව පිරුණු) |
| 15. උප/ උව - උපනය (පැමිණවීම), උවසර උපචාර) | 16. අප - අපගම (ඉවත් වීම) |
| 17. පස් - පසක් (ප්‍රත්‍යක්ෂ) | 18. පිළි - පිළිගන් |
| 19. අති/ ඉ - අතිගුණ (ශ්‍රේෂ්ඨ ගුණ) , ඉබොහෝ | 20. පි - පිහිකුළු (වැසුණු) |

පාලි, සංස්කෘත, භාෂාවල ආභාසයෙන් පැමිණි උපසර්ග සමග භාවිතයේ පවත්නා උපසර්ග සංඛ්‍යාව විශාල ය. පහත නිදසුන් සහිත ව දක්වා ඇත්තේ එබඳු උපසර්ග ය.

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | - | අමනුෂ්‍ය | අභි | - | අභිනිෂ්ක්‍රමණ |
| අති | - | අතිකාල | අධි | - | අධිරාජ්‍ය |
| අනු | - | අනුපිළිවෙළ | අප | - | අපද්‍රව්‍ය |
| අව | - | අවජාත | ඉ | - | ඉමිහිරි |
| උත් | - | උද්වේග (ත් + ද් බවට පත් වේ) | උප | - | උපදේශ |
| තත් | - | තත්සම | දුර් | - | දුර්විපාක |
| නිර් | - | නිර්දෝෂී | පරි | - | පරිහානි |
| පුනර් | - | පුනර්ජනනීය | ප්‍ර | - | ප්‍රභේද |
| ප්‍රති | - | ප්‍රතිපූර්ණ | ප්‍රාක් | - | ප්‍රාක්ධන > ප්‍රාග්ධන |
| බහිර් | - | බහිර්ජනන | වි | - | විපක්ෂ |

| | | | | | |
|---|---|---|---|---|---|
| සං | - | සංවර්ධන | සත් | - | සත්පුරුෂ |
| සහ | - | සහසම්බන්ධය | ස්ව | - | ස්වදේශී |
| ස්වයං | - | ස්වයංපෝෂණ | කු | - | කුමන්ත්‍රණය |
| දුෂ් | - | දුෂ්ප්‍රතිපත්ති | | | |

## ක්‍රියාකාරකම 24

- 'අ' වෘත්තයේ ඇති උපසර්ග 'ආ' වෘත්තයේ ඇති ප්‍රකෘති සමග ගළපා 'ඇ' වෘත්තයේ ලියන්න.

අ

අව, උප, උත්, සහ, පුනර්, තත්, අනු, අති, පරා, ප්‍ර, දුර්, පරි, දු, නිර්, ස්ව, පස, අනු, සං

ආ

වර්ධන, අවබෝධ, මෝදනා, වර්ධන, සිරිත්, රස, ජනනීය, භාර, මිතුරු, ජීවන, ශුද්ධ, කාලීන, ලක්ෂණ, කෘෂ්ට, දන්ත, උත්සහය, වර්තන

ඇ

1. ..................
2. .................. 3. ..................
4. ..................
5. .................. 6. ..................
7. .................. 8. ..................
9. .................. 10. ..................
11. .................. 12. ..................
13. .................. 14. ..................
15. .................. 16. ..................
17. ..................

## සුභාෂිත

අකුරට පදයට
වැකියට අරුතට
දොස පිස බලය කවා

අසදිස හෙළ බස
ළෙහි ලා පුද දෙමු
සිරිසරසවි කැඳවා

**- අරිසෙන් අහුබුදු -**

## සුචින්තන

අවස්ථා යනු ප්‍රවාහයකි. ඉන් ඔබට හිමි ප්‍රමාණය ඔබ අත ඇති විසල් බඳුන හෝ කුඩා හැන්ද හෝ මත තීරණය වනු ඇත.

# 03

# සන්ධි

සිංහල භාෂාවේ පද සාධන ක්‍රම අතරින් පද කෙටි කරන හෝ කැටි කරන ක්‍රම දෙකකි. එනම් සන්ධි සහ සමාස යි. එයින් සමාසය, පද අතර සම්බන්ධතාවක් වන අතර සන්ධිය අක්ෂර අතර සම්බන්ධතාවකි. භාෂණ ව්‍යවහාරයේ පද ශබ්ද කිරීමේදී එම පද අතර විවිධාකාර විපර්යාසයන් සිදු වෙමින් වාගාලාප ගලාගෙන යන්නේ කඳු හෙල් මිටියාවත් ගල්පර ආදිය පසු කරමින් යන ජල ප්‍රවාහයක් මෙනි. එහිදී ඇතැම් ශබ්ද ඉවත් වෙයි. තවත් විටෙක පවතින ශබ්ද වෙනස් වෙයි. මෙය නිරායාසයෙන් සිදුවන්නක් වන අතර එය සන්ධි වීම නම් වේ. ලේඛනයේදී පද සන්ධි වීමට අමතරව සන්ධි කිරීම ද සිදු වේ. ඒ අනුව සුමට සුසිනිඳු භාෂා ව්‍යවහාරයකට **“සන්ධි”** යන ව්‍යාකරණාංගය අත්‍යවශ්‍ය සාධකයකි. මෙම පාඩමෙන් අවධානය යොමු කෙරෙන්නේ ලේඛන කාර්යයේදී පද සන්ධි කිරීම සම්බන්ධව යි.

සිසි වන වුවන ඉඟ සුඟ ගත හැකි    මිටින
නිසි පුළුලුකුල රිය සකයුරු තිසර    තන
දිසි රනලියෙව් රූ සිරි යුත්    මෙපුරඟන
ඇසි පිය හෙළන පමණින් නොවෙති    දෙවඟන

- සැලළිහිණි සන්දේශය -

ඉහත පද්‍යය පාදයක මාත්‍රා 18 බැගින් යෙදෙන සමුද්‍රඝෝෂ විරිතෙන් රචනා වූවකි. ඉරි ඇඳි පද කෙරෙහි අවධානය යොමු කරන්න. ඒ සියලු ම පද වනාහි පද දෙකක එකතුවකින් සැදුණු පදයෝ වෙති. ඒවා සන්ධි පද යි. ඒවායේ විසන්ධි රූප මෙසේ දැක්විය හැකි ය.

| විසන්ධි පද | | සන්ධි පද |
|---|---|---|
| පුළුල් + උකුල | > | පුළුලුකුල |
| රියසක + අයුරු | > | රියසකයුරු |
| රනලිය + එව් | > | රනලියෙව් |
| පුර + අඟන | > | පුරඟන |
| දෙව් + අඟන | > | දෙවඟන |

ඒවා සන්ධි නොකර පද්‍යයේ යෙදුයේ නම්

- උච්චාරණය මෙතරම් පහසු නොවේ.
- ලිවිය යුතු අකුරු ප්‍රමාණය ද වැඩි වේ.
- පද්‍යයේ මාත්‍රා ගණන වෙනස් වේ.
- භාෂා ඥානයේ පරිණත බවක් නොපෙනේ.

ඒ අනුව භාෂාවේ පද සන්ධි කිරීමේ පරමාර්ථ කිහිපයක් දැක්විය හැකි ය.
එනම් -

- උච්චාරණ පහසුව (සුබෝච්චාරණය) } අකුරු අඩු වීම හෙවත්
- ලේඛන පහසුව } අල්පාක්ෂරතාව නිසා
- පද්‍යකරණයේදී අවශ්‍ය මාත්‍රා ගණන ගළපා ගැනීම
- භාෂාවේ ව්‍යක්ත බවක් ඇති කිරීම
- භාෂාව රසවත් වීම

පූර්වෝක්ත පරමාර්ථ සාධනය කරනු වස් යෙදෙන පද සන්ධි කිරීම සිදත් සඟරාවේ විග්‍රහ වාක්‍ය දෙකකින් දක්වා ඇත.

**"පෙර'පර වණන් ගළපනු සඳ නම්" ...**
**"පෙර'පර වණන් නිසි විදිනි ගළපනු සඳ නම්"...** යනුවෙනි.

මෙම විග්‍රහයන් සඳහා සංස්කෘත ව්‍යාකරණයේ ආභාසය ඍජු ව ලැබෙන්නට ඇති බව සාරස්වතයෙහි සඳහන්,

**"පූර්වාපර වර්ණයෝඃ සන්ධානම් සන්ධිඃ"**
(පූර්වාපර වර්ණයන්ගේ එකට ගැළපීම සන්ධිය යි) යන පාඨය අනුව පෙනේ.

දහතුන් (13) වන සියවසේ පද්‍යකරණයට සීමා වූ සිදත් සඟරාවේ උක්ත විග්‍රහය වර්තමාන ව්‍යවහාර ව්‍යාකරණයට ප්‍රමාණවත් නොවේ.

සන්ධි, සිදු වන ආකාරය අනුව ප්‍රධාන ප්‍රභේද දෙකකි. එනම්,

1. අභ්‍යන්තර සන්ධි
2. බාහිර සන්ධි

## අභ්‍යන්තර සන්ධි

යම් පදයක් තුළ ම අක්ෂර ගැළපීමක් සිදු වේ නම් හෙවත් ප්‍රකෘතියක් හා ප්‍රත්‍යයක් එකතු වී පද සන්ධි වී ඇත්නම් ඒ අභ්‍යන්තර සන්ධි ය.

උදාහරණ - ගම් + ඒ > ගමේ (ස්වර සන්ධි ක්‍රමය)
සිටු + ආණ > සිටාණ (පූර්ව ස්වර ලෝප සන්ධිය)
ගංගා + ඕ > ගංගාවෝ (ආගම සන්ධිය)

පූර්වෝක්ත නිදසුන් පද කිසි ම විටක සන්ධි නොවී යෙදෙන්නේ නැත. එබැවින් ඒවා නිත්‍ය සන්ධි පද වේ. එය වෙන් ව ඇති පද දෙක අතර නො ව එක ම පදයක් (ප්‍රකෘති හා ප්‍රත්‍යය) තුළ ම සිදු වන නිසා අභ්‍යන්තර සන්ධි ලෙස හැඳින්වේ. මේ සඳහා සිදතෙහි නිදසුන් සපයා නැත.

## බාහිර සන්ධි

සිදත් සඟරාවේ නිදසුන් සපයා ඇත්තේ මෙම සන්ධි ක්‍රමයට පමණි. එම යුක්තාර්ථවත් වචන දෙකක් අනුපිළිවෙළින් යෙදීමේදී පෙර පදයේ අග අකුරත් අග පදයේ පෙර අකුරත් අතර වෙනස් වීමක් ඇති කරමින් සිදු කරනු ලබන සන්ධි බාහිර සන්ධි නම් වේ.

උදාහරණ - මාර්ග + ආසන්න > මාර්ගාසන්න
පුරාණ + උක්ති > පුරාණෝක්ති
ඇත් + දළ > ඇද්දළ
මල් + අසුන > මලසුන

මෙවැනි පද අවශ්‍ය වේ නම් විසන්ධි ස්වරූපයෙන් ම වුව ද තැබිය හැකි ය. එබැවින් සන්ධි යන්න මෙසේ විග්‍රහ කළ හැකි ය.

අර්ථයට බාධාවක් නොවන පරිදි, භාෂා සම්ප්‍රදායට අනුගත ව, සුබෝච්චාරණය සහ ලේඛන පහසුව ඇති වන පරිදි, එක ම පදයේ ප්‍රකෘති සහ ප්‍රත්‍යයන් අතර හෝ වෙන් ව ඇති පද දෙකක අන්තයට හෝ ආදියට (අගට හෝ මුලට) හෝ දෙකට ම බලපාන පරිදි ලෝප ආදේශාදි ක්‍රමයක් අනුව සිදු වන අක්ෂර ගැළපීම සන්ධි නම් වේ.

පද දෙකක් සන්ධි කිරීමේදී ඊට අදාළ අක්ෂරයන්ගේ නොගැළපීම සන්ධිය සිදු කිරීමට බාධාවකි. එවිට එම බාධකය දුරලීමට එම අක්ෂරයන්ට සිදු කරනු ලබන විවිධ විපර්යාස "සන්ධි කාර්ය" නමින් හැඳින්වේ. සිදත් සඟරා විග්‍රහ වාක්‍යයේ "නිසි විදිනි"ලෙස හැඳින්වූයේ මෙම සන්ධි කාර්යයන්ට අනුකූලව යන්න යි. එම සන්ධි කාර්යයන් පහත දැක්වේ.

- ලෝපය
- ආදේශය
- ආගමය
- පූර්ව රූපය
- පර රූපය
- ද්විත්ව රූපය
- වෘද්ධිය
- හානිය
- ආරෝහණය
- පෙරළි

## ලෝපය

සිදත් සඟරාවෙහි ලෝපය විග්‍රහ කර ඇත්තේ, **"වණන් අනුසුරුවීම් ලොප් නම්"** යනුවෙනි. උසුරුවීම හෙවත් උච්චාරණය භාෂණයේදී සිදු වන්නක් බැවින් එය ලේඛනය සඳහා "නොලියා හැරීම" විය යුතු ය. එබැවින් අර්ථයට බාධාවක් නොවන පරිදි යම් පදයක ඇති අකුරක් නොලියා හැරීම ලෝපය යි. ලෝපය දෙයාකාර වේ. එනම්,

- **ස්වර ලෝපය**
- **ව්‍යඤ්ජන ලෝපය**

පදයක අර්ථයට බාධාවක් නොවන පරිදි එහි ඇති ස්වරයක් ඉවත් කිරීම ස්වර ලෝපය වන අතර එහි ප්‍රභේද පහකි.

**ආදි ස්වර ලෝපය - මුලින් ඇති ස්වරය ඉවත් කිරීම**

උදා - උතුමා - ~~උ~~තුමා > තුමා
අබරණ - ~~අ~~බරණ > බරණ

**මධ්‍ය ස්වර ලෝපය - මැදින් ඇති ස්වරයක් ඉවත් කිරීම්**

උදා - රුකුම > රුක්ම
නැගුම > නැග්ම

**අන්ත ස්වර ලෝපය - අග ඇති ස්වරය ඉවත් කිරීම**

උදා - අග > අග්
මහත > මහත්

**පූර්ව ස්වර ලෝපය - විසන්ධි පදවල මුල පදයේ අග ඇති ස්වරය ඉවත් කිරීම**

උදා - තෙද + ඇති
තෙද් + ~~අ~~ + ඇති
දැ
තෙදැති

**පර ස්වර ලෝපය - විසන්ධි පදවල පසු පදයේ මුල ඇති ස්වරය ඉවත් කිරීම**

උදා - පැහැ + ඇති
පැහැ + ~~ඇ~~ති
පැහැති

පදයක අර්ථයට බාධාවක් නොවන පරිදි එහි ඇති ව්‍යඤ්ජනාක්ෂරයක් ඉවත් කිරීම ව්‍යඤ්ජන ලෝපය යි. එහි ප්‍රභේද 3 කි.

**ආදි ව්‍යඤ්ජන ලෝපය - මුල ඇති ව්‍යඤ්ජනාක්ෂරය ඉවත් කිරීම**

උදා - හවන > අවන (ශාප කිරීම)
හැල්ම > ඇල්ම
හෙළ > එළ

**මධ්‍ය ව්‍යඤ්ජන ලෝපය - මැද ඇති ව්‍යඤ්ජනාක්ෂරය ඉවත් කිරීම**

උදා - දහවල් > දවල්
මහවැලි > මාවැලි
පොහොය > පෝය

**අන්ත ව්‍යඤ්ජන ලෝපය - අග ඇති ව්‍යඤ්ජනාක්ෂරය ඉවත් කිරීම**

උදා - නාග > නා
පැහැ > පෑ

## ආදේශය

සිදත් සඟරාවෙහි ආදේශය විග්‍රහ කර ඇත්තේ **“වණක්හු ලොපා වණක්හු කිරීම් අදෙස් නම්”** යනුවෙනි. අකුරක් ලොප් කොට (ඒ වෙනුවට වෙනත්) අකුරක් පුමුණුවා ගැනීම ආදේශය ලෙස සිදත් සඟරා පාඨයේ අදහස යි. මෙය සංස්කෘත ව්‍යාකරණයේ **“ශස්තෘ වදාදෙශඃ”** ලෙස දක්වා ආදේශය සතුරෙකුට සම කරයි. සිටින අය ඉවත් කොට එතැනට විත් පදිංචි වීම සතුරාගේ ස්වභාවය යි. ආදේශයේදී සිදු වන්නේ ද තිබෙන අකුර ඉවත් කොට වෙනත් අකුරක් පැමිණීම යි. ආදේශයෙහි ප්‍රධාන ප්‍රභේද දෙකකි. එනම්,

- **ස්වරාදේශය**
- **ව්‍යඤ්ජනාදේශය (ගාත්‍රාදේශය)**

පදයක අර්ථයට බාධාවක් නොවන පරිදි ඊට ස්වරාක්ෂරයක් ආදේශ වීම ස්වරාදේශය යි. මෙය ප්‍රභේද හතරකි.

**සංයුක්තස්වරාදේශය** - සන්ධ්‍යක්ෂර සෑදීමට යෙදෙන ස්වර දෙකක් වෙනුවට ඊට අනුරූප සන්ධ්‍යක්ෂරය ආදේශ වීම.

උදා -

| වියුක්ත ස්වර | සංයුක්ත ස්වර (සන්ධ්‍යක්ෂර) | උදාහරණ |
|---|---|---|
| අ + ඉ | එ | මහ + ඉසුරු > මහෙසුරු |
| අ + ඊ | ඒ | ධන + ඊශ්වර > ධනේශ්වර |
| අ + එ | ඓ | චිත්ත + එකාග්‍රතා > චිත්තෛකාග්‍රතා |
| අ + උ | ඔ | මහ + උර > මහොර |
| අ + ඌ | ඕ | ආසන + ඌර්ධව > ආසනෝර්ධව (අසුන මත) |
| අ + ඔ | ඖ | ගෘහ + ඖෂධ > ගෘහෞෂධ |

**අනම්‍ය ස්වරාදේශය** - අ, උ, ඔ යන නම්‍ය ස්වරයක් වෙනුවට ඇ, ඉ, එ යන අනම්‍ය ස්වරයක් ආදේශ වීම

උදා - අ - ඇ - ක වු ඩු > කැ වි ඩි
උ - ඉ - උ කු ණු > ඉ කි ණි
ඔ - එ - කො ර > කෙ ර

**පූර්ව ස්වරරූපාදේශය** - යම් ස්වරයකට පෙර යෙදී ඇති ස්වරයේ රූපය පරස්වරයට ආදේශ වීම

උදා - පිරිසුදු > පිරිසිදු [පිරිසුදු රි යන්නේ ඇති "ඉ" ස්වරයේ රූපය සු යන්නේ ඇති "උ" ස්වරයට ආදේශ වීම]
සැතපීම > සැතැපීම [සැ යන්නේ ඇති "ඇ" ස්වරයේ රූපය ත යන්නේ ඇති "අ" ස්වරයට ආදේශ වීම]

**පර ස්වරරූපාදේශය** - යම් ස්වරයකට පසු ව යෙදී ඇති ස්වරයේ රූපය පූර්වස්වරයට ආදේශ වීම

උදා - මහෙසුරු > මෙහෙසුරු ["හෙ" යන්නේ ඇති "එ" ස්වරයේ රූපය "ම" යන්නේ ඇති "අ" ස්වරයට ආදේශ වීම]
මහොර > මොහොර ["හො" යන්නේ ඇති "ඔ" ස්වරයේ රූපය "ම" යන්නේ ඇති "අ" ස්වරයට ආදේශ වීම]

අර්ථයට බාධාවක් නොවන පරිදි ව්‍යඤ්ජනාක්ෂරයක් හෙවත් ගාත්‍රාක්ෂරයක් වෙනුවට වෙනත් ව්‍යඤ්ජනාක්ෂරයක් ආදේශ වීම **ව්‍යඤ්ජනාක්ෂරාදේශ** හෙවත් **ගාත්‍රාක්ෂරාදේශ** ලෙස හැඳින්වේ. එහි ප්‍රභේද කීපයකි.

**අඝෝෂාදේශය** - ඝෝෂාක්ෂරයක් වෙනුවට අඝෝෂ ව්‍යඤ්ජනාක්ෂරයක් ආදේශ වීම

උදා - දිග් + නූල් > දික්නූල් [ග් වෙනුවට ක් ආදේශය]
ෂඩ් + කාරක > ෂට්කාරක [ඩ් වෙනුවට ට් ආදේශය]
තත් + ආසන්න > තද් + ආසන්න > තදාසන්න [ත් වෙනුවට ද් ආදේශය]
ලබු + නාරං > ලබ් + නාරං > ලප් + නාරං > ලප්නාරං [බ් වෙනුවට ප් ආදේශය]

**නාසික්‍යාදේශය** - විසන්ධි පදවල අපර වර්ණයට අදාළ වර්ගයේ ම නාසික්‍යාක්ෂරය පූර්ව වර්ණයට ආදේශ කිරීම

උදා - පාන් + කරත්තය > පාඞ්කරත්තය
ටින් + බෙලෙක්ක > ටිම්බෙලෙක්ක

**අන්තඃස්ථාදේශය** - අර්ථයට බාධාවක් නොවන පරිදි යම් ගාත්‍රාක්ෂරයක් වෙනුවට ය් ර් ල් ව් යන අන්තඃස්ථාක්ෂරයක් ආදේශ වීම

උදා - බිලි + කම් > බිලියම් [ක් වෙනුවට ය් ආදේශය]
සිතු + කම් > සිතුවම් [ක් වෙනුවට ව් ආදේශය]

අන්තඃස්ථාක්ෂරයක් ඊට අනුරූප ස්වරයක් වෙනුවට ආදේශ වීම ද සිදු වේ.

උදා - අති + අලංකාර > අත්‍යලංකාර

(මේ සඳහා නිදසුන් සහ විස්තර අර්ධ ස්වරාදේශ සන්ධි ක්‍රමය යටතේ දක්වා ඇත).

**පූර්ව රූපාදේශය** - පූර්ව රූප සන්ධියේදී සිදු වන්නේ මෙය යි. විසන්ධි පදවල පූර්ව ව්‍යඤ්ජනයේ රූපය අපර ව්‍යඤ්ජනයට ආදේශ කිරීම යි.

උදා - අත් + කම් > අත්තම්
යක් + හල > යක්කල

**පර රූපාදේශය** - පර රූප සන්ධියේදී සිදු වන්නේ මෙය යි. විසන්ධි පදවල පූර්ව ව්‍යඤ්ජනය සඳහා අපර ව්‍යඤ්ජනයේ රූපය ආදේශ කිරීම යි.

උදා - කොක් + ගල > කොග්ගල
වක් + පිහිය > වප්පිහිය

**"හ" කාරාදේශය** - ව්‍යඤ්ජනාක්ෂරයක් වෙනුවට "හ්" යන්න ආදේශ වීම යි.

උදා - නව + කම් > නවහම්
බළ + කම් > බළහම් (යුද්ධය)

## ආගමය

සිදත් සඟරාවේ ආගමය දක්වා ඇත්තේ **"වණක්හු නිසා ඔහු නොලොපා වනුයේ අගම් නම්"** යනුවෙනි. වර්ණයක් පමුණුවා ගැනීමට තිබෙන වර්ණයක් ලොප් නොකරයි නම් එය ආගමය ලෙස එයින් කියවේ. සංස්කෘත ව්‍යාකරණයේ මෙය **"මිත්‍ර වදගමඃ"** ලෙස දක්වා ඇත්තේ ආගමය මිතුරෙකුට සම කරමිනි. අමුතුවෙන් පැමිණ පෙර සිටි අයත් සමග සහයෝගයෙන් සිටීම මිතුරාගේ ස්වභාවය යි. අකුරක් ලොප් නොකොට පැමිණීම නිසා මේ අදහස "ආගමය" ට අන්වර්ථ වේ. ආගමය ආකාර දෙකකි. එනම්,

**ස්වරාගමය**
**ව්‍යඤ්ජනාගමය**

**ගාත්‍රාක්ෂර දෙකක් අතරට ආගමය වන්නේ ස්වරයකි. එය ස්වරාගමය නමි.**

උදා - තුන් + රුවන් > තුන් + උ + රුවන් > තුනුරුවන්
පුන් + පොහොය > පුන් + උ + පොහොය > පුනුපොහොය

ස්වර දෙකක් අතරට ආගමය වන්නේ ව්‍යඤ්ජනාක්ෂරයකි.

උදා - ගෙ + උයන > ගෙ + ව් + උයන > ගෙවුයන
නි + අවි > නි + ර් + අවි > නිරවි
දෙ + ආකාර > දෙ + ය් + ආකාර > දෙයාකාර
සුත + අඹු > සුත + න් + අඹු > සුතනඹු

## ද්විත්ව රූපය

ද්විත්වය යනු දෙකකි. සිදත් සඟරාවේ ද්විත්වය මෙසේ විග්‍රහ කරයි. **"වණහට ද පද හට ද දෙරූ දූනවුම් දෙරූනම්"** යනුවෙනි. එනම් වර්ණයන්ට හෝ පදයන්ට ද්විත්ව රූපයක් දූනවීම ද්විත්ව රූපය නම් වේ යන්න යි. මෙහිදී සන්ධියට අදාළ වන්නේ වර්ණ ද්විත්වය හෙවත් අකුරක්, දෙකක් බවට පත් කිරීම යි.

උදා - මල් + අත්ත > මල් + ල් + අත්ත > මල්ලත්ත ('ල්' ද්විත්ව වීම)
රුක් + අත්තන > රුක් + ක් + අත්නත > රුක්අත්තන ('ක්' ද්විත්ව වීම)

## වෘද්ධිය

මෙය සිදත් සඟරාවේ විග්‍රහ කර ඇත්තේ **"වැඩි නම් මත් වැඩි"** යනුවෙනි. හ්‍රස්ව මාත්‍රාව දීර්ඝ කිරීම මෙහි දී සිදු වේ.

උදා - සු + අසූ > සුවාසූ (අ > ආ)
එක් + අසූ > එකාසූ (අ > ආ)

## හානිය

මෙය සිදත් සඟරාවේ දක්වා ඇත්තේ **"අඩු නම් මත් අඩු"** යනුවෙනි. දීර්ඝ මාත්‍රාව හ්‍රස්ව මාත්‍රාවක් වීම මෙහිදී සිදු වේ.

උදා - නී + සයුරා (නිසයුරා)
සැසී + පියා > සැසිපියා

## පෙරළි

පදයක් තුළ ඇති අක්ෂරවල ස්ථාන මාරුවක් සිදු වේ නම් එය පෙරළි නම් වේ.


උදා - ඩහදිය + ඩාදිය > දඩිය
කලුවර > කරුවල

## ක්‍රියාකාරකම 1

1. ගුත්තිල කාව්‍යයේ හෝ සැලළිහිණි සන්දේශයේ යෙදී ඇති සන්ධි පද 25ක් සොයා ලියන්න.

2. ඒවා අභ්‍යන්තර සන්ධි සහ බාහිර සන්ධි වශයෙන් වෙන් කරන්න.

## විසන්ධි පදයක කොටස්





- පෙර පදයේ අග අකුර පූර්ව වර්ණය යි.
- පූර්ව වර්ණයේ ඇති ස්වරය පූර්ව ස්වරය යි.
- එහි ඇති ව්‍යඤ්ජනාක්ෂරය පූර්ව ව්‍යඤ්ජනය යි.
- පසු පදයේ මුල අකුර අපර වර්ණය යි.
- එහි ඇති ව්‍යඤ්ජනාක්ෂරය අපර ව්‍යඤ්ජනය යි.
- එහි ඇති ස්වරය අපර ස්වරය හෙවත් පරස්වරය යි.

සන්ධි කාර්යයේදී පූර්ව සහ අපර වර්ණයන්ගේ සංයෝගය හෙවත් ගැළපීම සිදු වන අතර එම පූර්වාපර වර්ණයන්ගේ සම්බන්ධය ආකාර කීපයකින් පවතියි.

1. ස්වරයක් සහ ස්වරයක් යෙදීම - දින + ඉසුරු > දිනිසුරු
2. ස්වරයක් සහ ව්‍යඤ්ජනයක් යෙදීම - සිතු + කම් > සිතුවම්
3. ව්‍යඤ්ජනයක් සහ ස්වරයක් යෙදීම - මල් + අසුන > මලසුන
4. ව්‍යඤ්ජනයක් සහ ව්‍යඤ්ජනයක් යෙදීම - පස් + සිල් > පන්සිල්

සන්ධි සිද්ධ වන ආකාරය අනුව හෙවත් පූර්වාපර වර්ණයන්ගේ ස්වභාවය අනුව පොදුවේ ප්‍රභේද හතර (04) කට වෙන් කළ හැකි ය.

1. ස්වර සන්ධි - ස්වාරාක්ෂර දෙකක් පමණක් සන්ධි වීම
2. ව්‍යඤ්ජන සන්ධි - ව්‍යඤ්ජනාක්ෂර දෙකක් පමණක් සන්ධි වීම
3. මිශ්‍ර සන්ධි - ස්වරයක් හා ව්‍යඤ්ජනයක් පමණක් සන්ධි වීම
4. ආරෝහණය - හල් අකුරකට ස්වරාක්ෂරයක් ආරූඪ කිරීම




ඉහත සටහනේ ඇති සන්ධි ක්‍රම 12 වර්තමාන භාවිතයේ යෙදේ.

1. පූර්වස්වර ලෝප සන්ධිය
2. පරස්වර ලෝප සන්ධිය
3. ස්වර සන්ධිය
4. ස්වරාදේශ සන්ධිය
5. ගාත්‍රාදේශ සන්ධිය
6. පූර්ව රූප සන්ධිය
7. පර රූප සන්ධිය
8. ගාත්‍රාක්ෂරාදේශ ලෝප සන්ධිය
9. ආගම සන්ධිය
10. ද්විත්ව රූප සන්ධිය
11. සවර්ණාදේශ සන්ධිය (සමාන ස්වර දීර්ඝ සන්ධිය)
12. අන්තඃස්ථාදේශ සන්ධිය (අර්ධස්වරාදේශ සන්ධිය)

මෙයින් මුල් සන්ධි ක්‍රම දහය (10) ශුද්ධ සිංහල සනධි ක්‍රම වන අතර එයින් පර රූප සන්ධිය හැර සෙසු සන්ධි ක්‍රම නමය (9) පිළිබඳ ව සිදත් සඟරාවෙහි නිදසුන් දක්වා පැහැදිලි කොට ඇත. අවසාන සන්ධි ක්‍රම දෙක මිශ්‍ර සිංහල සන්ධි ක්‍රම වේ. ඒවා පාලි සංස්කෘත තත්සම පද හා සම්බන්ධ වේ.

ශුද්ධ සිංහල සන්ධි ක්‍රම 10

පෙර සර ලොපේ දින + ඉසුරු දිනිසුරු වේය
පර සර ලොපේ ති + අයුණු තියුණු ම වේය
සර මලසුන ය, සරදෙස් මෙහෙසුරු වේය
ගතදෙස් සඳේ දඬු + කම්, දඬුවම් වේය

පෙර රූ සඳේ අත් + කම් අත්තම් වෙනවා
පර රූ සඳේ වප් + කඩ වක්කඩ වෙනවා
ගතකුරු ලෝපේ ගඟ + රන් ගංරන් වෙනවා
ආගම, දෙරූ කටුවල, බල්ලා වෙනවා

## පූර්ව ස්වර ලෝප සන්ධිය (පෙර සර ලොප් සඳ)

**සිදත් සඟරා විග්‍රහය**

"පෙර සර ලොපා පර සර ගතට පැමිණ වූ බැවින් පෙර සර ලොප් සඳ නම්"

සන්ධි වන පද දෙකෙහි මුල පදයේ අග අකුර පූර්ව වර්ණය යි. එහි ඇති ස්වරය පූර්ව ස්වරය යි. එම පූර්ව ස්වරය ලොප් කොට එතැන ඉතිරි වන ව්‍යඤ්ජනාක්ෂරය පර ස්වරය හා ගැළපීම පූර්ව ස්වර ලෝප සන්ධිය යි.

උදා - දින + ඉසුරු (විසන්ධිය)
දින් + අ + ඉසුරු (පූර්ව වර්ණය වෙන් කිරීම)
දින් + ~~අ~~ + ඉසුරු (එසේ වෙන් කළ පූර්ව වර්ණයේ ඇති ස්වරය හෙවත් පූර්ව ස්වරය ලොප් කිරීම)
දින් + ඉසුරු (දැන් පූර්ව වර්ණයේ ඉතිරිව ඇත්තේ හල් අකුර පමණි)

දින් + ඉසුරු
\/
නි (පූර්ව වර්ණයේ හල් අකුර පර ස්වරය හා ගැළපීම)
දිනිසුරු (සන්ධි පදය)

### භාවිතයට

පෙර සරය ලොප් වෙයි
හල් අකුර මුල තනි වෙයි
පර සර එයට එයි
දිගා පෙර සර ලෝප කදිමයි

උදා - බමර + උදුළ
බමර් + අ + උදුළ
බමර් + ~~අ~~ + උදුළ
බමර් + උදුළ
රු
බමරුදුළ (සන්ධි පදය) - (මල් පොකුර)

**මෙම පියවරයන් අනුව පහත පද සන්ධි කරන්න.**

| | | |
|---|---|---|
| විදුරු + අවි | වඳුරු + ආ | සුළු + ඇඟිල්ල |
| සඳ + එළි | දකුණු + අත | දිගු + ආ |
| ගිරි + අග | පොරණ + ඇඳුරු | බල + ඇති |
| ගුණ + ඇති | සුරු + අත | නළු + අඟන |
| අරුණු + අලු | යන + එන | දෙ + ඇවර |
| රිය + ඇඳුරු | මැද + ඇඟිල්ල | |

## පරස්වර ලෝප සන්ධිය (පර සර ලොප් සඳ)

මේ සඳහා විශේෂ වූ විග්‍රහ වාක්‍යයක් සිදත් සඟරාවෙහි නො එයි. නමුත් පද සන්ධි කිරීමේ දී පසු පදයේ මුල් අකුරේ ස්වරය හෙවත් පර ස්වරය ලොප් කිරීමෙන් එය සිදු වන අයුරු අවබෝධ කර ගත යුතු ය.

සිදත් සඟරා නිදසුන් -

| | |
|---|---|
| ඌලේ + උසුම්<br>ඌලේ + ~~උ~~සුම්<br>ඌලේසුම් (උල්පතෙහි උණුසුම) | සු + උස්මෙන්<br>සු + ~~උ~~ස්මෙන්<br>සුස්මෙන් (දැඩි උණුසුමෙන්) |
| ති + අයුණු<br>ති + ~~අ~~යුණු<br>තියුණු (අගුණ තුන) | වැටු + අසිපත<br>වැටු + ~~අ~~සිපත<br>වැටුසිපත (ලෙලවන ලද කඩුව) |

### භාවිතයට

පෙර අකුර නොසැලෙයි
පර සරය නම් ලොප් වෙයි
පිළි + උතුරු ඔහොමයි
එ පර සර ලොප් සඳ ය කදිමයි

පිළි + උතුරු (විසන්ධි පදය)
පිළි + ~~උ~~තුරු (පර ස්වරය ලොප් කිරීම)
පිළිතුරු (සන්ධි පදය)

මෙම පියවර අනුව පහත පද සන්ධි කරන්න.

| | | |
|---|---|---|
| අනු + අරුත් (අර්ථයට අනුකූල) | | |
| ගුරු + උතුමා | | |
| බුදු + අකුරු (බුද්ධාංකුර/ බෝධිසත්වයන්) | | |
| මුනි + උතුමා | | |
| උමා + අඟන (උමයංගනා) | | |
| සුර + අඟන | මුදලි + ඉඳු | රට + අල |
| පැහැ + ඇති | යති + උතුමා | මහ + අම්මා |
| මිණි + අබරණ | සිහ + අසුන | |
| වියළි + ඉඟුරු | පමණ + අත් | |
| උඩ + එළිපත | උඩ + අල | |

★ තත්සම පදවල හැර ශුද්ධ සිංහල පදවල පූර්ව සහ අපර ස්වර සමාන වන විට එහි පර ස්වරය ලොප් කළ යුතු ය.

උදාහරණයක්: ගුරු + ~~උ~~තුරු → ගුරුතුමා

## ස්වර සන්ධිය

**සිදත් සඟරා විග්‍රහය**

**"සර ලොප් නැත ද සර ගතට පැමිණ වූ බැවින් සර සඳ නම්"**

මෙම සන්ධි ක්‍රමයේදී ස්වර ලෝපය ආදි කාර්යයන්ට බඳුන් නොවුණත් පර ස්වරය පූර්ව ව්‍යඤ්ජයට ආරූඪ කිරීමෙන් මෙම සන්ධිය සිදු වේ. සිදතේ මෙම සන්ධි නාමකරණය නිවැරැදි නොවේ. මන්ද මෙහි සන්ධි කාර්ය සිදු වන්නේ ස්වරයක් හා ව්‍යඤ්ජනයක් අතර නිසා ස්වර සන්ධිය යි කීම ප්‍රමාණවත් නැත. එබැවින් මෙය ස්වරාරූඪ සන්ධිය, ආරෝහණ සන්ධිය, සරරුහ සඳ යන නම් වඩාත් උචිත වේ.

**භාවිතයට**

පෙර ගතකුර සොඳින
පර සරය හා එක් වින
විල් + අඟන විලඟන
සර සඳක් එහි වේය දනුමැන

විල් + අඟන (විසන්ධි පදය)

විල් + අඟන

ල (පූර්ව ව්‍යඤ්ජනය හා පර ස්වරය එක් වීම)

විලඟන (සන්ධි පදය)

**මෙම පියවර අනුව පහත පද සන්ධි කරන්න.**

පස් + ඇස් (බුදුන් වහන්සේ)
සහස් + ඇස්
මත් + ඇත්
ඉන් + ඉක්බිති
උපන් + උපන්
නිල් + අඹර
නෙත් + ඉන්
නිල් + අඹර
පින් + ඇති
මල් + අසුන

උන් + උන්
ඔවුන් + ඔවුන්
සිහින් + ඉඟ
එකින් + එක
පවුල් + එහි
පස් + ඉඳුරන්
අතින් + අත
මගින් + ඉවතට
රුවන් + ආර

## ස්වරාදේශ සන්ධිය (සරදෙස් සඳ)

**සිදත් සඟරා විග්‍රහය**

“ ‘අ’, ‘ඉ’, ‘උ’, න් ලොපා ‘එ’, ‘ඔ’, ‘ඕ’ අදෙස් කළ බැවින් සරදෙස් සඳ නම්”

අ, ඉ, උ අකුරු ලොප් කොට ඒ වෙනුවට එ, ඔ, ඕ අකුරු ආදේශ කිරීම ලෙස සිදතේ විස්තර කරයි. “වණක් හු ලොපා වණක්හු කිරීම් අදෙස් නම්” ලෙස සිදත ලෝපය විස්තර කරන්නේ වර්ණයක් ලොප් කොට ඒ වෙනුවට වර්ණයක් පමුණුවා ගැනීම ලෙස යි. නමුත් මෙහි දී සිදු වන්නේ අකුරු දෙකක් වෙනුවට එක් අකුරක් පැමිණ වීම යි. එබැවින් ස්වර දෙකක් වෙනුවට තනි ස්වරයක් ආදේශ වීම මෙහි දී සිදු වේ.

**භාවිතයට**
චූලෝදර මහෝදර යි
සහෝදරයො දබර උණ යි
ස්වර දෙක වෙනුවට ස්වරයයි
ස්වරාදේශ සඳ කදිමයි

චූල + උදර (විසන්ධිය)
චූල් + අ + උදර (පූර්ව සහ අපර ස්වර වෙන් කිරීම)
ඕ ('අ','උ' වෙනුවට 'ඕ' ආදේශය)
චූල් + ඕ + දර (සන්ධි පදය)
ලෝ (ආදේශ වූ ස්වරය පර පදයේ මුල ව්‍යඤ්ජනාක්ෂරය හා ගැළපීම)
චූලෝදර (සන්ධි පදය)

මෙහි දී ස්වරාදේශය පහත සඳහන් පරිද සිදු වේ.

| | | |
|---|---|---|
| අ - උ | වෙනුවට | ඔ/ ඕ |
| අ - ඉ | වෙනුවට | එ/ ඒ |
| එ - අ | වෙනුවට | ඇ |
| ඒ - අ | වෙනුවට | ඇ |
| එ - ඇ | වෙනුවට | ඇ |

**ඉහත පියවර අනුව පහත සඳහන් පද සන්ධි කරන්න.**

| | | |
|---|---|---|
| මහ + උදර | වට + උර | නගර + උදය |
| මහ + ඉසුරු | මේ + අතින් | සූර්ය + උදය |
| මාර්ග + උපකරණ | දෙ + අවුරුදු | මහ + උපකාර |
| දෙ + අගසව් | දෙ + අඟුල් | දෙ + ඇස |
| දෙ + අත | දෙ + ඇඟිලි | මහ + ඉසිකා |
| මේ + අත | දෙ + ඇල | දෙ + අතුර |
| ඒ + අත | ශ්‍රවණ + ඉන්ද්‍රිය | මහ + ඉන්ද්‍ර |
| නර + ඉන්ද්‍ර | ගජ + ඉන්ද්‍ර | |

## ගාත්‍රාක්ෂරාදේශ සන්ධිය (ගතදෙස් සඳ)

**සිදත් සඟරා විග්‍රහය**

“පර ‘ක’ කරනට ‘ව’ ‘ය’ න් හා ‘බ’ ‘ද’ න් සර ලොපා ‘ප’ ‘ත’ න් අදෙස් කළ බැවින් ගතදෙස් සඳ නම්”

අපර වර්ණයේ ‘ක’ අක්ෂරයට ‘ව’ සහ ‘ය’ අක්ෂරත් ‘බ’ ‘ද’ අක්ෂරවල ස්වර ලොප් කොට එහි ඇති ව්‍යඤ්ජනාක්ෂරයට ‘ප්’ ‘ත්’අක්ෂරත් ආදේශ කිරීම ගාත්‍රාක්ෂරාදේශ සන්ධිය ලෙස සිදතේ සඳහන් වේ. මේ අනුව ගාත්‍රාක්ෂරයක් වෙනුවට වෙනත් ගාත්‍රාක්ෂරයක් පැමිණවීමෙන් ගළපන සන්ධිය ගාත්‍රාක්ෂරාදේශ සන්ධිය නම් වේ.

**භාවිතයට**

දඬු + කම්, දඬුවම් වන්නේ
ගිනි + කම් ගිනියම් වන්නේ
ගත වෙනුවට ගත එන්නේ
ගත දෙස් සඳ දැනගන්නේ

**ක් වෙනුවට ව් ආදේශ වීම**

අත් + කරු (විසන්ධිය)
අත් + ක් + අරු
↓
අත් + ව් + අරු (ක් වෙනුවට ව් ආදේශය)
ව (ආදේශ වූ ගාත්‍රාක්ෂරය පර ස්වරය හා ගැළපීම)
අත්වරු (සන්ධි පදය)

ඉහත පියවර අනුව පහත සඳහන් පද සන්ධි කරන්න.

සිතු + කම්
දඬු + කම්
සුණු + කම්
මහණු + කම්

**ක් වෙනුවට ය් ආදේශ වීම**

ගිනි + කම්
බිලි + කම්
සිති + කම්
පිළි + කම්

**බ් වෙනුවට ප් ආදේශ කිරීම**

ලබු + නාරං
හෙබ + තොට
කැසුබු + පොතු

**ද් වෙනුවට ත් ආදේශ වීම**

සුදු + බත්
බුදු + සරණ

**ක් වෙනුවට හ් ආදේශ වීම**

දව + කල්
නව + කම්
බල + කම්

**ප් වෙනුවට ය් ආදේශ වීම**

සැරි + පුත්

**ස් වෙනුවට න් ආදේශ වීම**

පස් + තිස්
පස් + සිල්
පස් + සාළිස්

## පූර්ව රූප සන්ධිය

**සිදත් සඟරා විග්‍රහය**

"පර 'ක' කරනට පෙර රූ ලද්දෙන් පෙර රූ සඳ නම්"

අපර පදයේ මුල ඇති 'ක' අක්ෂරය පූර්ව පදයේ අග ඇති අක්ෂරයේ රූපය ගැනීම පූර්ව රූප සන්ධිය නම් වන බව මෙහි අදහස යි. සිදත් සඟරාවේ සඳහන් ව ඇත්තේ අපර වර්ණයේ 'ක' අක්ෂරය ගැන පමණක් වුව ද වර්තමාන භාවිත ව්‍යාකරණයේ විවිධ අක්ෂර පදනම් ව මෙම සන්ධිය සිදු වේ.

**භාවිතයට**

පෙර අකුරෙහි … රුවට
පරකුර සැදෙයි … එලෙසට
<u>පත් + කම</u> … <u>පන්න ම ට</u>
හැරෙයි <u>පෙර රූ සදින්</u> … කදිමට

උදා - පත් + කම් (විසන්ධිය)
පත් + ක් + අම් (පූර්ව වර්ණයේ හල් අකුරේ ස්වරූපය අපර වර්ණයේ හල් අකුරට පැමිණවීම)
පත් + ත් + අම්
න (පූර්ව රූපය අපර වර්ණය ගිය විට පරස්වරය හා ගැළපීම)
පන්නම් (සන්ධි පදය)

**පහත සඳහන් පද ඉහත පියවර අනුව සන්ධි කරන්න.**

ගෙත් + කම්
අත් + කම්
වත් + කම්
ඇත් + හල
සත් + හස
විස් + කම්
අස් + හල
කම් + හල
වත් + හල

## පර රූප සන්ධිය

මෙය සිදත් සඟරාවේ විග්‍රහ වාක්‍යක් මගින් දක්වා නොමැත. නමුත් ගාත්‍රාදේශ සන්ධියට දී ඇති නිදසුන්වලින් පර රූප සන්ධිය ඇති බව පිළිගෙන ඇත.

අපර වර්ණයේ හල් අකුරේ ස්වරූපය පූර්ව වර්ණයේ හල් අකුරට පැමිණවීමෙන් ගළපන සන්ධිය පර රූප සන්ධිය යි.

**භාවිතයට**

පසු අකුරේ රුව … බලා
පෙර අකුරට … පැමිණිලා
<u>ලිප් + ගල, ලිග්ගල</u> … වෙලා
<u>පර රූ සඳ සිදු</u> … වෙලා

ඇත් + දළ (විසන්ධිය)
ඇත් + ද් + අළ
ඇද් + ද් + අළ (අපර ව්‍යඤ්ජනයේ රූපය පූර්ව ව්‍යඤ්ජනය වෙත ගැළපීම)
ඇද් + දළ
ඇද්දළ (සන්ධි පදය)

**පහත විසන්ධි පද ඉහත පියවර අනුව සන්ධි කරන්න.**

| | | |
|---|---|---|
| ඇත් + දත් | කොක් + ගල | ලිප් + බොක්ක |
| පොහොසත් + දන | ලිප් + ගල | රුක් + පා |
| හත් + දවස | අත් + ගල | වක් + පිහිය |
| අත් + ල | හක් + ගෙඩිය | ගොප් + කොළ |
| අත් + ලස් | කත් + මුල | දුක් + පත් |
| අත් + සන | වප් + කඩ | |

## ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය (ගතකුරු ලොප් සඳ)

### සිදත් සඟරා විග්‍රහය

**" 'ග', 'බ', න් ලොපා මත් වැඩූ බැවින් ගතකුරු ලොප් සඳ නම්"**

විසන්ධි පදවල පෙර පදයේ අග යෙදෙන ඟ, ඹ අක්ෂරවල ඇති අර්ධානුනාසික්‍ය හැර ස්වරය හා ගාත්‍රාක්ෂරය වන ග, බ අක්ෂර ලොප් කොට අර්ධානු නාසික්‍ය පූර්ණත්වයට පත් කිරීමෙන් හෙවත් මාත්‍රා වෘද්ධි කිරීමෙන් සිදු වන සන්ධිය යි. මෙම සන්ධි ක්‍රමය තරමක් සංකීර්ණ වන නිසා එහි සන්ධිය සිදුවන ක්‍රම පිළිවෙළ මෙසේ දැක්විය හැකි ය.

- මෙම ක්‍රමයට සන්ධි වන්නේ පූර්ව වර්ණය සඤ්ඤක අකුරක් වන විට පමණි.
- එම සඤ්ඤක අකුර බණ්ඩනය කර ගනියි. මෙහි දී 'ඦ', 'ඬ' අක්ෂර විසන්ධි පදවල නොයෙදෙන තරම් ය.

  ඟ < ~~ඞ~~ $\frac{1}{2}$ + ග් + අ

  ඳ < ~~න්~~ $\frac{1}{2}$ + ද් + අ

  ඹ < ~~ම~~ $\frac{1}{2}$ + බ් + අ

- එහි ගාත්‍රාක්ෂරය ස්වරයක් සමග ලොප් කරයි.
- දැන් පූර්ව වර්ණයේ ඉතිරි ව ඇත්තේ අර්ධානුනාසික්‍ය පමණි.
- එම අර්ධ නාසික්‍යය සම්පූර්ණ කරයි.
- පද දෙක එකට ගළපා සන්ධි කරයි.

**භාවිතයට**

සර ගතකුර ලොප් වන්නේ
අඩ නාසික තනි වන්නේ
වැඩී ගොසින් සරු වන්නේ
ගංවතුරක් ඇති වන්නේ

උදා - ගඟ + වතුර (විසන්ධිය)

ග~~ඞ~~$\frac{1}{2}$ + ග් + අ + වතුර (සඤ්ඤකාක්ෂරය ඛණ්ඩනය කිරීම)

ග~~ඞ~~$\frac{1}{2}$ + ~~ග්~~ + ~~අ~~ + වතුර (ස්වරය සමග ගාත්‍රාක්ෂරය ලොප් කිරීම)

ග~~ඞ~~$\frac{1}{2}$ + වතුර (පූර්ව වර්ණයේ අර්ධ නාසිකාය ඉතිරි වීම)

ගඞ් + වතුර (අර්ධ නාසිකා පූර්ණ වීම)

ගඞ්වතුර (සන්ධි පදය)

ගංවතුර - (වර්තමාන ව්‍යවහාරය)

**පහත සඳහන් පද ඉහත පියවර අනුව සන්ධි කරන්න.**

| | | |
|---|---|---|
| ළිඳ + පඩිය | මඟ + මුලා | කොළොඹ + තොට |
| ළිඳ + මැඩි | මුගු + බියලි | මිහිඳු + තලය |
| අඹ + මල් | තඹ + පලා | ගඟ + පළ |
| අඹ + පාර | නෙළුඹු + මල් | |

## ආගම සන්ධිය (අගම් සඳ)

**සිදත් සඟරා විග්‍රහය**

**“පෙර සර නොලොපා ‘ය’ ‘ව’ ‘ර’ න් අගම් කෙළෙන් අගම් සඳ නම්”**

පූර්ව ස්වරය ලොප් නොකොට ය් ව් ර් අක්ෂර ආගමය වීමෙන් ගැළපෙන සන්ධිය ආගම සන්ධිය යි. මෙහි එන පරිදි පෙර සර නො ලොපා යන්න අමුතුවෙන් සඳහන් කළ යුත්තක් ද නොවේ. ඒ අනුව පූර්ව සහ අපර වර්ණ මැදට අමුතුවෙන් ම අකුරක් පැමිණ වීමෙන් ආගම සන්ධිය සිදු වේ.

**භාවිතයට**

අමුතු ම අකුරක් එන්නේ
ආගම සඳ සිදු වන්නේ
ගෙවුයන, වියවුල වන්නේ
ආගම වී දන ගන්නේ

උදා - **ය් ආගමය**

පිරි + අත් (විසන්ධිය)

පිරි + ය් + අත් (ය් ආගමය)

පිරි + ය් + අත්

ය (ආගමය වූ අකුර පරස්වරය හා ගැළපීම)

පිරියත් (සන්ධි පදය)

ව් - ආගමය

දෙ + උර
දෙ + ව් + උර
දෙ + ව් + උර
වු
දෙවුර

ර් - ආගමය

නි + අවි
නි + ර් + අවි
නි+ ර් + අවි
ර
නිරවි

**පහත සඳහන් පද ඉහත පියවර අනුව සන්ධි කරන්න.**

සිපි + එව්
දු + අඟ
තුනු + අඟ
පුන + උත්පත්තිය
නි + ඔද
කුලී + අ
සිව් + අඟ

නි + අකුරු
ළමා + ආ
වි + අවුල්
ගෙ + උයන
හිරි + අල
නො + එන
ලේඛක + එක්

ළිඳ + පඩිය
කොඩි + අක්
ඔරු + අක්
කැමරා + අක්
පොළො + අ

මීට අමතරව ඇතැම් අක්ෂර ආගමය වීම සන්ධි කාර්යය යටතේ විග්‍රහ කර ඇත.

## ද්විත්ව රූප සන්ධිය

**සිදත් සඟරා විග්‍රහය**

"පෙර සර ලොපා ගතට දෙරූ දුනැ වූ බැවින් දෙරූ සඳ නම්"

පූර්ව ස්වරය ලොප් කොට ගාත්‍රාක්ෂරය ද්විත්ව කිරීමෙන් ගළපන්නේ ද්විත්ව රූප සන්ධිය බව සිදතේ දක්වේ. නමුත් වර්තමාන ව්‍යවහාරයේ පූර්ව වර්ණය හල් අකුරක් ම වන අවස්ථා ද ඇත. එබැවින්,

පූර්ව වර්ණයේ ස්වරයක් තිබේ නම් එය ලොප් කොට ඉතිරි වන හල් අකුර ද්විත්ව කරයි. එහි දෙවැනි හල් අකුර පර ස්වරය හා ගැළපීම ද්විත්ව රූප සන්ධිය යි.

**භාවිතයට**

වල්ලම්බලමේ වල්ලුරා
කැවලු ඉන්නල ටික හාරා
පෙර සර ලොප් වී ගතකුර දෙක වී
දෙරූ සඳට යයි සර හා එක් වී

උදා - ඉනි + අල (විසන්ධිය)

ඉන් + ඉ + අල (පූර්ව ස්වරය වෙන් කිරීම)

ඉන් + ~~ඉ~~ + අල (පූර්ව ස්වරය ලොප් කිරීම)

ඉන් + න් + අල (පූර්ව ව්‍යඤ්ජනය ද්විත්ව කිරීම)

ඉන් + න් + අල

න (දෙවැනි හල් අකුර පර ස්වරය හා ගැළපීම)

ඉන්නල (සන්ධි පදය)

පූර්ව වර්ණය ව්‍යඤ්ජනයක් නම් එය එක්වර ම ද්විත්ව කළ හැකි ය.

**පහත සඳහන් පද ඉහත පියවර අනුව සන්ධි කරන්න.**

| | |
|---|---|
| කුලු + එන් | රුක් + අත්තන |
| පත් + ඉරු | සියලු + අ |
| යක් + ඇල්ල | අඩවි + අ |
| පින්වත් + උ | උදවි + අ |
| ඇත් + උ | වල් + ඌරා |
| බළල් + උ | පොල් + අත්ත |
| වල් + අම්බලම | ගොක් + අත්ත |

ඇතැම් පදවල අපර ව්‍යඤ්ජනය ද්විත්ව වන අවස්ථාව ඇත.

උදා- නුවණ + කාර

නුවණ +ක් + කාර (අපර ව්‍යඤ්ජන ද්විත්වය)

නුවණක්කාර (සන්ධි පදය)

**සන්ධි කරන්න.**

උරුම + කාර
වංශ + කාර
වෙඩි + කාර
කරුම + කාර

ඉහත විස්තර වූයේ ශුද්ධ සිංහලයේ යෙදෙන දස වැදෑරුම් සන්ධි ය. නමුත් වර්තමාන ව්‍යවහාරයේ මිශ්‍ර සිංහල සන්ධි ක්‍රම දෙකක් බහුල ව භාවිත වේ. ඒවා නම්,

1. සවර්ණාදේශ (සවර්ණ දීර්ඝ) සන්ධිය
2. අන්තඃස්ථාදේශ (අර්ධස්වරාදේශ) සන්ධිය

## සවර්ණාදේශ සන්ධිය - (සම සර දික් සඳ)

මෙය සංස්කෘත භාෂාවේ ආභාසයෙන් සිංහලයට පැමිණුණකි. පූර්ව හා අපර වර්ණ සවර්ණ වන විට එයට එහි අනුරූප දීර්ඝය ආදේශ වේ. සවර්ණ සහ ආදේශ වන දීර්ඝය මෙසේ දැක්විය හැකි ය.

| | | | | | |
|---|---|---|---|---|---|
| අ + ආ<br>ආ + අ<br>අ + ආ<br>ආ + ආ | දීර්ඝය 'ආ' | ඉ + ඉ<br>ඊ + ඉ<br>ඉ + ඊ<br>ඊ + ඊ | දීර්ඝය 'ඊ' | උ + උ<br>ඌ + උ<br>උ + ඌ<br>ඌ + ඌ | දීර්ඝය 'ඌ' |

තත්සම වචන සන්ධි වීමේදී මෙම ක්‍රමය ම අනුගමනය කළ යුතු ය.

**භාවිතයට**

පෙර පසු සර සම වන්නේ
සම දික් සර එහි එන්නේ
ගුරුපදේශය දෙන්නේ
සම සර දික් සඳ වන්නේ

උදා - පූර්ව + අපර (විසන්ධිය)
පූර්ව් + අ + අපර (සවර්ණ ස්වර වෙන් කිරීම)
ආ (සවර්ණ දීර්ඝාදේශය)
පූර්ව් + ආපර
වා (දීර්ඝ ස්වරය පූර්ව ව්‍යඤ්ජනය හා ගැළපීම)
පූර්වාපර (සන්ධි පදය)

**පහත සඳහන් පද ඉහත පියවර අනුව සන්ධි කරන්න.**

| | | |
|---|---|---|
| හේතු + උදාහරණ | කවි + ඉන්ද්‍ර | ක්‍රිස්තු + උත්පත්ති |
| විද්‍යා + ආලය | දේව + ආලය | පරම + අර්ථ |
| කවි + ඊශ්වර | පුස්තක + ආලය | ගුරු + උත්තම |
| මහා + අමාත්‍ය | සරණ + ආගමන | සාධු + උක්ති |
| අමාත්‍ය + අංශය | පරම + ආයුෂ | පෘථිවි + ඉන්ද්‍ර |
| පෘථිවි + ඊශ්වර | ප්‍රති + ඊක්ෂා | මුනි + ඉන්ද්‍ර |

## අර්ධ ස්වරාදේශ සන්ධිය (අන්තඃස්ථාදේශ)
## (අඩ සර අදෙස් සඳ)

මෙය ද සංස්කෘත භාෂාවේ ආභාසයෙන් සිංහලයට පැමිණුණකි. පූර්ව වර්ණය ඉ, ඍ, ඏ, උ, වන විට ඒ වෙනුවට ඊට අනුරූප අර්ධ ස්වර වන පිළිවෙළින් ය් ර් ල් ව් අක්ෂර ආදේශ වීමෙන් මෙම සන්ධිය සිදු වේ. තත්සම පද මෙලෙස සන්ධි විය යුතු නම් මෙම ක්‍රමයට ම සන්ධි කළ යුතු ය.

**භාවිතයට**

පෙර සර 'ඉ' යනු නම් හෝ 'උ' යන්නක් වේ නම්
වෙනුවට 'ය්' යන්නක් හෝ 'හල් වයනු' ඒ නම්
අත්‍යුත්තම වුවත් බහ්වර්ථයක් වේ නම්
එ තැන සිදු වන්නේ අඩ සර අදෙස් සඳ නම්

උදා - අති + උත්තම (විසන්ධිය)

අති + ඉ + උත්තම (පූර්ව ස්වරය වෙන් කිරීම)

↓

අති + ය් + උත්තම (අනුරූප අර්ධ ස්වරය ආදේශ වීම)

යු (ආදේශ වූ අර්ධ ස්වරයට පර ස්වරය ගැළපීම)

අත්යුත්තම (සන්ධි පදය)

අත්‍යුත්තම ("්‍ය" යොදා නිවැරැදි ව ලියන ආකාරය)

බහු + අර්ථ

බහ් + උ + අර්ථ

↓

බහ් + ව් + අර්ථ

ව

බහ්වර්ථ

කර්තෘ + අර්ථ

කර්තෘ + ඍ + අර්ථ

↓

කර්තෘ + ර් + අර්ථ

ර

කර්ත්රර්ථ

කර්ත්‍රර්ථ

**පහත සඳහන් පද ඉහත පියවර අනුව සන්ධි කරන්න.**

විභක්ති + අන්ත
අනු + අර්ථ
ප්‍රති + උත්තර
අනු + ඊක්ෂණ
අති + අලංකාර
හස්ති + ආරූඪ

පිතෘ + අර්ථ
ප්‍රති + උපකාර
අනු + ආයාම
අභි + උදය
හස්ති + අලංකාර
හස්ති + අශ්ව

භක්ති + ආදර
හේතු + අර්ථ
ප්‍රති + අන්ත
අනු + ඒක්ෂණ
අති + අන්ත

## සුභාෂිත

**Light appears at the end of the tunnel**

උමං කෙළවර ආලෝකය දිස්වනු ඇත.

## සුචින්තන

ඔබට යමකින් විනෝදයක් ලබන්න අවශ්‍ය නම් අද පළමු දවස සේ සිතන්න. ඔබට යමකින් ජයග්‍රහණයක් ලබන්න අවශ්‍ය නම් අද අවසාන දවස සේ සිතන්න.

# 04

# සමාස

භාෂාවක් ප්‍රාණවත් වන්නේ එහි භාවිත වචන හෙවත් පදවල පවතින විචිත්‍රතාව මත ය. භාෂා භාවිතයේදී පද සාධනයක් පිළිබඳ සැලකිලිමත් වන්නේ ඒ නිසා ය. සිංහල භාෂාවේ දී එසේ සාධනයට ලක්වන පද වර්ග කීපයකි. සන්ධි, සමාස, තද්ධිත, කෘදන්ත ආදි වශයෙන් දැක්වෙන්නේ ඒවා ය. පද අතර කැටි කිරීම මෙන් ම කෙටි කිරීම පදනම් කරගත් සමාස නම් වූ පද විශේෂය පිළිබඳ මෙම පාඩමේදී ඔබට අධ්‍යයනය කළ හැකි ය.

# සමාස

භාෂාවේ සන්ධි හැරුණුවිට පද කෙටි කරන හෝ කැටි කරන අනෙක් ක්‍රමය සමාස යි. වෙන් වෙන් ව ඇති විවිධාර්ථවත් පද කීපයක් ඒකාර්ථවත් එක් ශබ්දයක් බවට පත්වීම සමාස නම් වේ. එය සාම්ප්‍රදායික ව්‍යාකරණයේ ද මෙසේ විග්‍රහ වී ඇත.


> කියොලත එක අරුත - සබඳ වැ සදන් නනරුත්
> එ වියූ සමස් විදි නම් - එහි බේ දන් පවස්මෝ
>
> \- සිදත් සඟරාව -

සං+ආස සමාස යන්නෙහි වචනාර්ථය කැටි කරන ලද, එකට යොදන ලද යන්න යි. මෙසේ සමාස වන පද 'යුක්තාර්ථවත්' පද විය යුතු වේ. යුක්තාර්ථවත් ලෙස මෙහිදී සලකන්නේ අර්ථ වශයෙන් කිසියම් ගැළපීමක් ඇති පද ය.

මෙය උදාහරණයකින් විමසා බලමු. ගස්, වැල් යන පද දෙක අර්ථයෙන් විවිධ වූ වෙන් ව ඇති පද දෙකකි. එය "ගස්වැල්" ලෙස සමාස කළ හැකි ය. එසේ වන්නේ එම පදවල ඇති යුක්තාර්ථවත් භාවය නිසා ය.

නමුත් ගස්, ගඟ යන්න ද එවැනි ම විවිධ වූ පද දෙකක් වුවත් ඒවා යුක්තාර්ථවත් නොවන නිසා සමාස කළ නොහැකි ය.

## සමාස මගින් භාෂාවට ඇති ප්‍රයෝජන




## සමාස ප්‍රභේද

1. අව්‍යය සමාසය (අවිය සමස්)
2. විභක්ති සමාසය (විබත් සමස්)
3. විශේෂණ සමාසය (වෙසසුන් සමස්)
4 අන්‍යාර්ථ සමාසය (අන් අරුත් සමස්)
5. ද්කාරාර්ථ සමාසය (ද අරුත් සමස්)

## 1. අව්‍යය සමාසය (අවිය සමස්)

අව්‍යය පද යනු නිපාත හා උපසර්ග පද ය. නිපාත, උපසර්ග පදයක් මුලට යෙදී පසු පදයක් හා සමාස වන්නේ නම් ඒ අව්‍යය සමාසය නම් වේ. සිදත් සඟරාවේ අව්‍ය සමාසය මෙසේ හඳුන්වා ඇත.

පෙර කඩ උසුරු වන - යව් කු ප න ඈ අවියන්
පර පද සබඳ ලදහොත් - අවිය සමස් එ වියූ

**තේරුම**

පූර්ව කොටසෙහි උච්චාරණය කරන යව්, කු, ප, න යන අව්‍යය ශබ්ද පසු ව යෙදෙන පද සමග සම්බන්ධය ලද හොත් එය අව්‍යය සමාසය යි.

අව්‍ය සමාසයේ ප්‍රභේද හතරකි.

### i. යව් ආදි වර්ගය

'යව්' ආදි වර්ගයට අයත් අව්‍යය පද ලෙස යව්, යාව, යත, යථා, අනු, තාව පද වේ.

උදාහරණ - යව් + දිවි = යව්දිවි (දිවි ඇතිතෙක්)
යත + ලබ = යතලබ (ලැබෙන පරිදි)
යථා + ලාභ = යථාලාභ (ලැබෙන පරිදි)
තාව + කාලික = තාවකාලික (කෙටි කාලයට අයත්)
අනු + නායක = අනුනායක

### ii. කු ආදි වර්ගය

මේ සඳහා කු, දු, සු, දුර්, දුෂ්, නිර්, නිෂ්, දු යන අව්‍ය පද අයත් වේ. දූෂිත භාවයක් හෝ භූෂිත භාවයක් මෙමගින් අර්ථවත් කරයි.

උදාහරණ - කු + පුරිස් = කුපුරිස් (ගැරහුම් ලද පුරුෂයා)
කු + දිටු = කුදිටු (මිථ්‍යා දෘෂ්ටිය)
සු + දන = සුදන (යහපත් ජන)
දුර් + ජන = දුර්ජන
ඉ + මිහිරි = ඉමිහිරි
දුෂ් + කර = දුෂ්කර
නිර් + ධන = නිර්ධන
නිෂ් + ක්‍රමණ = නිෂ්ක්‍රමණ
දු + දන = දුදන
අති + රස = අතිරස

### iii. ප ආදි වර්ගය

ප ආදි වර්යට අයත් වන්නේ ප, උප, ප්‍ර ආදි අව්‍යය පද ය. මෙමගින් උත්කෘෂ්ට යන අර්ථය හා සමීප යන අර්ථය ගෙන දේ.

උදාහරණ - ප + බ = පබ (ප්‍රභාව යන අර්ථය ගෙන දේ.)
ප + බල = පබල, (උත්කෘෂ්ට බලය ඇති)

උප + වන = උපවන, (සමීපවනය)
උප + නායක = උපනායක
ප්‍ර + වර = ප්‍රවර (ඉතා උසස්)

## iv. නකාරාර්ථ වර්ගය

නකාරාර්ථ වර්ගයට අයත් වන්නේ ‘න’ අව්‍යය පදය යි. එමගින් නැත යන අර්ථය ගෙන දේ.

‘න’ අව්‍ය ව්‍යංජන අක්ෂරයකට පූර්වයෙන් යෙදේ නම් ඊට ‘අ’ ආදේශ වේ.

උදාහරණ -
න + සුර = අසුර (සුර නොවනුයේ)
න + කුසල් = අකුසල් (කුසල් නොවනුයේ)
න + පමණ = අපමණ (අප්‍රමාණ)
න + ඇති = නැති
නො + මිනිස් = නොමිනිස්
නො + විධිමත් = නොවිධිමත්

‘න’ අව්‍යය යෙදෙන්නේ ස්වරයකට පෙර නම් ඊට ‘අන්’ ආදේශ වේ.

උදාහරණ -
න + අදර  අන් + අදර = අනදර (ආදර නැති)
න + ආචාර  අන් + ආචාර = අනාචාර (ආචාර නැති)

## 2. විභක්ති සමාසය (විබත් සමස්)

ප්‍රථමා හා ආලපන විභක්ති හැර අනෙක් විභක්ති හතෙහි (එනම් කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, සම්බන්ධ, ආධාර) අර්ථ ගත් පදයක් පසු පදයක් හා ගැළපී සමාස වීම ‘විභක්ති’ සමාසය නම් වේ.

එය සිදත් සඟරාවේ මෙසේ හඳුන්වා ඇත.

පෙර පසු විබත් හැර - සෙසු සත් විබත් අත් පද
පර පද හා සමස් වන - එ විබත් සමස් නම් වේ.

පූර්ව හා පසු විභක්ති හැර සෙසු විභක්ති හතෙන් අන්ත වූ පද පර පද හා සමාස වන විට විභක්ති සමාස නම් වේ.

විභක්ති සමාසයෙහි ප්‍රභේද හතකි.

### i. කර්ම විභක්ති සමාසය (කම් විබත් සමස්)

කර්ම විභක්තිය සහිත පදයක් පූර්ව පදය වශයෙන් තිබියදී සිදු වන සමාසය කර්ම විභක්ති සමාසය නම් වේ.

උදාහරණ - වැඩ කරනුයේ - වැඩකරු

මෙම වාක්‍යයේ ‘වැඩ’ යනු කර්ම විභක්තිය ගත් පදයකි. එම පදය පූර්වයෙන් යෙදී ‘කරනුයේ’ යන පසු පදය හා සමාස වී ඇත. එනිසා ‘වැඩකරු’ යනු කර්ම විභක්ති සමාසය පදයකි.

උදාහරණ - ගත් කරන්නේ - ගත්කරු
කම් කරනුයේ - කම්කරු
ගවයන් පාලනය කරන්නේ - ගවපල්

සෑම කර්ම විභක්ති සමාස පදයකින් ම අර්ථවත් වන්නේ යම් ක්‍රියාවක් කරන්නකු පිළිබඳව යි.

උදාහරණ - ප්‍රශ්න විචාරන්නේ - ප්‍රශ්නවිචාරක
ඡන්දය දෙන්නේ - ඡන්දදායක

## ii. කර්තෘ විභක්ති සමාසය (කතු විබත් සමස්)

කර්තෘ විභක්තියට අයත් පදයක් පසු පදයක් සමග සමාස වන්නේ නම් එය කර්තෘ විභක්ති සමාසය යි.

උදාහරණ - වේයන් විසින් නැගුණු පස් - වේපස්
බඹුන් විසින් දෙන ලද්දේ - බඹදත් (සිවුරු)
බුදුන් විසින් දේශිත බණ - බුදුබණ

## iii. කරණ විභක්ති සමාසය (කරණ විබත් සමස්)

කරණ විභක්තියට අයත් පදයක් පසු පදයක් සමග සමාස වන්නේ නම් එය කරණ විභක්ති සමාසය යි.

අතින් කරන කම් - අත්කම් (හස්ත කර්මාන්ත)

ක්‍රියාව කිරීම සඳහා කරණය වන්නේ ‘අතින්’ යන පදය යි. එය මුලට යෙදී සමාසය තැනී ඇත්තේ ‘අත්කම්’ යනුවෙනි. එබැවින් එය කරණ විභක්ති සමාසයට අයත් වේ.

දුවයෙන් කළ බඩු - දුවබඩු
ගලින් කළ පඩි - ගල්පඩි
රනින් කළ කම් - රන්කම්
මලින් කළ සැරසිලි - මල්සැරසිලි

## iv. සම්ප්‍රදාන විභක්ති සමාසය (සපදන් විබත් සමස්)

සම්ප්‍රදාන විභක්තියට අයත් පදයක් පසු පදයක් හා සමාස වන්නේ නම් ඒ සම්ප්‍රදාන විභක්ති සමාසය යි.

උදාහරණ - ළමයින් සඳහා කරන පොත් - ළමාපොත්
පිනට දියයුතු හාල් - පින්හාල්
බෙහෙතට ගත් බඩු - බෙහෙත්බඩු
පරයනට කරන වැඩ - පරවැඩ

## v. අවධි විභක්ති සමාසය (අවදි විබත් සමස්)

අවධි විභක්තියට අයත් පදයක් පසු පදයක් හා සමාස වන්නේ නම් ඒ අවධි විභක්ති සමාසය යි.

උදාහරණ - මිණියෙන් මුතු - මිණිමුතු

මෙම පදයේ මිණියෙන් මුතු යනු මණි පත්‍රයෙන් මුක්ත (මල් කොපුවෙන් මිදුණු) යන අර්ථය සපය යි. මණි පත්‍රයෙන් මුක්ත යනු සීමාවක් දනවයි. එබැවින් අවධි විභක්තියට අයත් වේ.

අහසින් ලැබෙන දිය - අහස්දිය
ගොඩින් හමන සුළං - ගොඩසුළං
මිහියෙන් නැගුණු දුම් - මිහිදුම්

### vi. සම්බන්ධ විභක්ති සමාසය (සබඳ විබත් සමස්)

සම්බන්ධ විභක්තියට අයත් පදයක් පසු පදයක් හා සමාස වන්නේ නම් ඒ සම්බන්ධ විභක්ති සමාසය නම් වේ.

උදාහරණ - රජුගේ පිරිස - රජපිරිස
බුදුන්ගේ ගුණ - බුදුගුණ
රජුන්ගේ භෝජන - රාජභෝජන
ඇතුන්ගේ දළ - ඇත්දළ

### vii. ආධාර විභක්ති සාමාසය (අදර විබත් සමස්)

ආධාර විභක්තියට අයත් පදයක් පසු පදයක් සමග සමාස වන්නේ නම් ඒ ආධාර විභක්ති සමාසය යි.

උදාහරණ - බවයෙහි දුක් - බවදුක්
සරා කල්හි සඳ - සරාසඳ
පොලයෙහි තෙල් - පොල්තෙල්
වනයෙහි මල් - වනමල්

- ඇතැම් අවස්ථාවල පෙර පදයේ විභක්ති ප්‍රත්‍යය ලොප් නොවී සිදු වන සමාස තිබේ. එවැනි සමාස 'අලුප්ත සමාස' ලෙස නම් කෙරේ.

උදාහරණ - අතැවසනුයේ - අතැවැසි (අන්තේවාසිකයා)

**ඒ ඒ විභක්ති සමාස පද හුදකලාව ගෙන විභක්ති ප්‍රභේදය සඳහන් කළ නොහැකි ය.**

**ඒ සඳහා සමාස විග්‍රහය සැලකිය යුතු ම ය.**

උදාහරණ - ගසෙහි ගෙඩි = ගස්ගෙඩි - ආධාර විභක්ති සමාසය
ගසෙන් වැටුණු ගෙඩි = ගස්ගෙඩි - අවධි විභක්ති සමාසය
ගසෙන් ලැබෙන ගෙඩි = ගස්ගෙඩි - කරණ විභක්ති සමාසය

## ක්‍රියාකාරකම 1


**පහත ප්‍රකාශයේ අංකිත පද කොටස් එක්කොට තනි පද ලෙස යොදා ඡේදය නැවත ලියන්න.**

නගරයෙහි වැසියන් අව්ව සහ වැස්ස තකන්නේ නැති ව දරුවන් ද මල්ලන් ද රැගෙන ඒ රැස්වීමට සහභාගි වූයේ ඉවසිල්ලක් නැතිව ය. එම දිනයේ සියලු ම කඩ ද සාප්පු ද වසා තිබුණි. තරුණයෝ ද තරුණියෝ ද නගරය පුරා ඔබ ද මොබ ද හැසිරෙති.

නායකයෝ සහ නායිකාවෝ උද්වේගවත් ආකාරයට පිරිස අමතති. හිරුගේ කිරණ ජනතාවට පීඩාවක් නොවූවත් පොදු වශයෙන් වැටෙන වැස්සක් පැවතීම තරමක් බාධා වුණි. දෙවියන්ගේ දුන්න හිරු බසින දිශාවේ දිස්වෙයි.

**අව්‍යය සමස් කුසුම් කළඹෙහි ඒ ඒ වර්ගයට අයත් කුසුමෙහි පෙතිවල ඒ ඒ වර්ගයට අයත් පද ලියා දක්වන්න.**

1. යාවජීව
2. සුපෝෂිත
3. නිෂේධන
4. අනාගත
5. නොවෙනස්
6. අනුබල
7. අමර
8. නිෂ්කාශන
9. තාවකාලික
10. නිශ්ශබ්ද
11. පමණ
12. කුකවි
13. යාවත්කාලීන
14. අකුසල්
15. දුරවබෝධ
16. පසිඳු
17. සුපිපි
18. යථාර්ථ
19. අතිරස
20. අභිමාන
21. නොමනා
22. උපදෙස්
23. උපනායක
24. අනාචාර



## ක්‍රියාකාරකම 2

- **පහත සඳහන් විග්‍රහයන්ට අදාළ සමාස පදය ලියා එහි විභක්ති ප්‍රභේදය නම් කරන්න.**

| උදා:- රජුගේ පිරිස | රජපිරිස | සම්බන්ධ විභක්ති සමාසය |
|---|---|---|
| ගුරුවරයාට දෙන පඬුරු | | |
| ගුරුවරයාගෙන් ලැබුණු උපදෙස් | | |
| ගමෙහි වසන | | |
| අතින් කරන කම් | | |
| බුදුන්ගේ බණ | | |
| බුදුන් විසින් දෙසන ලද බණ | | |
| පොලයෙහි තෙල් | | |
| පොල්වලින් ගත් තෙල් | | |
| ළමයින්ගේ ගීත | | |

## 3. විශේෂණ සමාසය (වෙසසුන් සමස්)

සමාන සමූහයකින් එකක් හෝ කීපයක් වෙන් කර හඳුනාගැනීමට යොදන පදය විශේෂණ පදය යි. එවැනි පදයක් විශේෂ්‍ය පදයක් සමග සමාස වන විට එය විශේෂණ සමාසය යි.


සිදත් සඟරාව විශේෂණ සමාසය මෙසේ හඳුන්වයි.

විදැ වතින් තොර - සිය දැ වතට සමවත
වෙසෙසා සබඳ සදැ වත - වෙසෙසුන් සමස් එ වියූ

**තේරුම**

විජාතීය වස්තුවෙන් (තොර වූ) ස්වජාතිය වස්තුවට සමාන වූ වස්තුව විශේෂණ කොට සම්බන්ධ වන කල්හි එය විශේෂණ සමාසය යි.

පෙර පදයේ හා පර පදයේ ලක්ෂණ අනුව විශේෂණ සමාසය හය වැදෑරුම් ය.




## i. විශේෂණ පූර්ව පද විශේෂණ සමාසය

විශේෂණ පදය සමාස පදයේ පූර්වයෙන් යෙදී ඇති විට එය විශේෂණ පූර්ව පද විශේෂණ සමාසය නම් වේ.

නිදර්ශන - නිල්මල
කළුකුඩය

## ii. විශේෂණ උත්තර පද විශේෂණ සමාසය

විශේෂණ පදය පසු පදය ලෙස යෙදී සිදු වන සමාසය විශේෂණ උත්තර පද හෙවත් විශේෂණ පසු පද විශේෂණ සමාසය ලෙස නම් කරයි.

නිදර්ශන - මව්මැහැලි - මහලු වූ මව
ලියකොමළ - කෝමළ වූ ලිය

## iii. උපමාන පූර්ව පද විශේෂණ සමාසය

සමාස විග්‍රහයේ උපමාන අර්ථය දෙන පදය සමාස පදයේ මුලට යෙදී ඇති විට එය උපමාන පූර්ව පද විශේෂණ සමාසය නම් වේ.

නිදසුන් - රකුසකුගේ මුහුණ වැනි මුහුණ = රකුසුමුහුණ

මෙහි රකුසු යන්නෙන් උපමාන අර්ථය හඟවයි. එය මුහුණ යන පදයට විශේෂණයක් වී ඇත. රකුසකුගේ මුහුණ වැනි මුහුණ යන්න මෙමගින් පැවසේ.

සඳවත - සඳ වැනි වූ වත
මල්සිනා - මල් වැනි වූ සිනා
ගල්හිත - ගලක් වැනි වූ හිත

## iv. උපමාන උත්තර පද විශේෂණ සමාසය

උපමානයක් වූ විශේෂණය උත්තර පදය ලෙස හෙවත් දෙවන පදය ලෙස සිට සිදු වන සමාසය උපමා උත්තර පද විශේෂණ සමාසය නම් වේ.

සමාස විග්‍රහයේ උපමාන අර්ථය දෙන පදය සමාස පදයේ අගට යෙදී ඇත්නම් එය උපමාන උත්තර පද හෙවත් උපමාන අපර පද විශේෂණ සමාසය යි.

සිනාමල් - මල් වැනි වූ සිනා
නරදෙව් - දෙවියෙකු වැනි මිනිසා
නරරකුසු - රකුසකු වැනි මිනිසා
පාපියුම් - පියුමක් වැනි පාද
මුවකමල - කමලක් වැනි මුව

## v. සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය

විශේෂණය වශයෙන් සංඛ්‍යාවාචී පදයක් පෙර පදය සේ යෙදී සිදු වන සමාසය සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය නම් වේ.

නිදසුන් - අටසිල්

සිල් යනු විශේෂ්‍ය පදය යි. අට යනු ඊට විශේෂණ වන සංඛ්‍යාවාචී පදය වේ. සිල් අටක් එක් කර සලකන ලද නිසා 'අටසිල්' වේ. තවත් එබඳු නිදසුන් කීපයක්,

දෙලෝ
නවදොර
දසපනත
දෙඅත්
සදෙව්ලොව

## vi. සංඛ්‍යා උත්තර පද හෙවත් සංඛ්‍යා පර පද විශේෂණ සමාසය

සංඛ්‍යාවාචී පදයක් විශේෂණය වී විශේෂ්‍ය පදයට පසුව යෙදෙන විට සංඛ්‍යා උත්තර පද හෙවත් සංඛ්‍යා පසු පද විශේෂණ සමාසය ලෙස නම් කරයි.

නිදසුන් - අත්දෙක
දොරටුදෙක
ගම්පහ
ඇඟිලිදහස
රුපියල්දෙක

## ක්‍රියාකාරකම 3

**පහත දැක්වෙන විශේෂණ සමාස පද අයත් වන විශේෂණ සමාස වර්ගය තෝරා ඊතලයකින් යා කරන්න.**

| | |
|---|---|
| 1. සිසිල්පැන් | විශේෂණ පූර්ව පද විශේෂණ සමාසය |
| 2. ගුත්තිලඇඳුරු | සංඛ්‍යා උත්තර පද විශේෂණ සමාසය |
| 3. වතකමල | විශේෂණ උත්තර පද විශේෂණ සමාසය |
| 4. මල්සිනහව | සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය |
| 5. තෙරුවන් | උපමාන පූර්ව පද විශේෂණ සමාසය |
| 6. අටසිල් | විශේෂණ පූර්ව පද විශේෂණ සමාසය |
| 7. ගල්හිත | උපමාන උත්තර පද විශේෂණ සමාසය |
| 8. කළුකොඩි | සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය |
| 9. දසසිල් | උපමාන පූර්ව පද විශේෂණ සමාසය |
| 10. තුන්සරණ | උපමාන උත්තර පද විශේෂණ සමාසය |

## ක්‍රියාකාරකම 4

**පහත දැක්වෙන ප්‍රකාශ සමාස කොට පහත ඒ සමාස පදවලින් වාක්‍ය සම්පූර්ණ කරන්න.**

- රුවන් තුනක් වූයේ .............................
- සුදු වූ මල් .............................
- පඬි වූ විදුර .............................
- සැරියුත් නම් වූ තෙර .............................
- ගලක් වැනි වූ හිත .............................
- මල් වැනි වූ සිනහව .............................
- දහයක් වූ සිල් .............................
- නිල් වූ මල් .............................
- සයුරක් වැනි වූ භවයෙන් .............................
- පහක් වූ සිල් .............................

1. අපි ............................. ගෙන මුනිඳු පුදමු.
2. අපි ............................... සුරකින සමාජයක් තනමු.
3. ළමයි උදෙන් ම .................................. සරණ යති.
4. ..................................... පැන විසඳුවේ ය.
5. ..................................... ධර්මය දේශනා කරයි.
6. බොදු මග යන්නෝ .................................. එතෙර වෙති.
7. ඔහුගේ .............................. ඔහුට විනාශය ගෙන දුන්නේ ය.
8. නංගීගේ ............................... දැක අම්මා සතුටු වූවා ය.
9. ................................ සමාදන් වූ අපි විහාරයේ නතර ව සිටියෙමු.
10. අපි ............................ ගෙන විහාරයට ගියෙමු.

## 4. අන්‍යාර්ථ සමාසය (අන් අරුත් සමස්)

වෙන් වෙන් අර්ථ ඇති පද සමාස වීමෙන් පසු එම පදවලින් අන්‍ය වූ අර්ථයක් සමාස පදයට ලැබේ නම් එය වෙනස් වූ අර්ථයක් ගෙන දෙන නිසා අන්‍යාර්ථ සමාසය ලෙස හඳුන්වයි. නිදසුනකින් මෙය පැහැදිලි කර ගනිමු.

නෙත් තුනක් ඇත්තේ - තිනෙත් - ඊශ්වර

සිදත් සඟරාවේ අන්‍යාර්ථ සමාසය හඳුන්වන්නේ මේ ආකාරයෙනි.

කියොලත අන් අරුත් - පදනත් අනේ වැ සියෝ
එ සමස් අන් අරුත් නම් - එහි බේ සත් විබතැ වේ

**තේරුම**

අන්‍ය වූ අර්ථ ඇති නොයෙක් පදයන් එක් ව අන්‍යාර්ථයක් ප්‍රකාශ කරන කල්හි ඒ අන්‍යාර්ථ සමාස නම් වේ.

මෙම අන්‍යාර්ථ සමාසය විභක්ති අර්ථ අනුව ප්‍රභේද හතකට බෙදිය හැකි ය.

### i. කර්ම විභක්ති අන්‍යාර්ථ සමාසය

සමාස පදයෙන් ලැබෙන අර්ථය (අන්‍යාර්ථය) කර්මාර්ථයක් ගෙන දෙන්නේ නම් ඒ කර්ම විභක්ති අන්‍යාර්ථ සමාසය නම් වෙයි.

**'එරුණු හස්'** යනු අන්‍යාර්ථ සමාස පදයකි. හංසයා එරුණේ යමකට ද එය 'එරුණු හස්' යන නම් වේ. ඒ අනුව **'එරුණු හස්'** යන සමාස පදයෙන් ලැබෙන අන්‍යාර්ථය නම් විල යනු යි. හංසයාගේ එරීමට විල ගොදුරු වූ හෙයින් 'විල' කර්මාර්ථයක් ගනී. කර්ම විභක්ති අන්‍යාර්ථ සමාසයට එය අයත් වන්නේ එනිසා ය.

උදා :- හිරු බටුයේ කොතැනට ද ඒ - බටහිර - අපරදිග
නැගෙන්නා වූ ඉර - නැගෙනහිර - පෙරදිග

### ii. කර්තෘ විභක්ති අන්‍යාර්ථ සමාසය (කතු විබත් අන් අරුත් සමස්)

දමනය කරන ලද ඉඳුරෝ යමෙකු විනිස් ද ඒ - 'දැමිඳුරු' ලෙස නම් කරයි. දැමිඳුරු යනු මුනිවරයාට ප්‍රකාශ කරන නමකි. මුනිවරයා විසින් ඉඳුරන් දමනය කරන ලද නිසා එහි කර්තෘ අර්ථයක් ගනී. එබැවින් 'දැමිඳුරු' කර්තෘ විභක්ති අන්‍යාර්ථ සමාසයට අයත් වේ.

උදා :- දිනය කරනුයේ යමෙකු විසින් ද ඒ - දිනකර - හිරු
නිස කරනුයේ යමෙකු විසින් ද ඒ - නිසාකර - සඳ

### iii. කරණ විභක්ති අන්‍යාර්ථ සමාසය (කරණ විබත් අන් අරුත් සමස්)

යම් දෙයක් කරණ කොට ගෙන බත් සුන් වූයේ ද ඒ 'සුන්බත්' ලෙස හඳුන්වයි. **'සුන්බත්'** යන සමාස පදයේ අන්‍යාර්ථය නම් අඹුසැමි කෝලාහලය යි. කෝලාහලය කරණ කොට ගෙන බත් සුන් වේ, නැති වේ. බත් සුන් වීමට, කෝලාහලය කාරණයක් වූ හෙයින් 'සුන්බත්' යන සමාස පදය කරණ විභක්ති අන්‍යාර්ථ සමාසයට ඇතුළත් වේ.

උදා :- පත් (පත්‍ර) සිඳෙනුයේ යමකින් ද ඒ - පත්හිඳ - ලේඛනී
තුරු සුන් වූයේ යමකින් ද ඒ - සුන්තුරු - පොරොව

### iv. සම්ප්‍රදාන විභක්ති අන්‍යාර්ථ සමාසය (සපදන් විබත් අන් අරුත් සමස්)

වස්ත්‍ර යම් කෙනෙකුට දෙන ලද්දේ ද ඔහු **'දුන්වත්'** යන අර්ථ ගෙන දේ. එම සමාස පදයේ අන්‍යාර්ථය නම් 'බමුණා' යනු යි. යමක් ලබන තැනැත්තා සම්ප්‍රදාන විභක්ති ගන්නා බැවින් 'දුන්වත්' යන්නෙහි අන්‍යාර්ථය සම්ප්‍රදාන විභක්තිය ගනියි.

### v. අවධි විභක්ති අන්‍යාර්ථ සමාසය (අවධි විබත් අන් අරුත් සමස්)

පද දෙකක් සමාස වී එම සමාස පදයෙන් පැවසෙන අන්‍යාර්ථය අවධි අර්ථයක් ප්‍රකාශ කරයි නම් එය අවධි විභක්ති අන්‍යාර්ථ සමාසය යි. නිදසුනකින් විමසාබලමු. 'ගුලුගොනගුල්' යනු අවධි විභක්ති අන්‍යාර්ථ සමාස පදයකි. ගොනගුල් වඳුරාට නමකි. ගුළු ගිලුහුණ යන අර්ථය ගෙන දෙයි. මේ පද දෙක සමාස වූ විට තැනෙන 'ගුළුගොනගුල්' යන සමාස පදයේ අන්‍යාර්ථය ගසට නමකි. ගසින් වඳුරා ගිලිහුණ අර්ථය ගන්නා නිසා එය අවධි විභක්ති අන්‍යාර්ථ සමාසයට අයත් වේ.

### vi. සම්බන්ධ විභක්ති අන්‍යාර්ථ සමාසය (සබඳ විබත් අන් අරුත් සමස්)

සමාස පදයෙන් ගෙනෙන අන්‍යාර්ථය සම්බන්ධ අර්ථයක් ගෙන දේ නම් එය සම්බන්ධ විභක්ති අන්‍යාර්ථ සමාසය යි. 'දසබල' යනු අන්‍යාර්ථ සමාස පදයකි. බල දහයක් ඇත්තේ යමෙකුගේ ද, මෙය සමාස වූ කල තැනෙන 'දසබල' යන සමාස පදයෙන් ගෙන එන අන්‍යාර්ථය 'බුදුරජ' යනු යි. බල දහයක් ඇති යන, අර්ථය අයිතියක් හිමිකමක් ගෙන දෙන බැවින් 'දසබල' යනු සම්බන්ධ විභක්ති අන්‍යාර්ථයට ගනී.

උදා :- හිස් දහසක් ඇත්තේ යමෙකුගේ ද ඒ - දසිස් - රාවණ
සහසක් ඇස් ඇත්තේ ඒ - සහසැස් - ශක්‍රයා

### vii. ආධාර විභක්ති අන්‍යාර්ථ සමාසය (අදර විබත් අන් අරුත් සමස්)

'මත්තේ ගජන්' යන අන්‍යාර්ථ සමාස පදයේ අන්‍යාර්ථය වනාන්තරය යනු යි. මද සහිත නොයෙක් හස්තීහු වනාන්තරයේ සිටිති. මත්වූ නොයෙක් ඇතුන් ඇත්තේ යම් තැනක ද ඒ වනාන්තරය යි. ඇතුන්ගේ සිටීමට වනාන්තරය ආධාරයක් විය. එනිසා වනාන්තරය සඳහා යෙදෙන 'මත්තේගජන්' ආධාර විභක්ති අන්‍යාර්ථ සමාසයට ගනී.

උදා :- සස ඇත්තේ යමෙක ද ඒ - සිසි - හඳ
අකාරය ආදි කොට පද ඇත්තේ යමක ද ඒ - අකාරාදිය - ශබ්දකෝෂය

අන්‍යාර්ථ සමාසයේ තවත් ප්‍රභේද දෙකකි.

i. තද්ගුණ අන්‍යාර්ථ සමාසය (තගුණ අන් අරුත් සමස්)
ii. අතද්ගුණ අන්‍යාර්ථ සමාසය (අතගුණ අන් අරුත් සමස්) යනුවෙනි.

### i. තද්ගුණ අන්‍යාර්ථ සමාසය (තගුණ අන් අරුත් සමස්)

සමාස වන පදයේ ඇති අන්‍යාර්ථයෙහි සඳහන් ගුණය එයින් පැවසෙන පුද්ගලයා කෙරෙහි හෝ වස්තුව තුළ දක්නට ලැබේ නම් එය තද්ගුණ අන්‍යාර්ථ සමාසය නම් වේ.

නිදසුන් - 'ලඹසවන්'

ලඹසවන් යනු එල්ලෙන කන් ඇත්තා යි. එයින් ලැබෙන අන්‍යාර්ථය නම් 'ක්ෂත්‍රියයා' යනු යි. එල්ලෙන කන් ක්ෂත්‍රියයා කෙරෙහි දක්නට ලැබෙන ගුණයකි. මෙසේ සමාස පදයෙන් පැවසෙන ගුණය එයින් හඟවන තැනැත්තා කෙරෙහි දක්නට ලැබෙන නිසා 'ලඹසවන්' යන සමාස පදය තද්ගුණ අන්‍යාර්ථ සමාසයට නිදසුනකි.

### ii. අතද්ගුණ අන්‍යාර්ථ සමාසය (අතගුණ අන් අරුත් සමස්)

අන්‍යාර්ථයේ සඳහන් වන ගුණය එයින් පැවසෙන පුද්ගලයා කෙරෙහි හෝ වස්තුව කෙරෙහි දක්නට නොලැබේ නම් ඒ අතද්ගුණ අන්‍යාර්ථ සමාසය නම් වේ.

'ඉකුත්සයුරු' යනු සයුරු ඉකුත් කළ කෙනාට හෝ නැවට යොදන නමකි. එහෙත් සාගරය තරණය කළ පුද්ගලයා තුළ හෝ නැවක හෝ එම ගුණය දක්නට නොලැබේ. එබැවින් 'ඉකුත්සයුරු' යනු අතද්ගුණ අන්‍යාර්ථ සමාසයට අයත් වේ.

## 5. දකාරාර්ථ සමාසය (ද අරුත් සමස්)

ද කාරය භාෂාවේ අර්ථ දෙකක යෙදේ. එනම්

1. ප්‍රශ්නාර්ථයෙහි
   උදා :- එහි ගියේ ඔබ ද මම ද?

2. සමුච්චයාර්ථයෙහි
   උදා :- ඔබ ද මම ද එහි ගියෙමු.

මෙයින් සමාසයට අදාළ වන්නේ සමුච්චයාර්ථයේ ද නිපාතය යි. එම අර්ථය අඟවන තවත් නිපාත වෙයි. ඒවානම් ත්, යි, සහ, හා ආදිය යි. මෙම සමුච්චයාර්ථ නිපාතවලින් පද කීපයක් සම්බන්ධ වී, එම නිපාත ඉවත් කොට ඒ හා සම්බන්ධිත එම පද සමාස කිරීම දකාරාර්ථ සමාසය යි.

| නිදසුන් - | | |
|---|---|---|
| | ඉර ද හඳ ද | - ඉරහඳ |
| | තෙලුත් මලුත් පහනුත් | - තෙල්මල්පහන් |
| | ඇඳුම් සහ පැලඳුම් | - ඇඳුම්පැලඳුම් |
| | ගස් හා වැල් | - ගස්වැල් |
| | බතුයි මාළුයි | - බත්මාළු |

★ පද දෙකක් පමණක් දකාරාර්ථ ක්‍රමයට සමාස වන විට ඒ සෑම පදයක් ම යුගල පදයක් වේ.

සිදත් සඟරාවේ ද අරුත් සමස් හඳුන්වන්නේ මේ ආකාරයෙනි.

"අඟ පා මොක් වත - සමුදමැ හෝ එපදන්
ද අරුතැ වූ පද සමාම් - ද අරුත් සමස් නම් වේ"

**තේරුම**

පදයන්ගේ අංග හෙවත් අවයවයන් ප්‍රමුඛ වුවහොත් හෝ සමුදයාර්ථයක් ප්‍රමුඛ වන කල්හි හෝ දකාරාර්ථයෙහි වූ පදයන්ගේ එක් වීම දකාරාර්ථ සමාස නම් වේ.

දකාරාර්ථ සමාසයේ ප්‍රභේද දෙකකි.

i. අංග ප්‍රධාන
ii. සමුදාය ප්‍රධාන යනුවෙනි.

## i. අංග ප්‍රධාන

බඹසුරනරෝ නමදිත් යන තැන බඹසුරනර යනුවෙන් සමාස වී ඇත්තේ බඹහු ද සුරහු ද නරහු ද යනාකාරයෙන් 'ද' නිපාතයෙන් වෙන් කර ලියා ඇති පද කීපයකි. මේ එක් එක් අවයවයක් නමදිති යන ක්‍රියාවෙන් බැඳී සිටියි. එනිසා බඹ සුර නර යන අවයව තුන ම ප්‍රධානත්වයක් ගනී. අවයව ප්‍රමුඛ ලෙස සලකන ලද්දේ එනිසා ය.

## ii. සමුදාය ප්‍රධාන

පෙර සඳහන් වූ පරිදි අවයව වශයෙන් නොගෙන එක ම සමූහයක් ලෙස පැවතීම සමුදය ප්‍රධාන ලෙස සලකයි.

උදහරණ - ගී ද නැටුම් ද - ගී නැටුම්

මෙහිදී අවයව වශයෙන් වෙන වෙන ම නොගෙන ගී නැටුම් ලෙස එක ම සමූහයක් ලෙස ගැනීම සමුදය ප්‍රධාන ලෙස සලකයි.

## ක්‍රියාකාරකම 5


1. අන්‍යාර්ථ සමාසයේ ප්‍රභේද නම් කරන්න.

## ක්‍රියාකාරකම 6

1. විභක්ති සමාසයේ ප්‍රභේද නම් කරන්න.

## ක්‍රියාකාරකම 7

- පහත සඳහන් සමාස සටහනෙහි බෙදී ඇති ප්‍රශාඛා සුදුසු උදාහරණ පදවලින් පුරවන්න.



## සුභාෂිත

එක එක මොහොතින්
ගතහොත් නිසි පල
ටික් ටික් ටික් ටික්
පැමිණේ සැප බල

කාලය මඳකුත්
නොම කළ හැකි දික්
නිකමට නොයවන්
ටික් ටික් ටික් ටික්

-කුමාරතුංග මුනිදාස-

## සුචින්තන

ගංගාව තමාගේ දිය නොබොන්නී ය.
වෘක්ෂයෝ තමන්ගේ ම පල නොබුදින්නෝ ය.
සූර්යයා සිය ප්‍රයෝජනය තකා තාපය නිකුත් නොකරන්නේ ය.
පුෂ්පයෝ සිය ප්‍රයෝජනය තකා සුවඳ නොපතුරවන්නෝ ය.
බලන්න, ස්වභාව ධර්මයාගේ සනාතන දහම අනුන් හට ම කැපවීම යි.

# 05

# ආඛ්‍යාත පද

නාම පද, ක්‍රියා පද, නිපාත පද හා උපසර්ග වාක්‍ය නිර්මාණයෙහිලා සමාන ප්‍රධානත්වයකින් දායක වෙයි. නිවැරැදි ලේඛන ව්‍යවහාරය සඳහා සම්මත රීතිවලට අනුකූලව ක්‍රියා පද භාවිත විය යුතු ය. ආඛ්‍යාත පද යන්න නිවැරැදි ව හඳුනා ගැනීම, එහි ප්‍රභේද, ඒ එකිනෙකෙහි ඇති සුවිශේෂ ලක්ෂණ හා ආඛ්‍යාත පද වරනැඟීම ආදිය පිළිබඳ ඔබට සවිස්තරාත්මක දැනුමක් ලබා දීම මෙම පාඩමේ අරමුණ යි.

# ආඛ්‍යාත පද

සභාපති හිමි : සද්ධර්මෝදය පාරිවේණික ශිෂ්‍ය සංගමයේ අද පැවැත්වෙන රැස්වීමේ න්‍යාය පත්‍රයට අනුව මීළඟට තිබෙන්නේ විශේෂාංග වැඩසටහන යි. අද විශේෂාංග වැඩසටහන යටතේ සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට ප්‍රාචීන මධ්‍යම පන්තියේ කිනිගම මහින්ද හිමියන් සමග සිංහල විෂයභාර මාවනැල්ලේ රාහුල ගුරු හිමියන්ට යි දැන් අවස්ථාව.

මහින්ද හිමි : ගරු පරිවෙණාධිපති හිමියන් ඇතුළු ආචාර්ය මණ්ඩලයෙන් අවසර යි. මගේ සහෝදර හිමිවරුනි, අප අද බලාපොරොත්තු වෙන්නේ ඔබේ සිංහල ව්‍යාකරණය පිළිබඳ දැනුමට යමක් එකතු කිරීමට යි. අද අපේ මාතෘකාව ආඛ්‍යාත පද යන්න යි. ඒ සඳහා මා සමග සම්මුඛ සාකච්ඡාවට එකතු වන්නේ සිංහල විෂයභාර ආචාර්ය මාවනැල්ලේ රාහුල හිමියනු යි. මා ප්‍රථමයෙන් උන්වහන්සේ ගෞරවයෙන් පිළිගන්නව, තෙරුවන් සරණයි අපේ හාමුදුරුවනේ.

රාහුල හිමි : තෙරුවන් සරණයි

මහින්ද හිමි : පළමුවෙන් මා දැනගන්න කැමතියි ක්‍රියා පදයක් කියන්නේ මොකද්ද කියලා.

රාහුල හිමි : එහෙමයි හාමුදුරුවනේ. **සාමාන්‍යයෙන් ක්‍රියා පද කියන්නේ කිරීමක්, සිදුවීමක්, විඳීමක් හඟවන පද යි.** දැන් මේ උදාහරණ දිහා බලන්න.

ළමයා පොත කියවයි.
ගසින් ගෙඩියක් වැටෙයි.
සිසිල් සුළඟින් ගතට සුවයක් දැනෙයි.

'කියවයි' කියන්නේ යම් කෙනෙකු කරන දෙයක්, 'වැටෙයි' කියන්නෙ ඉබේ සිදුවන දෙයක්, 'දැනෙයි' කියන්නේ විඳීමක්. ඔය විදිහට තමයි අප කුඩා කාලයේ ඉඳලා ක්‍රියාපද ගැන ඉගෙනගෙන තියෙන්නේ. ඒ වුණාට සිදත් සඟරාවේ පළමු වන අදියරේ මෙන්න මෙහෙම ක්‍රියාපද හැඳින්වෙනවා. එහි දැක්වෙන විදියට 'කිරිය' යන්න හඳුන්වනවා **"නොදැව් නුගුණ දැව් නිසා සකරුණෙන් ද මුව වැ සිදු කිරිය නම්"** කියලා. **එහි තේරුම ද්‍රව්‍යයක් නොවන ගුණයක් නොවන ද්‍රව්‍යයක් ආශ්‍රය කොටගෙන කාරක සයෙන් ධාතුවක් මුල් වීමෙන් සිද්ධ වන්නේ ක්‍රියා නම් වේ.**
අපේ විශිෂ්ට විද්වතකු වූ මුනිදාස කුමාරතුංග මහත්තයා එතුමාගේ 'ක්‍රියා විවරණය' නමැති පොතේ ක්‍රියා පද යන්න හඳුන්වා දී ඇත්තේ 'ධාත්වර්ථයක් දෙනුයේ ක්‍රියා' වශයෙනු යි. ධාතුවක අර්ථය දෙන්නේ ක්‍රියා කියල යි එතුමා හඳුන්වන්නේ.

මහින්ද හිමි : හොඳයි, දැන් අපට ක්‍රියා පද ගැන යම් වැටහීමක් ලැබුණා. අප ඊළඟට ක්‍රියාපද පිළිබඳ මාතෘකාවේ තව ගැඹුරට ගියොත්,

රාහුල හිමි : එහෙමයි හාමුදුරුවනේ, පොදුවේ ක්‍රියා පදවල දකින්නට ලැබෙන විශේෂ ලක්ෂණ අනුව ඒවා වර්ග තුනකට බෙදන්න පුළුවන්. ඒවා තමයි

1. අවසාන ක්‍රියා
2. නාම ක්‍රියා
3. නිපාත ක්‍රියා

## අවසාන ක්‍රියා

මහින්ද හිමි : මොනවද ඒ අවසාන ක්‍රියා කියන්නෙ?

රාහුල හිමි : අවසාන ක්‍රියා කියන්නේ පූර්ණ ක්‍රියා ලක්ෂණ පෙන්වන ක්‍රියා පද යි. මා දෙවෙනි ව දක්වුව නාම ක්‍රියාත් අවසාන ක්‍රියා විශේෂයක් වුණත් ඒවායේ නාම ලක්ෂණත් ක්‍රියා ලක්ෂණත් තියෙනවා. ඒ වුණාට මා දැක්වුව අවසාන ක්‍රියා පූර්ණ ක්‍රියා ලක්ෂණ පමණක් පෙන්නුම් කරන නිසා නාම ක්‍රියාවලින් අවසාන ක්‍රියා වෙන් කර දක්වන්න පුළුවන්. මේ අවසාන ක්‍රියාත් නැවතත් වර්ග හතර (4)කට බෙදා දක්වන්න පුළුවන්. මේ ආඛ්‍යාත වර්ග ගැන හතර (4) වෙනි පන්තියේදී ඔබට සාමාන්‍ය දැනුමක් ලැබෙන්න ඇති.

1 ආඛ්‍යාත ක්‍රියා ඒ කියන්නේ ශුද්ධ ආඛ්‍යාත
2 ප්‍රයෝජ්‍ය ආඛ්‍යාත
3 විධි ආඛ්‍යාත
4 ප්‍රාර්ථනා ආඛ්‍යාත

මේ වර්ග හතරේ ම පූර්ණ ක්‍රියා ලක්ෂණ තියෙනවා. අපි ඉස්සෙල්ලා ම ගනිමු ආඛ්‍යාත ක්‍රියා කියන එක.

## 1. ආඛ්‍යාත ක්‍රියා හෙවත් ශුද්ධ ආඛ්‍යාතය

සෑම ක්‍රියාවක් ම ආඛ්‍යාත ක්‍රියාවක් නොවෙයි. ආඛ්‍යාත ක්‍රියාවක නැත්නම් ශුද්ධ ආඛ්‍යාතයක ක්‍රියා අර්ථය ශුද්ධ ව, අමිශ්‍ර ව තියෙනවා. එබඳු ශුද්ධ ක්‍රියා අර්ථය ඇති ධාතු ප්‍රකෘතියකට ආඛ්‍යාත ප්‍රත්‍යයක් එකතු වෙලා හැදෙන්නේ ආඛ්‍යාත ක්‍රියා යි. ඒවා තමයි ශුද්ධ ආඛ්‍යාත ලෙස හඳුන්වන්නෙ. ඒ වගේ ම ඒවායේ විශේෂ ලක්ෂණයක් තමයි ලිංග භේදයක් නොමැති වීම.

බලන්න මේ උදාහරණ දිහා,

| අනතීත | අතීත |
|---|---|
| ඔහු ලියුමක් ලියයි. | ඔහු ලියුමක් ලිවී ය. |
| ඈ ලියුමක් ලියයි. | ඈ ලියුමක් ලිවී ය. |
| නළුවෝ නැටුම් නටති. | නළුවෝ නැටුම් නැටූහ. |
| නිළියෝ නැටුම් නටති. | නිළියෝ නැටුම් නැටූහ. |
| තෝ ගීයක් ගයහි. | තෝ ගීයක් ගැයීහි. |
| තී ගීයක් ගයහි. | තී ගීයක් ගැයීහි. |

මේවා ත්‍රෛකාලික ක්‍රියා විදියටත් සාම්ප්‍රදායික ව්‍යාකරණ පොත්වල හඳුන්වල දීල තියෙනවා. ඒත් මා ඒ හැඳින්වීමට එකඟ නැහැ. මොකද සිංහල භාෂාවේ තියෙන්නේ කාල දෙකකට අයත් ක්‍රියා විතර යි. ඒ කියන්නේ අතීත කාල ක්‍රියා පද සහ වර්තමාන අනාගත කාල දෙකට ම පොදු ක්‍රියා පද විතර යි. මාතෘකාවෙන් ටිකක් බැහැරට ගියත් ශුද්ධ ආඛ්‍යාත හඳුනා ගන්නත් ඒක උදව් වෙන නිසා මම විස්තර කරන්නම්. සිදත් සඟරාවේ අන්නේ, එන්නේ, ඔන්නේ, නේ කියලා අනාගත කාල ප්‍රථම පුරුෂ ඒක වචන ප්‍රත්‍යයන් හතරක් දක්වල තියෙනවා. මේවා අනාගත කාල ක්‍රියා ප්‍රත්‍ය නොවෙයි. වර්තමාන කෘදන්ත ප්‍රත්‍යයන් ය. ඒවා ශුද්ධ ආඛ්‍යාත වගේ නොවෙයි. ලිංගාර්ථයේත් වරනැගෙනව බලන්න මේ වරනැගීම දිහා.

| පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග |
|---|---|
| සෙබළා රට රකින්නේ ය.<br>ඔහු බත් දෙන්නේ ය.<br>ඔහු කිරි බොන්නේ ය.<br>පියා දරුවන් රක්නේ ය. | සෙබළිය රට රකින්නී ය.<br>ඈ බත් දෙන්නී ය.<br>ඈ කිරි බොන්නී ය.<br>මව දරුවන් රක්නී ය. |

මහින්ද හිමි : ඔබ වහන්සේ කියන එක හරි. ආඛ්‍යාත ක්‍රියා ලිංගාර්ථයේ වරනැගෙන්නේ නැහැනේ. එහෙනම් මේවා වර්තමාන කාල කෘදන්ත මිස ශුද්ධ අනාගත කාල ආඛ්‍යාත නෙමෙයි.

රාහුල හිමි : ඒක තමයි මාත් කියන්නෙ. පැරණි භාෂා ව්‍යවහාරයෙත් අද වගේ ම අනාගත කාලය දක්වන්න ශුද්ධ වර්තමාන කාල ආඛ්‍යාතය එක්ක අනාගත කාලවාචී පදයක් යොදා ගෙන තියෙනව. බලන්න මේ උදාහරණය දිහා,

- මම ද එමි එම දින (ගුත්තිල කාව්‍යය)
- එ හසුන් පැසුළු පවසමි රස නුසුන් කොට (සැලළිහිණි සන්දේශය)
- සිල්ප සත්වෙනි දවස දක්වමි (ගුත්තිල කාව්‍යය)
- එයින් ගෙට ගිය නසී ගුරුහිණි (කාව්‍ය ශේඛරය)

මහින්ද හිමි : හරි දැන් පැහැදිලියි හාමුදුරුවනේ. ඒවා ත්‍රෛකාලික ක්‍රියා කියලා නෙවෙයි ආඛ්‍යාත ක්‍රියා කියල හැඳින්වීම යි නිවැරැදි. ඊළඟට අපට පැහැදිලි කරන්න, ආඛ්‍යාත ක්‍රියා වරනැගෙන්නේ කොහොමද කියලා.

රාහුල හිමි : හොඳයි, මේ වගුව දිහා බලන්න. මේ කර්තෘ කාරක ක්‍රියාව කාල, පුරුෂ වචන භේද අනුව වරනැගෙන ආකාරය.

| කර්තෘ කාරක | | | | |
|---|---|---|---|---|
| | අනතීත | | අතීත | |
| පුරුෂය | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| ප්‍රථම පුරුෂ | බලයි | බලති | බැලීය | බැලූහ |
| මධ්‍යම පුරුෂ | බලහි | බලහු | බැලීහි | බැලූහු |
| උත්තම පුරුෂ | බලමි | බලමු | බැලීමි | බැලූමු |

ඊළඟට මේ කර්මකාරක ක්‍රියාව කාල, පුරුෂ, වචන භේද අනුව වරනැගෙන ආකාරය බලන්න මේ වගුව.

| කර්ම කාරක | | | | |
|---|---|---|---|---|
| | අනතීත | | අතීත | |
| පුරුෂය | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| ප්‍රථම පුරුෂ | බැලෙයි | බැලෙති | බැලිණි | බැලුණු |
| මධ්‍යම පුරුෂ | බැලෙහි | බැලෙහු | බැලිණිහි | බැලුණුහු |
| උත්තම පුරුෂ | බැලෙමි | බැලෙමු | බැලිණිමි | බැලිණුමු |

මීළඟට මම කෘදන්ත ක්‍රියා හා ශුද්ධ ආඛ්‍යාත පැහැදිලි ව තේරුම් ගත හැකි පරිදි නිදසුන් වාක්‍ය කීපයක් දැක්වෙන වගුවක් ඉදිරිපත් කරන්නම්.

| | කෘදන්ත ක්‍රියාව | ශුද්ධාඛ්‍යාතය |
|---|---|---|
| 1. නාට්‍යාංගනාව රැඟුමක් ඉදිරිපත් | කරන්නී ය.<br>(කරන තැනැත්තිය) | කරයි. |
| 2. පාංකිරිත්තා උදෑසන ම අවදි ව මිහිරි ලෙස කූජනය | කරන්නේ ය.<br>(කරන තැනැත්තේ ය) | කරයි. |
| 3. ගොවියෝ කාබනික පොහොර භාවිතයට | හුරුවන්නෝ ය/ වන්නාහ<br>(හුරුවන තැනැත්තෝ ය) | හුරුවෙති. |
| 4. පොලිස් නිලධාරියා මාර්ගයේ වාහන ගමනාගමනය තාවකාලික ව නවත්වා මගීන්ට පාර මාරුවීමට ඉඩ | සැලැස්සුවේ ය.<br>(සැලැස්වූ තැනැත්තේ ය) | සැලැස්වී ය. |
| 5. රියදුරෝ සිය රථ වාහන මාර්ගයේ පසෙකට ගෙන ගිලන් රථයට ඉඩ | දුන්නෝ ය/ දුන්නාහ<br>(දුන්න තැනැත්තේය) | දුන්හ. |
| 6. තරුණිය බස්රියට නැගී මහලු මවකට සිය අසුන | පිදුවා ය.<br>(පිදූ තැනැත්ති ය) | පිදී ය. |
| 7. ආනන්ද සමරකෝන් සූරීහු ජාතික ගීය රචනා | කළෝ ය.<br>(කළ තැනැත්තෝ ය) | කළහ. |
| 8. සංවිධායකයන් විසින් ආරාධිත අමුත්තා | පිළිගනු ලබන්නේ ය.<br>(පිළිගනු ලබන තැනැත්තේ ය) | පිළිගනු ලබයි/ පිළිගැනෙයි. |
| 9. විදුහල්පතිවරයා විසින් ලසුලේඛිකාවක් | පත්කරන ලද්දී ය.<br>(පත්කරන ලද තනැත්තිය) | පත්කරන ලදි/ පත් කෙරිණි. |
| 10. වෛද්‍යවරුන් විසින් රෝගීහු පරීක්ෂා | කරනු ලබන්නෝ ය.<br>(කරනු ලබන තැනැත්තෝ ය) | කෙරෙති. |

## ක්‍රියාකාරකම 1

✿ පහත දක්වෙන ක්‍රියා පද ශුද්ධ ආඛ්‍යාත ක්‍රියා හා කෘදන්ත ක්‍රියා වශයෙන් බෙදා දක්වන්න.

| |
|---|
| කියවීමි, පැළෙයි, උසුලන්නේ ය, බැලුවා ය, දුරුහ, දුව්වා ය, ගොතයි, ලියූහ, තෝරන්නෝ ය, පදිති, ගැයුවෝ ය, කරන්නෝ ය, දුවන්නාහ, කියති, නැටූහ, දුරුහ, පිසන්නී ය, මනියි, පිදුවේ ය, දරන්නෙහි. |

| ආඛ්‍යාත ක්‍රියා | කෘදන්ත ක්‍රියා |
|---|---|
| 1. .................................................. | 1. .................................................. |
| 2. .................................................. | 2. .................................................. |
| 3. .................................................. | 3. .................................................. |
| 4. .................................................. | 4. .................................................. |
| 5. .................................................. | 5. .................................................. |
| 6. .................................................. | 6. .................................................. |
| 7. .................................................. | 7. .................................................. |
| 8. .................................................. | 8. .................................................. |
| 9. .................................................. | 9. .................................................. |
| 10. .................................................. | 10. .................................................. |

## ක්‍රියාකාරකම 2

✿ පහත වරහන් තුළ දී ඇති ක්‍රියා පද දෙක අතුරින් ආඛ්‍යාත ක්‍රියාව (ශුද්ධ ආඛ්‍යාතය) තෝරා වාක්‍යවල හිස් තැන් පුරවන්න.

1. සමහරු අනුන්ගේ ම දොස් ................................ (දකිති/දකින්නෝ ය)
2. වෛද්‍යවරිය රෝගීන්ගේ සුවපහසුව සොයා ................................ (බැලීය/බැලුවා ය)
3. අපි ද චාරිකාවට එක් ................................ (වූවෙමු/වීමු)
4. මී මැස්සෝ මී වදය තුළ ................................ (සිටින්නෝ ය/සිටිති)
5. දරුවෝ පාසල් වැඩවල නිරත ................................ (වූවෝ ය/වූහ)
6. ඇමැතිවරයා පුස්තකාල ගොඩනැගිල්ලට මුල්ගල ................................ (තැබීය/තැබුවේ ය)
7. ශිෂ්‍යයා රිය අනතුරට මුහුණ ................................ (දුනි/දුන්නේ ය)
8.සියලු ශිෂ්‍යයෝ උද්‍යෑසනින් පාසලට ................................ (පැමිණියහ/පැමැණියෝ ය)
9.ඈ සර්පයාට බිය ................................ (වුණා ය/ විය)
10.අපි අනතුර දැක විස්මයට ................................ (පත් වීමු/පත් වූයෙමු)

## 2. ප්‍රයෝජ්‍ය ආඛ්‍යාතය

මහින්ද හිමි : හොඳයි, දැන් අපි කතා කරමු ප්‍රයෝජ්‍ය ආඛ්‍යාතය ගැන

රාහුල හිමි : ප්‍රයෝජ්‍ය ආඛ්‍යාතය කියන්නෙ අනෙකෙකු විසින් මෙහෙයනු ලබන පුද්ගලයාගේ ක්‍රියාව යි. සිදත් සඟරාවේත් මේ අදහස ම දීල තියෙනවා මේ විදියට **"පරා විසින් මෙහෙයන ලදහු කිරිය පියදු කිරිය නම්"**

අපි නිදසුනක් ගනිමු.

**මව මෙහෙකාරිය ලවා බත් පිසවයි.**

i. මේ වාක්‍යයේ 'පිසවයි' යන ක්‍රියාවට සම්බන්ධ කතුවරුන් දෙදෙනෙකු ගැන කියවෙනවා. පිසවන ක්‍රියාව කරවන්නී මව යි. ඒ ක්‍රියාව කරන්නී මෙහෙකාරිය යි. ඒ නිසා ක්‍රියාව කරවන්නා ප්‍රයෝජ්‍ය කර්තෘ හෙවත් ශුද්ධ කර්තෘ විදියටත් ක්‍රියාව කරන්නා ප්‍රයෝජක කර්තෘ හෙවත් කර්ම කර්තෘ විදියටත් හඳුන්වන්න පුළුවන්. ඒ වාක්‍යයේ ප්‍රයෝජ්‍ය කර්තෘ මව යි; ප්‍රයෝජක කර්තෘ මෙහෙකාරිය යි.

ii. තව ලක්ෂණයක් තමයි ප්‍රයෝජ්‍ය ආඛ්‍යාතය හැදෙන විධි ය. ධාතු ප්‍රකෘතියටත් ප්‍රත්‍යයටත් අතර 'ව' ප්‍රත්‍යය යෙදීමෙන් තමයි ප්‍රයෝජ්‍ය ආඛ්‍යාතය හදාගන්නෙ. මෙහෙදී ඇතැමුන් 'ව' අකුරින් අවසන් වන 'කව', 'පොව' ආදි ධාතුවලින් සකස් වන 'කවයි', 'පොවයි' වගේ ක්‍රියා ප්‍රයෝජ්‍ය ක්‍රියා විදියට දක්වනවා. එය වැරැදියි.

| **ක්‍රියාව** | **ප්‍රයෝජ්‍ය ක්‍රියා** |
|---|---|
| කවයි | කවවයි |
| පොවයි | පොවවයි |
| පණගන්වයි | පණගන්වවයි |

මව දරුවාට බත් කවයි. - මව මෙහෙකාරිය ලවා දරුවාට බත් කවවයි.
රියදුරා රිය පණගන්වයි. - රියදුරා කාර්මිකයා ලවා රිය පණ ගන්වවයි.
හෙදිය රෝගියාට බෙහෙත් පොවයි. - වෛද්‍යවරයා හෙදිය ලවා රෝගියාට බෙහෙත් පොවවයි.

iii. ඒවගේ ම ප්‍රයෝජ්‍යාර්ථයේ වාක්‍යයක තවත් ලක්ෂණයක් දකින්නට ලැබෙනවා. ඒ තමයි කර්ම පද දෙකක් තිබීම. ඉහත වාක්‍යයේ 'පිසවයි' යන ප්‍රයෝජක කර්තෘගේ ක්‍රියාවට යටත් වන පදය මෙහෙකාරිය යි. ඒ නිසා ඒක, එක කර්ම පදයක්

මෙහෙකාරියගේ පිසීමේ ක්‍රියාවට යටත් වන්නේ 'බත්' යන පදය යි. ඒ නිසා ඒක තවත් කර්ම පදයක් මේ විදියට ප්‍රයෝජ්‍ය ආඛ්‍යාතයට යටත් වන කර්ම පද දෙකක් මෙබඳු වාක්‍යයක හඳුනා ගන්න පුළුවන්.

මහින්ද හිමි : ප්‍රයෝජ්‍ය ආඛ්‍යාතවල තවත් ලක්ෂණ තියෙනවා ද?

රාහුල හිමි : iv. එහෙමයි හාමුදුරුවනේ තවත් විශේෂ ලක්ෂණ තියෙනවා. වාක්‍යයක් ප්‍රයෝජ්‍යාර්ථයට නැගීමේදී දකින්නට ලැබෙන තවත් ලක්ෂණයක් තමයි අකර්මක ධාතු සකර්මක ධාතු බවට පත් වීම. ඒ වගේ ම සකර්මක ධාතු බහු කර්මක ධාතු බවටත් පත් වෙනවා. ඒ ලක්ෂණය සිදත් සඟරාවෙත් මේ විදියට දක්වල තියෙනවා.

අකම් සකම් වේ - පියදුම් ලද විසාහි
බුහු කම් සකම් පියදුම් - ලද හට ලවා හා වේ

මෙහෙයුම් ලද්දහුගේ ක්‍රියා විෂයයෙහි අකර්මක ක්‍රියා සකර්මක බවට ද සකර්මක ක්‍රියා බහු කර්මක බවට ද පත්වේ. මෙහෙයීම ලද්දහුට 'ලවා' යන්නක් ද එක් වෙයි.

'සඳ බබළයි' මේ අකර්මක ක්‍රියාවක් සහිත වාක්‍යයක්. එම වාක්‍යය 'ඉර සඳ බබළවයි' කියල ප්‍රයෝජ්‍යාර්ථයේ යෙදුවහම සකර්මක ක්‍රියාවක් සහිත වාක්‍යයක් බවට පත් වෙනවා. ඒ වගේ ම සකර්මක ක්‍රියාවක් සහිත වාක්‍යයක් බහු කර්මක වාක්‍යයක් බවට පත් වෙනවා. බලන්න මා ඉහත දැක්වූ අකර්මක වාක්‍යය සකර්මක වාක්‍යයක් බවට පත් වීමේදී යෙදී තිබුණෙ 'සඳ' කියන එක කර්ම පදය යි. මේ වාක්‍ය දෙක බලන්න.

**'කම්කරුවෝ පාලම තනති'** මේ සකර්මක වාක්‍යයක් කියන්නේ පාලම කියන එක කර්ම පදය යි. ඒ වාක්‍යය ප්‍රයෝජ්‍යාර්ථයේ යෙදුවම **'ඉංජිනේරුවෝ කම්කරුවන් ලවා පාලම තනවති'** කියල "කම්කරුවන්" "පාලම" කියන කර්ම පද දෙකක් වුණා. ඒ කියන්නේ සකර්මක වාක්‍යය බහු කර්මක වාක්‍යයක් බවට පත් වුණා. ඊළඟ ලක්ෂණය තමයි ප්‍රයෝජ්‍යාර්ථයේ වාක්‍යයට 'ලවා' යන නිපාත පදයක් එකතු වීම. ඒත් ඒක හැම තැනම සිද්ධ වෙන්නේ නැහැ. අකර්මක වාක්‍යයක් සකර්මක වීමේ දී බොහෝ විට 'ලවා' යන්න යෙදෙන්නේ නැහැ. බලන්න මේ උදාහරණය

ක්‍රීඩකයා දුවයි > පුහුණුකරු ක්‍රීඩකයා දුවවයි.
දරුවා හඬයි > වෛද්‍යවරයා දරුවා හඬවයි.

දැන් අපි මේ කියපු කරුණු සියල්ල සාරාංශ කරලා මේ විදියට දක්වමු.

1. ප්‍රයෝජක කර්තෘ හා ප්‍රයෝජ්‍ය කර්තෘ කියලා කතුවරුන් දෙදෙනෙකු සිටිනවා.
2. ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර 'ව' ප්‍රත්‍යය යෙදීමෙන් ප්‍රයෝජ්‍ය ආඛ්‍යාතය සෑදෙනවා.
3. ප්‍රයෝජ්‍යාර්ථයේ වාක්‍යයක කර්ම පද දෙකක් දක්නට ලැබෙනවා.
4. අකර්මක ක්‍රියා සකර්මක වෙනවා.
5. සකර්මක ක්‍රියා බහු කර්මක වෙනවා.
6. ප්‍රයෝජ්‍යාර්ථයේ වාක්‍යයට 'ලවා' යන නිපාතය එකතුවෙනවා.
7. එහෙත් අකර්මක වාක්‍ය ප්‍රයෝජ්‍යාර්ථයට හැරවීමේදී 'ලවා' යන නිපාතය බොහෝ විට යෙදෙන්නේ නැහැ.

## ක්‍රියාකාරකම 3

**පහත සඳහන් වාක්‍ය ඇසුරෙන් ඉහත සඳහන් ලක්ෂණ හත සඳහා නිදසුන් දෙන්න.**

- දරුවා සිනාසෙයි.
- පියා දරුවා සිනස්වයි.
- ගැමියෝ මග දෙපස සෙවණට රුක් රෝපණය කරති.
- පරිසරවේදීහු ගැමියන් ලවා මග දෙපස සෙවණ රුක් රෝපණය කරවති.

## ක්‍රියාකාරකම 4

❀ **පහත දැක්වෙන වාක්‍ය ප්‍රයෝජ්‍යාර්ථයේ වාක්‍ය බවට හරවා ලියන්න.**

1. ශිෂ්‍යයෝ රචනා ලියති.
2. දරුවා කිරි බොයි.
3. සංගීතඥයෝ සංගීත භාණ්ඩ වාදනය කළහ.
4. ආරාධිත අමුත්තෝ උත්සව ශාලාවේ අසුන් ගත්හ.
5. ගුරුවරු අධ්‍යාපන චාරිකාවක් සංවිධානය කරති.
6. දරුවා හඬයි.
7. අඳ ගොවියා විසින් කුඹුර වැපිරෙයි.
8. සිසුන් විසින් තොරණක් නිර්මාණය කරනු ලැබී ය.
9. බාලිකාවන් විසින් පිළිගැනීමේ ගීතය ගයන ලදි.
10. ගුරුවරියන් විසින් කාලසටහන සැලසුම් කරනු ලැබී ය.

## 3. විධාන ආඛ්‍යාතය

මහින්ද හිමි : අපි දැන් ඊළඟ ආඛ්‍යාත වර්ගයට යමු.

රාහුල හිමි : එහෙමයි, තුන්වෙනි ආඛ්‍යාත වර්ගය තමයි විධාන ආඛ්‍යාතය කියන්නෙ. කිසියම් විධානයක්, නියෝගයක්, පැවරීමක්, අණ කිරීමක්, ඉල්ලීමක්, ආයාචනයක් කරන ක්‍රියාව තමයි ඒ. විධානාඛ්‍යාතයේත් විශේෂ ලක්ෂණ තියෙනවා

**i.** විධාන ආඛ්‍යාතයේ කාල භේදයක් නැත. එය නිතර ම පළ කරන්නේ අනාගත කාලාර්ථය යි.

**ii.** විධානය ආදරයෙන් හෝ අනාදරයෙන් හෝ ගෞරවයෙන් යුක්ත ව කළ හැකි යි. බලන්න මේ උදාහරණ

- දරුව, මෙහි එන්න  මේ විධානය ආදරයෙන් කරන එකක්
- වහා මෙතනින් පිටව යනු.  ඒක අනාදරයෙන් කළ විධානයක්
- ස්වාමීනි, බණට වඩිනු මැනවි  ඒ ගෞරවයෙන් කළ විධානයක්

මෙහිදී විධානය කරන හා විධානය ලබන දෙදෙනා අතර පවතින සම්බන්ධතාව මත විධානයේ ස්වරූපය තීරණය වෙනවා.

**iii.** ප්‍රකෘති කථන ලේඛනයේදී උත්තම පුරුෂ ඒක වචන පදය (මම) තවත් පිරිසකට එකතු ව යෝජනා ස්වරූපයෙන් කරන ඉල්ලීම ද විධාන ක්‍රියා රූපය ගන්නවා එවැනි වාක්‍යවල යෙදෙන්නේ උත්තම පුරුෂ බහු වචන පදය යි. උදාහරණයක් ලෙස මේ වාක්‍ය බලන්න.

- අපි මෙය නිවැරැදි ව කරමු'යි මම සේවකයන්ට කීවෙමි.

**iv.** ඊළඟ ලක්ෂණය තමයි විධානයක් නිතර ම ඉදිරියේ සිටින කෙනෙකුට කරන එකක් නිසා ඒක අයිති වෙන්නෙ මධ්‍යම පුරුෂයට යි. “සිංහලයනි, අවදි වවු” ළමයිනි, නිශ්ශබ්ද වන්න. යනුවෙන් ආමන්ත්‍රණය කළත් මෙහිදී “නුඹලා” යන මධ්‍යම පුරුෂ බහු වචනය ගම්‍ය වන බව සිතන්න.

**v.** තව ලක්ෂණයක් වන්නේ විධි ක්‍රියාව ක්‍රම කීපයකට සකස් වීම යි.

(අ) විධි ක්‍රියාව ධාතු ප්‍රකෘතිය පමණක් යෙදිල සකස් වෙනවා.

බල සේනානායක සපු කුමරු එන
නරඹ යනෙන වෙළඳුන් ඔරු පාරුවෙනි
මේ කටයුත්ත නොපමාව කර

(ආ) ධාතු ප්‍රකෘතියට පරව ප්‍රත්‍යය යොදා ගැනීම තවත් ක්‍රමයක්. එහෙම යෙදෙන ප්‍රත්‍යය අතර ව, උ, හු, අ, ග විභක්ති ප්‍රත්‍යය වගේ ම නු, න්න, අන්න ඉන්න, එන්න වගේ කෘදන්ත ප්‍රත්‍යයත් තියෙනවා.

ග - කියග මගිය, එනු කොහි සිට? (කිය + ග)
නු - නගරය වටා ආරක්ෂාව යොදනු (යොද + නු)
න්න - කසළ ඉවත් කරන්න (කර + න්න)
අන්න - වෙලාව නොඉක්මවන්න (ඉක්ම + අන්න)
ඉන්න - නිති පන්සිල් රකින්න (රක් + ඉන්න)
එන්න - රඟපාද්දී ඔබ මා අබියස ඇද වැටෙන්න (වට + එන්න)

(ඇ) උපකාරක පදයක් එක්කර ගැනීම තවත් ක්‍රමයක්
ගන්න, ගන්, ගනු, පිය, පියවු, ලව, ලන්න, පන්

ගන්න - ඔබේ අංකය මතක **තබා ගන්න**
ගන් - කරතොත් **කරගන්** දන්පින් සීරුව
ගනු - නුඹ මීට පෙර ද වැරැදි කර ඇති බව සිහි **තබාගනු**
පිය - තෝ අප ගැන ද **බලාපිය**
පියවු - දරුවනි, රටට ජාතියට වැඩ **කරපියවු**
ලව/ලන්න - සියලු දෙනාට ම ආහාර **පිසලව/ පිසලන්න**
පන් - මේ ලියුම තැපැලට **දමාපන්**

(ඈ) කෘදන්ත ක්‍රියාවත් සමග උපකාරක පදයක් යෙදීම

මැනවි - **වඩින මැනවි** මහවෙල මැද වෙරළාන
ඔවුන්ට අනුකම්පා **කළ මැනවි**
හොඳයි - මැරෙනවාට වඩා තොප ජීවත් **වෙනවා හොඳයි**
යහපති - මේ අවස්ථාවේ ඔබතුමා දුරදිග බලා වැඩ **කිරීම යහපති**
යෙහේ - කල්යල් බලා කුඹුර **වැපිරීම යෙහේ**
සේක්වා - ස්වාමීනි අපට අනුකම්පා **කරන සේක්වා**

(ඉ) නිපාත පදයක් යොදා ගැනීම

ඕනෑ - සිදු වූ අලාභයට මට ඔබෙන් වන්දි මුදලක් ඕනෑ
එපා - මේ විදියට බාගෙට වැඩ කරන්න **එපා**
තහනම් - දූන්වීම් ඇලවීම **තහනම්**

(ඊ) පැහැදිලි ධාතු ප්‍රකෘතියක් හඳුනා ගත නොහැකි පද විධානාඛ්‍යාතය ලෙස යොදා ගැනීම.

වර - චරපුරුෂය, නොපමාව මා අභිමුඛයට **වර**
වරෙන් - කැලණි ගඟේ ඔරු යනවා බලා **වරෙන්**
බහු වචනයෙහි **වරෙල්ලා**
පල/ පලයන් - මොහොතක්වත් මෙහි නොරැඳී මෙතනින් **පල/ පලයන්**
බහු වචනයෙහි **පලයල්ලා**
ඉන්න - මා එන තෙක් මෙහි රැඳී **ඉන්න**

මහින්ද හිමි : මං හිතන්නෙ විධාන ක්‍රියාව ගැන ඔබ වහන්සේ ප්‍රමාණවත් විස්තරයක් අපට ලබා දුන්නා

## ක්‍රියාකාරකම 5

**පහත දැක්වෙන වාක්‍යවල ඇති විධාන ක්‍රියා පද උපුටා දක්වන්න.**

1. ලියක මහිම බල ගෝමර ඉසීලා.
2. ඉර පායා ඉර මුදුනට එන්ට එපා.
3. සාදුකාර දී ඔරුවක නැගී වරෙන්.
4. නොවළා ගොසින් මෙහසුන් සැල කරව සිට.
5. සතොසින් මිණි කොඬොල් ලෙස තා සවන් සද.
6. සබඳ වඩින දැක නෙත සිත සතපාය.
7. පැන යන මුවන් දැක නොදමවු නෙළු පලා.
8. වල්ලම්බලම දැක යාගන් සහතොසිනි.
9. පටාචාරාවෙනි, තෙපි මුසුප්පු නොවව.
10. ස්වාමීනි, ගැත්තවුන්ට පිටිවහල් වුව මැනව.

## 4. ප්‍රාර්ථනා ආඛ්‍යාතය

මහින්ද හිමි : අපි දැන් අවසාන ආඛ්‍යාත වර්ගයට යමු.

රාහුල හිමි : හතරවෙනි ආඛ්‍යාත වර්ගය තමයි ප්‍රාර්ථනා ආඛ්‍යාතය. බොහෝ ව්‍යාකරණ පොත්වල මේ ආඛ්‍යාත වර්ගය දක්වල තියෙන්නෙ ආශීර්වාද ක්‍රියා විදියට යි. ඒත් එහෙම හඳුන්වන එක වැරැදි යි. මොකද "ආශීර්වාද" කියන්නෙ යහපතක්, හොඳක් පැතීමනෙ. ඉතින් භංගවේවා, වැනසේවා, ශාපවේවා කියන අයහපත් ප්‍රාර්ථනාත් ආශීර්වාද කියලා හඳුන්වන එක වැරැදියිනෙ. ඒ නිසා මේ සියලු ප්‍රාර්ථනා කිරීම් හඳුන්වමු ප්‍රාර්ථනා ආඛ්‍යාත කියල.

මහින්ද හිමි : බොහෝ ම හරි. ඔබ වහන්සේගේ ඒ නිවැරැදි කිරීමෙන් ම දැන් අපට පැහැදිලි යි ඉෂ්ටාර්ථයක් හෝ අනිෂ්ටාර්ථයක් ප්‍රාර්ථනා කිරීම සඳහා යෙදෙන ක්‍රියා තමයි ප්‍රාර්ථනා ආඛ්‍යාතය කියන්නෙ කියල. මා නිවැරැදි යි නේද හාමුදුරුවනේ?

රාහුල හිමි : බොහොම හරි. සිදත් සඟරාවෙත් ආසිකිරිය නමින් මේ ක්‍රියා වර්ගය හඳුන්වා තියෙනවා.

> **"ඉටු නොපත් තෙ සද බඳ අනා අරුත් පැතුම් ආසි නම්"**
>
> කැමැති වූ, නොපැමිණියා වූ පුරුෂ තුනේ ශබ්ද පිළිබඳව මතු හොඳක් පැතීම ආශීර්වාද නමි.

මහින්ද හිමි : ප්‍රාර්ථනා ආඛ්‍යාතයෙත් විශේෂයෙන් සඳහන් කළ යුතු ලක්ෂණ තියෙනවද?

රාහුල හිමි : ඔව්. මා මුලින් දැක්වුව ප්‍රාර්ථනයේ යහපත් බව හා අයහපත් බව හැරුණා ම තව විශේෂ ලක්ෂණයක් තමයි ප්‍රාර්ථනා ආඛ්‍යාතය සෑදෙන ආකාරය. සාමාන්‍ය අනතීත ක්‍රියාවකට අනතුරු ව "වා" කියන අතුරු ප්‍රත්‍යයක් ආඛ්‍යාතයට එකතු වෙලා ප්‍රාර්ථනා ආඛ්‍යාතය සකස් වෙනවා.

කරාවා/ කෙරේවා (කරයි + වා කෙරේ + වා)
කරත්වා/ කෙරෙත්වා (කරත් + වා කෙරෙත් + වා)
ලබාවා/ ලැබේවා (ලබයි + වා ලැබේ + වා)
ලබත්වා/ ලැබෙත්වා (ලබත් + වා ලැබෙත් + වා)
බලාවා/ බැලේවා (බලයි + වා බැලේ + වා)
බලත්වා/ බැලෙත්වා (බලත් + වා බැලෙත් + වා)

පැරණි ව්‍යවහාරයේ "වා" ප්‍රත්‍යය නැතිවත් ප්‍රාර්ථනා ආඛ්‍යාතය යෙදී තියෙනවා.

<u>සැරද,</u> කිර රද සද (සැරදේවා)
ඔබට <u>ජය!</u>

ඊළඟ ලක්ෂණය තමයි ප්‍රාර්ථනා ආඛ්‍යාතය කර්තෘ කාරක, කර්ම කාරක දෙකෙහිත් පුරුෂත්‍රයෙහිත් ඒක වචන හා බහු වචන දෙකෙහිත් වර නැගෙනවා. ඒ වුණත් ලිංග හා කාල භේදයෙන් තොරයි.

මහින්ද හිමි : ප්‍රාර්ථනා ආඛ්‍යාතය වරනැගෙන විදිය පෙන්නුම් කළොත් ඔය කියන කරුණු ටික පැහැදිලි වෙයි. එහෙම නේද අපේ හාමුදුරුවනේ.

රාහුල හිමි : ඔව්. ඊළඟට බලාපොරොත්තු වුණේ ඒ වගේ වරනැගෙන ක්‍රම දැක්වෙන වගු සටහන් දෙකක් ප්‍රදර්ශනය කරන්න යි. බලන්න කාරක, පුරුෂ, වචන භේද දැක්වෙන මේ සටහන් දෙක. ඒවායේ කාල භේදයත් නැහැ ලිංග භේදයත් නැහැ.

| කර්තෘ කාරක | | | කර්ම කාරක | |
|---|---|---|---|---|
| **පුරුෂය** | **ඒක වචන** | **බහු වචන** | **ඒක වචන** | **බහු වචන** |
| ප්‍රථම පුරුෂ | ගයාවා | ගයත්වා | ගැයේවා | ගැයෙත්වා |
| මධ්‍යම පුරුෂ | ගයහිවා | ගයහුවා | ගැයෙහිවා | ගැයෙහුවා |
| උත්තම පුරුෂ | ගයම්වා | ගයමුවා/ ගයමෝවා | ගැයෙම්වා | ගැයවෙමුවා |

ඒ වගේ ම ප්‍රයෝජ්‍ය ක්‍රියා අර්ථයෙහිත් ප්‍රාර්ථනා ආඛ්‍යාතය වර නැගිය හැකි යි. හැබැයි කර්තෘකාරකයේ පමණයි.

| කර්තෘ කාරක | | |
|---|---|---|
| පුරුෂය | ඒක වචන | බහු වචන |
| ප්‍රථම පුරුෂ | ගයවාවා | ගයවත්වා |
| මධ්‍යම පුරුෂ | ගයවහිවා | ගයවහුවා |
| උත්තම පුරුෂ | ගයවම්වා | ගයවමුවා/<br>ගයවමෝවා |

මේ කර්තෘ කාරකයෙහි ප්‍රයෝජ්‍යාර්ථයේ ප්‍රාර්ථනා ආඛ්‍යාතය යෙදෙන හැටි දක්වන උදාහරණ කීපයක්. කර්ම කාරක ක්‍රියා තැනීමේදී වර්තමාන කෘදන්තයට පසු ව 'ලබ' ධාතුව යොදා ගන්නවා.

රජ ගත්කරුවන් ලවා ග්‍රන්ථ ලියවාවා.
රජු විසින් ගත්කරුවන් ලවා ග්‍රන්ථයෝ ලියනු ලබත්වා.

මහින්ද හිමි : දැන් ඔබ වහන්සේ ක්‍රියා පද යි අවසාන ක්‍රියා පද යි අතර වෙනස වගේ ම අවසාන ක්‍රියා පදවල ප්‍රභේදත් ඒ එකක් එකක් ගානෙ ඒවායෙ පවතින විශේෂ ලක්ෂණත් ගැන හොඳ විස්තරයක් අපට ලබා දුන්නා. ඒ දැනුම ලබා දුන් ඔබ වහන්සේට සද්ධර්මෝදය පාරිවේණික ශිෂ්‍ය සංගමය වෙනුවෙන් පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතිය පුද කරනවා. තෙරුවන් සරණ යි.

රාහුල හිමි : තෙරුවන් සරණ යි.
අපගේ සංවාදයේදී ඉදිරිපත් කළ කරුණු පිළිබඳ ව යම්කිසි ගැටලුවක් තිබේ නම් ප්‍රශ්න කිරීමට මා ඔබ වහන්සේලාට අවස්ථාව ලබා දෙනවා.

## ක්‍රියාකාරකම 6

- **පහත සඳහන් වාක්‍යවල ඇති හිස්තැන්වලට ගැළපෙන ප්‍රාර්ථනා ආඛ්‍යාත යොදා හිස්තැන් පුරවන්න.**

1. සියලු සත්ත්වයෝ නිදුක් ......................................
2. ඔබේ සියලු යහපත් ප්‍රාර්ථනා ඉෂ්ට ......................................
3. මේ සියලු පූජාවෝ මාගේ බුදුපියාණන් වහන්සේට පූජා ......................................
4. ඔබ වහන්සේ සුවපත් වන ......................................
5. අපි දුක් පීඩානැත්තෝ ......................................
6. විභාගයෙන් ඔබ විශිෂ්ට ලෙස සමත් ......................................
7. දේශද්‍රෝහී නිවටයෝ ......................................
8. ද්‍රෝහීන්ට ශාප ......................................
9. බුදුදහම ලොව ......................................
10. අපේ ක්‍රිකට් ක්‍රීඩකයෝ ජය ......................................

## ක්‍රියාකාරකම 7

පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| | කර්තෘ කාරක | | කර්ම කාරක | |
|---|---|---|---|---|
| පුරුෂය | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| ප්‍රථම පුරුෂ | රකීවා | | රැකේවා | |
| මධ්‍යම පුරුෂ | | | | |
| උත්තම පුරුෂ | | | | |

## ක්‍රියාකාරකම 8

අදාළ නිවැරැදි කොටුව තුළ හරිලකුණ ( ✓) යොදන්න.

| ක්‍රියා පදය | කර්තෘ කාරක | කර්ම කාරක | ප්‍රථම පුරුෂ | මධ්‍යම පුරුෂ | උත්තම පුරුෂ | ඒක වචන | බහු වචන | අතීත | අනතීත |
|---|---|---|---|---|---|---|---|---|---|
| පිදෙති | | ✓ | ✓ | | | | ✓ | | ✓ |
| ලියැවෙයි | | | | | | | | | |
| මියෙම්වා | | | | | | | | | |
| බිඳිවු | | | | | | | | | |
| පුබුදනු ලබත්වා | | | | | | | | | |
| දැල්වුණහ | | | | | | | | | |
| කීවහු | | | | | | | | | |
| නැගිටවවු | | | | | | | | | |
| බැස්සෙමු | | | | | | | | | |
| නසව | | | | | | | | | |

## ක්‍රියාකාරකම 9

- පන්තිය කණ්ඩායම් හතරකට බෙදී එක් එක් ආඛ්‍යාත වර්ගයක ඇති විශේෂ ලක්ෂණ කරුණු වශයෙන් අංක යටතේ ගොනු කොට එක් පත්‍රිකාවක් බිත්ති පුවත් පතේ ප්‍රදර්ශනය කරන්න.

## ක්‍රියාකාරකම 10

- සංවාදයේ ඉදිරිපත් වූ කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න නැඟීමට අවස්ථාව සලසා දුන් විට ඉදිරිපත් වන්නට ඇතැ යි සිතිය හැකි ප්‍රශ්න 5ක් ගොඩනගා ඒවාට පිළිතුරු ද සපයන්න.

### සුභාෂිත

බස නැති දා රැස නැත
රැස නැති දා දෙස නැත

- මුනිදාස කුමාරතුංග-

### සුචින්තන

වස් දඬුවෙහි ඇත්තේ සිදුරුත් හිස් බවත් පමණි. එහෙත් එය නිසි කාර්යයෙහි යොදනු ලැබුවහොත් අසිරිමත් ස්වර මාධුර්යයෙන් ලොව ම පිනවනු ඇත. එසේ ම ජීවිතය ද වස් දඬුවකි.

# 06

# ප්‍රත්‍යයාර්ථ නාම

ද්විතීයික ප්‍රත්‍යය යෙදී සෑදෙන සාධ්‍ය නාම විශේෂයන් දෙකක් වන **තද්ධිත** හා **කෘදන්ත**, ප්‍රත්‍යයාර්ථ නාම ලෙස හැඳින්වේ. තද්ධිත හා කෘදන්ත හඳුනා ගැනීම, ඒවායේ ප්‍රභේද හා වරනැඟීම, ඒවා භාෂාවේ යෙදෙන ආකාරය ආදිය පිළිබඳ ව මෙම පාඩමෙන් සැපයෙන සවිස්තරාත්මක දැනුම භාෂා කාර්යයේදී ඔබට මනා පිටිවහලක් වනු ඇත.

## ප්‍රත්‍යයාර්ථ නාම

නාම ප්‍රකෘතියකින් හෝ ධාතු ප්‍රකෘතියකින් හෝ පර ව ද්විතීයික ප්‍රත්‍යය එක් කිරීමෙන් සාදා ගනු ලබන ද්විතීයික නාම ප්‍රත්‍යයාර්ථ නාම යනුවෙන් හැඳින්වේ. සිදත් සඟරාවේ ප්‍රත්‍යයාර්ථ නාම **"පසරුත් නම්"** යනුවෙන් හඳුන්වා දී ඇත්තේ මෙසේ ය.

**"දයින් නමින් හොත කැරු අරුතට නිසි පසන් සපයා සදන් පසරුත් හිම් නොලැගැ ලොවැ වහරන්"**

ධාතුවෙන් හෝ නාමයෙන් හෝ පර ව අරුතට නිසි වන ප්‍රත්‍යයන් යොදා ලෝක ව්‍යවහාරයේ සීමාවන් නොඉක්මවා ප්‍රත්‍යයාර්ථ ශබ්දයන් සපයනු.

- ප්‍රත්‍යාර්ථ නාමවල ප්‍රභේද දෙකකි.

    1. තද්ධිත නාම
    2. කෘදන්ත නාම

## තද්ධිත නාම

සංස්කෘත ව්‍යාකරණයේ දැක්වෙන පරිදි තද්ධිත යනු (තත් + හිත) "එයට හිතකර" යන අර්ථයෙන් සැදෙන නාම විශේෂයකි. සිංහල ව්‍යාකරණයේ ද නාම ප්‍රකෘතියකට ද්විතීයික ප්‍රත්‍යයක් යොදා සාදා ගන්නා ද්විතීයික නාමයක් ලෙස තද්ධිත යන්න හඳුන්වා දී තිබේ.

- ප්‍රති + අය = ප්‍රත්‍යය යනු පද සිද්ධි විධිය යි. ප්‍රත්‍යය යනු නාම ප්‍රකෘතියක් වන බැවින් එය විභක්ති ප්‍රත්‍යය ගෙන නාම පදයක් වන්නේ ප්‍රත්‍යය + අ = ප්‍රත්‍යයය යනුවෙනි. ඒ අනුව ව්‍යාකරණානුකූල ව "ප්‍රත්‍යයය" ඒක වචනය ද ප්‍රත්‍යය බහු වචනය ද විය යුතු ය.

එමෙන් "ආලය" නාම ප්‍රකෘතිය වන බැවින් "විද්‍යා" යන්න සමග බැඳී විද්‍යාලය (විද්‍යා + ආලය) යනුවෙන් බහු වචන රූපය ද "විද්‍යාලයය" (විද්‍යා + ආලය + අ) යනුවෙන් ඒකවචන රූපය ද නිර්මාණය වේ. එහෙත් විද්‍යාලයය, දේවාලයය, පුස්තකාලයය යනුවෙන් ව්‍යවහාරයේ නොපවතින නිසා 'විද්‍යාලය, දේවාලය, පුස්තකාලය යන ඒක වචන පදත් විද්‍යාල, දේවාල, පුස්තකාල යන බහුවචන පදත් භාවිතයේ පවතී.

එබැවින් සුබෝච්චාරණය හා ව්‍යවහාරය සලකා මෙතැන් පටන් මෙම පාඩමේ ද "ප්‍රත්‍යය" ඒකවචනය ලෙස ද "ප්‍රත්‍ය" බහු වචනය ලෙස ද යොදා ඇත. පද සිද්ධිය හා භාවිතය අතර වෙනස සිසු අවධානයට යොමු කෙරේ.

නාම ප්‍රකෘතියකට පර ව විභක්ති ප්‍රත්‍යයක් යෙදී මූලික වශයෙන් සැදෙන්නේ නාම පදයකි. එම මූලික නාම පද සිද්ධ නාම පද හෙවත් මූල නාම පද ලෙස ද හැඳින්වේ. නාම ප්‍රකෘතියකට විභක්ති ප්‍රත්‍යයක් යොදා සාදා ගනු ලබන නාම පදයට අමතර ව නාම ප්‍රකෘතියකට ද්විතීයික ප්‍රත්‍යයක් යොදා සාදා ගනු ලබන ද්විතීයික නාම තද්ධිත නාම යනුවෙන් හැඳින්වේ. එසේ සැදෙන තද්ධිත නාමය ද නාම ප්‍රකෘතියකි. ඊට විභක්ති ප්‍රත්‍යය යොදා තද්ධිත නාම පද සාදා ගනු ලැබේ. තද්ධිත නාම සාධ්‍ය නාම හෙවත් සංග්‍රහ නාම ලෙස දැක්විය හැකි ය.

සිද්ධ නාම පද

| නාම ප්‍රකෘතිය | විභක්ති ප්‍රත්‍යය | නාම පදය |
|---|---|---|
| නැකත් | අ | නැකත |
| ගම් | අ | ගම |
| නගර | අ | නගරය |

සාධ්‍ය නාමපද

| නාම ප්‍රකෘතිය | තද්ධිත ප්‍රත්‍යයය | තද්ධිත නාමය | විභක්ති ප්‍රත්‍යයය | තද්ධිත නාම පදය |
|---|---|---|---|---|
| නැකත් | ඉ | නැකති | ආ | නැකතියා |
| ගම් | ඉ | ගැමි | ආ | ගැමියා |
| නගර | ඉක | නාගරික | ආ | නාගරිකයා |

තද්ධිත නාමවලින් නාම පද සාද ගත හැකි අතර තද්ධිත නාම, නාම විශේෂණ පද ලෙස ද භාවිත කළ හැකි ය.

| නාම ප්‍රකෘතිය | තද්ධිත ප්‍රත්‍යය | තද්ධිත නාමය | තද්ධිත නාමය නාම විශේෂණයක් ලෙස |
|---|---|---|---|
| ඉතිහාස | ඉක | ඓතිහාසික | ඓතිහාසික ග්‍රාම |
| චන්ද්‍ර | ඉකා | චන්ද්‍රිකා | චන්ද්‍රිකා තාක්ෂණය |
| සෞභාග්‍ය | වත් | සෞභාග්‍යවත් | සෞභාග්‍යවත් යුගය |
| ලංකා | ඒය | ලාංකේය | ලාංකේය සිනමාව |
| රන් | මුවා | රන්මුවා | රන්මුවා පිළිමය |

තද්ධිත නාම සාධනය තද්ධිත ප්‍රත්‍ය එකක් හෝ දෙකක් හෝ තුනක් හෝ යෙදී සිදු විය හැකි ය.

| නාම ප්‍රකෘතිය | තද්ධිත ප්‍රත්‍යය | තද්ධිත ප්‍රත්‍යය | තද්ධිත ප්‍රත්‍යය | විභක්ති ප්‍රත්‍යය | තද්ධිත නාම පදය |
|---|---|---|---|---|---|
| නැව් | ඉ | - | - | ආ | නැවියා |
| ගුණ | වත් | ආණ | - | ඕ | ගුණවතාණෝ |
| සංගීත | ඥ | වර | ආණ | ඕ | සංගීතඥවරයාණෝ |

මෙසේ තද්ධිත ප්‍රත්‍ය එකතු වීම විවිධාර්ථ සැපයීම සඳහා සිදු වේ. එකම ප්‍රත්‍යයක් වුව ද අර්ථ කිහිපයක් සැපයීම සඳහා නාම ප්‍රකෘතිය සමග එකතු වේ.

## විවිධාර්ථවත් තද්ධිත ප්‍රත්‍ය

1. 'ඉ' ප්‍රත්‍යය - (ඇත්තේ, නියුක්ත වූයේ, දන්නේ, උපන්නේ ආදි විවිධාර්ථ සැපයීමෙහි)

| | | |
|---|---|---|
| පද + ඉ | = | පැදි (පද ඇත්තේ) |
| තොට + ඉ | = | තොටි (තොටෙහි නියුක්ත වූයේ) |
| නකත් + ඉ | = | නැකති (නැකත් දන්නේ) |
| සග + ඉ | = | සැගි (ස්වර්ගයෙහි උපන්නේ) |
| සබ + ඉ | = | සැබි (සබයට යෝග්‍ය වූයේ) |
| ලෝ + ඉ | = | ලොවි (ලොවට සම්බන්ධ වූයේ) |
| අඳුරු + ඉ | = | ඇඳිරි (අඳුරම) |
| කොවුල් + ඉ | = | කෙවිලි |
| බුබුළු + ඉ | = | බිබිළි |

2. "ඉති" ප්‍රත්‍යය (අල්පාර්ථයෙහි හා අධිකාර්ථයෙහි)

| | | |
|---|---|---|
| පැන් + ඉති | = | පැනිති (පැන් ටික) |
| පොඩි + ඉති | = | පොඩිති (කුඩා බව අධික) |

3. "ඉක" ප්‍රත්‍යය (එයට අයත්)

මෙහිදී තද්ධිත නාමයේ මුල් ස්වරය වෘද්ධි වේ.

i. අ > ආ

| | | |
|---|---|---|
| අධ්‍යාත්ම + ඉක | = | ආධ්‍යාත්මික |
| ප්‍රසංග + ඉක | = | ප්‍රාසංගික |
| අධ්‍යාපන + ඉක | = | ආධ්‍යාපනික |
| ධර්ම + ඉක | = | ධාර්මික |

ii. ඉ/ ඊ > ඓ

| | | |
|---|---|---|
| සිද්ධාන්ත + ඉක | = | සෛද්ධාන්තික |
| ඉතිහාස + ඉක | = | ඓතිහාසික |
| විශේෂ + ඉක | = | වෛශේෂික |
| නිරුක්ත + ඉක | = | නෛරුක්තික |
| නීති + ඉක | = | නෛතික |

iii. උ/ ඌ/ ඕ > ඖ

| | | |
|---|---|---|
| පුද්ගල + ඉක | = | පෞද්ගලික |
| උදාර + ඉක | = | ඖදාරික |
| භූත + ඉක | = | භෞතික |
| ලෝක + ඉක | = | ලෞකික |

iv. ඍ > ආර්

| | | |
|---|---|---|
| හෘද් + ඉක | = | හාර්දික |
| වෘත්ති + ඉක | = | වාර්තික |

වෘද්ධි වීමෙන් තොරව ද ඉක ප්‍රත්‍යය යෙදේ.

| | | |
|---|---|---|
| ක්ෂණ + ඉක | = | ක්ෂණික |
| රස + ඉක | = | රසික |
| රසායන + ඉක | = | රසායනික |

4. "ක" ප්‍රත්‍යය (මුල් ස්වරය දීර්ඝ නොවේ)

| | | |
|---|---|---|
| සංස්කෘති + ක | = | සංස්කෘතික |
| පන්ති + ක | = | පන්තික |
| ජාති + ක | = | ජාතික |

'ක' ප්‍රත්‍යය (ණ් + අ ලෝපයෙන් ද සිදුවේ)

| | | |
|---|---|---|
| නිෂ්පාදන + ක | = | නිෂ්පාදක |
| පාලන + ක | = | පාලක |
| දූෂණ + ක | = | දූෂක |
| භක්ෂණ + ක | = | භක්ෂක |

5. "ඉකා" ප්‍රත්‍යය (පූර්වස්වර ලෝපයෙන්)
ස්ත්‍රී ලිංගාර්ථයෙහි හා ස්වල්පාර්ථයේ යෙදේ.

| | | |
|---|---|---|
| චන්ද්‍ර + ඉකා | = | චන්ද්‍රිකා |
| කුමාර + ඉකා | = | කුමාරිකා |
| දූත + ඉකා | = | දූතිකා |

"ඉකා" ප්‍රත්‍යය (අ + ක් , අ ලෝපයෙන්)

| | | |
|---|---|---|
| උපාසක + ඉකා | = | උපාසිකා |
| නායක + ඉකා | = | නායිකා |
| පුස්තක + ඉකා | = | පුස්තිකා (කුඩා පොත) |

6. "ඉනි" ප්‍රත්‍යය (හලන්ත ශබ්දවලට පරව)

| | | |
|---|---|---|
| ඇත් + ඉනි | = | ඇතිනි |
| සප් + ඉනි | = | සැපිනි |
| කොක් + ඉනි | = | කෙකිනි |

7. "නි" ප්‍රත්‍යය

| | | |
|---|---|---|
| ඇමති + නි | = | ඇමතිනි |
| අගමැති + නි | = | අගමැතිනි |
| ජනාධිපති + නි | = | ජනාධිපතිනි |

8. "ඉත" ප්‍රත්‍යය (එයින් යුත් යන අර්ථයෙහි)

| | | |
|---|---|---|
| ව්‍යාධි + ඉත | = | ව්‍යාධිත |
| ආබාධ + ඉත | = | ආබාධිත |
| පීඩා + ඉත | = | පීඩිත |

9. ඉෂ්ට ප්‍රත්‍යය (අතිශයාර්ථයෙහි)

| | | |
|---|---|---|
| ශ්‍රා + ඉෂ්ඨ | = | ශ්‍රේෂ්ඨ |
| ජ්‍යා + ඉෂ්ඨ | = | ජ්‍යෙෂ්ඨ |
| කන් + ඉෂ්ඨ | = | කනිෂ්ඨ |

10. "ඊය" ප්‍රත්‍යය (එයට අයත්)

| | | |
|---|---|---|
| ප්‍රදේශ + ඊය | = | ප්‍රදේශීය |
| විද්‍යාලය + ඊය | = | විද්‍යාලයීය |
| කාර්යාලය + ඊය | = | කාර්යාලයීය |
| සමාජ + ඊය | = | සමාජීය |
| ප්‍රාන්ත + ඊය | = | ප්‍රාන්තීය |
| පාඨශාලා + ඊය | = | පාඨශාලීය |
| මණ්ඩල + ඊය | = | මණ්ඩලීය |

11. "ඒය" ප්‍රත්‍යය (මුල් ස්වරය වෘද්ධි වේ.)

| | | |
|---|---|---|
| මිත්‍ර + ඒය | = | මෛත්‍රෙය |
| ගංගා + ඒය | = | ගාංගේය |
| ලංකා + ඒය | = | ලාංකේය |
| සිංහල + ඒය | = | සෛංහලේය |
| ජීව + ඒය | = | ජෛවේය |

12. "ඊන" ප්‍රත්‍යය (එයට අයත්)

| | | |
|---|---|---|
| කුල + ඊන | = | කුලීන |
| නව + ඊන | = | නවීන |
| සමකාල + ඊන | = | සමකාලීන |
| ප්‍රාච් + ඊන | = | ප්‍රාචීන |

13. "ඊ" ප්‍රත්‍යය (ඊට සම්බන්ධ)

| | | |
|---|---|---|
| ජීව + ඊ | = | ජීවී |
| ප්‍රේම + ඊ | = | ප්‍රේමී |
| විරෝධ + ඊ | = | විරෝධී |

14. "අටි" ප්‍රත්‍යය (ප්‍රදේශය, ඊට හුරු යන අර්ථයෙහි)

| | | |
|---|---|---|
| ඉස් + අටි | = | ඉසටි/ ඉහටි |
| පා + අටි | = | පහටි |
| කර + අටි | = | කරටි |

15. "අටු" ප්‍රත්‍යය (බහුලාර්ථයෙහි හා ස්වාර්ථයෙහි)

| | | |
|---|---|---|
| හර + අටු | = | හරටු/ අරටු (හර බොහෝ) |
| වක + අටු | = | වකුටු |
| කැස + අටු | = | කැසටු/ කැහැටු |

16. “අස්” “අත්” ප්‍රත්‍ය (ස්වාර්ථයෙහි)

| | | |
|---|---|---|
| වරල් + අස් | = | වරලස් |
| මුහුළු + අස් | = | මුහුළස් |
| මුහුණ + අත් | = | මුහුණත් |
| නුවන් + අත් | = | නුවනත් |

17. “අළ” ප්‍රත්‍යය (ප්‍රදේශය අර්ථයෙහි)

| | | |
|---|---|---|
| ඉස් + අළ | = | ඉහළ |
| පා + අළ | = | පහළ |

18. “ආ” ප්‍රත්‍යය (ස්වාර්ථයෙහි)

| | | |
|---|---|---|
| හැකි + ආ | = | හැකියා |
| මිහිරි + ආ | = | මිහිරියා |
| නැමි + ආ | = | නැමියා |

19. “ආණ” “අණු” “අණි” ප්‍රත්‍ය (ගෞරවාර්ථයෙහි)

ආණ ප්‍රත්‍යය (පුරුෂ ලිංගයෙහි)

| | | |
|---|---|---|
| බොසත් + ආණ | = | බෝසතාණ |
| බමුණු + ආණ | = | බමුණාණ |

“අණු” ප්‍රත්‍ය (පුරුෂ ලිංගයෙහි)

| | | |
|---|---|---|
| පුත් + අණු | = | පුතණු |
| තෙර + අණු | = | තෙරණු |

“අණි” ප්‍රත්‍යය (ස්ත්‍රී ලිංගයෙහි)

| | | |
|---|---|---|
| අඹු + අණි | = | ඇඹණි |
| නඟ + අණි | = | නැඟණි |

20. “උ” ප්‍රත්‍යය (ස්වාර්ථයෙහි)

| | | |
|---|---|---|
| බිත් + උ | = | බිතු |
| නෙත් + උ | = | නෙතු |
| සිත් + උ | = | සිතු |

21. "වත්" "මත්" ප්‍රත්‍ය (ඇත්තේය යන අර්ථයෙහි)

වත් ප්‍රත්‍යය (අකාරාන්ත, ආකාරාන්ත හා හලන්ත පදවලට පරව)

| | | |
|---|---|---|
| පැණ + වත් | = | පැණවත් |
| ආදර්ශ + වත් | = | ආදර්ශවත් |
| ආලෝක + වත් | = | ආලෝකවත් |
| සෞභාග්‍ය + වත් | = | සෞභාග්‍යවත් |
| සෝබා + වත් | = | සෝබාවත් |
| සිල් + වත් | = | සිල්වත් |

"මත්" ප්‍රත්‍යය (ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරාන්ත පදවලට පරව)

| | | |
|---|---|---|
| බුද්ධි + මත් | = | බුද්ධිමත් |
| ඍද්ධි + මත් | = | ඍද්ධිමත් |
| ශ්‍රී + මත් | = | ශ්‍රීමත් |
| ධී + මත් | = | ධීමත් |
| ඉසුරු + මත් | = | ඉසුරුමත් |
| රූ + මත් | = | රූමත් |

22. "වන්ත" "මන්ත" ප්‍රත්‍ය (ඇත්තේය යන අර්ථයෙහි)
මෙම ප්‍රත්‍ය යෙදෙන්නේ තත්සම ප්‍රකෘති සමග පමණ ය.

(ප්‍රත්‍ය එකතු වීම වත්, මත් ප්‍රත්‍යවල මෙනි)

| | | |
|---|---|---|
| ශ්‍රද්ධා + වන්ත | = | ශ්‍රද්ධාවන්ත |
| බල + වන්ත | = | බලවන්ත |
| ප්‍රඥ + වන්ත | = | ප්‍රඥවන්ත |
| ශ්‍රී + මන්ත | = | ශ්‍රීමන්ත |
| ධී + මන්ත | = | ධීමන්ත |

23. "තර", "තම" ප්‍රත්‍ය

තර ප්‍රත්‍යය (ගුණ දෙකක් සැසඳීමෙහිදී දෙකෙන් එකක් වඩාත් වැඩි බව දැක්වීම)

| | | |
|---|---|---|
| මිහිරි + තර | = | මිහිරිතර (වඩා මිහිරි) |
| පූජ්‍ය + තර | = | පූජ්‍යතර |
| ශ්‍රේෂ්ඨ + තර | = | ශ්‍රේෂ්ඨතර |

"තම" ප්‍රත්‍යය (සමූහයකින් එකක් වඩා වැඩි බව)

| | | |
|---|---|---|
| මිහිරි + තම | = | මිහිරිතම (වඩාත් මිහිරි) |
| පූජ්‍ය + තම | = | පූජ්‍යතම |
| ශ්‍රේෂ්ඨ + තම | = | ශ්‍රේෂ්ඨතම |

24. "මුවා", "මය" ප්‍රත්‍ය (එයින් තැනුණේ යන අර්ථයෙහි)
මුවා තත්භව ප්‍රකෘති සමගත් මය තත්සම ප්‍රකෘති සමගත් යෙදේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| රන් + මුවා | = | රන්මුවා | - | ස්වර්ණ + මය | = | ස්වර්ණමය |
| දැව + මුවා | = | දැවමුවා | - | දාරු + මය | = | දාරුමය |
| මිණි + මුවා | = | මිණිමුවා | - | මාණික්‍ය + මය | = | මාණික්‍යමය |
| සෙල් + මුවා | = | සෙල්මුවා | - | ශෛල + මය | = | ශෛලමය |
| රිදී + මුවා | = | රිදීමුවා | - | රජත + මය | = | රජතමය |

25. ''බ'' ප්‍රත්‍යය (ප්‍රදේශය යන අර්ථයෙහි)

| | | |
|---|---|---|
| එ + බ | = | එබ > ඔබ (එතැන) |
| මෙ + බ | = | මෙබ > මොබ (මෙතැන) |
| කො + බ | = | කොබ/ කොයිබ |
| දිය + බ | = | දියබ |

26. ''තා'' ප්‍රත්‍යය (සමූහය, භාවය යන අර්ථයෙහි)

| | | |
|---|---|---|
| ජන + තා | = | ජනතා |
| මුදු + තා | = | මුදුතා |

27. ''වර'' ප්‍රත්‍යය (ස්වාර්ථයෙහි)

| | | |
|---|---|---|
| කළු + වර | = | කළුවර |
| මුහුණු + වර | = | මුහුණුවර |
| ගම් + වර | = | ගම්වර |
| දිය + වර | = | දියවර |
| මෙහෙ + වර | = | මෙහෙවර |

28. ''බඩ'', ''බද'' ප්‍රත්‍ය (සමීපාර්ථයෙහි හා ප්‍රදේශාර්ථයෙහි)

| | | |
|---|---|---|
| ගං + බඩ | = | ගංබඩ/ ගම්බඩ |
| වෙරළ + බඩ | = | වෙරළබඩ |
| ගම් + බද | = | ගම්බද |
| මුහුදු + බඩ | = | මුහුදුබඩ |
| | (ඒ බව යන අර්ථයෙහි) | |

29. ''ය'' ප්‍රත්‍යය (අග ස්වරය ලොප් වී මුල් ස්වරය වෘද්ධි වේ.)

| | | |
|---|---|---|
| පණ්ඩිත + ය | = | පාණ්ඩිත්‍ය |
| සමර්ථ + ය | = | සාමර්ථ්‍ය |
| කුශල + ය | = | කෞශල්‍ය |
| සුන්දර + ය | = | සෞන්දර්ය |
| ලලිත + ය | = | ලාලිත්‍ය |
| ප්‍රමොද + ය | = | ප්‍රාමොද්‍ය |
| බහුල + ය | = | බාහුල්‍ය |
| මධුර + ය | = | මාධුර්ය |
| ලවණ + ය | = | ලාවණ්‍ය |
| වත්සල + ය | = | වාත්සල්‍ය |
| විෂම + ය | = | වෛෂම්‍ය |

30. ''ත්ව'' ප්‍රත්‍යය (භාවාර්ථය)

| | | |
|---|---|---|
| කවි + ත්ව | = | කවිත්ව |
| තත් + ත්ව | = | තත්ත්ව |
| විශාල + ත්ව | = | විශාලත්ව |
| විශාරද + ත්ව | = | විශාරදත්ව |
| ප්‍රභූ + ත්ව | = | ප්‍රභූත්ව |
| සත් + ත්ව | = | සත්ත්ව |

31. “තන” ප්‍රත්‍යය (අයිති බව)

| | | |
|---|---|---|
| අද්‍ය + තන | = | අද්‍යතන |
| නව + තන | = | නූතන |
| චිර + තන | = | චිරන්තන |
| සදා + තන | = | සදාතන |
| පුරා + තන | = | පුරාතන |

32. “ස්ථ” ප්‍රත්‍යය (ඊට අයත් යන අර්ථයෙහි)

| | | |
|---|---|---|
| සේවා + ස්ථ | = | සේවාස්ථ |
| විහාර + ස්ථ | = | විහාරස්ථ |
| මාර්ග + ස්ථ | = | මාර්ගස්ථ |

33. “කම්” ප්‍රත්‍යය

| | | |
|---|---|---|
| උගත් + කම් | = | උගත්කම් |
| කුහක + කම් | = | කුහකකම් |
| නපුරු + කම් | = | නපුරුකම් |

34. “නු” ප්‍රත්‍යය

| | | |
|---|---|---|
| ඉන්දියා + නු | = | ඉන්දියානු |
| පකිස්තා + නු | = | පකිස්තානු |
| ඇමෙරිකා + නු | = | ඇමරිකානු |

35. “කරු” ප්‍රත්‍යය

| | | |
|---|---|---|
| ඉල්ලුම් + කරු | = | ඉල්ලුම්කරු |
| අයැදුම් + කරු | = | අයැදුම්කරු |
| වාර්තා + කරු | = | වාර්තාකරු |

36. “ඥ” ප්‍රත්‍යය

| | | |
|---|---|---|
| අධ්‍යාපන + ඥ | = | අධ්‍යාපනඥ |
| නීති + ඥ | = | නීතිඥ |
| සර්ව + ඥ | = | සර්වඥ |

37. “ධර” ප්‍රත්‍යය

| | | |
|---|---|---|
| ත්‍රිපිටක + ධර | = | ත්‍රිපිටකධර |
| සාහිත්‍ය + ධර | = | සාහිත්‍යධර |

38. “වර” ප්‍රත්‍යය

| | | |
|---|---|---|
| ආචාර්ය + වර | = | ආචාර්යවර |
| වෛද්‍ය + වර | = | වෛද්‍යවර |

39. ද්විත්ව ප්‍රත්‍ය තද්ධිත

| | | | |
|---|---|---|---|
| කාමී - කාම + ඊ | = කාමී = | ආත්මාර්ථ + කාම + ඊ | = ආත්මාර්ථකාමී |
| | | බල + කාම + ඊ | = බලකාමී |
| ගාමී - ගාම + ඊ | = ගාමී = | ශීඝ්‍ර + ගාම + ඊ | = ශීඝ්‍රගාමී |
| | | අපාය + ගාම + ඊ | = අපායගාමී |
| ධාරී - ධර + ඊ | = ධාරී = | උපාධි + ධර + ඊ | = උපාධිධාරී |
| | | චීවර + ධර + ඊ | = චීවරධාරී |
| වාදී - වාද + ඊ | = වාදී = | ප්‍රජාතන්ත්‍ර + වාද + ඊ | = ප්‍රජාතන්ත්‍රවාදී |
| | | සමාජ + වාද + ඊ | = සමාජවාදී |
| වාසී - වාස + ඊ | = වාසී = | වන + වාස + ඊ | = වනවාසී |
| | | නගර + වාස + ඊ | = නගරවාසී |
| වේදී - වේද + ඊ | = වේදී = | නීති + වේද + ඊ | = නීතිවේදී |
| | | මාධ්‍ය + වේද + ඊ | = මාධ්‍යවේදී |
| ශූරී/ සූරී - සූර + ඊ | = සූරී = | ධාවන + ශූර + ඊ | = ධාවනශූරී (දක්ෂ) |
| | | දර්ශන + සූර + ඊ | = දර්ශනසූරී (උගත්) |
| ශීලී - ශීල + ඊ | = ශීලි = | ප්‍රගති + ශීල + ඊ | = ප්‍රගතිශීලී |
| | | ආචාර + ශීල + ඊ | = ආචාරශීලී |

## ක්‍රියාකාරකම 1

**පහත සඳහන් නාම පද සිද්ධ නාම පද (මූල නාම පද) හා සාධ්‍ය නාම පද (සංග්‍රහ නාම පද) ලෙස වෙන් කරන්න.**

පුතණුවෝ, පුතා, පොත, ඥාණවන්තයා, නැවියා, වරලස, ප්‍රසංගය, චන්ද්‍රිකාව, ඉගටිය, වීදුරුව, සූර්යයා, මිත්තණිය, කුසලතාව, කාන්තාව, විද්‍යාඥයා, පොළොව, භාෂාව, මැෂිම

| සිද්ධ නාම පද | සාධ්‍ය නාම පද |
|---|---|
| 1. .................................. | 1. .................................. |
| 2. .................................. | 2. .................................. |
| 3. .................................. | 3. .................................. |
| 4. .................................. | 4. .................................. |
| 5. .................................. | 5. .................................. |
| 6. .................................. | 6. .................................. |
| 7. .................................. | 7. .................................. |
| 8. .................................. | 8. .................................. |
| 9. .................................. | 9. .................................. |

## ක්‍රියාකාරකම 2

❁ පහත ‘අ’ වෘත්තයේ ඇතුළත් නාම ප්‍රකෘතිවලට ගැළපෙන තද්ධිත ප්‍රත්‍ය ‘ආ’ වෘත්තයෙන් තෝරා තිත් ඉරි මත ලියන්න.

‘අ’ වෘත්තය

ප්‍රදේශ,
ප්‍රසංග, පුද්ගල,
ඉතිහාස, සිහිල්, චක,
ශිල්ප, විද්‍යාලය,
ආදර්ශ, කුසල,
මාණික්‍ය, ලලිත

‘ආ’ වෘත්තය

ඉක, අටු,
ර්, වත්, ර්ය, ඉක,
මය, තා, ර්ය, අස්,
ය, ඉක

1. ........................................................
2. ........................................................
3. ........................................................
4. ........................................................
5. ........................................................
6. ........................................................
7. ........................................................
8. ........................................................
9. ........................................................
10. ........................................................
11. ........................................................
12. ........................................................


## ක්‍රියාකාරකම 3

❁ නිවැරදි තද්ධිත ප්‍රත්‍ය වරහන් තුළින් තෝරා තද්ධිත නාම තනන්න.

| නාම ප්‍රකෘති | තද්ධිත ප්‍රත්‍යය | තද්ධිත නාමය |
|---|---|---|
| උදා - පුත් | (අණු/ අණි) | පුතණු |
| 1. ඥාණ | (වත්/ වන්ත) | |
| 2. සෞභාග්‍ය | (මත්/ වත්) | |
| 3. ආලෝක | (වත්/ මත්) | |
| 4. ධෛර්‍ය | (මත්/ වත්) | |
| 5. රත්න | (මය/ මුවා) | |
| 6. රන් | (මය/ මුවා) | |
| 7. පණ්ඩිත | (අ/ ය) | |
| 8. පුද්ගල | (ඉකා/ ඉක) | |
| 9. ස්වදේශ | (ර්ය/ ඒය) | |
| 10. තරුණ | (ය/ අ) | |
| 11. පන්ති | (ඉක/ ක) | |
| 12. දින | (ඉක/ ක) | |
| 13. ශ්‍රා | (ඉෂ්ට/ ඉෂ්ඨ) | |
| 14. සංස්කෘති | (ක/ ඉක) | |

## ක්‍රියාකාරකම 4

❀ දී ඇති උපකාරක පද ඇසුරින් තනා ගත් තද්ධිත පද යොදා ප්‍රහේලිකාව පුරවන්න.




හරහට

1. වඩා ශ්‍රේෂ්ඨ
4. බොහෝ කල් පවත්නා
6. නිරුක්ත + ඉක
8. අතිශයින් පාපී
9. ජනපදයට අයත්
12. කළුවට හුරු
14. දුවයෙන් නිමවන ලද්දේ
15. සුග + ඉති

පහළට

2. එයට ආසන්න
3. පෙර දිගට අයත්
5. තරුණ + ය
7. විකල්ප + ඉක
10. දින + ඉක
11. ඉඟ ප්‍රදේශය
13. යකඩින් නිමවන ලද්දේ

## කෘදන්ත නාම

ධාතු ප්‍රකෘතියකට කෘදන්ත ප්‍රත්‍යයක් යොදා සාදා ගනු ලබන නාම, **කෘදන්ත නාම** යනුවෙන් හැඳින්වේ. වාක්‍ය නිර්මාණයේදී අප භාවිත කරන්නේ ක්‍රියා පද හෝ කෘදන්ත නාම බැවින් කෘදන්ත නාම සාදා ගැනීමෙහිලා ක්‍රියා පදයක ධාතු ප්‍රකෘතිය හෙවත් ක්‍රියා මූලය හඳුනා ගැනීම අවශ්‍ය වේ. ක්‍රියා පදයක ධාතු ප්‍රකෘතිය සොයා ගන්නේ කෙසේ ද? මේ සඳහා ක්‍රම කීපයක් ඇතත් ප්‍රයෝජ්‍ය ක්‍රියාර්ථයේ යෙදීම වඩාත් උචිත ක්‍රමය යි.

| ක්‍රියා පදය | ප්‍රයෝජ්‍ය ක්‍රියාව | ධාතු ප්‍රකෘති |
|---|---|---|
| බලයි | බල/ වයි | බල |
| වඳියි | වඳ/ වයි | වැඳ |
| බඳියි | බඳ/ වයි | බඳ |
| පලඳියි | පලඳ/ වයි | පලඳ |
| සිනාසෙයි | සිනස්/ වයි | සිනස් |
| රකියි | රක්/ වයි | රක් |

ඉහත දැක්වෙන ක්‍රියාපද ප්‍රයෝජ්‍ය ක්‍රියාවේ යොදු ඒවායින් ‘ව’ ‘ය්’ ප්‍රත්‍ය දෙක ඉවත් කළ විට ධාතු ප්‍රකෘතිය පහසුවෙන් හඳුනා ගත හැකි වේ.

## ධාතු ප්‍රකෘති ප්‍රභේද

### 1. ක්‍රියාර්ථ ධාතු හා නාමාර්ථ ධාතු (නාම ධාතුක ක්‍රියා)

ක්‍රියා පදයේ ප්‍රකෘතිය ක්‍රියාර්ථයක් දේ නම් එය ක්‍රියාර්ථ ධාතුවකි.

උදා :- නට, දුව, බල, කර, උදුර, වස්

ක්‍රියා පදයේ ප්‍රකෘතිය නාමාර්ථයක් වේ නම් එය නාමාර්ථ ධාතුවකි.

උදා :-

මග නිලමින් සිටිනා දෙඹ නී පියල (නිල් පැහැ ගන්වමින්)
උන්වහන්සේ යතිවරයෙකි.
මම භික්ෂුවක්මි.

ඉහත නිදසුන්වල නිල්, යතිවර, භික්ෂු යනු එම නාම ධාතුක ක්‍රියාවල නාමාර්ථ ධාතු ය.

### 2. ස්වරාන්ත හා හලන්ත ධාතු

ධාතු ප්‍රකෘතිය ස්වරයකින් අවසන් වේ නම් එය ස්වරාන්ත ධාතුවකි.

| | | | | | |
|---|---|---|---|---|---|
| උදා :- | දෙ | (දීමෙහි) | (ද් + එ) | - | එකාරාන්ත |
| | පිස | (පිසීමෙහි) | (ස් + අ) | - | අකාරාන්ත |
| | බො | (බීමෙහි) | (ප් + ඔ) | - | ඔකාරාන්ත |
| | හසුර | (හැසිරවීමෙහි) | (ර් + අ) | - | උකාරාන්ත |
| | යා | (යාමෙහි) | (ය් + ආ) | - | ආකාරාන්ත |

හල් අකුරකින් හෙවත් ව්‍යඤ්ජනයකින් අවසන් වන්නේ හලන්ත ධාතු ය.

රක් (රැකීමෙහි)
බස් (බැසීමෙහි)
නස් (නැසීමෙහි)
පුප් (පිපීමෙහි)

### 3. නිෂ්පන්න (දේශීය), තත්භව හා තත්සම ධාතු

වෙනත් භාෂාවකට සම්බන්ධ නැති හෙළ බසෙහි ම උපන් ධාතු නිෂ්පන්න (දේශීය) ධාතු ය.

වෙවුල (වෙවුලීමෙහි)
නෙළ (නෙළීමෙහි)
ඔරව (එරවීමෙහි)
පෙර (පෙරීමෙහි)

වෙනත් භාෂාවල යෙදෙන ධාතු ප්‍රකෘති ඒ ආකාරයෙන් ම සිංහල භාෂාවේ ද යෙදේ නම් ඒවා තත්සම ධාතු ප්‍රකෘති යි.

මර (මැරීමෙහි)
නම (නැමීමෙහි)

නට (නැටීමෙහි)
කර (කිරීමෙහි)

වෙනත් භාෂාවලින් සිංහල භාෂාවට බිඳී ආ ධාතු ප්‍රකෘති තත්භව ධාතු ප්‍රකෘති යි.

රක් (රැකීමෙහි)
සිඳ (සිඳීමෙහි)
ලබ (ලැබීමෙහි)

### 4. සකර්ම ධාතු හා අකර්මක ධාතු

වාක්‍යයක අවසාන ක්‍රියාව කර්මයක් අපේක්ෂා කරන්නේ නම් එම ක්‍රියාවේ ධාතුව සකර්මක ය.

උදා :- වපුර (වැපිරීමෙහි)
දව (දැවීමෙහි)
බල (බැලීමෙහි)
පිස (පිසීමෙහි)
විකුණ (විකිණීමෙහි)

වාක්‍යයක අවසාන ක්‍රියාව කර්මයක් අපේක්ෂා නොකරන්නේ නම් එම ක්‍රියාවේ ධාතු ප්‍රකෘතිය අකර්මක ය.

උදා :- නිද (නිදීමෙහි)
හඬ (හැඬීමෙහි)
දුව (දිවීමෙහි)
උතුර (ඉතිරීමෙහි)
පිහින (පිහිනීමෙහි)

## කෘදන්ත නාම ප්‍රභේද

1. අර්ථ ක්‍රියා නාම
2. භාව ක්‍රියා නාම යනුවෙන් කෘදන්ත නාම ප්‍රභේද දෙකකි.

### 1. අර්ථ ක්‍රියා නාම

ධාතු ප්‍රකෘතියෙන් පර ව කාරක අර්ථවත් ප්‍රත්‍යයක් යෙදී සෑදෙන්නේ අර්ථ ක්‍රියා නාම යි. ඒ අනුව කාරක අර්ථ 4ක් ප්‍රධාන වශයෙන් හඳුනා ගත හැකි ය.

i. කර්තෘ කාරක අර්ථය
ii. කර්ම කාරක අර්ථය
iii. කරණ කාරක අර්ථය
iv. භාව අර්ථය

### i. කර්තෘ කාරක අර්ථය

කර්තෘ කාරක අර්ථයෙහි න, උ, ඉ, නා ප්‍රත්‍යයන් යෙදී කෘදන්ත නාම සෑදේ. කර්තෘ කාරක අර්ථය යනු කෘදන්තයෙන් කර්තෘ උක්ත වීම යි.

න - (බල + න) - ඔහු බලන පොත මා තෑගි දුන් එකකි.
(දල්ව + න) - මා දල්වන පහන බුදුන්ට පූජා වේවා.

උ - (කර + උ) - කම්කරුවෝ වැඩ වරති.
(මර + උ) - කොතැන වුණත් නැත මරුහට බාදා,

ඉ - (විඳ + ඉ) - රැකියා ස්ථානයේ අප විඳි ගැහැට බොහෝ ය.
(නිද + ඉ) - ඔබ නිදි යහන සුව පහසු නොවේ.

නා - (ගය + නා) - බැතිමතුන් ගයනා ගී ඇතට ඇසේ.
(උසුල + නා) - මෙර උසුලනා මහ මිහිකතටත් වැඩි ය.

## ii. කර්ම කාරක අර්ථය

කෘදන්තයෙන් කර්මය උක්ත වීම සිදු වේ. එන, උණ, උණු ප්‍රත්‍ය යෙදී කර්ම කාරක කෘදන්ත සෑදේ.

එන - (පුද + එන) - පිදෙන මල් පරවී යනු ඇත.
(දව + එන) - දවෙන සෑය අබියස ජනතාව නිහඬ ව බලා සිටිති.

උණ - (බිඳ + උණ) - බිඳුණ බඳුන රත්රන් නම් එහි අගයෙහි අඩුවක් නැත.
(සිඳ + උණ) - නිදන් හොරුන් විසින් සිඳුණ චෛත්‍යය මෙය යි.

උණු - (තන + උණු) - රජරට පුරා ඇත්තේ පැරණි රජවරුන් විසින් තැනුණු වාරි පද්ධතිය යි.

## iii. කරණ කාරක අර්ථය

කෘදන්තයෙන් කරණ විභක්ති අර්ථය ප්‍රකාශ වේ නම් ඒවා කරණ කාරක කෘදන්ත ලෙස හැඳින්වේ. ඒ සඳහා, න, නා යන ප්‍රත්‍යය යෙදේ.

න - (පිය + න) - පියන (එයින් වසනුයි යන අර්ථයෙන්)
(කඩ + න) - කඩනය (එයින් කඩනුයි යන අර්ථයෙන්)
(පිස් + නා) - පිස්නාව (එයින් පිසිනුයි යන අර්ථයෙන්)
(දක් + න) - දක්නාව (එයින් දකිනුයි යන අර්ථයෙන්)

## iv. භාව අර්ථය

ධාතු ප්‍රකෘතියට ඇතැම් ප්‍රත්‍ය යෙදීමෙන් ඉහත දැක්වූ පරිදි කිසියම් අර්ථයක් ප්‍රකාශ නොවී හුදු ක්‍රියා මාත්‍රය පමණක් දැක්වේ නම් ඒවා භාව කාරක කෘදන්ත වේ.

භාව කාරක කෘදන්ත ප්‍රත්‍ය - නු, උම්, ඉලි, ර්ම්, මන්

නු - (ලිය + නු) = ලියනු
(ගය + නු) = ගයනු

උම් - (රිද + උම්) = රිදුම්
(රක් + උම්) = රැකුම්

ඉලි - (ලිය + ඉලි) = ලියවිලි
(බල + ඉලි) = බැලිලි

ඊම් - (කර + ඊම්) = කිරීම්
(නට + ඊම්) = නැටීම්

මන් - (කිය + මන්) = කියමන්
(ලිය + මන්) = ලියමන්

කෘදන්ත නාම භාෂාවේ භාවිත වන ස්වභාවය අනුව වර්ග තුනක් හඳුනා ගත හැක.

**i. නාමපද වශයෙන්**

වචන්නෝ දිනන්නෝ ය.
දරුවා පාසලට ඇතුළත් කිරීමේදී ලියවිලි රැසක් ඉදිරිපත් කළ යුතු විය.

**ii. නාම විශේෂණ වශයෙන්**

රඟන ළඳුන් බල රූ සිරි සියල්ලා
ගැයෙන ගී කන්කලු ය.
හැඬූ කඳුළු මුහුදට එක් වුණා දෝ

iii. අවසාන ක්‍රියා පද වශයෙන්

රණවිරුවෝ රට රැකුමට දිරි දෙන්නෝ ය.
ඈ මිහිරි ගීයක් ගැයුවා ය.

## කෘදන්ත නාම වරනැගීම

කෘදන්ත නාම වරනැගීම ප්‍රභේද පහක් අනුව සිදු වේ. එනම්,

1. කාල භේදය
2. කාරක භේදය
3. වචන භේදය
4. ලිංග භේදය
5. පුරුෂ භේදය යනු යි.

## කර්තෘ කාරක - අනතීත

| පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ගයන්නේ ය/ ගයන්නී ය | ගයන්නෝ ය/ ගයන්නාහ |
| මධ්‍යම පුරුෂ | ගයන්නෙහි | ගයන්නහු |
| උත්තම පුරුෂ | ගයන්නෙමි | ගයන්නෙමු |

## කර්තෘ කාරක - අතීත

| පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ගැයුවේ ය/ ගැයුවා ය | ගැයුවෝ ය/ ගැයුවාහ |
| මධ්‍යම පුරුෂ | ගැයුවෙහි | ගැයුවෙහු |
| උත්තම පුරුෂ | ගැයුවෙමි | ගැයුවෙමු |

## කර්ම කාරක - අනතීත

| පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ගැයෙන්නේ ය/ ගැයෙන්නී ය | ගැයෙන්නාහ/ ගැයෙන්නෝ ය |
| මධ්‍යම පුරුෂ | ගැයෙන්නෙහි | ගැයෙන්නෙහු |
| උත්තම පුරුෂ | ගැයෙන්නෙමි | ගැයෙන්නෙමු |

## කර්ම කාරක - අතීත

| පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ගැයුණේ ය/ ගැයුණා ය | ගැයුණෝ ය/ ගැයුණාහ |
| මධ්‍යම පුරුෂ | ගැයුණෙහි | ගැයුණෙහු |
| උත්තම පුරුෂ | ගැයුණෙමි | ගැයුණෙමු |

භාවාර්ථ කෘදන්ත ලිංග, කාල වචන හා පුරුෂ භේදයක් නැතිව භාව අර්ථයෙහි පමණක් යෙදේ.

ලියනු, ලියුම්, ලියවිලි, ලිවීම්, ලියමන්,
රකිනු, රැකුම්, රැකවිලි, රැකීම්, රැකුමන්

## ක්‍රියාකාරකම 5

❀ පහත දැක්වෙන කෘදන්ත නාම කර්තෘ කාරක කර්ම කාරක හා භාවාර්ථ වශයෙන් බෙදා දක්වන්න.

බැබළුණේ, ලියුවේ, ගලන්නේ, දුවන්නෝ, පිදෙන්නෝ, පැරැදුණේ, ගැයුම්, කඩන, බැලෙන, මැනුම්, තැවිලි, පෙළෙන්නෝ, තැවෙන්නෝ, සැරසුම්, රිදෙනු

| කර්තෘ කාරක කෘදන්ත | කර්ම කාරක කෘදන්ත | භාව අර්ථ කෘදන්ත |
|---|---|---|
| 1. ................................ | 1. ................................ | 1. ................................ |
| 2. ................................ | 2. ................................ | 2. ................................ |
| 3. ................................ | 3. ................................ | 3. ................................ |
| 4. ................................ | 4. ................................ | 4. ................................ |
| 5. ................................ | 5. ................................ | 5. ................................ |

## ක්‍රියාකාරකම 6

❀ අදාළ කොටුවේ " √ " ලකුණ යොදන්න.

| කෘදන්ත | කර්තෘ කාරක | කර්ම කාරක | භාව කාරක | ප්‍රථම පුරුෂ | මධ්‍යම පුරුෂ | උත්තම පුරුෂ | පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග | නපුංසක ලිංග | ඒක වචන | බහු වචන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බලන්නෝ | | | | | | | | | | | |
| බැලුණේය | | | | | | | | | | | |
| බලන්නාහ | | | | | | | | | | | |
| බැලුණා ය | | | | | | | | | | | |
| බලන්නී ය | | | | | | | | | | | |
| බැලුණෙහි | | | | | | | | | | | |
| බලන්නෙහි | | | | | | | | | | | |
| බලන්නෙමි | | | | | | | | | | | |
| බැලුමන් | | | | | | | | | | | |
| බැලුම් | | | | | | | | | | | |

## ක්‍රියාකාරකම 7

**පහත සඳහන් ගේය පද රචනයේ ඇති කෘදන්ත පද තෝරා ලියන්න.**

රඟන රැඟුම් ගයන ගැයුම් සතුට සදු දේ
දෝත් සලා දෑත් විදා රඟන විලාසේ

පාද බැඳුණු මිණි කිංකිණි සළඹ සලාලා
පාටවලින් චන්දන තිලකය ද තියාලා
ජයට රැඟුම් දේ - මිහිර ගිගුම් දේ
දෝත් සලා දෑත් විදා රඟන විලාසේ

සිහින් සිනිඳු දෙතොල අගේ නිතර සිනා දේ
තාල යොදා රඟන පදේ අරුත කියාදේ
තාන තනානේ තාන තනානේ
දෝත් සලා දෑත් විදා රඟන විලාසේ

**(ගායනය - වසන්තා සන්දනායක)**

### සුභාෂිත

**විඥානෙව විජානාති**
**විඥ්‍යජ්ජන පරිශ්‍රමම්**

ඉගෙනීමේ වෙහෙස උගත් තැනත්තා ම දන්නේ ය.

### සුචින්තන

ගඩොල් පරණ වුවත් ඒවායින් අලුත්, අලංකාර මන්දිර නිර්මාණය කළ හැකි ය.

# 07

# නෛපාතික කෘදන්ත

වාක්‍යයේ මැද යෙදෙන ක්‍රියා අනවසාන ක්‍රියා හෙවත් නෛපාතික කෘදන්ත ලෙස හැඳින්වේ. එසේ යෙදී වාක්‍යාංශ නිර්මාණය කරමින් සංකීර්ණ වාක්‍ය තැනීමට උපකාරී වන නෛපාතික කෘදන්ත වර්ග හතරක් පිළිබඳ හඳුන්වා දෙමින් ඒවා නිර්මාණය වන ආකාර හා වාක්‍යවල යෙදෙන ආකාර පිළිබඳව සවිස්තරාත්මක අවබෝධයක් මෙම පාඩමෙන් ඔබට ලද හැකි ය.

# නෛපාතික කෘදන්ත

මීට පෙර පාඩම්වලදී අප ඉගෙන ගත් අවසාන ක්‍රියා හා නාම ක්‍රියා වාක්‍යවල අවසානයෙහි යෙදී පොදුවේ අවසාන ක්‍රියා ලෙස භාවිත වෙතත් වාක්‍යයක මැද යෙදී අනවසාන ක්‍රියා ලෙස භාවිත වන ක්‍රියා පද විශේෂයක් ද වේ. වාක්‍යයක් අර්ථවත් කිරීම සඳහා තැන තැන යෙදී නිපාත මෙන් ක්‍රියා කරන බැවින් ඒවා නිපාත ක්‍රියා හෙවත් නෛපාතික ක්‍රියා ලෙස ද හැඳින්වේ. වාක්‍යයක් අර්ථවත් කිරීම සඳහා නිපාත ක්‍රියාවලින් සිදු වන මෙහෙය පහත දැක්වෙන නිදසුනින් පැහැදිලි වනු ඇත.

අගහිඟතා රැකියාවක මැනැවැ යි ඔහු නගරයට සේන්දු විය.

නිපාත ක්‍රියා නොමැති ව අර්ථවත් නොවූ එම වාක්‍යය නිපාත ක්‍රියා නිසා අර්ථවත් වන ආකාරය බලන්න.

අගහිඟතා <u>දුරලනු පිණිස</u> රැකියාවක <u>නිරත වුවහොත්</u> මැනැවැ යි <u>සිතා</u> ඔහු නගරයට සේන්දු විය.

වාක්‍යයක මැද යෙදෙන එබඳු නෛපාතික ක්‍රියා ප්‍රභේද වශයෙන් හතරකි.

1. පූර්ව ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා
3. ආවස්ථික ක්‍රියා
4. අපර ක්‍රියා

## 1. පූර්ව ක්‍රියා

වාක්‍යයක එක ම කර්තෘගේ අවසාන ක්‍රියාවට පෙර නිම කරන ලද ක්‍රියා පූර්ව ක්‍රියා නමින් හඳුන්වනු ලැබේ.

උපාසිකාව සුදුවතින් <u>සැරසී</u> තෙල්මල් <u>ගෙන</u> විහාරයට පා නගයි.

මෙහි අවසාන ක්‍රියාවට පෙර කරන ලද ක්‍රියා දෙකක් වෙයි. එනම් <u>"සැරසී" "ගෙන"</u> යනු යි. එක ම කර්තෘ විසින් අවසාන ක්‍රියාවට පෙර නිම කරන ලද ක්‍රියා පූර්ව ක්‍රියා බව ඉහත නිදසුන් වාක්‍යයෙන් පැහැදිලි වේ.
සිදත් සඟරාවේ "පෙර කිරිය" නමින් එය හඳුන්වා ඇත්තේ මෙසේ ය.

"එක කතු කිරියෙනෙන් පෙර කිරියට
ඇ ආ ඊ ඉන් ලා යුතු ද වියුතු ද"

එක ම කර්තෘගේ ක්‍රියාවන්ගෙන් පූර්ව ක්‍රියාව න්, ට, ලා යන්නක් සහිත ව ද රහිත ව ද ඇ, ආ, ඊ, ඉන් යන ප්‍රත්‍යයන් ද යෙදේ.

පූර්ව ක්‍රියාවල පුරුෂ, ලිංග, වචන, භේද නැතත් කාරක භේදය පවතී. පූර්ව ක්‍රියාව හැම විට ම අතීත කාලයට අයත් වේ.

**කර්තෘ කාරක**

නිළිය අබරණින් සැරසී වේදිකාවට පිවිසුණා ය.

**කර්මකාරක**

රෝගියා රෝහලට ඇතුළු කරනු ලැබ ප්‍රතිකාර සඳහා යොමු කරන ලදී.

## පූර්ව ක්‍රියා පද සෑදෙන ක්‍රම

i. ප්‍රත්‍ය ගැන්වීම

| | |
|---|---|
| 'අ' ප්‍රත්‍යය - | බස් + අ = බැස<br>පන් + අ = පැන |
| 'ආ' ප්‍රත්‍යය - | බල + ආ = බලා<br>මර + ආ = මරා |
| 'ඇ' ප්‍රත්‍යය - | දක් + ඇ = දැකැ<br>බස් + ඇ = බැසැ |
| 'ඊ' ප්‍රත්‍යය - | බො + ඊ = බී<br>දෙ + ඊ = දී |

ප්‍රත්‍ය යෝගයේදී ස්වර විපර්යාසයක් ද සිදුවේ.

| | |
|---|---|
| ගන් + අ = ගෙන | දෙ + ඊ = දී |
| පුප් + ඊ = පිපී | පො/ බො + ඊ = පී /බී |

ii. ඇතැම් පූර්ව ක්‍රියා ධාතු ප්‍රකෘති ස්වරූපයෙන් ම යෙදේ.

කර - මම වත්තේ වැඩ කර දිය නෑවෙමි.
පිස - මව ආහාර පිස සාලයට ආවා ය.
පිවිස - ඇමතිවරයා මාලිගාවට පිවිස රජු බැහැ දැක්කේ ය.
බිඳ - සොරු ගෙය බිඳ බඩු පැහැර ගත්හ.

iii. ධාතු ප්‍රකෘතියට උපකාරක පදයක් යොදා ගැනීම

දමා - හැර දමා, ගසා දමා
පියා - හැර පියා, ගසා පියා
ලා - හැර ලා, ගසා ලා
ගෙන - හැර ගෙන, ගසා ගෙන

iv. රකාරාන්ත ධාතුවලට ප්‍රත්‍ය ගැන්වීමට අමතරව විශේෂ රූප ද ඇත.

| | | |
|---|---|---|
| වපුර | (වපුරා) | වපුට |
| මතුර | (මතුරා) | මතුට |
| කර | (කර) | කොට |
| විකුණ | (විකුණා) | විකොට |
| අතුර | (අතුරා) | අතුට / අතුළ |

v. ප්‍රකෘති හා ප්‍රත්‍ය වෙන් කර ගත නොහැකි පූර්ව ක්‍රියා පද විශේෂයක් ද භාවිතයේ පවතී.

අවුත්, ඇවිත්, විත්, අවුදින්, අවුදු, වුත්, ගොස්, ගොසින්

## ක්‍රියාකාරකම 1

**පහත දැක්වෙන පද්‍ය පාඨ ඇසුරෙන් පූර්ව ක්‍රියා පද තෝරා ලියන්න.**

බැද්ද වටට සුදු මොරමල් පිපීලා
සද්ද කර බඹරු ඒ වග අසාලා
ඉටිත් පැණිත් ලොව හැමට ම බෙදාලා
යන්නන් බඹරු දුක් මැසිවිලි කියාලා

ඕලු නෙළුම් නෙරිය රඟාලා
කිකිණි හඬන වලා නඟාලා
ගගුල් තොටිල්ලේ - මල් ඇතිරිල්ලේ
මගේ කුඩා ඔරුව හබල්ගා
යමු නැළැවිල්ලේ - නැළැවිල්ලේ - නැළවිල්ලේ
ඇදී ඇදී යන්නැ නදී රිදී තොටිල්ලේ

## ක්‍රියාකාරකම 2

**ගැළපෙන පූර්ව ක්‍රියා පද වරහන තුළින් තෝරා ගෙන පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවන්න.**

(දැල්වී, කරන ලදුව, කර, හලාලා, නිමවා, තෝරා ගන්නා ලදුව, තෝරා ගෙන, සලාලා, උරා, කොට, තනවා)

1. ක්‍රියාකාරී නිලධාරී මණ්ඩලයක් ................................ මහිලා සමිතියට පුනර්ජීවයක් දෙන්නට සාමාජිකාවෝ උත්සාහ දරති.
2. දක්ෂතම ශිෂ්‍යයා ................................ තිළිණය ප්‍රදානය කරන ලදි.
3. තරග නීතිරීති පිළිබඳව ශිෂ්‍යයෝ දැනුම්වත් ................................ රචනා තරගයට ඉදිරිපත් කෙරුණහ.
4. සංවිධායකයෝ උත්සවය පිළිබඳ පූර්ව ප්‍රචාරයක් ................................ බොහෝ පිරිසක් ඊට කැඳවා ගැනීමට අදහස් කරති.
5. ලිපිකරුවා සිය කාර්යය වේලාසනින් ................................ ලිපිගොනුව කාර්යාල ප්‍රධානියාට භාර දුන්නේ ය.
6. පැරණි රජවරු වැව් ................................ කෙත් වතු සරුසාර ................................ සහලින් රට ස්වයංපෝෂිත කළහ.

7. මාර්ගයේ සවිකරනු ලැබ ඇති මාර්ග සංඥා එළි මගින් රතු, කහ, කොළ එළි .............. ................... රථවාහන හැසිරවීම කෙරෙයි.

8. පියලි ................................ රේණු ................................ සුවඳ ................................ සිසිල් සුළඟ හමන්නේ.

## 2. මිශ්‍ර ක්‍රියා

වාක්‍යයක එක ම කර්තෘ විසින් අවසාන ක්‍රියාවත් සමග කරනු ලබන ක්‍රියා මිශ්‍ර ක්‍රියා නමින් හැඳින්වේ. අවසාන ක්‍රියාවත් සමග මිශ්‍ර ක්‍රියා කීපයක් වුව ද සිදු විය හැකි ය.

රියදුරා මාර්ග නීති පිළිපදිමින් රථය පදවයි.
මහ ගංවතුර ගස්ගල් පෙරළමින් ගම්බිම් යටකරමින් බියකරු හඬ නගමින් වේගයෙන් ගලා ගියේ ය.

සිදත් සඟරාවේ "මුසුකිරිය" නමින් එය දක්වෙන්නේ මෙසේ ය.

> "එක කතු කිරියනෙන් මුසු බැවැ මින්
> මින මිනිද"

ක්‍රියාවන් එකට කිරීමෙහි හෙවත් මිශ්‍ර ක්‍රියාවන්හි මින්, මින, මිනි යන ප්‍රත්‍යයන් යෙදේ.

මිශ්‍ර ක්‍රියාවල ද පුරුෂ, ලිංග හා වචන භේද නැතත් කාරක භේදය පවතී. මිශ්‍ර ක්‍රියාව හැමවිට ම වර්තමාන කාලය හා බැඳේ.

### කර්තෘ කාරක

ඈ හඬමින් ගීතය ගායනා කළා ය.

### කර්ම කාරක

ඇය විසින් ගීතය ගැයෙමින් තිබේ.

### භාව කාරක

ඇයට හැඬෙමින් තිබිය දී ද ඈ ගීතය ගායනා කළා ය.

## මිශ්‍ර ක්‍රියා සාදා ගන්නා ක්‍රම

i. ප්‍රත්‍ය යෝගය

'මින්', 'මිනි', 'මිනි', 'මින' ප්‍රත්‍ය යෙදීම

මින් - තොටියා ගීයක් ගයමින් ඔරුව පදියි. (ගය + මින්)
මිනි - ඔහු ගමෙන් පිටව ගියේ හඬමිනි. (හඬ + මිනි)
මිනි - හිරු උදාවෙද්දී තරු මිලියෙමිනි අහසේ සැඟවිණි. (මිලිය + මිනි)

මින - රෝගියා ගියේ කොර ගසමින (ගස + මින)

මෙම ප්‍රත්‍යවලින් මින්, මිනි ප්‍රත්‍ය වර්තමාන ව්‍යවහාරයේදී පැවතුණත් මින, මිනි ප්‍රත්‍ය පැරණි කාව්‍ය භාෂාවෙහි යෙදී ඇත.

ii. ධාතු ප්‍රකෘතිය ද්විත්ව වීමෙන් ද මිශ්‍ර ක්‍රියා තැනෙයි.

බැණ බැණ
දැක දැක
වැඳ වැඳ

ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අනේ දෙව්දත් නුදුටි මොක්පුර

ඇතැම් ධාතු ප්‍රකෘති ද්විත්ව වීමේදී දෙවන ප්‍රකෘති පදයේ අග ස්වරය දීර්ඝ වේ.

නට නටා, ගය ගයා, උතුර උතුරා

නැට්ටුවෝ නට නටා පෙරහැරේ යති.
බාලිකාවෝ ගී ගය ගයා රංගනයක යෙදෙති.
සුනිල්වන් නුවන් යුග වසා උතුර උතුරා

ගැලූ කඳුළු ගංගාවෙ ඇය දූන් කිඳීලා

- ප්‍රයෝජ්‍ය ක්‍රියා අර්ථයෙහි ද මිශ්‍ර ක්‍රියාව යෙදේ.

  ලියවමින්/ ලියව ලියවා
  කරවමින්/ කරව කරවා
  පුදවමින්/ පුදව පුදවා
  හඬවමින්/ හඬව හඬවා

- මිශ්‍ර ක්‍රියාව ප්‍රායෝගිකව යෙදෙන තවත් අවස්ථාවක් ලෙස, අසම්භාව්‍ය ක්‍රියාව මිශ්‍ර ක්‍රියා අර්ථය හැඟවීම දැක්විය හැකි ය. එහිදී ඊට සම්බන්ධ වාක්‍යයේ අවසාන ක්‍රියාවේ ස්වරූපය අනුව එය කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියා ස්වරූපයෙන් වෙන් කර ගත හැකි ය. එනම් අවසාන ක්‍රියාව නිරුත්සාහක ක්‍රියාවක් වන විට මුල් වාක්‍යාංශයේ ක්‍රියාව කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා අර්ථය දෙයි.

මා පොත **බලද්දී** මට **නින්ද ගියේ ය.**

බලද්දී ↑ කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාව
නින්ද ගියේ ය ↑ නිරුත්සාහක ක්‍රියාව

අවසාන ක්‍රියාව උත්සාහක ක්‍රියා ස්වරූපය ගන්නා විට පූර්ව වාක්‍යාංශයේ යෙදෙන ක්‍රියාව මිශ්‍ර ක්‍රියා අර්ථය දෙයි.

මා මල් පූජා **කරද්දී** ගාථා ද **කීවෙමි.**

කරද්දී ↑ මිශ්‍ර ක්‍රියාව
කීවෙමි ↑ උත්සාහක ක්‍රියාව

## ක්‍රියාකාරකම 3

❁ පහත දක්වෙන වාක්‍යවල ඇති හිස්තැන් ගැළපෙන මිශ්‍ර ක්‍රියා යොදා සම්පූර්ණ කරන්න.

1. බෙරකරුවෝ බෙර ...................................., බෙර තාලයට පා .................................... පෙරහැරේ යති.

2. පෙර හෙළ රජවරු වැව් .................................... ගොවිතැන නගා .................................... බුදුසසුනේ දියුණුවට ද මහත් සේ කැප වූහ.

3. මාර්ගයේ රතු එළිය .................................... වාහන නවතා තිබියදී පදිකයෝ පදික මාරුවෙන් මාර්ගය හරහා ගමන් .................................... සිටියහ.

4. අලුත් අවුරුදු නැකත උදාවෙද්දී රතිඤ්ඤා පිපිරෙන හඬින් රටම ගිගුම් ........................ ............. තිබිණි.

5. අවමඟුල් පෙරහැරේ ඥාතීහු .................................... , .................................... ගමන් කළහ.

## ක්‍රියාකාරකම 4

❁ දී ඇති ක්‍රියා පද දෙයාකාරයක් වන සේ මිශ්‍ර ක්‍රියාවලට නගා හිස් තැන් පුරවන්න.

| අ | ආ | ඇ |
|---|---|---|
| 1. දෙයි | 1. .......................... | 1. .......................... |
| 2. ගොතයි | 2. .......................... | 2. .......................... |
| 3. කැවේ ය | 3. .......................... | 3. .......................... |
| 4. හැලුවේ ය | 4. .......................... | 4. .......................... |
| 5. යෙදුණහ | 5. .......................... | 5. .......................... |
| 6. බිරූහ | 6. .......................... | 6. .......................... |
| 7. ඇහිලුවේ ය | 7. .......................... | 7. .......................... |
| 8. ගිගිරූහ | 8. .......................... | 8. .......................... |
| 9. කෙඳිරුවෙමි | 9. .......................... | 9. .......................... |
| 10. පැතිරිණි | 10. .......................... | 10. .......................... |

## 3. ආවස්ථික ක්‍රියා

ක්‍රියාව සිදු වන අවස්ථාව පිළිබඳ ප්‍රකාශ කෙරෙන ක්‍රියා ආවස්ථික ක්‍රියා ලෙස හැඳින්වේ. එම ක්‍රියා නැවත කොටස් දෙකකට බෙදේ.

1. නියත අර්ථයේ ආවස්ථික ක්‍රියා (කාලාර්ථය)
2. අනියත අර්ථයේ ආවස්ථික ක්‍රියා (අසම්භාව්‍යාර්ථය)

### 1. නියතාර්ථයේ ආවස්ථික ක්‍රියා

ක්‍රියාව සිදු වන අවස්ථාව නිශ්චිත ව ප්‍රකාශ කෙරෙන ක්‍රියා නියතාර්ථයේ ආවස්ථික ක්‍රියා ය. මෙමගින් වාක්‍යයේ ප්‍රධාන ක්‍රියාව සිදු වන අවස්ථාව නිශ්චිත ව ප්‍රකාශ කෙරේ.

උදා - බල්ලන් බුරද්දී සොරු පලා ගියහ. මෙම වාක්‍යයේ සොරුන් පලා ගිය අවස්ථාව නිශ්චිත ව ප්‍රකාශ වන්නේ බල්ලන් බුරද්දී යන නියත ආවස්ථික ක්‍රියාවෙනි. මෙම ක්‍රියාවල ද පුරුෂ, ලිංග, වචන හා කාල භේද නැතත් කාරක භේදය පෙනේ.

| කර්තෘ කාරක | කර්ම කාරක |
|---|---|
| බලද්දී | බැලෙද්දී |
| කරද්දී | කෙරෙද්දී |
| පුදද්දී | පිදෙද්දී |

### නියතාර්ථයේ ආවස්ථික ක්‍රියා ප්‍රත්‍ය

‘ත’ ප්‍රත්‍යය - කියත උන් මෙතෙපල - ආයෙය ඇදුරු
ගුත්තිල (කිය + ත) (කියන කල්හි)

‘ත්’ ප්‍රත්‍යය - හිරු උදාවත් පිනි නොතිබේ.
උදාව + ත් (උදාවන කල්හි)

‘ඉත’ ප්‍රත්‍යය - හිරු බසිත පියුම් හැකිළේ.
(බස් + ඉත) (බැසයන කල්හි)

‘ඉත්’ ප්‍රත්‍යය - හිරු නගිත් පියුම් පිපේ.
(නග + ඉත්)

‘එත’ ප්‍රත්‍යය - හිරු කිරණ වැටෙත පිනි වියැකේ.
(වට + එත)

‘එත්’ ප්‍රත්‍යය - සඳ නැගෙත් අඳුර දුරු වේ.
(නග+ එත්)

‘දී’ ප්‍රත්‍යය - කම්කරුවන් රට නැගුමට වැඩ කරද්දී එම සේවය අගය කළ යුතු ය.
(කරත් + දී)
(ඉහත ත්, ඉත්, එත් ප්‍රත්‍යවලට ම ‘දී’ ප්‍රත්‍ය යෙදේ.)
හිරු නගිද්දී පියුම් පිපේ. (නගිත් + දී)
සඳ නැගෙද්දී අඳුර දුරු වේ. (නැගෙත් + දී)

ප්‍රත්‍ය යෝගයට අමතර ව කෘදන්ත රූපයට සඳ, විට, කල්හි යන නිපාත පද යෙදී නියතාර්ථ ආවස්ථික ක්‍රියා පද සෑදේ.

උදා - මරන විට
කරන කල්හි
දුවන සඳ

## 2. අනියතාර්ථයේ ආවස්ථික ක්‍රියා

සිදු වීම අවිනිශ්චිත ක්‍රියා මෙනමින් හැඳින්වේ. වාක්‍යයේ ප්‍රධාන ක්‍රියාව අන්තර් වාක්‍යයේ සිදු වීම මත රඳා පවතී. එහෙත් එය අවිනිශ්චිත ය. එබැවින් එබඳු අනියත ක්‍රියා අනියතාර්ථයේ ආවස්ථික ක්‍රියා ලෙස හැඳින්වේ.

උදා - වැසි වැස්සොත් ගඟ පිරේ.

ප්‍රධාන වාක්‍යයේ ක්‍රියාව සිදු වීම රඳා පවත්නේ අන්තර් වාක්‍යයේ ක්‍රියාව මත ය. එනම් ගඟ පිරෙන්නේ වැසි වැටුණොත් ය. වැසි වැසීම නිශ්චිත නැත.

එම ක්‍රියා ද කාරකාර්ථයෙහි පමණක් යෙදේ.

| **කර්තෘ කාරක** | **කර්ම කාරක** |
|---|---|
| බලතොත් | බැලෙතොත් |
| කරතොත් | කෙරෙතොත් |
| පිදුවොත් | පිදෙතොත් |

### අනියතාර්ථයේ ආවස්ථික ක්‍රියා ප්‍රත්‍යයන්

‘අ’ ප්‍රත්‍යය - බැලුව මුළු දඹදිව මේ
සමව සිටිනෝ අපි දෙදෙන මේ (බැලු + අ)
(අතීත කෘදන්තයට ‘අ’ ප්‍රත්‍යය යෙදේ)

‘ත’ ප්‍රත්‍යය - සතුරන් පරදත අපට ජය ලැබේ. (පරද + ත)
(ධාතු ප්‍රකෘතියට ‘ත’ ප්‍රත්‍යය යෙදේ)

‘ඔත්’ ප්‍රත්‍යය - යතොත් වේලාසනින් යන්න. (යත + ඔත්)
කරතොත් කරගත් දන් පින් සීරුව (කරත + ඔත්)

‘හොත්’ ප්‍රත්‍යය - යතහොත් වේලාසනින් යන්න. (යත + හොත්)
කරතහොත් නොපමාව දන් පින් කරගන්න. (කරත + හොත්)
(‘ත’ ප්‍රත්‍යාන්ත ආවස්ථික ක්‍රියා රූපයට ‘ඔත්’ හා ‘හොත්’ ප්‍රත්‍යයන් යෙදේ)

කළොත් පිනක් ම කරන්න. (කළ + ඔත්)
මළොත් සුගතියෙහි ම උපදිනු ඇත. (මළ + ඔත්)
කළහොත් පිනක් ම කරන්න. (කළ + හොත්)
මළහොත් සුගතියෙහි ම උපදිනු ඇත. (මළ + හොත්)
(අතීත කාල කෘදන්තයට ඔත්, හොත් ප්‍රත්‍යයන් යෙදේ)

### ‘නම්’ නිපාතය යෙදීම

යන්නේ නම් - යන්නේනම් වේලාසනින් අවදි වන්න.
ගියා නම් - ඔබ රැස්වීමට ගියා නම් පැමිණීමේ ලේඛනයෙන් ඒ බව දැන ගත හැකි ය.
කරයි නම් - යමෙක් උනන්දුවෙන් වැඩ කරයි නම් ප්‍රතිඵල ද යහපත් වේ.
කරත් නම් - දේශපාලකයෝ රට නැගුමට වැඩ කරත් නම් ඔවුහු ජනතා ප්‍රසාදය ලබත්.

අසම්භාව්‍ය ක්‍රියාව යෙදෙන වාක්‍යාංශයේ උක්තය අනුක්ත රූපයෙන් තැබීම ව්‍යාකරණ රීතිය වුවත් වාක්‍ය දෙකක් ‘නම්’ ප්‍රත්‍යයෙන් සම්බන්ධ වන විට දෙපස වාක්‍ය දෙක ම උක්තාඛ්‍යාත රීති අනුව සමබර ව සිටී.

ඉහත සඳහන් වාක්‍ය දෙක කෙරෙහි නැවත අවධානය යොමු කරන්න.
යමෙක් උනන්දුවෙන් වැඩ කරයි නම් ප්‍රතිඵල ද සුබ වේ.
දේශපාලකයෝ රට නැගුමට වැඩ කරත් නම් ඔවුහු ජනතා ප්‍රසාදය ලබත්.

## ක්‍රියාකාරකම 5

**❁ පහත දී ඇති පාඨවල ඇති ආවශ්‍යක ක්‍රියා යටින් ඉරි අඳින්න.**

1. හැම ගුණ කියත් නොපිළිවතින් පුරිසදම්මසාරථී ගුණ කියමු.

2. ගින්නෙන් නැගුණු දුම්
   දවතහොත් වැද මහ දුම්

3. හිමි මෙ තොප අවසර
   දුනහොත් රජුට මෙනුවර

4. කසේ සැමිටි වේවැල් ඉරටු ගෙන අතේ
   ඇසේ කඳුළු අකුරට ගිය කලට ගතේ

5. මෙ දැන කළෝතින් වැඩ වෙයි සව් ඉසුරු

6. විදුලිය වන් මේ කය ලත් තැනදී
   සිදු නොකළොත් මතු සගමොක් වරදී

7. ඇතොත් වරදක් මෙතෙක් කල් හිඳ කමා කරවයි කර කතා

8. පෙර දළනිඳු දිය කඳ රට බිම් ගලත
   සුරකුල හිමි රකිනුව ලක මැවූ සත

# ක්‍රියාකාරකම 6

- **පහත දී ඇති වාක්‍යාංශවල ඉරි ඇඳි පද නියතාර්ථයේ ආවස්ථික ක්‍රියා හා අනියතාර්ථයේ ආවස්ථික ක්‍රියා ලෙස වෙන් කර ලියන්න.**

  මේ කථාව දැනගත්තොත්
  ගඟ ගලන කල්හි
  ඔහු මා දෙස බලත් ම
  නරක ආරංචි පැතිරුවහොත්
  මල් කැඩුවොතින්
  ඇඳුම මහනව නම්
  ඇය සිනාවෙද්දී
  හිරු නැගෙත් ම
  මේ අවස්ථාව පැහැර හැරියොත්
  බඩු විකිණෙද්දී

## 4. අපර ක්‍රියා

වාක්‍යයක එක ම කර්තෘගේ අවසාන ක්‍රියාවට පෙර කරන ලද ක්‍රියා පූර්ව ක්‍රියා ලෙස මීට පෙර අපි උගතිමු. ඒ අනුව එක ම කර්තෘගේ අවසාන ක්‍රියාවට පසුව කරනු ලබන ක්‍රියා අපර ක්‍රියා ලෙස හැඳින්විය හැකි ය.

උදා - කෙත රකිනුව ගොවියා බත් මුලක් ගෙන පැලට ගියේ ය.

මෙහි ගොවියා කළ අවසාන ක්‍රියාව 'ගියේය' යන්න ය. ගොවියා පැලට ගියේ කෙත රැකීම පිණිස ය. ඒ අනුව කෙත රැකීම සිදු වන්නේ පැලට ගියාට පසුව බැවින් 'රකිනුව' යන්න අපර ක්‍රියාවකි.

අපර ක්‍රියා විෂයෙහි ද පුරුෂ, ලිංග, කාල හා වචන භේද නැතත් කාරක භේදය පෙනේ.

### කර්තෘ කාරක

රියදුරා අනතුර වළකනුව රථයේ තිරිංග තද කළේ ය.

### කර්ම කාරක

ගොවියා විසින් හේන රැකෙනුව/ රැකෙනු පිණිස ඒ වටා දඬුවැට බැඳේ.

## අපර ක්‍රියා තැනෙන ක්‍රම

i. ධාතු ප්‍රකෘතියට පරව 'නුව' ප්‍රත්‍යය යෙදීම

බලනුව (බල + නුව)
කරනුව (කර + නුව)
පුදනුව (පුද + නුව)

ii. කෘදන්තයට පිණිසාර්ථයේ නිපාත පද යෙදීම


පිණිස - දෙනු පිණිස
සඳහා - දීම සඳහා
වස් - යනු වස්
උදෙසා - කියවීම් උදෙසා
අරභයා - ජයග්‍රහණය අරභයා

iii. කෘදන්තයට පරව අට ප්‍රත්‍යය යෙදීම

කරනු + අට = කරන්නට
කිරීම් + අට = කිරීමට

බෙහෙත් ගනු පිණිස රෝගියා රෝහලට ගියේ ය.
බෙහෙත් දීම සඳහා වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කළේ ය.
උත්සවයට ප්‍රසිද්ධියක් ලබාගනු වස් සංවිධායකයෝ මාධ්‍යවේදීන්ට ආරාධනා කළහ.
උපාසිකාව තෙරුවන් නමදින්නට විහාරයට ගියා ය.

මෙතෙක් ඔබ ඉගෙන ගත් ක්‍රියා පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.



## ක්‍රියාකාරකම 7

* **පහත සඳහන් ගීතය ඇසුරෙන් දී ඇති ක්‍රියා පද වර්ගවලට උදාහරණ සපයන්න.**

බැස සීතල ගඟුලේ - පීන පීන නාමුකෝ නගෝ
හඳපානේ ...................
සීතල ජලය අගෙයි - ගත සිත පිනයි පිනයි
පොඩි පොඩි රැලි ද නගී - රාසි රාසි පෙළගැසී ගැසී
සමනොළ කන්ද පෙනේ - කදිමට හඳ එළියේ
හනිකට බසිමු නගෝ - නාමු නාමු ගිලෙමින ජලයේ
මානෙල් ඕලු නෙළුම් - පිපිලා යසයි යසයි
නෙළමින පීනමුකෝ - ප්‍රීති ප්‍රීති වෙමින බෝ ලෙසේ
ජලයේ ගිලී මෙසේ - පිරිසිදු වෙමුකො නගෝ
අලුයම වඳින ලෙසින - සාදු සාදු ඒ මුනි සිරිපා
හිඳිමුද මෙහිම නගෝ - පොඩි පැල්පතක් තනා
සැමදා වඳිනට හැක - සාදු සාදු ඒ මුනි සිරිපා

- ආනන්ද සමරකෝන් -

1. පූර්ව ක්‍රියා - .................................
2. ආඛ්‍යාත ක්‍රියා - .................................
3. මිශ්‍ර ක්‍රියා - .................................
4. අපර ක්‍රියා - .................................
5. නිරුත්සාහක ක්‍රියා - .................................
6. කෘදන්ත ක්‍රියා - .................................

## ක්‍රියාකාරකම 8

* **ඉහත දැක්වූ විවිධ අපර ක්‍රියා රූප අනුගමනය කරමින් පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට ගැළපෙන අපරක්‍රියා ලියමින් වාක්‍ය සම්පූර්ණ කරන්න.**

1. බාලිකාවෝ පිළිගැනීමේ ගීතය ගායනා ...................................... වේදිකාව මත පෙළ ගැසෙති.
2. පරිසරය ආරක්ෂා ...................................... පැළ සිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක වේ.
3. නළුනිළියෝ නාට්‍යයක් වේදිකාගත ...................................... පුහුණු වීම්වල නිරත වෙති.
4. බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය ...................................... බරණැස ඉසිපතනය කරා වැඩම කළ සේක.
5. උපාසක උපාසිකාවෝ පුර පසළොස්වක් පොහෝ දින උදැසනින් පෙහෙවස් ............ ........................... විහාරස්ථානය කරා පිය නගති.

6. වෛද්‍යවරයා රෝගීන් පරීක්ෂා ....................................... වාට්ටුව වෙතට පැමිණෙයි.

7. ගංවතුරෙන් අවතැන් වූ ජනතාවට සහන ....................................... දිසාපතිතුමා සහන මණ්ඩලයක් පත් කරයි.

8. අලුත් අවුරුද්දට ඇඳුම් පැලඳුම් මිලදී ....................................... ජනතාව නගර කරා ඇදෙති.

9. තරුණ සංවිධානය මාර්ග ආවරණයක් ....................................... මහජන ආධාර පතයි.

10. ක්‍රිකට් තරගය ....................................... ක්‍රීඩාලෝලීහු මහත් උනන්දුවෙන් ක්‍රීඩාගාරයේ අසුන් ගෙන සිටිති.

## සුභාෂිත

**අවන්ධ්‍යං දිවසං කුර්‍යාත් දානාධ්‍යයන කර්මසු**

ඉගෙනුම හා දන් දීම නොකිරීමෙන් දවස හිස් නොකළ යුතු ය.

## සුචින්තන

ජල බිඳුව විලකට පතිත වුවහොත් එහි කිසිදු විශේෂත්වයක් නොරැඳෙයි. එහෙත් එය නෙළුම් පතක් මතට පතිත වුවහොත් මුතුකැටයක් මෙන් දිදුලනු ඇත. ඔබේ ජීවිතය ද දීප්තිමත් වන්නට සුදුසු හොඳ ම තැන තෝරා ගන්න.

# 08

# කාරක

භාෂා භාවිතය අර්ථවත් වන්නේ එහි ව්‍යාකරණය නිසි ලෙස හඳුනාගෙන අවශ්‍ය පරිදි ගැළපීමෙන් ය. එහිදී ඒ ඒ ව්‍යාකරණාංගවලට තිබෙන වටිනාකම් නිසි ලෙස හඳුනා ගෙන තිබීම අතිශය වැදගත් ය.

භාෂාවේ සමහර ව්‍යාකරණාංග භාවිතයේ පැවතිය ද ඒවායෙහි නියමාකාර සැකැස්ම හා වටිනාකම් පිළිබඳ අවබෝධයක් නොමැතිකම භාෂාවේ ඉදිරි පැවැත්ම විෂයෙහි අයහපත් බලපෑම් ඇති කරයි. කාරක යනු එසේ විශේෂයෙන් හඳුනා ගෙන භාවිතයට ගත යුතු ව්‍යාකරණාංගයකි. මෙම පාඩමෙන් සිදු කෙරෙන්නේ කාරක පිළිබඳ විමසා බැලීම යි.

# දසුනක අසිරිය

ඓතිහාසික මහියංගණ මහා විහාරීය ශ්‍රී ධම්මතිලක මහ පිරිවෙණේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව මෙවර සංවිධානය කරනු ලැබුවේ කොත්මලේ මහ සෑරදුන් වන්දනා කිරීමට හා කොත්මලේ ජලාශය නැරඹීම සඳහා යාමට ය. සංවිධායක මණ්ඩලය විසින් තීරණය කරගත් පරිදි අදාළ දින අධ්‍යාපන චාරිකාව නිම කළේ ගුරු-ශිෂ්‍ය දෙපිරිස ම විනෝදය සපිරි ආධ්‍යාපනික අත්දැකීම් රාශියක් ළඟා කර ගනිමිනි.

චාරිකාවෙන් පසු දින සිංහල පාඩම සඳහා 5 ශ්‍රේණියට පැමිණි සිංහල විෂය භාර ආචාර්ය චන්ද්‍රරත්න මහතා, පෙර දින නිමා කළ චාරිකාවේ සටහන් ඇතුළත් පොත් තමා වෙත ලබා ගත්තේ චාරිකාවට පෙර සිසුනට කළ දැනුම් දීම පරිදි ය.

සෑම ශිෂ්‍යයෙකු ම චාරිකාව සම්බන්ධ ව තබා ඇති සටහන් විවිධාකාර ඒවා විය. ඒ සටහන් තබා තිබුණේ කුමන හෝ ලද අත්දැකීමක් ඇසුරෙනි. ඒ අතර කොත්මලේ මහ සෑරදුන් පිළිබඳ තැබූ සටහන් බුද්ධාලම්බන ප්‍රීතිය ඇති වීමට හේතු විය. තව සටහනක වූයේ කොත්මලේ ඇති ඓතිහාසිකත්වය පිළිබඳව යි. ඒ අතර දුටුගැමුණු රාජ නාමය සිහිපත් කර තිබුණේ වීර රසය මතුවන ලෙස ය. කඳුගැට සහිත අවට පිහිටි ස්වාභාවික සෞන්දර්යය ද තවත් සිසු පිරිසකගේ නෙත් සිත් වශී කර ගත් බවට සඳහන් කර තිබූ සටහන් ද විය. ජලාශවේල්ල ගැන ද තමන් ලද විස්මිත අත්දැකීමක් ලෙස එක් සටහනක සඳහන් ව තිබිණ. ජලාශය ගැන තිබූ සටහන් බොහෝ ය. ඒ අතර එහි වූ නිල් දියවර ගැන සඳහන් ව තිබුණේ චිත්තාකර්ෂණීය දර්ශනයක් සිතෙහි සිතුවම් කරන අයුරිනි. ජලාශයේ ඉහළ ප්‍රදේශයේ කෙළි දෙලෙන් විසූ හංස ජෝඩුව ගැන ද එක් ශිෂ්‍ය හිමි නමක් අපූරු සටහනක් තබන්නට අමතක නො කළේ ය. මේ ආකාර වූ සෑම සටහනක් ම වැදගත්කමක් ඉසුලුවේ ය. ඒ නිසා ම චන්ද්‍රරත්න ගුරු මහතා ඒ සියල්ල ප්‍රශංසාත්මක ඇගයීමකට ලක් කළේ ය.

කවදත් සිංහල ව්‍යාකරණ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන අම්පිටියේ සාරද ශිෂ්‍ය හිමියන්, කොත්මලේ ජලාශය නැරඹීමේදී දුටු සිදු වීමක් අලළා තැබූ සටහන චාරිකා සටහන් පොතක කිසිසේත් දක්නට නො ලැබෙන්නකි. චන්ද්‍රරත්න මහතා එය විමසිල්ලෙන් කියවන්නට වූයේ ඒ නිසා ය. එය මෙසේ වූ සටහනකි.

තොටියා ඔරුව පදියි.
තොටියා විසින් ඔරුව පදිනු ලැබේ.
තොටියා හබලෙන් ඔරුව පදියි.
මගියා තොටියාට ආහාර දෙයි.
මගියා තොටියාගෙන් වෙන් ව යයි.
තොටියා ජලාශයේ ඔරුව පදියි.

උක්ත සටහන තමා මෙදින මෙම පන්තියට සිදු කරන්නට සූදානමින් ආ සිංහල ව්‍යාකරණයට අදාළ **කාරක** පාඩමට අපූරු ලෙස ගැළපෙන ආධාරකයක් බව පැවසූ චන්ද්‍රරත්න ගුරු මහතා එම පාඩම මෙසේ අරඹන්නට විය.

- තොටියා ඔරුව පදියි.
- තොටියා විසින් ඔරුව පදිනු ලැබේ.
- තොටියා හබලෙන් ඔරුව පදියි.
- මගියා තොටියාට ආහාර දෙයි.
- මගියා තොටියාගෙන් වෙන් ව යයි.
- තොටියා ජලාශයේ ඔරුව පදියි.

මෙම වාක්‍යවල අවසානයේ ඇති ක්‍රියා මාලාව නිපදවීමට උපකාර වූයේ පිළිවෙළින් **ඔරුව, තොටියා විසින්, හබලෙන්, තොටියාට, තොටියාගෙන්, ජලාශයේ** යන නාම පද යි. ක්‍රියා නිපදවීමට උපකාරී වූ නිසා එම නාම පද **කාරක** කමින් හඳුන්වනවා.

**"කිරිය නිපැත්මට හේනෙන් මේ සකරුනම්"**

යනුවෙන් සිදත් සඟරාවේ දක්වා තිබෙන්නේ එය යි. **බාලාවතාරයේ**

**"කරොති කිරියං නිප්පාදෙතීති කාරකං**
**කිරියා නිප්පත්ති නිමිත්තන්ත්‍යත්ථො''**

යනුවෙනුත්, **සාරස්වතයේ**

**"ක්‍රියා සිද්ධ්‍යුපකාරකං කාරකං"**

යනුවෙනුත් දක්වෙන පාඨයන්ගේ අර්ථය සිදත් සඟරා පාඨයේ දක්වෙන අර්ථය ම යි.

ක්‍රියා නිපදවීමට උපකාර වන එම කාරක හය ෂට් කාරක ලෙස යි, හැඳින්වෙන්නෙ. පහත දක්වෙන්නේ එම කාරක හය යි.

| | | |
|---|---|---|
| කර්ම විභක්තිය | කර්ම කාරකය | කම් කරු |
| කර්තෘ විභක්තිය | කර්තෘ කාරකය | කතු කරු |
| කරණ විභක්තිය | කරණ කාරකය | කරණ කරු |
| සම්ප්‍රදාන විභක්තිය | සම්ප්‍රදාන කාරකය | සපදන් කරු |
| අවධි විභක්තිය | අවධි කාරකය | අවදි කරු |
| ආධාර විභක්තිය | ආධාර කාරකය | අදර කරු |

සිදත් සඟරාවේ එය සඳහන් වන්නේ මේ විදිහට යි.

**කම් කතු කරණ හා**
**සපදන් අවදි අදර ද**
**මෙවියූ විබත් සයටම**
**කරු නම් වියූ පඬුවෝ**

**කර්ම කර්තෘ කරණ සම්ප්‍රදාන අවධි ආධාර යන විභක්ති හයට පණ්ඩිතයෝ කාරක යැ යි කියූහ.**

මෙම කර්ම, කර්තෘ ආදි විභක්ති හය ක්‍රියා නිපදවීමට උපකාර වන නිසා ඒවා **කාරක විභක්ති** කියල හඳුන්වනවා. ඒ වගේ ම

**ආලපන - අලප්**

**සම්බන්ධ - සබඳ**

යන විභක්ති දෙක ක්‍රියා නිපදවීමට උපකාර නොවන නිසා ඒවා **ආකරක විභක්ති** කියල යි හඳුන්වන්නේ. ඊට හේතුව එම විභක්ති දෙකට ක්‍රියාවක් නිපදවීමේ හැකියාවක් නොමැතිකම යි.

ළමයාගේ පොත නැති විය

යන වැකියේ පොත සහ නැති විය යන ක්‍රියාව අතර සබඳතාවක් තිබුණත් **ළමයාගේ නැති විය** පද අතර අර්ථයක් නැත. ආලපන විභක්තිය හා ක්‍රියා ගැළපීමේදී ද සිදු වන්නේ මෙවැනි දෙයකි.


පොඩි හාමුදුරුවනේ, දන් අපි හොයලා බලමු, මේ කාරක ඇසුරින් ක්‍රියා නිපදවෙන්නේ කොහොමද කියලා.

## කර්ම කාරකය

කර්මය යනු ක්‍රියාවට යටත් වීම යි. කර්ම කාරකයේදී කර්මය ක්‍රියාව නිපදවීමට දායක වන්නේ ක්‍රියාවට යටත් වීම් වශයෙනි.

**තොටියා ඔරුව පදියි**

යන වාක්‍යයේ තොටියාගේ පැදීමට යටත් වන්නේ ඔරුව යි. මෙහි "ඔරුව" යනු කර්ම කාරක පදය යි. තොටියා යනු කර්තෘ කාරක පදය වේ. එහි තොටියා යන්න ප්‍රථමා විභක්තියට අයත් වන අතර ඔරුව කර්ම විභක්තියට අයත් වේ. පදියි යන ක්‍රියාව කිරීමට මෙම දෙදෙනා ම අවශ්‍ය වේ.




## කර්තෘ කාරකය

ක්‍රියාව කිරීම් වශයෙන් කර්තෘ, ක්‍රියා නිපදවීමට උපකාරි වෙනවා.

**තොටියා ඔරුව පදියි.**

යන වාක්‍යයේ කර්තෘ තොටියා ය. ඒ අනුව එය කර්තෘ කාරකය යි. ඔරුව කර්ම කාරක පදය වේ. තව ද තොටියා යන්න ප්‍රථමා විභක්තියට අයත් වන අතර ඔරුව යන්න කර්ම විභක්තියට අයත් වේ.

මෙම වාක්‍යය ම කර්ම කාරකයට හැරවීමේදී කාරකයන් මෙසේ පෙන්වා දිය හැකි ය.

**තොටියා විසින් ඔරුව පදිනු ලැබේ.**

මෙහි තොටියා විසින් යනු කර්තෘ කාරක පදය යි. ඔරුව යනු කර්ම කාරක පදය යි. විභක්ති පරීක්ෂා කිරීමේදී තොටියා විසින් යනු කර්තෘ විභක්තිය වන අතර ඔරුව යන්න ප්‍රථමා විභක්තියට අයත් වේ. සමස්ත වාක්‍යය කර්ම කාරක වේ.

තොටියා විසින්
පදිනු ලැබේ
ඔරුව

## කරණ කාරකය

කර්තෘගේ ක්‍රියාව කිරීමට උදව් කිරීමෙන්, සහාය වීමෙන් "කරණ කාරකය" ක්‍රියාව නිපදවීම හා බැඳී පවතිනවා.

**තොටියා හබලෙන් ඔරුව පදියි.**

යන වැකියේ තොටියාට ඔරුව පැදීම සඳහා උදව් වන්නේ, සහාය වන්නේ "හබලයි" මෙහි "හබලෙන්" යනු කරණ කාරකය යි. තොටියා යනු කර්තෘ කාරකය යි. ඔරුව යනු කර්ම කාරකය යි. සමස්ත වාක්‍යය ම කර්තෘ කාරක වන අතර මෙහි සඳහන් කාරක තුන ම පදියි යන ක්‍රියාව සමග බැඳී පවති යි.

තොටියා
හබලෙන්
පදියි
ඔරුව

## සම්ප්‍රදාන කාරකය

සම්ප්‍රදාන යනු මනා දීම යන්න යි. ඒ දීම ලබන්නා හඟවන නාම පද යොදන්නේ සම්ප්‍රදාන කාරකයෙනි. ක්‍රියාර්ථය ලැබීම් වශයෙන් සම්ප්‍රදානය ක්‍රියා නිපදවීමට උපකාරී වෙනවා.

**මගියා තොටියාට ආහාර දෙයි**

මෙහි තොටියාට යනු සම්ප්‍රදාන කාරක වෙයි. මගියා කර්තෘ කාරක පදය යි. අහාර කර්ම කාරක පදය යි. දෙයි යන ක්‍රියාව නිෂ්පාදනයට මෙම කාරක තුන ම අත්‍යවශ්‍ය ය.

මගියා
තොටියාට
දෙයි
ආහාර

## අවධි කාරකය

අවධි විභක්ත්‍යර්ථය වන්නේ වෙන්වීමේ සීමාව හැඟවීම යි. ක්‍රියාර්ථයේ පූර්ව සීමාව හැඟවීම් වශයෙන් අවධි කාරකය ක්‍රියා නිපදවීමට උපකාරි වෙනවා. එම පද යොදන්නේ අවධි කාරකයෙනි.

**මගියා තොටියාගෙන් වෙන් ව යයි.**

යන වැකියේ මගියා තොටියාගේ සීමාවෙන් වෙන්වීමක් අර්ථවත් කෙරේ. තොටියාගෙන් යනු මෙහි අවධි කාරක පදය යි. මගියා කර්තෘ කාරක පදය යි.

මගියා
තොටියාගෙන් — වෙන්ව යයි

## ආධාර කාරකය

ආධාර යනු දැරීම යි. ක්‍රියා නිපදවීමට දැරීම් වශයෙන් "ආධාර කාරකය" ක්‍රියා නිපදවීමට උපකාර වෙනවා.

**තොටියා ජලාශයේ ඔරුව පදියි**

යන වැකියට අනුව ජලාශයේ යනු ආධාර කාරක පදය යි. තොටියා යනු කර්තෘ කාරක පදය යි. ඔරුව කර්ම කාරක වේ. සමස්ත වාක්‍යය කර්තෘ කාරක වේ. පදියි යන ක්‍රියාව සිදුවීමට ඉහත කාරක තුන ම අනිවාර්ය වේ.

තොටියා
ජලාශයේ — පදියි
ඔරුව

කාරක, ඇසුරු කරගෙන ක්‍රියාව නිපදවෙන්නෙ කොහොමද කියල පොඩි හාමුදුරුවන්ට දැන් පැහැදිලියි නේද? ඒ වගේ ම පොඩි හාමුදුරුවනේ වාක්‍යයක ක්‍රියාවත් ඉහත සඳහන් කළ කාරකත් අතර මනා සම්බන්ධතාවක් තිබිය යුතු යි. "ක්‍රියා කාරක පද සම්බන්ධතාව" යනු එය යි.

ක්‍රියාව හා කාරක අතර සම්බන්ධයෙන් තොරව අර්ථවත් වාක්‍යයක් කිසි විටෙකත් සම්පාදනය නොවේ. මෙහි දී අවසාන ක්‍රියාව සමග පමණක් නොව පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා අසම්භාව්‍ය ක්‍රියා ආදිය සමග ද කාරක අතර සම්බන්ධය තිබිය හැකි ය. සිදත් සඟරාවේ

ක්‍රියාකාරක පද සම්බන්ධයට සපයා ඇති නිදසුන මේ සඳහා හොඳට ම ප්‍රමාණවත් ය.

**මුළු දෙට පා පිඬු කනා ඉකිළියේ සඳුන් කටින් පිස සඟනට දී බවෙන් මිදිණි.**
**(මුළුතැන්ගෙයි ජ්‍යොෂ්ඨයා කිරිබත් රන් භාජනයෙහි සඳුන් දරවලින් පිස සංඝයාට දී භවයෙන් මිදුණේ ය.)**

කර්තෘ කාරකය - මුළුදෙට


කර්ම කාරකය - පා පිඬු

ආධාර කාරකය - කනා ඉකිළියේ

කරණ කාරකය - සඳුන් කටින්

සම්ප්‍රදාන කාරකය - සඟනට

අවධි කාරකය - බවෙන්



පිස

දී

මිදිණි

මෙම කාරක හය නැවතත් කොටස් **දෙකකට** බෙදිය හැකි ය. එනම්

ප්‍රධාන හා අප්‍රධාන කාරක වශයෙනි.

ප්‍රධාන කාරකය - කර්තෘ කාරකය

අප්‍රධාන කාරක - කර්ම, කරණ, සම්ප්‍රදාන, අවධි, ආධාර යනුවෙනි.

ඔන්න ඔය විදිහට තමයි පොඩි හාමුදුරුවනේ ''කාරක'' පිළිබඳව අප අවබෝධය ලබා ගන්න ඕනි. අපේ සාරද පොඩි හාමුදුරුවන්ගේ චාරිකා සටහන අද අපේ පාඩම කරන්න ලොකු උදව්වක් උණා. ඒ වගේ අනිත් පොඩි හාමුදුරුවරුත් නිර්මාණාත්මකව හිතලා අලුත් - අලුත් වැඩ කරන්න හිතට ගන්න. අද අපේ පාඩම මෙයින් නිමා කරනවා.

සැම දෙනාට ම තෙරුවන් සරණ යි!

## ක්‍රියාකාරකම 1

**සුදුසු කාරක පද, දී ඇති පද අතරින් තෝරා මෙම වැකිවල හිස්තැන් පුරවන්න. කාරකය ද නම් කරන්න.**

1. චරපුරුෂයා ................................................ ඇතුළු නුවරට පිවිසියේ ය.

2. බුදුහු ආනන්ද තෙරුන් සමග ................................................ චාරිකා කළහ.

3. මිහිඳු හිමියන් විසින් ලංකාවට ................................................ ගෙනෙන ලදි.

4. ධර්මය දකින්නා ............................................ ආලෝකයට යයි.

5. ............................................ සිංහල බෞද්ධයෝ අවදි කරන ලදහ.

6. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ ............................................ සහාය පළ කළහ.

7. ගැල් නායකයා ............................................ කතර තරණය කරයි.

8. මල්ලිකා දේවිය ............................................ දහම් ඔවදන් දුන්නා ය.

9. ............................................ කවිජිත දිනවන ලදි.

10. කාලගෝල සත් වසරක් ............................................ කළේය.

(අඳුරෙන්, කොසොල් රජුට, ප්‍රමුදිත විසින්, බුදුදහම, කුරුබිලියෙන්, මෙහෙකම්, තරු සලකුණෙන්, නාලන්දාවේ, සභාපතිතුමාට, අනගාරික ධර්මපාලතුමා විසින්)

## ක්‍රියාකාරකම 2

**පහත සඳහන් උපමා කතාවේ ඇතුළත් කාරක පද තෝරා ඒවා නම් කරන්න.**

**තමාට ම කැපුණු වළ**

එක් මහලු සිංහයෙක් ගිලන් ව ගුහාවක ලැග සිටියේ ය. එසේ සිටින ඔහු බැලීමට නරියා පමණක් හැර අන් හැම සතෙක් ම පැමිණියේ ය. සිංහයාට ඇසෙන පරිදි නරියා ගැන ගතු කීමට වෘකයා මෙය හොඳ ප්‍රස්තාවක් කර ගති. "තමන්ගේ නායකයා වූ රජ්ජුරුවන්ට නරියා තුළ කිසි ගෞරවයක් නැති නිසයි ඌ එතුමා බැලීමටවත් නො ආවේ"යි වෘකයා කීය. ඒ අතර පැමිණි නරියාට මේ කථාවේ අග කොටස ඇසිණි. සිංහයා තර්ජනාත්මක ලෙසින් නරියාට ගෙරෙව්වේ ය. නරියා ද තම නිදහසට කරුණු කියන්නට අවසර අයැ ද සිටියේ ය. "මෙහි රැස් ව සිටින සතුන්ගෙන් කොයි සතා ද ඔබතුමාට මා තරම් පිහිටක් රැගෙනවිත් සිටින්නේ? ඔබ තුමාගේ රෝගයට බෙහෙත් සොයා සෑම තැන ම ඇවිද්දෙමි. අන්තිමේදී පිළියමක් සොයා ගතිමි"යි හේ පැවසී ය. "හනික ම බෙහෙත කියව"යි සිංහයා අණ කළේ ය. "වෘකයෙකු පණ පිටින් හම ගසා රස්නය තිබියදී ම ඒ හම පොරවා ගත යුතු ය"යි නරියා කීවේ ය. ගත වූයේ මොහොතකි. වෘකයා තවත් ජීවත් නොවී ය.

නුවණට හුරු දෙය නම් තම නායකයාගේ කේන්තිය ඇවිස්සීම නොව ඔහුගේ හොඳ හිත දිනා ගැනීමෙන් ප්‍රයෝජන ලැබීම යැයි නරියා සිනාසෙමින් පැවසී ය.

- ඊසෝප් උපමා කතා -

## ක්‍රියාකාරකම 4

- පුවත්පත් වාර්තා ඇසුරෙන් ක්‍රියා කාරක පද සම්බන්ධතාව සහිත වාක්‍ය 20ක් ලියා ඒවායෙහි කාරක හා ක්‍රියා සම්බන්ධ වී ඇති අයුරු දක්වන්න.

### සුභාෂිත

විද්‍යාතුරානං න සුඛං න නිද්‍රා

ඉගෙනීමට නැඹුරු වූ තැනැත්තා සැප හා නින්ද නැත.

### සුචින්තන

ඔබ කෙරෙහි විශ්වාසය ඇති කරගන්න.
එහෙත් ඔබට කළ හැක්කේ කුමක් ද යි ලෝකයට නොකියන්න.
එය ක්‍රියාවෙන් පෙන්නුම් කරන්න.

# 09

# වාක්‍ය නිර්මාණය

භාෂාව නිරතුරුව ම ව්‍යාකරණය සමග බැඳී පවතී. භාෂණයේදී ද අදහස් ප්‍රකාශ කිරීම යම් සම්මත ක්‍රමවේදයකට අනුව සිදු වේ. එය භාෂණ ව්‍යාකරණය යි. ලිඛිත ව අදහස් ප්‍රකාශ කිරීමේදී ඊට වඩා වෙනස් රීති සමුදායක් භාවිතයේ පවතී. භාෂණ ව්‍යාකරණය ඒ ඒ භාෂා පරිසරයට අනුව නිරායාසයෙන් ලද හැක්කකි. එහෙත් ලේඛන ව්‍යාකරණය සම්මත රීති සමුදායක් මගින් මෙහෙය වේ. ඒවා අධ්‍යයනයෙන් ම උගත යුතු ය. ලිඛිත වාක්‍යයක් යනු නිරවුල් ව අදහස් සන්නිවේදනය වන පරිදි ක්‍රමවත් ව සම්මත රීතීන් අනුව සකස් වූ වාග් මාලාවකි. එබැවින් මෙම පාඩමේ අරමුණ සම්මත වාක්‍ය රීති පිළිබඳ අවබෝධයක් ලබා දීම යි.

# වාක්‍ය නිර්මාණය

ලිඛිත ව්‍යවහාරය සඳහා නිවැරැදි වාක්‍ය භාවිත කෙරෙයි. අර්ථවත් වචන රාශියක් එක්කර වාක්‍ය තනා ගැනෙයි. කිසියම් අදහසක් ප්‍රබල ව හා සිත්ගන්නා අයුරින් ඉදිරිපත් කිරීමට වාක්‍ය අවශ්‍ය වෙයි. වාක්‍යාංග, වාක්‍ය වර්ග, උක්තාඛ්‍යාත රීති පිළිබඳ ව මෙම පාඩම මගින් සාකච්ඡා කෙරේ.

## වාක්‍ය විග්‍රහය

"මම පොත බලමි." මේ සරල වාක්‍යයකි. මෙම වාක්‍යයේ අංග තුනක් තිබේ. එනම්

| උක්තය | කර්මය | ආඛ්‍යාතය |
|---|---|---|
| ↓ | ↓ | ↓ |
| මම | පොත | බලමි |

වාක්‍යයක අන්තර්ගත විය හැකි අව ම අංග කීපයක් ඉහත වාක්‍යයේ පෙන්නුම් කෙරෙයි. වාක්‍යයක අන්තර්ගත විය හැකි උපරිම වාක්‍ය අංග ගණන අටකි. එනම්

1. උක්ත විශේෂණය
2. උක්තය
3. කර්ම විශේෂණය
4. කර්මය
5. ක්‍රියා විශේෂණය
6. ආඛ්‍යාත පූර්ණ විශේෂණය
7. ආඛ්‍යාත පූර්ණය
8. ක්‍රියාව/ ආඛ්‍යාතය යනුවෙනි.


නිදසුන් වාක්‍යය :

දක්ෂ ගුරුවරයා දුබල සිසුවා සුළු කලකදී ඉතා අගනා උගතෙකු කරයි

1. උක්ත විශේෂණය ⟵ දක්ෂ
2. උක්තය ⟵ ගුරුවරයා
3. කර්ම විශේෂණය ⟵ දුබල
4. කර්මය ⟵ සිසුවා
5. ක්‍රියා විශේෂණය ⟵ සුළු කලකදී
6. ආඛ්‍යාත පූර්ණ විශේෂණය ⟵ ඉතා අගනා
7. ආඛ්‍යාත පූර්ණය ⟵ උගතෙකු
8. ආඛ්‍යාතය ⟵ කරයි

## සාමාන්‍ය වාක්‍ය රීතිය

කර්තෘ කිනම් පුරුෂ, කිනම් වචන, කිනම් ලිංගයට අයත් ද ආඛ්‍යාතය එම පුරුෂ එම වචන එම ලිංගයෙන් ම තැබිය යුතු ය. කර්තෘ උක්ත වේ. ඔබ මෙතෙක් ඉගෙනගත් පුරුෂ, වචන ලිංග භේදයට මෙන් ම ඒ ඒ උක්ත පදයට අනුව√කර ධාතුව කාලත්‍රයෙහි වරනගන ආකාරය පිළිබඳ සාරාංශයක් පහත රූප සටහනේ දැක්වේ.



## ක්‍රියාකාරකම 1

- සාමාන්‍ය වාක්‍ය රීතිය ඇසුරෙන් පහත දක්වෙන වාක්‍ය සුදුසු උක්තාඛ්‍යාත පද යොදා සම්පූර්ණ කරන්න.

1. ...................................... ඔවුන් කැඳවමු.
2. නුඹ නිතිපතා පන්සිල් ......................................
3. සුළි සුළඟින් ගෙවල් ......................................
4. කිරිල්ලියෝ පැටවුන් සොයා ගුවනේ ඔබමොබ ......................................
5. ...................................... සිසුන් සිප් සයුරෙන් එතෙර කරති.
6. ...................................... දූය ගොඩනගනු.
7. ඔහුගේ දේශනය ...................................... අගය කරන්නාහ.
8. ...................................... නිවැරැදි ව ශිල්ප හදාරම්හ.
9. ...................................... තුරුලතා වනසති
10. දිනකර අවරඹරට ......................................

## විශේෂ වාක්‍ය රීති

සාමාන්‍ය වාක්‍ය රීතියෙන් බැහැර ව කර්තෘ සහ ක්‍රියාව ගැළපෙන අවස්ථා ඇත. එනම් කර්තෘ ඒක වචන වී ක්‍රියාව බහුවචන වේ. කර්තෘ බහුවචන වී ක්‍රියාව ඒක වචන වේ. තවත් විටක උත්තම පුරුෂ හෝ මධ්‍යම පුරුෂ කර්තෘට තබන ක්‍රියාව ප්‍රථම පුරුෂ වේ. එලෙස තබන්නේ ද සම්මත රීතීන්ට අනුව ය. ඒවා විශේෂ වාක්‍ය රීති නම් වේ.

### 1. අප්‍රාණවාචී උක්තය

i. අප්‍රාණවාචී බහු වචන පදයක් උක්ත වූ විට ක්‍රියාව ඒක වචන වේ.
උදා :- ගංගා ගලා බසියි.

ii. අප්‍රාණවාචී පද කීපයක් සම්බන්ධ වී කර්තෘ ලෙස තබන විට ආඛ්‍යාතය ඒක වචන වේ.
උදා :- ගංවතුරින් ගස්වැල් ගෙවල් දොරවල් විනාශ විය.

iii. අප්‍රාණවාචී පදයක් සමග ප්‍රාණවාචී පදයක් සම්බන්ධ වී කර්තෘ ලෙස තබන විට ආඛ්‍යාතය බහු වචන වේ.
උදා :- ගවයා ද කරත්තය ද පාරේ යති.

iv. අප්‍රාණවාචී පදයක් “ඕ” “හු” ප්‍රත්‍යාන්තව යෙදී කර්තෘ වශයෙන් සිටින විට ආඛ්‍යාතය බහු වචන වේ.
උදා :- ගංගාවෝ ගලා බසිති (ගංගා + ඕ)
ගස්හු සුළඟට සෙලවෙති (ගස් + හු)

## 2. සමූහාර්ථවාචි උක්තය

සමූහාර්ථවාචි පද :- සමූහයක් එක ම ඒකකයක් සේ සලකා හැඳින්වීමට යොදන පද සමූහාර්ථවාචි පද යි.

රළ, පෙළ, මුළ, කැල, නඩ, පන්ති, හමුදා, කට්ටි, කණ්ඩායම්, රංචු, කැන්, මුළු, රැස, ගණ

i. සමූහාර්ථවාචි පදයක් ප්‍රාණවාචී පදයක් හා සම්බන්ධ වී කර්තෘ ලෙස සිටින විට ආඛ්‍යාතය බහු වචන වේ.

උදා :- මුව රළ වනයේ ඔබ මොබ දුව පනිති
වන්දනා නඩය ඓතිහාසික තැන් නරඹති
සඟ ගණ අරමෙහි වසති
දන කැන් වෙහෙර නමදිති

ii. සමූහාර්ථවාචී පදයක් අප්‍රාණවාචී පදයක් සමග සම්බන්ධ වූ විට ආඛ්‍යාතය ඒක වචන වේ.

උදා :- තුරු පෙළ සුළඟට සෙලවේ.
මල් කැන් සුවඳ පතුරයි.

## 3. නිත්‍ය බහු වචන උක්තය

### නිත්‍ය බහු වචන පද

කෙනෙක්, අයෙක්, ඇතැමෙක්, ඇතැම්හු, කවරෙක්, කවුරු, සමහරු, සමහරෙක්, කිසිවෙක්, අය

i. මෙම නිත්‍ය බහු වචන පදයක් වාක්‍යයක කර්තෘ ලෙස යෙදෙන විට ආඛ්‍යාතය බහු වචන වේ.

උදා :- කෙනෙක් ඊට පක්ෂ වූහ.
ඇතැමෙක් එයින් සතුටු වූහ.

ii. නිත්‍ය බහු වචන පදයක් වුවත් පැහැදිලි ඒක වචන පදයක් ලෙස ඇඟෙන පරිදි කර්තෘ ලෙස යෙදී ඇත්නම් ආඛ්‍යාතය ඒක වචන වේ.

උදා :- එක් කෙනෙක් ඊට සහභාගි විය.
දෙදෙනාගෙන් කෙනෙක් එයින් සතුටු විය.
වික්‍රමසිංහ නමැති අයෙක් ගම හැර ගියේ ය.

## 4. ගෞරවාර්ථ උක්තය

✶ ගෞරවාර්ථ ප්‍රත්‍ය

| | | |
|---|---|---|
| ආණ, අණු | - පුරුෂ ලිංග | |
| අණි | - ස්ත්‍රී ලිංග | |
| ණ්ඩ | - පුරුෂ/ ස්ත්‍රී ලිංග | |
| ණ්ඩි | - පුරුෂ/ ස්ත්‍රී ලිංග | |
| ඕ | - පුරුෂ/ ස්ත්‍රී ලිංග | නිත්‍ය බහු වචන ගෞරවාර්ථ ප්‍රත්‍ය |
| හු | - පුරුෂ/ ස්ත්‍රී ලිංග | නිත්‍ය බහු වචන ගෞරවාර්ථ ප්‍රත්‍ය |

ඉහත සඳහන් ගෞරවාර්ථ ප්‍රත්‍යයක් නාම පදයක් සමග එක් වූ විට ගෞරවාර්ථ නාම පදයක් සෑදේ.

උදා :- පිය + ආණ = පියාණ
දූ + අණි = දියණි / දූවණි
පුත් + අණු = පුතණු
අම්ම + ණ්ඩි = අම්මණ්ඩි - අමඬි
මල + ණ්ඩ = මලණ්ඩ - මලඬ

මෙවැනි ගෞරවාර්ථ නාම පදයක් උක්තය ලෙස යෙදෙන සෑම තැනක ම එය "ඕ" "හු" ප්‍රත්‍යාන්ත ව බහු වචන රූපයෙන් ම තැබිය යුතු ය.

උදා :- පිය + ආණ + ඕ = පියාණෝ
පුත් + අණු + ඕ = පුතණුවෝ
සිටු + ආණ + හු = සිටාණහු

උදා :- පියාණෝ දියණියන් රකිති.
මෑණියෝ පුතණුවන් කැඳවති.
වෙළෙඳාණහු භාණ්ඩ රැගෙන යති.

★ **ගෞරවාර්ථ පද**

එවැනි පද තුනකි.
**පා**
**දෑ**
**වහන්සේ**

i. මෙවැනි පද උක්ත වූ විට ආඛ්‍යාතය බහු වචන වේ.

උදා :- රජ පා යුදට නික්මෙති.
මෑණියන් දෑ මළුව අමදිති.
තෙරුවන් වහන්සේ දනට වඩිති.

ii. දෑ යන්න උක්ත වූ විට දැය යනුවෙන් ද වහන්සේ යන්න උක්ත වූ විට සේක යනුවෙන් ආඛ්‍යාතය තැබීම සාම්ප්‍රදායික ක්‍රමය වේ.

උදා :- මෑණියන් දෑ මළුව අමදින දෑ ය.
තෙරුන් වහන්සේ දනට වඩින සේක.

iii. අතීත කාලික ස්ත්‍රී ලිංගික ඒක වචන නාම පදයක් සමග දේවි, මෙහෙසි, බිසව්, කුමරි වැනි සම්මත ගෞරවාර්ථ පදයක් යෙදුණු වැකිවල ආඛ්‍යාතය බහු වචනයෙන් තැබීම සාම්ප්‍රදායික ලේඛනයේ දක්නට ඇත.

උදා :- යසෝධරා දේවි සිදුහත් කුමරුගේ අබිනික්මණින් තැවුණෝ.
මායා දේවි තුසී පුරේ වුසූ.

## 5. අනියතාර්ථ උක්තය

★ අනියතාර්ථ ප්‍රත්‍ය

| | | | |
|---|---|---|---|
| පුරුෂ ලිංග උක්ත → | එක් | අක් | ← ස්ත්‍රී ලිංග උක්ත<br>← අප්‍රාණවාචී උක්ත/ අනුක්ත |
| පුරුෂ ලිංග අනුක්ත → | අකු/ එකු | අක | ← ස්ත්‍රී ලිංග අනුක්ත |

ඉහත අනියතාර්ථ ප්‍රත්‍යයක්, නාමයක් සමග සම්බන්ධ වූ විට අනියතාර්ථ නාම පදයක් සෑදේ.

උදා :- මිනිස් + එක් = මිනිසෙක්
කාන්තා + අක් = කාන්තාවක්
ගස් + අක් = ගසක්

මෙවැනි අනියතාර්ථ උක්ත පද, වාක්‍යයක උක්ත කර්තෘ ලෙස තැබිය යුතු ය. සෙසු තැන්වල අනියතාර්ථ පද යෙදේ නම් ඒවා අනුක්ත රූප ගනී.

මිනිස් + අකු = මිනිසකු
මිනිස් + එකු = මිනිසෙකු
කාන්තා + අක = කාන්තාවක
ගස් + අක් = ගසක්

උදා :- මිනිසෙක් ගවයෙකු දක්කයි.
කාන්තාවක් දරුවකු නළවයි.
හොරෙක් ගෙයක් බිඳියි.
ගසක් සුළඟින් සෙලවෙයි.

## 6. අසම්භාව්‍ය ක්‍රියා යෝගය

කාලාර්ථයේ හෝ අනියතාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක් සහිත වාක්‍යයක කොටස් දෙකකි.

★ අසම්භාව්‍ය ක්‍රියාව හා සම්බන්ධ වාක්‍ය කොටස (අන්තර් වාක්‍ය)
★ අවසාන ක්‍රියාව හා සම්බන්ධ ප්‍රධාන වාක්‍ය කොටස

උදා :- ගුරුවරුන් උගන්වද්දී ශිෂ්‍යයෝ අසා සිටියහ.

අන්තර් වාක්‍ය ප්‍රධාන වාක්‍ය කොටස

සොරුන් පැමිණියහොත් ගම්මු බිය වෙති.

මෙවැනි වාක්‍යවල අසම්භාව්‍ය ක්‍රියාව සම්බන්ධ කර්තෘ (අන්තර් වාක්‍යයේ) අනුක්ත වේ. ප්‍රධාන වාක්‍ය කොටස සාමාන්‍ය වාක්‍ය රීතිය අනුව තැබෙයි.

## 7. ද්විත්ව උක්ත රීතිය

එක ම වාක්‍යයක උක්ත කර්තෘ පිළිබඳ ව කීප වතාවක් කියවේ නම් ඒ සෑම අවස්ථාවක් ම උක්ත රූපයෙන් තැබිය යුතු ය.

උදා :- මම දක්ෂයෙක් වෙමි.
ඔවුහු සියල්ලෝ උපාසකයෝ නොවෙති.

## 8. යුතු, යුතු ය, මැනවි, යෙහෙකි නිපාත යෝගය

**i.** යුතු, යුතු ය, මැනවි, යෙහෙකි යන පදයකින් අවසන් වන වාක්‍යවල කර්තෘ අනුක්ත වේ.

උදා :- මා එහි යා යුතු ය.
ඔවුන් එය පැවසිය යුතු
අප නිවැරැදි ව වැඩ කිරීම මැනවි
ඔවුන් සියල්ලන් නිහඬ වීම යෙහෙකි.

**ii.** යුතු යන්න පුරුෂත්‍රයේ වරනගා තබයි නම් එහිදී කර්තෘ උක්ත රූපයෙන් තැබිය යුතු ය.

උදා :- මම එහි යා යුත්තෙමි.
අපි පොත් කියවිය යුත්තෙමු.
තෝ එය උගත යුත්තෙහි.
තොපි නිහඬ විය යුත්තෙහු.
පියා යුතුකම් ඉටු කළ යුත්තේ ය.
සියල්ලෝ ධාර්මික විය යුත්තෝ ය.

## 9. සංශයාර්ථ කථන රීතිය

සැකය ප්‍රකාශ වන අර්ථයේ වාක්‍ය මේ රීතියෙන් තැබිය යුතු ය. මෙවැනි වාක්‍යවල කොටස් දෙකකි. ඒ කොටස් "යි" නිපාතයෙන් සම්බන්ධ වේ.

උදා :- මා එය කළහ යි ඔවුහු සිතූහ

| මා එය කළහ | ඔවුහු සිතූහ |
|---|---|
| සැකය ප්‍රකාශවන අන්තර් වාක්‍ය | ප්‍රධාන වාක්‍ය කොටස |

මෙහි අන්තර් වාක්‍යයේ

★ කර්තෘ අනුක්ත විය යුතු ය.
★ කර්තෘගේ වචන භේදයක්, පුරුෂ භේදයක් නොසලකා හැම විට ම එහි ක්‍රියාව ප්‍රථම පුරුෂ බහු වචනයෙන් ම තැබිය යුතු ය.
★ ප්‍රධාන වාක්‍ය කොටස සාමාන්‍ය වාක්‍ය රීති අනුව තැබිය යුතු ය.

උදා :-
- මා විභාගයෙන් සමත් වෙති යි ගුරුවරු සිතූහ.
- තා එහි ගියහ යි මම සිතුවෙමි.
- ඔහු පැමිණෙති යි ගුරුවරයා සිතීය.

## 10. ප්‍රශ්නාර්ථවත් වාක්‍ය

i. ප්‍රශ්නාර්ථයේ ද නිපාතයෙන් අවසන් වන වාක්‍යවල කර්තෘ උක්ත විය යුතු ය.

උදා :- මම දක්ෂයෙක් ද?
හෙතෙම ගායකයෙක් ද?
ඕ උපාසිකාවක් ද?

ii. ඇයි, කෙසේ ද, කවදා ද, කොහේ ද, කවර හෙයින් ද, මොනාව ද, කුමක් ද ආදි ප්‍රශ්නවාචි යෙදුම්වලින් අවසන් වන වාක්‍යවල කර්තෘ අනුක්ත වේ.

උදා :- මිනිසුන් කෑ ගසන්නේ ඇයි?
ඔවුන් එසේ කරන්නේ කවර හෙයින් ද?
මා උගතකු වන්නේ කවදා ද?

## 11. අවිනිශ්චිතාර්ථයේ වි නිපාත යෝගය

අවිනිශ්චිතාර්ථයේ වි නිපාතයෙන් වාක්‍යයක් අවසන් වන විට කර්තෘ අනුක්ත වේ.

උදා :- ඔවුන් හෙට පැමිණේවි.
රටවැසියන් එයින් සතුටු වේවි.

## 12. ශ්‍රැති සූචනාර්ථයේ නිපාත යෝගය

ශ්‍රැති සූචනාර්ථයේ ල, ලු නිපාතවලින් වාක්‍යයක් අවසන් වීමේදී කර්තෘ උක්ත ව තැබිය යුතු ය.

උදා :- ඔවුහු දක්ෂයෝ ලු.
වැසියෝ එයින් කිපෙත් ල

## 13. උපමාවාචි නිපාත යෝගය

උපමාවාචි නිපාත :- මෙන්, සේ, වැනි, වගේ, බඳු, අයුරු, විලස, ආකාර, ලෙස ආදිය

මෙම නිපාත හා බැඳෙන්නේ අනුක්ත නාම පදයකි.

උදා :- දෙවියන් වැනි මිනිස්සු එහි වෙති.
සමන් දරුවකු ලෙස කටයුතු කළේ ය.
ගුරුවරුන් ලෙස ඔවුහු යුතුකම් ඉටු කරති.
කෝකිලයෙකු බඳු ගායකයෙක් ප්‍රසංගයට පැමිණෙයි.

## 14. හෙවත්, නොහොත්, හෝ නිපාත යෝගය

i. හෙවත් යන සමානාර්ථ නිපාතයෙන් සම්බන්ධ වන පද එක ම අයකු හෝ එකම දෙයක් ගැන විය යුතු ය. ඒවා උක්ත රූපයෙන් තැබිය යුතු ය.

උදා :- දෝන ඉසබෙලා හෙවත් ගජමන් නෝනා දක්ෂ කිවිඳියක් වූවා ය.
කොග්ගල ප්‍රාඥයා හෙවත් මාර්ටින් වික්‍රමසිංහ කෘතහස්ත ගත්කරුවෙකි.

ii. නොහොත්, හෝ නිපාත යෙදෙන්නේ විකල්පාර්ථයෙහි ය. ඒ හා බැඳෙන සියලු පද උක්ත වේ. ක්‍රියාවට ආසන්න පදයට අයත් පුරුෂයට ගැළපෙන පරිදි ආඛ්‍යාතය තැබේ.

උදා :- පියා නොහොත් මව ඊට සහභාගි වූවා ය.
මම නොහොත් නුඹ එහි යන්නෙහි.
නායකයා හෝ නායිකාව තරගය මෙහෙය වූවා ය.

## 15. ප්‍රාර්ථනාර්ථයේ "වා" නිපාත යෝගය

ප්‍රාර්ථනාර්ථයෙහි "වා" නිපාතයෙන් වාක්‍යයක් අවසන් වීමේදී කර්තෘ උක්ත වන අතර ක්‍රියාව කර්තෘ පදයට අනුව වරනැඟී තිබිය යුතු ය.

උදා :- මම නිදුක් වෙම්වා
අපි නිදුක් වෙමුවා
නුඹ නිදුක් වෙහිවා
නුඹලා නිදුක් වෙහුවා
ගුරුතුමා නිදුක් වේවා
සියල්ලෝ නිදුක් වෙත්වා

## 16. සමුච්චයාර්ථයේ නිපාත යෝගය

සමුච්චයාර්ථවත් ද, ත්, යි, හා, සහ යන නිපාතවලින් බැඳුණු නාම පද කර්තෘ ලෙස තබන විට ඒවා ප්‍රථම, මධ්‍යම, උත්තම පුරුෂ පිළිවෙළට ගැළපී තිබිය යුතු ය. ක්‍රියාවට ආසන්න පුරුෂයේ බහු වචනයෙන් ආඛ්‍යාතය තැබේ.

උදා :- අයියා ද නුඹ ද මම ද එහි ගියෙමු.
අයියාත් නුඹත් එහි ගියෙහු.
නුඹයි මමයි එහි ගියෙමු.
අයියා සහ මම එහි ගියෙමු.

## 17. සහ අර්ථයේ නිපාත යෝගය

සහ අර්ථවත් හා, සහ, සමග, කැටුව, ඉහි යන නිපාත සමග යෙදෙන නාම අනුක්ත රූපයෙන් තැබේ.

උදා :- මවුවරු <u>දරුවන් සමග</u> පන්සල් යති.
මම <u>ඔවුන් හා</u> සම්බන්ධ නොවෙමි.
ගොපල්ලා <u>ගවයන් කැටුව</u> වනයට යයි.
"සැරදේ සියනිහි (සියන් + ඉහි) සැලළිහිණි සඳ"

## 18. පිණිසාර්ථයේ නිපාත යෝගය

පිණිස, උදෙසා, නිසා, සඳහා, අරභයා, වෙනුවෙන් ආදි නිපාත පද හා බැඳෙන කර්තෘ අනුක්ත වේ.

උදා :- තෙරුවන් උදෙසා අපි පූජා පවත්වමු.
ළමයින් නිසා දෙමවුපියෝ වෙහෙසෙති.
ගුරුවරුන් අරභයා උපහාර පුද කරමු.

## 19. ආඛ්‍යාත ආධ්‍යාහාරය

ආඛ්‍යාත ආධ්‍යාහාරය නම් වාක්‍ය රීතියේදී ආඛ්‍යාතයක් යෙදෙන්නේ නැත. එය තිබේ යැයි සලකා කර්තෘ උක්ත ව තබයි.

උදා :- මම දක්ෂයෙක්. (වෙමි)
එහි සියල්ලෝ දක්ෂයෝ. (වෙති)

## 20. ප්‍රයෝජ්‍ය ක්‍රියා යෝගය

ප්‍රයෝජ්‍ය ක්‍රියා සහිත වාක්‍යයක කර්තෘ පද දෙකක් වෙයි. එනම්,

1. ප්‍රයෝජ්‍ය කර්තෘ - කරවන්නා
2. ප්‍රයෝජක කර්තෘ - කරන්නා

උදා :- ගුරුතුමා ළමයින් ලවා අකුරු ලියවයි.

ගුරුතුමා ↓ ප්‍රයෝජ්‍ය කර්තෘ
ළමයින් ↓ ප්‍රයෝජක කර්තෘ

මෙවැනි වාක්‍යවල ප්‍රයොජ්‍ය කර්තෘ උක්ත වන අතර ආඛ්‍යාතය ඊට ගැළපෙන පරිදි තැබිය යුතු ය. ප්‍රයෝජක කර්තෘ අනුක්ත වේ.

උදා :- මම සේවකයන් ලවා වැඩ කරවමි.
තෝ වෙළෙන්දන් ලවා භාණ්ඩ විකුණවහි.

★ ප්‍රයෝජ්‍ය ක්‍රියා සහිත වාක්‍යවල ඇතැම් විට ප්‍රයෝජක කර්තෘ නැතිව ද තැබිය හැකි ය.

උදා :- අම්මා මල් කඩවයි.

## 21. අවධාරණාර්ථයේ නිපාත යෝගය

වනාහි, වූකලි, මා නම් ආදි අවධාරණාර්ථයේ නිපාත පද සමග බැඳෙන නාම පද උක්ත රූපයෙන් තබයි.

උදා :- දරුවෝ වැඩ කරත් නම් මවුපියෝ සතුටු වෙති.
ඔවුහු වූකලි වාසනා වන්තයෝ වෙති.
සියල්ලෝ ම එහි පැමිණෙති.

**22.** වී, වූ, වන කෘදන්ත පද සමග බැඳෙන කර්තෘ අනුක්ත වේ.

උදා :- හේ ධනවතකු වී සිටියේ ය.
ගායිකාවක වන ඕ එක රැයින් ජනප්‍රිය වූවා ය.
දක්ෂයකු වූ හෙතෙම කාගෙත් සිත් ගත්තේ ය.

**23.** ඇත, නැත, ඇති, නැති, යන පදවලින් වාක්‍යයක් අවසන්වන විට,

i. ඊට පෙර පදය ක්‍රියා රූපයක් ගනී නම් එහිදී කර්තෘ අනුක්ත වේ.

උදා :- ඔවුන් දක්ෂයන් වනු ඇත.
මා එහි ගොස් නැත.

ii. ඉහත පදවලට පෙර පදය ක්‍රියා රූපයක් නොගන්නා විට කර්තෘ උක්ත වේ.

උදා :- පන්තියේ ළමයි ඇත.
අපි එහි නැත.

**24.** පමණ, පමණක් නොව, බව, වශයෙන් ආදි නිපාත පද සමග බැඳෙන කර්තෘ අනුක්ත වේ.

උදා :- දෙමාපියන් පමණ කවුරු වෙහෙසෙත් ද?
ඔවුන් පමණක් නොව මම ද එහි ගියෙමි.
එහි සිටින්නේ ශිෂ්‍යයන් බව කවුරුත් දැන සිටියහ.
උගතුන් වශයෙන් ඔවුහු නිතර බුහුමන් ලබති.

## 25. විනාර්ථවත් නිපාත යෝගය

විනා, මුත්, මිස, හැර ආදි නිපාත හා බැඳෙන කර්තෘ අනුක්ත වේ.

උදා :- ඔවුන් විනා එය පිළිගන්නෝ කවරහු ද?
ගුරුවරුන් මුත් අන් අය එහි යත් ද?
දක්ෂයින් මිස සෙස්සෝ ජය නොලබති.
කාන්තාවන් හැර අන් අය එතැනින් ඉවත් විය යුත්තෝ ය.

## 26. තෙමේ, තොමෝ, තුමූ පද යෝගය

තෙමේ - පුරුෂ ලිංග ඒක වචන උක්ත රූපය.

උදා :- රජ තෙමේ යුදට නික්මෙයි.

තොමෝ - ස්ත්‍රී ලිංග ඒක වචන උක්ත රූපය.

උදා :- ඕ තොමෝ වෙහෙර පැදකුණු කළා ය.

තුමූ - ස්ත්‍රී, පුරුෂ ලිංගික බහු වචන උක්ත රූපය.

උදා :- උපාසකයෝ තුමූ නිති පතා සිල් රකිති.
කාන්තාවෝ තුමූ ශ්‍රම බලකායට එක් වෙති.

### ක්‍රියාකාරකම 2

**පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.**

i. මැණියෝ අවවාද දුන්නේ ය.
..............................................................

ii. අමඩි පරුෂ වචනයෙන් බැන්නා ය.
..............................................................

iii. මැණියන් දැ විහාරයට ගියා ය.

..............................................................

iv. සුමනා දේවිය පුතණු කෙනෙකුන් බිහි කළා ය.

..............................................................

✿ **පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.**

1. මම විභාගය සමත් වෙති යි ඔවුන් සිතයි.
2. ගංගාවන් රට සරුකරමින් මුහුදට ගලා යයි.
3. ලේනා ද කුඩුව ද ගසෙන් පහළට වැටෙයි.
4. මුව රැළ වනයේ ඔබමොබ හැසිරෙති.
5. කවරෙක් එය පිළිගනියි ද?
6. සඟ ගණ නුවර සැරිසරා පිඬු සිඟා වඩියි.
7. තිදෙනාගෙන් දෙදෙනෙක් ඉවත් වූ විට එක් අයෙක් එයින් සතුටු වෙති.
8. පියාණ දරුවෝ රකියි.
9. මැණියන් පුතණුවෝ කැඳවති.
10. භික්ෂූන් වහන්සේ සුමධුර දම් දෙසුමක් පැවැත්වූහ.
11. ගවයෙක් කොකෙක් සමග මිත්‍ර ව වසති.
12. මම පිරිවෙණට යද්දී මිතුරන් පැමිණ සිටියහ.
13. අන්‍යාගමිකයෝ සියල්ලන් ම මිථ්‍යාදෘෂ්ටිකයන් නොවේ.
14. අපි නිවැරැදිව වැඩ කළ යුතු ය.
15. දෙවියෝ වැනි මිනිසුන් අප අතර වෙයි.

## කර්තෘ කාරක වාක්‍ය සහ කර්ම කාරක වාක්‍ය

### කර්තෘ කාරක වාක්‍ය

කාරක යනු කරන්නා යන්න යි. යම් කිසි වාක්‍යයක අවසාන ක්‍රියාව කරනු ලබන්නේ එහි උක්ත කර්තෘ විසින් නම් එවැනි වාක්‍ය **කර්තෘ කාරක වාක්‍ය** වේ. එවැනි වාක්‍යවල අවසාන ක්‍රියාවට "එය කරන්නේ කවුද?" යන ප්‍රශ්නය යොමු කළ විට ලැබෙන පිළිතුර වන්නේ උක්ත කර්තෘ පදය යි. එවැනි වාක්‍යවල අවසාන ක්‍රියාවට "කාවද?", "මොනවා ද?" යන ප්‍රශ්න යොමු කළ විට ලැබෙන පිළිතුර වන්නේ අනුක්ත කර්ම පදය යි.

උදා :- පාලකයෝ ජන නායකයන් පසසති.

ඉහත වාක්‍යයේ අවසාන ක්‍රියාව වන්නේ "පසසති" යන්න යි. පැසසීම කරන්නේ කවු ද? එයට පිළිතුර වන්නේ "පාලකයෝ" යන්න යි. එය උක්ත කර්තෘ පදය යි. "පසසන්නේ කාව ද?" යන්නට පිළිතුර වන්නේ "ජන නායකයන්" යන්න යි. එය අනුක්ත කර්මය යි. අවසාන ක්‍රියාව කරන්නේ උක්ත කර්තෘ නිසා එවැනි වාක්‍ය කර්තෘ කාරක වාක්‍ය නම් වේ.

## කර්තෘ කාරක වාක්‍යයක ලක්ෂණ

* කර්තෘ උක්ත රූපයෙන් සිටියි.
* එම උක්ත කර්තෘ පදය ප්‍රථමා විභක්ති ගනියි.
* කර්මය අනුක්ත වන අතර එය කර්ම විභක්ති ගනියි.
* උක්ත කර්තෘ පදයට ගැළපෙන පරිදි ආඛ්‍යාතය තැබිය යුතු ය.

උදා :- ගුරුවරු ශිෂ්‍යයන් අගය කරති.
සත්පුරුෂයෝ පිනට දහමට සිත් යොදති.
ගායක ගායිකාවෝ රසිකයන් කුල්මත් කළහ.

● උක්ත කර්තෘ පදය ● අනුක්ත කර්ම පදය

## කර්ම කාරක වාක්‍ය

අවසාන ක්‍රියාවෙන් උක්ත වන්නේ කර්මය නම්, ඒවා **කර්ම කාරක වාක්‍ය** වේ.

උදා :- පාලකයන් විසින් ජන නායකයෝ පැසසෙති.

ඉහත වාක්‍යයේ අවසාන ක්‍රියාව "පැසසෙති" යන්න යි. "පැසසෙන්නේ කවුද?" යන ප්‍රශ්නයට පිළිතුර "ජන නායකයෝ" යන්න යි. එය වාක්‍යයේ උක්ත කර්ම පදය යි. මෙම වාක්‍යවල අවසාන ක්‍රියාවට "කා විසින් ද?" "කුමකින් ද?" යන ප්‍රශ්න යොමු කළ විට ලැබෙන පිළිතුර වන්නේ අනුක්ත කර්තෘ පදය යි. ඉහත වාක්‍යයේ අනුක්ත කර්තෘ පාලකයන් යන්න යි. එබැවින් එම වාක්‍යය කර්ම කාරක වේ.

## කර්ම කාරක වාක්‍යයක ලක්ෂණ

* කර්තෘ අනුක්ත වේ.
* අනුක්ත කර්තෘ කර්තෘ විභක්ති ගනියි.
* කර්මය උක්ත වේ.
* උක්ත කර්මය ප්‍රථමා විභක්ති ගනියි.
* අවසාන ක්‍රියාව ගළපන්නේ උක්ත කර්ම පදයට අනුව යි.
* එම ක්‍රියාව නිරුත්සාහක ස්වරූපයෙන් හෝ ලද/ ලබ ධාතු සමග තැබිය හැකි ය.
 (අතීත කාල ක්‍රියා සඳහා ලද/ ලබ ධාතු දෙක ම යෙදේ. අනතීත ක්‍රියා සඳහා යෙදෙන්නේ ලබ ධාතුව පමණි)

උදා :- කරන ලදි, කරනු ලැබී ය (අතීත කාල)
කරනු ලබයි, කරනු ලබන්නේ ය (අනතීත කාල)

උදා :- ගුරුවරුන් විසින් ශිෂ්‍යයෝ අගය කෙරෙති/ කරනු ලබති.
සත් පුරුෂයන් විසින් පිනට දහමට සිත් යෙදෙයි/ යොදනු ලබයි.
ගායක ගායිකාවන් විසින් රසිකයෝ කුල්මත් කෙරුණහ/ කරනු ලැබූහ/ කරන ලදහ.

## කර්තෘ කාරක වාක්‍යයක් කර්ම කාරකයට හැරවීමේදී සැලකිය යුතු කරුණු

i. අවසාන ක්‍රියාවට අනුව උක්ත කර්තෘ පදය සහ අනුක්ත කර්ම පදය හඳුනා ගැනීම.
ii. උක්ත කර්තෘ පදය අනුක්ත කොට ඊට ''විසින්'' නිපාතය එකතු කිරීම
(ප්‍රථමා විභක්තියෙන් තබා ඇති කර්තෘ පදය කර්තෘ විභක්ති රූපය ගැන්වීම)
iii. අනුක්තව තබා ඇති කර්ම පදය උක්ත කිරීම.
(කර්ම විභක්තියෙන් තබා ඇති කර්ම පදය ප්‍රථමා විභක්ති රූපය ගැන්වීම)
iv. උක්ත කර්තෘ පදයට අනුව තබා ඇති ක්‍රියාව උක්ත කර්ම පදයට ගැළපෙන පරිදි සිතා ගැනීම.
v. එම ක්‍රියා පදය නිරුත්සාහක ස්වරූපයට හෝ ලද/ ලබ ධාත්වන්ත ස්වරූපයට හැරවීම.
vi. දී ඇති කර්තෘ කාරක වාක්‍යයේ අවසාන ක්‍රියාවට අදාළ කාලය වෙනස් නොවිය යුතු ය.

උදා :- බල්ලෝ සොරුන් ලුහු බඳිති. - කර්තෘ කාරක
බල්ලන් විසින් සොරු ලුහු බැඳෙති/ ලුහු බඳිනු ලබති - කර්ම කාරක

## ක්‍රියාකාරකම 3

**පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.**

i. ගුවන් නියමුවෝ ගුවනේ විස්කම් දක්වති.
ii. විචාරකයෝ ලේඛකයන් දිරි ගන්වති.
iii. ශිෂ්‍ය නායකයා ශිෂ්‍යාවක කැඳවී ය.
iv. දෛවඥයෝ විස්මිත අනාවැකි පළ කළහ.
v. කම්කරුවෝ වෙහෙස නොබලා වැඩ කරති.

## කර්ම කාරක වාක්‍යයක් කර්තෘ කාරකයට හැරවීමේදී සැලකිය යුතු කරුණු

i. අනුක්තව තබා ඇති කර්තෘ පදය උක්ත කිරීම.
ii. විසින් නිපාතය ඉවත් කිරීම.
(කර්තෘ විභක්ති ගත් උක්ත කර්තෘ පදය ප්‍රථමා විභක්ති රූප ගැන්වීම)
iii. උක්ත කර්මය අනුක්ත කිරීම.
(ප්‍රථමා විභක්ති ගත් කර්ම පදය කර්ම විභක්ති රූප ගැන්වීම)
iv. නිරුත්සාහක ස්වරූපයෙන් හෝ ලද/ ලබ ධාතු සමග තබා ඇති ක්‍රියාව, සාමාන්‍ය ක්‍රියා පදයක් බවට සිතා ගැනීම.
v. උක්ත කර්මයට අනුව තබා ඇති ක්‍රියාව උක්ත කර්තෘ පදයට අනුව ගැළපීම.
vi. කර්ම කාරක වාක්‍යයේ අවසාන ක්‍රියාව තබා ඇති කාලය වෙනස් නොවිය යුතු ය.

උදා :- ඇමැතිතුමා විසින් මන්ත්‍රීවරු අගය කෙරෙති/ කරනු ලබති - කර්ම කාරක
ඇමැතිතුමා මන්ත්‍රීවරුන් අගය කරයි - කර්තෘ කාරක

## ක්‍රියාකාරකම 4

**පහත සඳහන් කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයට හරවන්න.**

i. ගොවියන් විසින් රට සරු කෙරෙයි./ කරනු ලබයි.
ii. විනිසුරුවරුන් විසින් චූදිතයෝ දඬුගෙට යැවෙති./ යවනු ලබති.
iii. කපුටා විසින් ලේනා ද කුඩුව ද ගසින් පහළට ඇද දැමෙති./ දමනු ලබති.
iv. මා විසින් සාහිත්‍යකරුවෝ අගය කෙරුණහ.
v. තෙරණුවන් විසින් සුමිහිරි හඬින් බණ දේශනා කෙරෙයි./ කරනු ලබයි.

## ක්‍රියාකාරකම 5

i. උක්තාඛ්‍යාත පද නිවැරැදි ව යොදමින් කර්තෘ කාරක වාක්‍ය 10ක් ලියන්න.
ii. එම වාක්‍ය කර්මකාරකට හරවා නැවත ලියන්න.

### සුභාෂිත

**සික්ඛෙය්‍ය සික්ඛිතබ්බානි**

උගත යුතු කවර ශිල්ප ශාස්ත්‍රයක් වුව උගත යුතු ය.

### සුචින්තන

ගුවන්යානය මිහිතලය මතදී හැම විට ම සුරක්ෂිත ය. එහෙත් එබඳු පැවැත්මකට එය නිපදවනු ලැබ නැත. ජීවිතයේ ශ්‍රේෂ්ඨ ජයග්‍රහණ උදෙසා අවදානම් සහිත වුවත් ඵලදායි කාර්යයක නිරත වීම මැනවි.

# 10

# අර්ථාවබෝධය

භාෂාව ලේඛනයට නැගීමේදී ත් භාෂණයට නැගීමේ දීත් සිදු වන්නේ එක ම කාර්යයකි. එනම් අදහස් ප්‍රකාශ කිරීම යි. එම ප්‍රකාශිත අදහස්හි අරුත් නිවැරදි ව වැටහීමෙන් පමණක් ම භාෂාවේ කාර්යය ඉටු වේ. භාෂණයේදී ප්‍රකාශ වන අදහස් වටහා ගැනීමට යම් බඳු පහසුකමක් ඇත. භාෂණය, අභිමුඛව සිදු වන නිසා නැවත නැවත විමසිය හැකි වීම, ඉඟි, සංඥා වැනි දේ ඇසුරු කිරීමට හැකි වීම ඊට හේතු යි. එහෙත් ලේඛනයේදී ලේඛනය ම කියවා, බලා, අසා වටහා ගැනීමට සිදු වන නිසා වටහා ගැනීමේදී යම් යම් බාධා ඇති වේ.

ගද්‍ය වශයෙන් වේවා පද්‍ය වශයෙන් හෝ වේවා කුමන හෝ ලේඛනයක වුව ද අන්තර්ගත අරුත් නිවැරදිව වටහා ගැනීම ලේඛන ගත භාෂා අවබෝධයට මහෝපකාරී වේ. අර්ථාවබෝධය පාඩමෙන් උත්සාහ ගන්නේ එය පහසුවෙන් කළ හැකි ක්‍රමවේද මොනවා ද යි විමසා බැලීම යි.

## වදන් පෙරළිය

දෙණියේගෙදර වෙදආතා පොල්පිටිය ගමේ විසූ පාරම්පරික දේශීය වෛද්‍යවරයෙකි. වෙදහෙදකම්වලට අමතර ව ජ්‍යොතිෂ්‍ය කටයුතු ද සිදු කළ නිසා වෙදආතාට තරමක් අවිවේකය පැවතිය ද ලැබුණු හැම විට ම විනෝදයෙන් සැහැල්ලුවෙන් කල් ගෙවීම වෙද ආතා තුළ වූ විශේෂතාවකි.

සේදිරිස් ළමයා වෙද ආතාට සිටි කීකරු ආවතේවකරුවා ය. තරුණයකු වුව ද එතරම් උගත්කමක් නැති සේදිරිස් ළමයා වෙද ආතාට පිහිටවන්නේ තමන් දන්නා කියන බෙහෙත් අඩු-වැඩි ටික වෙද ආතාට සොයා දීමෙනි. දිනක් දකුණතින් හිසත් වමතින් ඉදිරියට නෙරූ උදරයත් පිරිමදිමින් සිටි වෙද ආතා වෙද කාමරයේ දොරකඩ ළඟ සිටි සේදිරිස් ළමයා අමතා **කල්පොට්ටක් සහ කරණ පහ** සොයා ගෙන එන ලෙස කීවේ ය. වෙනදා මෙන් වෙද ආතාගේ විධානය හිස් මුදුනින් පිළිගත් සේදිරිස් ළමයා වෙද ආතා කියූ කල්පොට්ට සහ කරණ පහ සොයමින් පළමුව වෙද ගෙදර පුරාත් අනතුරු ව මුළු පොල්පිටිය ගම පුරාත් ඇවිද හති දමමින් වෙදගෙදරට ආවේ,

"අනේ වෙදආතේ හැම තැන ම හෙව්වා කල්පොට්ට සහ කරණ පහ සොයා ගන්නට නොහැකි වුණානේ" යැයි පවසමිනි.

"ඈ සේදිරිස් ළමයො? උඹ ඕකට ඔය හැටි මහන්සි වුණේ ඇයි? උඹ නිකමටවත් මං කියපු දේ අනිත් පැත්ත පෙරළලා බැලුවෙ නෑ නේ? මං උඹට කිව්වේ පොල්කට්ටක් සහ පරණ කහ ගේන්න කියල නෙ...."

වෙදආතා එසේ කීවේ මුවගට නගා ගත් සිනහවක් ද සහිත ව ය. එය ඇසූ සේදිරිස් ළමයා ඔළුවේ අත ගසා ගත්තේ වෙද ආතාගේ විහිළුවකට තමන් අදත් අසු වුණු බව සිතමිනි.

මේ කතාවෙන් මතු වන එක අදහසක් නම් භාෂා අවබෝධයේදී විවිධ පැතිකඩ පිළිබඳ දැනුමක් සහිතව කටයුතු කළ යුතු බව යි. ඒ අනුව මෙම කතාවෙන් තහවුරු වන්නේ භාෂාවේ පද පෙරළි වශයෙන් තිබෙන අවස්ථා හඳුනා ගෙන භාෂාව අවබෝධ කර ගන්නට උත්සාහ ගත යුතු බව යි.

ගද්‍ය පද්‍ය වශයෙන් පමණක් නොව විවිධාකාර ප්‍රායෝගික ලේඛනවලත් පුවත්පත් ආදි ලියවිලිවලත් ඇති භාෂාව අවබෝධකර ගැනීමට උත්සාහ ගැනීමේදී ඒවායෙහි අර්ථ විවිධ වශයෙන් පවතින නිසා, ඊට අනුගත ව අවබෝධකර ගන්නට සිදු වේ. භාෂාවේ අර්ථ වටහා ගැනීම මූලික වශයෙන් ආකාර තුනකි.

1. වාච්‍යාර්ථය වටහා ගැනීම
2. ලක්ෂ්‍යාර්ථය වටහා ගැනීම
3. ව්‍යංග්‍යාර්ථය වටහා ගැනීම යනු යි.

## 1. වාච්‍යාර්ථය වටහා ගැනීම

වාච්‍යාර්ථය යනු වචනවල මතුපිටින් කියවෙන අර්ථය යි. එදිනෙදා ව්‍යවහාර බසින් සුසැදි ලේඛනවල වාච්‍යාර්ථය පහසුවෙන් වටහා ගත හැකි ය.

**"ඔබ නිවසේ රැඳී සිටින්න**
**මම නොපමාව එමි"**

යන වැකියේ භාවිත ව ඇත්තේ ව්‍යවහාර බස යි. ඒ නිසා අවබෝධය පහසු ය. මෙවැනි ව්‍යවහාර බසක් සහිත ඕනෑම ලේඛනයක පදයෙන්, පදය වැකියෙන්, වැකිය කියවීමෙන් සමස්ත ලේඛනයේ අන්තර්ගත අර්ථාවබෝධය ලද හැකි ය. එහෙත් පැරණි බස යෙදී ඇති
"අදිති පෑයූ සඳ තුසර රැස් සිඳී යේ" යන වැකියේ
අර්ථ වටහා ගන්නට නම් වචනාර්ථ ව්‍යවහාර බසට නගා දැන ගත යුතු ය.

| | | |
|---|---|---|
| අදිති | - | සූර්යයා |
| පෑයූ සඳ | - | පෑයූ කල්හි |
| තුසර රැස් | - | පිනි බිඳු සමූහය |
| සිඳී යේ | - | සිඳී යයි |

ඒ අනුව ඉහත වැකියේ අර්ථය "සූර්යයා පෑයූ කල්හි පිනි බිඳු පහව යයි" යන්න යි. මෙසේ පැරණි බසේ අර්ථ වටහා ගන්නට නම් පැරණි භාෂාවේ ව්‍යවහාර අර්ථ පිළිබඳ වැටහීමක් පැවතිය යුතු ය.

## ක්‍රියාකාරකම 1

**පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. අදහස් ප්‍රකාශනයෙහිලා ඉවහල් වන ශබ්ද හා රීති සමූහය භාෂාව ලෙස හැඳින්වේ. භාෂාව ගැන පවත්නා දැනුම, ව්‍යාකරණය, රචනය, උච්චාරණය හා සාහිත්‍යයට පමණක් සීමා වූවක් නොවේ. එය පෘථුල ගම්භීරාර්ථයක් ප්‍රකට කරයි. සිතෙහි හටගන්නා අදහස් ලේඛන මාධ්‍යය තුළින් වෙනත් අයකුට පෙන්නුම් කිරීම සඳහා සංකේත යොදා ගැනේ. සංකේතාත්මක මාධ්‍යය තුළින් වෙනස් වන්නා වූ භාෂා දහස් ගණනක් ලොවෙහි පවතී. ඒවා මානව ශිෂ්ටාචාරයේ වර්ධනයත් සමග ඇති විය. ඇතැම් ඒවා කාලානුරූපව පරිහානියට පත් විය. පරිහානියට පත් ව පොදු ජන ව්‍යවහාරයෙන් ඉවත් වූ භාෂා මළ භාෂා ලෙස හැඳින්වේ.

i. භාෂාවේ අංග දෙක මොනවා ද?
ii. මළ භාෂා යනු මොනවා ද?
iii. සිතෙහි හටගන්නා අදහස් අන් අයට ඉදිරිපත් කිරීම සඳහා යොදා ගන්නේ මොනවා ද?
iv. මානව ශිෂ්ටාචාරයේ වර්ධනයත් සමග ඇති වූයේ මොනවා ද?
v. පෘථුල, ගම්භීර යන වචනවල අර්ථ ලියන්න.

2. එ වේලෙහි පූර්ණා නම් දාසී ද සුජාතාවන් කී බස් මුදුනෙන් පිළිගෙන අජපාල නුගරුක් මුලට ගොස් නිල් වලාකුළක් ළඟ ළහිරු මඬලක් මෙන් රන්වන් රසින් එරුක සාදා නැගෙනහිර බලා වැඩහුන් උත්තමයා දැක ''අද අපගේ දේවතාවාණෝ රුකින් බැසපූය''. අතින් කිරිපිඬු පිළිගන්ට උන්වනැයි බියපත් ව වෙලෙවි වෙලෙවි ව ගොස් සාමි දියණියන්ට කිව...."

- ථූපවංසය -

1. මෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

2. i. මෙහි "උත්තමයා" ලෙස නම් කර ඇත්තේ කවුද?
ii. මෙහි ඇතුළත් උපමාව සහ උපමේය ගෙන හැර දක්වන්න.
iii. ස්ත්‍රී ලිංගික සංඥා නාම දෙකක් දක්වන්න.
iv. පූර්ණා දාසිය උපකල්පනය කරන කරුණ කුමක් ද?
v. පූර්ව ක්‍රියා තුනක් නම් කරන්න.

3. ජීවය කවා හදවත් තුළ කුළුණු බර
දස්කම් කළා මහිමෙන් සිත් පුබුදු කර
මේ ගිරි හිසෙන් පෙන්වා දී කුවෙර පුර
ඉතිහාසයක් මැව්වා යුගයකයට පෙර

i. මෙහි වර්ණිත වස්තුව කුමක් ද?
ii. එය උපමා කර ඇත්තේ කුමකට ද?
iii. මෙහි සඳහන් ස්ථානයේ දක්නට ඇති ලක්ෂණ දෙකක් ලියන්න.
iv. ඉතිහාසය යන්නෙහි අර්ථය කුමක් ද?
v. මෙම ස්ථානයේ මැවුම්කරු වන්නේ කවුද?

4. නිල් දෙරණේ තුරුලිය මත මල් සම්පත අම්මා
තුරුලිය මත පිපි කුසුමේ පල සම්පත අම්මා
සිය දහසක් නෙක ලෝ දා එළිය කරන අම්මා
සොළොස් කලා පිරි පුරහඳ එළිය කරන අම්මා

i. මව වෙනුවෙන් යොදා ඇති උපමා දෙකක් ලියා දක්වන්න.
ii. දෙරණ, තුරුලිය, කුසුම්, නෙක යන වචනවල අර්ථ ලියන්න.
iii. පුරහඳ යන්න විශේෂ කර ඇත්තේ කෙසේ ද?
iv. පූර්ව ක්‍රියා පද දෙකක් නම් කරන්න.
v. ආධාර විභක්ත්‍යන්ත පද දෙකක් නම් කරන්න.

## 2. ලක්ෂ්‍යාර්ථය වටහා ගැනීම

භාෂාවේ වාච්‍යාර්ථයෙන් මතුවන අදහස ඔස්සේ අවබෝධ කර ගත හැකි දෙවැනි අරුත, වඩා සංකල්ප සහිත සැඟවුණු අර්ථ ලක්ෂ්‍යාර්ථය වේ. එවැනි අර්ථ සහිත වචනවල අර්ථ අවබෝධ කර ගැනීම ලක්ෂ්‍යාර්ථය වටහා ගැනීම යි.

**මගේ නිවස පිහිටා ඇත්තේ දේවාලේගම හන්දියේ.** යන්නෙහි හන්දියේ ගෙවල් පිහිටීමක් නැත. එහි දෙවැනි අරුත වන්නේ දේවාලේගම හන්දිය සමීපයේ පිහිටා ඇති බවකි. ලක්ෂ්‍යාර්ථය යනු එය යි. **පොඩි හාමුදුරුවෝ බෝධියේ.** යන්නෙහි බෝධිය මත සිටීමක් නොව බෝධිය සමීපයේ සිටීම අදහස් කරයි.

## 3. ව්‍යංග්‍යාර්ථය වටහා ගැනීම

භාෂාව, වාච්‍යාර්ථය කිසි සේත් ම ඉස්මතු නො වන ආකාරයට යෙදිය හැකි ය. ව්‍යංග්‍යාර්ථවත් බස යනු එය යි. ව්‍යංග්‍යාර්ථවත් බස අවබෝධ කර ගත හැක්කේ සමස්ත ප්‍රකාශනය මත ය. උක්ති හා යෙදුම් ඊට ඇසුරු කෙරේ. විශේෂයෙන් කාව්‍යකරණයේදී හමුවන්නේ මෙම ව්‍යංග්‍යාර්ථවත් බස යි.

**මා හඬනා කඳුළු ගලා**
**සැදුණු කඳුළු සාගරේ**
**ඔබ ඇය හා**
**ඔරු පැද පැද**
**සිනාසුණේ ඇයි**

පෙම්වතා හැර ගිය විරහිනියකගේ ශෝකාලාපයකි, මෙය. තමන් දුකෙහි රන්දා තවත් පෙම්වතියක වෙත ගොස් ඇය හා සතුටින් කල් ගෙවන පෙම්වතා ඇමතීම මෙහිදී සිදු ව ඇත. එහෙත් එසේ නො කියන කවියා ව්‍යංග්‍යාර්ථවත් ව එය මේ පාඨයෙන් ප්‍රකාශ කර ඇත.

පෙම්වතුන් දෙදෙනෙකු තම ජීවිතයට එක් වුවත් තමන් අසතුටින් දිවි ගෙවන බව හැඟවෙන මේ ප්‍රකාශය කෙතරම් ව්‍යංග්‍යාර්ථවත් ද?

**හිරු සඳු එක වර දෙපස නැගේ**
**කළුවර ඇයි විජිතය ම මගේ**

ව්‍යංග්‍යාර්ථාවබෝධයේදී භාෂා පටුත්වය, පාරිසරික හා සංස්කෘතික ඥානය සේ ම අත්දැකීම් බහුල බව ද වැදගත් වේ.

අර්ථාවබෝධයේදී ඉහත දක්වූ වාච්‍යාර්ථය වටහා ගැනීම, ලක්ෂයාර්ථය වටහා ගැනීම, ව්‍යංග්‍යාර්ථය වටහා ගැනීම යන අවස්ථා තුනෙන් බැහැර ව සුවිශෙෂ ව අර්ථ වටහාගත යුතු අවස්ථා ද ඇත. ඒ අතර ගැඹුරු ධර්ම කරුණක් හෝ වෙනත් සංකල්පයක් සඟවා අරුත් පෙන්වා ඇති තැන් දක්විය හැකි ය. දහම්ගැට මාලය නම් පැරණි ධර්ම ග්‍රන්ථයේ සඳහන් මේ පද්‍යය අවධානයට ගන්න.

**ඉස්සන් මරාපිය**
**රා කළයක් ම බීපිය**
**මෝ ව මරවා පිය**
**මෙතුන කරලා මාව කාපිය**

මෙය බැලූ බැල්මට සරල මතුපිට අදහසක් පෙන්නුම් කළ ද මෙහි ගැබ් ව ඇත්තේ ගැඹුරු ධර්ම කරුණකි. මින් කියවෙන්නේ ඊර්ෂ්‍යාව, රාගය, මෝහය නැති කොට නිවන අවබෝධ කරගන්නා ලෙස යි. මෙවැනි අරුත් පහදා ගැනීම් ගුරුපදේශ සහිත ව ම කළ යුතු ව ඇත.

එමෙන් ම අර්ථාවබෝධය ලැබීමේදී ප්‍රදේශීය භාෂා විෂමතාවන් ගැන ද අවබෝධය ලබා තිබීම වැදගත් වේ. භාෂාව ලේඛනගත කිරීමේදී ප්‍රදේශීය අනන්‍යතාව ලේඛකයා සතු ව පවතී. එම නිසා ප්‍රදේශීය වශයෙන් පවතින වාග් මාලාවන් හි විෂමතාවත් ඒ ඒ වචනවල අර්ථත් වටහා ගෙන සිටීම අවශ්‍යතාවකි.

වාච්‍යාර්ථය සහ ලක්ෂ්‍යාර්ථය යන දෙකෙහිදී ම නිශ්චිතාර්ථයක් ගම්‍ය වුව ද ව්‍යංග්‍යාර්ථය දනවා ගත හැක්කේ රසඥතාව සහ අද්දැකීම්වල ස්වභාවය මත යි. එය පුද්ගල බද්ධ විය හැකි ය.

## අර්ථාවබෝධයට අත්වැල

1. ගද්‍ය හෝ පද්‍ය පාඨය හොඳින් කියවීම

2. අර්ථ සංකීර්ණ වචන, යෙදුම් ඇත්නම් ඒවා සලකුණු කිරීම

3. එම අර්ථ සංකීර්ණ වචන හා යෙදුම්වල අර්ථ වටහා ගැනීම. ඒ යටතේ
   වාච්‍යාර්ථ
   ලක්ෂ්‍යාර්ථ
   ව්‍යංග්‍යාර්ථ ගැන අවධානය යොමු කිරීම

4. මුඛ්‍ය අදහස/ තේමාව වටහා ගැනීම

5. මුඛ්‍ය අදහසට/ තේමාවට සම්බන්ධ සමස්ත අදහස වටහා ගැනීම

6. අන්තර්ගත කරුණු සංකල්පීය වශයෙන් හා නාමික වශයෙන් හඳුනා ගැනීම

7. ව්‍යාකරණ ලක්ෂණ හඳුනා ගැනීම

8. අන්තර්ගතයට අදාළව අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී ප්‍රශ්න මනාව තේරුම් ගැනීම

9. විස්තර කළ යුතු කරුණු ඔබේ වචනයෙන් ඉදිරිපත් කිරීම

10. යමක් පිළිබඳව ඔබේ මතය විමසා ඇත්නම් එය නොපැකිලිව ඉදිරිපත් කිරීම

11. ඔබේ පිළිතුර නිශ්චිතව, කෙටියෙන් සහ පැහැදිලිව දැක්වීම

## ක්‍රියාකාරකම 2

**පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨවල අර්ථය ලිහිල් බසින් ලියන්න.**

1. සොර ක්ලාන්ත වියැ. මියෙහි කෙළ සිඳී ගියෙ. ශරීරයෙන් ස්වේද බස්සි. එක ලැ අඟුල්මල් සොර විස්මිත වැ "මම් පූර්වයෙහි දිවෙන ඇතුන් ලුහුබැඳැ ගනිම් මැ යැ. අසුන් ලුහුබැඳැ ගනිම් මැ යැ. රථ ලුහුබැඳැ ගනිම් මැ යැ. දිවෙන මුවන් ලුහුබැඳැ ගනිම් මැ යැ එතෙකුදු හොත් මම් මෙ මහණහු පියෙවි ගමනින් යන්නහු බැල පමණින් දිවෙනුයෙම් හඹා නොගත හෙමි'' යි......."

(අමාවතුර අඟුල්මල් දමනය)

2. ඒ අසා ආලවකයා විස්මය පත් වැ "මත්තෙහි අනික් කා විචාරන්නට තබම් ද විචාරණ දෙයක් මොවුන් වහන්සේ මැ විචාරමි'' යි සිතා විචාරන්නේ "කාම යැ, භව යැ, දෘෂ්ටි යැ, අවිද්‍යා යැ යන මේ සතර වතුරෙන් සත්ත්ව තෙම කෙසේ එතෙර වන්නේ ද'' යි විචාළේ. ඉක්බිති සර්වඥයන් වහන්සේ "ආලවකය සත්ත්ව තෙමේ මේ තා කී සතර වතුරෙන් එතෙර වන්නේ තුණුරුවන්හි කරන සැදැහැයෙන් මැ ය'' යි වදාළ සේක......

(බුත්සරණ - ආලවක දමනය)

3. දිලිහෙන ගඟු ලැලීය ඇද හැලීය
ගිලිමල් රොනවුලීය සුදු වැලීය
මදමත් හස කැලීය වන විලීය
දැක යව මන කලීය වන මලීය

(ගිරා සන්දේශය)

4. ඔවා දෙනු පරහට - තමා සම්මතෙහි පිහිටා සිට
දුසිරිත් දනන් දෙන - ඔවා වැද්දන් කියන බණ වැනි

**(ලෝකෝපකාරය)**

5. කුළුණු ගුණෙන් යුතු උතුමන් සිත මහරු
දුදන බසින් නොයෙදෙයි කරනට නපුරු
නවරුවනින් පිරි මහ සමුදුර ගැඹුරු
තණ සුළෙකින් හුණු කළ හැකි වෙති කවුරු

**(සුභාෂිතය)**

## ක්‍රියාකාරකම 3

**පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. සංස්කෘත ශාබ්දික නියමය අනුව සාවද්‍ය බව ප්‍රකට වන ඇතැම් රූප මේ වන විට සිංහල ව්‍යවහාරයෙහි මුල් බැස ඇති බව පෙනී යයි. "ප්‍රාදේශීය" යනු එබන්දකි. ප්‍රදේශ යන පදය සමග ඊය ප්‍රත්‍යය එක් වීමෙන් සැදෙනුයේ "ප්‍රදේශීය" යනු විනා "ප්‍රාදේශීය" යන්නක් නොවේ. ඇතැම්විට මෙය 'ඉක' ප්‍රත්‍යයට අදාළ ප්‍රදේශික යන වචනයේ ආදි ස්වරයේ වෘද්ධිය අයථා සාදෘශ්‍යයෙන් යොදා ගැනීමෙන් සකස් කොට ගත්තක් විය හැකි ය.

   i. සංස්කෘත ශාබ්දික නියමය අනුව මෙහි ඇති සාවද්‍ය රූපය කුමක් ද?
   ii. එහි නිරවද්‍ය රූපය දක්වන්න
   iii. ඊය ප්‍රත්‍ය යෙදුණු වෙනත් වචන දෙකක් ලියන්න
   iv. සංස්කෘත ශාබ්දික නියමය යනු කුමක් ද?
   v. ස්වර වෘද්ධිය යනු කුමක් ද?

2. නිදහසේ අදහස් ප්‍රකාශ කිරීම සීමා කරන නුවුමනා නීති රීති ජන කවියාට නැත. ජනකවියා සිතීමේදී හා අදහස් ප්‍රකාශ කිරීමේදී උගත් කවියාට වඩා නිවහල් ය. උගත් කවියා තතන තතනා ප්‍රකාශ කරන දේ ජන කවියාගෙන් ප්‍රකාශ වන්නේ නිතැතිනි. ජනකවියාගෙන් සිදු වන්නේ ජලයෙන් පිරී ඉතිරී යන විට වැව් කන්ද කඩා බිඳ ගෙන යන වැවක් මෙන් අදහස් වැඩි වූ විට එම අදහස් කවි බසට නැගී ගලා යාම යි.

   i. ජන කවියා උගත් කවියාගෙන් වෙනස් වන්නේ කෙසේ ද?
   ii. උගත් කවියා උත්සාහයෙන් කරන දේ ජන කවියා කරන්නේ කෙසේ ද?
   iii. මෙහි සඳහන් උපමාව සහ උපමේය ගෙන හැර දක්වන්න.
   iv. විශේෂ පද දෙකක් සහ උපසර්ග සහිත පදයක් ලියා දක්වන්න.
   v. මේ ඡේදයේ මුඛ්‍ය අදහස කුමක් ද?

3. මල් රොන් තුරු සිරේය නිරතුරේය
පවනද වැද සිරේය මළු තුරේය
බිඟු ලොබ කර තරේය නොවිතරේය
දම් පිළිරැව් යුරේය නද කෙරේය

**(ගිරා සන්දේශය)**

   i. සුළං වැදී මිදුල මත ඉහිරී යන්නේ මොනවා ද?
   ii. ධර්මය පිළිරැව් දෙන්නාක් ලෙස දක්වා ඇත්තේ කුමක් ද?

iii. මෙම වර්ණනාවට මුල් වී ඇත්තේ කුමන ස්ථානයක් ද?
iv. විශේෂණ පදයක්, පූර්ව ක්‍රියා පදයක්, උපසර්ග සහිත පදයක් දක්වන්න.
v. මෙහි ඇති මුඛ්‍ය අදහස පිළිබඳ ඔබට හැඟෙන්නේ කුමක් ද?

4. හැම මලකින් ම රොන් ගෙන සදන මී පැණි
ලෙඩ සුව කරන දිව ඔසුවක් වන හෙයිනි
ලොව දුටු හැම දෙයින් පාඩම් ගතෝතිනි
වැඩි වෙයි නුවණ දින දින පුරහඳ ලෙසිනි

i. මී පැණි හදන්නේ කෙසේ ද?
ii. මී පැණි එතරම් වටින්නේ ඇයි?
iii. නුවණ වැඩි වීමට හේතු වන කරුණ ලෙස දක්වා ඇත්තේ කුමක් ද?
iv. නුවණ වැඩි වීම උපමා කර ඇත්තේ කුමකට ද?
v. මෙහි සමස්ත අර්ථයෙන් කුළු ගැන්වෙන්නේ කුමක් ද?

## සුභාෂිත

**"නික්කාරණා දුල්ලභා අජ්ජමිත්තා"**

ආත්මාර්ථයක් නැති ව නිකරුණේ මිතුරුවන්නෝ
මෙකල්හී දුර්ලභ ය

## සුචින්තන

සිතිවිල්ලක් වපුරන්න
ක්‍රියාවක් ලැබේ.
ක්‍රියාවක් වපුරන්න
පුරුදු ලැබේ.
පුරුදු වපුරන්න
චරිතය ලැබේ.
චරිතය වපුරන්න
දෛවය ලැබේ.

# 11

# විරාම ලක්ෂණ

ලේඛනයක් තුළ අක්ෂර වින්‍යාසය, වාක්‍ය වින්‍යාසය වැනි දේ කෙතරම් නිවැරැදිව යෙදී තිබුණ ද අදහස් වටහා ගැනීමට බාධා පැමිණෙන, අර්ථ ව්‍යාකූල වන අවස්ථා දක්නට ඇත. විරාම ලක්ෂණ අවභාවිතය, වැරැදි පද බෙදීම වැනි දේ ඊට බලපායි. එවැනි දුර්වලතා ලේඛනයේ දී මගහරවා ගැනීමට හැකි නම්, නිවැරැදිව හා නිරවුල්ව අර්ථාවබෝධය කරගැනීමට පහසු වෙයි. මෙම පාඩමේදී අවධානය යොමු කරවන්නේ විරාම ලක්ෂණ සුභාවිතය පිළිබඳ අවබෝධයට යි.

කෑගල්ල දේවාලේගම ශ්‍රී සංඝමිත්ත මහ පිරිවෙණේ වාර්ෂික ත්‍යාග සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවය අතිඋත්කර්ෂවත් අයුරින් පසුගිය දිනක පැවැත්විණ. එහි ආරාධිත දේශනය සඳහා සහභාගී වූයේ සබරගමු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විජේසුන්දර ලියනගේ මහතා ය.

පාරිවේණික ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලාගේ ආධ්‍යාපනික ජීවිතය වඩාත් අර්ථවත් කර ගැනීම අරමුණු කර ගෙන පැවැත්වූ එම දේශනය රැස් ව සිටි සැමගේ විශේෂ අවධානයට ලක්විය. ඒ, හුදෙක් දැනුම වර්ධනයට ඉවහල් වන කරුණු රාශියක් ඉදිරිපත් කිරීම නිසා පමණක් නොවේ. කාගේත් අවධානය තමා වෙත නතු කරවා ගනිමින් සිත්කලු, ලෙසත් කන්කලු ලෙසත් සිය දේශනය ඉදිරිපත් කිරීම ඊට ප්‍රධාන හේතුව විය.

එහි දී විජේසුන්දර මහතා ප්‍රකාශ කරන අදහස්වලට ගැළපෙන පරිදි දෑත් උස්පහත් කළේ ය. මුහුණේ ඉරියවු වෙනස් කළේ ය; අවශ්‍ය ලෙස හඬ උස්පහත් කළේ ය. විටෙක වාග් මාලාව වේගවත් විය. තවත් විටෙක මඳ ස්වරය සහිත විය. තමන් ඉදිරියේ සිටි පිරිසට නැමී ආමන්ත්‍රණය කරන අයුරු දක්නට ලැබිණ. සිනා පිරුණු මුහුණින් ඔවුනගෙන් විවිධ ප්‍රශ්න ඇසී ය. සුභාෂිතයේ සඳහන් "පින් මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු" යන කවිය දේශනයට ඇතුළත් කළ විජේසුන්දර මහතා ඒ සඳහා භාවිත කළේ තාලානුකූල රිද්මයකි. මේ ආකාර චර්යාත්මක හැඩගැන්වීම් නිසා විජේසුන්දර මහතාගේ දේශනය ශ්‍රාවකයින්ට පහසුවෙන් වටහා ගැනීමට හැකි විය. එපමණක් නොව රසඥතාඥාන වර්ධනයට ඉවහල් වන බොහෝ දෑ දේශනයෙන් අපූරුවට ඉදිරිපත් වූ නිසා ශ්‍රාවක මනස වින්දනීය සැහැල්ලුවක තබන්නට ද හැකි විය.

විජේසුන්දර ලියනගේ මහතා පැවැත් වූ දේශනය තුළ වූයේ කථන ව්‍යවහාරය යි. ඉහතින් දැක්වූයේ කථන ව්‍යවහාරය පහසුවෙන් වටහා ගැනීමට හැකි වන චර්යාත්මක හැඩගැන්වීම් ය. එහෙත් කථනයේදී ඉදිරිපත් කළ පුදුමය, ශෝකය, ප්‍රශ්නාර්ථය, සතුට ආදි දේ සඳහා වූ චර්යාත්මක ලක්ෂණ ලේඛන ව්‍යවහාරයේදී ඉදිරිපත් කරන්නට ලේඛකයාට නොහැකි ය. ඒ සඳහා ඔහු භාවිත කරන්නේ සංකේත විශේෂයකි. **විරාම ලක්ෂණ** යනු එම සංකේත යි.

ලේඛන ව්‍යවහාරයේදී විරාම ලක්ෂණ සුදුසු පරිදි, නිවැරැදි තැන්වල භාවිත කිරීමෙන් අදහස් නිරවුල්ව හා විධිමත්ව පමණක් නොව අලංකාරව ද ඉදිරිපත් කළ හැකි ය. එවිට ලේඛනාවබෝධය පහසු වෙයි. එසේ නො වුවහොත් ලේඛනයේ අර්ථ විකෘති වෙයි, අපැහැදිලි වෙයි, තොරතුරු වැරැදි ලෙස සන්නිවේදනය වෙයි. ඒ නිසා ම විවිධාකාර භාෂා අර්බුදවලට පමණක් නොව සමාජ අර්බුදවලට පවා මග පෑදෙයි. විරාම ලක්ෂණ හඳුනා ගැනීමෙන් හා ඒවා භාවිත කරන ස්ථාන පිළිබඳ අවබෝධ කර ගැනීමෙන් මේ ගැටලු සියල්ල මග හරවා ගැනීමට හැකියාව ඇත.

## සිංහල ලේඛන සම්ප්‍රදායේ ව්‍යවහාරික විරාම ලක්ෂණ

### 1. තිත .

1. වාක්‍යයක සමාප්තිය දැක්වීම සඳහා යෙදේ.

උදා:- හිරුකිරණින් පියුම් විකසිත වෙයි.

2. පද හකුළුවා දැක්වීම සඳහා යෙදේ.

උදා:- සංයුක්තනිකාය - සං.නි.
හේවා මද්දුමගේ පියසේන - හේ.ම. පියසේන
ලංකා විදුලිබල මණ්ඩලය - ලං.වි.ම

3. දශම භාග දැක්වීම සඳහා යෙදේ.

උදා:- 8.3
7.12

4. අවුරුදු, මාස, දින දැක්වීම සඳහා යෙදේ.

උදා:- 1972.02.15
1974.02.08
2002.05.04
2008.05.05

## 2. දෙතිත :

1. විස්තරයක් දැක්වීමේදී යෙදේ.

උදා:- ජනකවි : සාමාන්‍ය ජන ජීවිතයේ නිර්ව්‍යාජ සිතුම් කවියට නැඟීමකි.

2. නිදසුන් දැක්වීමේදී යෙදේ.

උදා:- උභය ජීවි යනු දියෙහි හා ගොඩෙහි වෙසෙන ජීවීන් ය.
නිදසුන් : කිඹුලා, ඉබ්බා, ගෙම්බා

3. කරුණු කීපයක් දැක්වීමේදී යෙදේ.

උදා:- කරදිය හා මිරිදිය වශයෙන් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත දෙවර්ගයකි.
- කරදිය : බලා, තෝරා, මෝරා,
- මිරිදිය : ලූලා, කාවයියා, පෙතියා

4. සංවාද ලියා දැක්වීමේදී කථක නාමයට පසු ව යෙදේ.

උදා:- මන්ද්‍රි දේවි : උෟට තිබහ නම් උෟ අම්මාගෙන් කිරි බෝවී.
ක්‍රිෂ්ණජිනා : අම්මේ, අද උදේ මුවදෙන පැටියට කිරි දීලා නෑ

5. පැය හා විනාඩි ඉලක්කමෙන් ලිවීමේදී යෙදේ.

7:30 } පැය 24 ඔරලෝසු ක්‍රමයට - ඩිජිටල්
13:30 }
පෙ.ව 7:30
ප.ව 9:30

6. ගණිත ප්‍රකාශනයක අනුපාත ලියා දැක්වීමේදී යෙදේ.

4 : 5 අනුපාතයට
2 : 1 අනුපාතයට

## 3. කොමාව ,

1. වාක්‍යාංශය කෙළවරේ යෙදේ.
 උදා:- සුරඟනෝ තාලයට පා තබමින්, නුවනග බැලුම් දෙමින් නැටූහ.

2. ආමන්ත්‍රණ පදය අවසානයේ යෙදේ.
 උදා:- පුතේ, මෙහි වාඩිවෙන්න.

3. පද සමූහයක් එක පෙළට ලිවීමේදී ඒවා වෙන් කර දැක්වීම සඳහා යෙදේ.
 උදා:- අරළු, බුළු, නෙල්ලි, ඉඟුරු, කටුවැල්බටු වැනි ඖෂධ
 නටන, ගයන, හිනැහෙන සෙනග බලන්න.

4. ප්‍රශ්නවාචී වාක්‍යයක ප්‍රශ්නාර්ථ සූචක පදය මුලින් හෝ මැදින් යෙදෙන තැන.
 උදා:- ඇයි, ඔබ මට මෙහෙම කියන්නෙ?
 ඔබ මොකද, මට එහෙම කියන්නෙ?

5. ආමන්ත්‍රණ පදයකට පසු ව
 උදා:- පින්වත්නි, දහම්හි හැසිරෙන්න.

## 4. තිත් කොමාව ;

1. ඉදිරි ප්‍රකාශනය හා බැඳී පවතින සමාප්තිය දැක්වීම සඳහා යෙදේ.
 උදා:- මම ඉදුරු හුල් ඇත්තෙමි; සිසිල් වූයේ වෙමි; නිවුණේ වෙමි.

2. සමාන අදහස් දැක්වීමේදී යෙදේ.
 ඒ කවිය මිහිරි ය; ගීතවත් ය; සිත් අදනා සුලු ය.

## 5. තිත් පෙළ ...

1. ඌනත්වය දැක්වීමේදී යෙදේ.
 උදා:- බුදුන් වහන්සේ, නාලන්දා, විශාලා, චාපාල... ගෝතබ්බ ආදි චෛත්‍ය නැරඹීමට වැඩියහ.

2. අඛණ්ඩ සම්බන්ධතාව දැක්වීමේදී යෙදේ.
 උදා:- ... එමග නොයා, එමග...
 නම් සොරෙකැ, ලෙහෙමුඩු අත්...

## 6. උඩු කොමාව ’

1. අක්ෂර ලෝපය දැක්වීම සඳහා යෙදේ.

   උදා:- නිසි පුළුලු’කුළ රිය සක’යුරු තිසර තන

## 7. යුගළ උඩු කොමා “ ”

1. උද්ධෘත පාඨ දැක්වීමේ දී යෙදේ.

   උදා:- “ඉක්බිති මහා බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට සතුටුව බණ කියා දශ රාජ ධර්මයෙන් අනුශාසනා කළහ.”

   “අමා රසයට වැඩි
   රසයෙක් නො මැත සුරන් බුදිනා
   ඊටත් වැඩිය රසෙකි
   තමා දරුවන් ඈනූ සුබොජුන්”

2. ප්‍රකෘති භාෂණ දැක්වීමේදී යෙදේ.

   උදා:- “මම නොබිය ව ඊට මුහුණ දෙමි” ඇය කීවා ය.

## 8. තනි උඩු කොමා ‘ ’

1. අවධාරණය කළ යුතු පදයක් දැක්වීමේදී යෙදේ

   උදා:- මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ ‘ගම්පෙරළිය’ නවකතා ඉතිහාසයේ සන්ධිස්ථානයකි.

2. උද්ධෘත පාඨයක අන්තර් ප්‍රකාශයක් දැක්වීමේදී යෙදේ.

   උදා:- “... නන්ද කුමරු ද බුදුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ‘පාත්‍රය හැර ගත මැනව’යි නො කියා රජගෙන්...”

## 9. කෙටි ඉර -

1. පදාන්තර සම්බන්ධය දැක්වීම සඳහා යෙදේ.

   උදා:- ඉගෙනීම සඳහා දිවා-රාත්‍රී දෙකෙහි ම වෙහෙසෙන්න.

2. කාලාන්තර සම්බන්ධය දැක්වීම සඳහා යෙදේ.

   උදා:- රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමි (1852-1918)

3. පරිච්ඡේදාන්තර සම්බන්ධය දැක්වීම සඳහා යෙදේ.

   උදා:- කාව්‍යශේඛරයේ 10-20 පරිච්ඡේද

4. අක්ෂරාන්තර සම්බන්ධය දැක්වීම සඳහා යෙදේ.
උදා:- අනුරාධපුරය, පොළොන්-
නරුව, දඹදෙණිය

5. ගීයක පාද වෙන් කිරීමේදී යෙදේ.
උදා:- සැරද සුල'කළ'කුරු - මියුරු තෙපලෙන් රඳනා
රජකුල රහස මැතිනිය - සියනිහි සැලළිහිණි සඳ

6. මුල-අග, සිට-දක්වා සම්බන්ධය දැක්වීමේදී යෙදේ.
උදා:- තරග අංක 1-20 දක්වා අය මෙහි එන්න.
කෑගල්ල-නාවලපිටිය අතර දුර සැතපුම් 36කි.

## 10. කඩ ඉර ------

1. මෙය ද ඌනත්වය දැක්වීම සඳහා යෙදේ.
උදා:- සේනකාදි වූ පණ්ඩිතවරු සතර ------ මහත් වූ
කෝලාහල ශබ්දය අසා කුමන ------

## 11. ඇල ඉර /

1. විකල්ප ප්‍රකාශ දැක්වීම සඳහා යෙදේ.
උදා:- ගරු ස්වාමීන්වහන්ස/ මහත්මයාණෙනි/ මහත්මියනි
බ්‍රාහ්මණ/ ක්ෂත්‍රිය/ වෛශ්‍ය/ ශුද්‍ර

## 12. හර්ෂාදි ලකුණ !

1. හර්ෂය දැක්වීම සඳහා යෙදේ.
උදා:- අහා! බොහොම අගෙයි

2. ප්‍රාර්ථනය දැක්වීම සඳහා යෙදේ.
උදා:- චිර ජීවනය වේවා!

3. විධානය දැක්වීම සඳහා යෙදේ.
උදා:- යමවු! වරෙවු! නැගිටිවු! නොපියවු! දෙඇස

4. ශෝකය දැක්වීම සඳහා යෙදේ.
උදා:- අහෝ! විපතක මහත

5. සතුට දැක්වීම සඳහා යෙදේ.
උදා:- ලැබුණා! ලැබුණා! මැණිකක් ලැබුණා!

## 13. ප්‍රශ්නාර්ථ ලකුණ ?

1. ප්‍රශ්නාර්ථ වාක්‍යයක අවසානයේ යෙදේ.
   උදා:- මේ අඹ ගස හැර තවත් අඹ ගස් තිබේ ද?

2. සැකයක් සටහන් කිරීම සඳහා වරහන් තුළ යෙදේ.
   උදා:- ඇය උසස් පෙළ විභාගයට 2010(?) පෙනී සිටි බව මට පැවසුවා ය.

## 14. කාක පාදය ^

1. අත්හැරුණු අකුරු දැක්වීම සඳහා යෙදේ.
   උදා:- මණ්ඩ(ලි)^ය , සූර්යග්‍ර(හ)^ණය

2. අත්හැරුණු පද දැක්වීම සඳහා යෙදේ.
   උදා:- ආඛ්‍යාත පදයේ(මූලය)^ධාතු ප්‍රකෘතිය යි.

3. අත්හැරුණු වාක්‍ය දැක්වීම සඳහා යෙදේ.
   උදා:- වැලිමීයෝ ස්වභාවයෙන් ම අන්ධ ය. එහෙත් එක් වැලි මීයෙක් උගෙ ඇස් පෙනෙන බව මටට කීවේය. ඌ පිරික්සීම සඳහා උගෙ මව කට්ටකුමංජල් කැටයක් දී 'ඒ කුමක් ද'යි ඇසුවාය.(ගලකැ'යි ඌ පිළිතුරු දුනි.)^එවිට මව කතා කරමින් 'පුතේ උඹේ ඇස් නොපෙනෙනවා පමණක් නොව උඹේ ඉවත් නැති වී ගිහින්' යයි කීවා ය.

## 15. වරහන ( )

1. අවශ්‍ය සේ පෙනෙන වචනයක් වෙන් කර දැක්වීම සඳහා යෙදේ.
   උදා:- බොහෝ ඇසූ පිරූ තැන් ඇති (බහුශ්‍රැත) බව ගැටලු නිරාකරණයට පහසු ය.

2. අවශ්‍ය සේ පෙනෙන වාක්‍ය ඛණ්ඩයක් වෙන් කර දැක්වීම සඳහා යෙදේ.
   උදා:- මහාචාර්යවරයා පෙරදිග කාව්‍ය සම්ප්‍රදාය පිළිබඳ (බටහිර කාව්‍ය සම්ප්‍රදාය ගැන ද, කරුණු දක්වමින්) හරවත් දේශනයක් කළේ ය.

3. අවශ්‍ය සේ පෙනෙන වාක්‍යයක් වෙන් කර දැක්වීම සඳහා යෙදේ.
   උදා:- හොඳ කලා කෘතියක් කියවන සහෘදයා අපූරු ආස්වාදයක් ලබයි. (පෙර නොවූ ප්‍රබෝධවත් සිතිවිලි ඇත්තෙක් බවට පත් වෙයි.) එවැනි ආස්වාදයක් ලැබෙන්නේ රසඥතාව ඇති විට ය.

4. අවශ්‍ය සේ පෙනෙන වාක්‍ය කීපයක් වෙන් කර දැක්වීම සඳහා යෙදේ.

උදා:- ගීතය අනිවාර්යයෙන් ම සංගීතමය අත්දැකීමක් ලෙස (මෙයින්, ගීතය ගායනය සඳහා ම වෙන් වූවක් බව පැහැදිලි ය. එමෙන් ම එය හුදෙක් පාඨක අත්දැකීමක් නොවන බව ද ප්‍රකට වෙයි.) රසිකයන් අතරට යන ශ්‍රව්‍ය ගෝචර කලා මාධ්‍යයකි.

5. නාට්‍ය පිටපතක රංග විධාන දැක්වීමේදී යෙදේ.

උදා:- ඇමැතිය, කිමෙක් ද රූං යන අනුකරණය? (විස්මයෙන්)

## 16. නිරුක්ති ලකුණ >

1. විසන්ධිය, සන්ධියෙන් නිපන් බව දැක්වීමේදී යෙදේ.

උදා:- පින් + ඇති > පිනැති
සුර + අසුර > සුරාසුර

2. සමාස පදය, සමාස විග්‍රහයෙන් නිපන් බව දැක්වීමේදි යෙදේ.

උදා:- ගම් ද බිම් ද > ගම්බිම්
සහසක් ඇස් ඇතියේ > සහසැස්

3. ක්‍රියා පදය, ධාතු ප්‍රත්‍යයෙන් නිපන් බව දැක්වීමේදී යෙදේ.

උදා:- නට + යි > නටයි
කර + ව + ඊමි > කරවමි

4. නාම පදය, ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යයේ එකතුවෙන් නිපන් බව දැක්වීමේදී යෙදේ.

උදා:- මිනිස් + ආ > මිනිසා
ගොන් + උන් > ගොනුන්

5. තද්ධිත පදය නාම මූලය හා තද්ධිත ප්‍රත්‍යය එකතුවී නිපන් බව දැක්වීමේදී යෙදේ.

උදා:- තොට + ඉ > තොටි
නගර + ඉක > නාගරික

6. කෘදන්ත පදය ක්‍රියා මූලය හා කෘදන්ත ප්‍රත්‍යය එක් ව නිපන් බව දැක්වීමේදී යෙදේ.

උදා:- කර + නු > කරනු
ලිය + උම් > ලියුම්

7. පදයක නිරුක්තිය (විකාශනය වූ ආකාරය) දැක්වීමේදී යෙදේ.

උදා:- වාපි > වපි > වවි > වෙව > වැව
සංවත්සර > සංවච්චර > සවරජ > හවරජ > හවුරුජු > හවුරුදු > අවුරුදු

★ මෙම ලකුණ පැති දෙකට ම යෙදිය හැකි ය. එහිදී විවෘත පැත්ත විස්තාරණය වී ඇති පැත්තට තිබිය යුතු ය.

උදා:- ගඟ + වතුර > ගංවතුර
ගංවතුර < ගඟ + වතුර

## 17. ධාතු සූචකය √

1. ක්‍රියා මූලය හෙවත් ධාතුව දැක්වීමට යෙදේ.

උදා:- √බල
√නළව
√පතුර

2. ගණිත කාර්යවල වර්ග මූලය දැක්වීමේදී යෙදේ.

උදා:- $\sqrt{16} = 4$
$\sqrt{64} = 8$
$\sqrt{81} = 9$

## 18. කුණ්ඩලිය ෴

පැරණි පුස්කොළ ලේඛන සම්ප්‍රදායේ දක්නට ලැබුණු විරාම ලකුණකි කුණ්ඩලිය. වාක්‍යාවසානය සඳහා මෙය භාවිත කර ඇත. කුණ්ඩලිය යන්නෙහි අර්ථය නාග යන්න යි. නාගයකුගේ හැඩය මෙහි ඇති නිසා මීට කුණ්ඩලිය යන නම යෙදී ඇත. කුණ්ඩලිය යෙදී ඇති ආකාර තුනකි.

1. වාක්‍යාවසානයේ ෴
2. පරිච්ඡේදාවසානයේ ෴ ෴
3. ග්‍රන්ථාවසානයේ ෴ ෴ ෴

## 19. තරු ලකුණ ✶

1. අධෝලිපියකින් විස්තර සැපයෙන බව දැක්වීමට යෙදේ.

උදා:- සිදත් සඟරාව පතිරාජ පරිවේණාධිපති වෛදේහ නම් තෙරුන් විසින්* රචනා කරන ලද'යි බොහෝ විචාරකයින්ගේ මතය යි.

✶ මෙය අනෝමදස්සි නම් තෙර කෙනෙකුන් විසින් කරන ලද'යි තවත් මතයක් පවතී.

2. ලේඛනයක සංක්ෂිප්ත කරුණු වශයෙන් දක්වන විටදී ද තරු ලකුණ යෙදේ.

උදා:- මහින්දාගමනය නිසා ලක්දිව ඇති වූ නවෝදය පැතිකඩ කීපයක් ඔස්සේ සිදු වූ බව පැහැදිලි ය. එනම්

✶ ආගමික වශයෙන් වූ නවෝදය
✶ දේශපාලනික වශයෙන් වූ නවෝදය
✶ සංස්කෘතික වශයෙන් වූ නවෝදය
✶ සමාජමය වශයෙන් වූ නවෝදය
✶ ආර්ථික වශයෙන් වූ නවෝදය

## 20. පෙයයාලම -පෙ-

පෙර පරිදි ම නැවතත් දැක්විය යුතු පාඨයක් බව ඇඟවීමට මෙම ලකුණ යෙදේ.

උදා:- මහණෙනි, රූපය අනිත්‍ය යි, දුක යි, අනාත්ම යි.
වේදනාව අනිත්‍ය යි, දුක යි, අනාත්ම යි. සඤ්ඤාව -පෙ-
සංඛාරය -පෙ- විඤ්ඤාණය -පෙ-

## 21. සමාන ලකුණ =

1. සමානාර්ථ පද දැක්වීමේදී යෙදේ.
   උදා:- සහස් නෙත = සක්‍රයා

3. ගණිත කාර්යවල දී යෙදේ.
   උදා:- 3 x 2 = 6
   5 - 2 = 3
   15 ÷ 3 = 5
   3 + 2 = 5

## ක්‍රියාකාරකම 1

**පහත දැක්වෙන පාඨ සුදුසු විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.**

1. මහෞෂධ පණ්ඩිතුමා දේවයන් වහන්ස බිය නොවන්න සතුරාගෙන් බේරී පලා යාමට සුදුසු පියවර මම ගතිමියි කීවේය

2. ඒ සිංහ ධේනුවට කවදාවත් එක පැටවකුට වඩා නොලැබෙන හෙයින් දිනක් නරි දෙනක් සිංහ දෙනකට අපහාස කළා ය ඔව් එකා තමයි එහෙත් ඌ සිංහයෙකැ යි සිංහ දෙන පිළිතුරු දුන්නා ය

3. විදුහල්පතිතුමනි පාසල් ක්‍රීඩාංගණය ප්‍රමාණවත් නොවන නිසා මෙවර ක්‍රීඩා උත්සවය ඉහළවෙල ක්‍රීඩාංගණයේදී පවත්වමු ද

4. සමස්ත ලංකා පාරිවේණික තරග සඳහා ඔබ පැමිණෙන විට බසය දුම්රිය පෞද්ගලික ප්‍රවාහනය යොදාගත යුතු අතර ආපසු යද්දී මරදාන වේයන්ගොඩ මීරිගම පොල්ගහවෙල රඹුක්කන පසු කරමින් දුම්රියෙන් ගමන් කරන්නට වග බලා ගන්න

5. වෛද්‍යවරයාගේ නිර්දේශය වූයේ රාත්‍රී ඖෂධ මාත්‍රාව 2 1 අනුපාතයටත් උදේ ඖෂධ මාත්‍රාව 3 2 අනුපාතයටත් ගත යුතු බව යි

6. අර අර බලන්න එළිය පාත් වෙනවා ඉස්සෙනවා ආයිත් ගමන් කරනවා

7. දූපතේ ඔය පැත්තේ අවතාරයක් ඉන්නවා යයි පොඩිගමරාල අපට කිව්වා මතක ද ජින්නා මගෙන් ඇසුවේ ය

8. ගාත්‍රාක්ෂර ගතකුරු විස්සක් ඇති බව සිදත් සඟරාවේ සඳහන් වේ.

9. ඇඹුල් රස පලතුරුවල සී විටමින් බහුලව ඇත
නිදසුන් නාරං දොඩං ජම්බෝල සිදරං

## ක්‍රියාකාරකම 2

- **පහත දැක්වෙන විරාම ලක්ෂණ යෙදෙන අයුරු දැක්වීම සඳහා වාක්‍යය බැගින් ලියන්න.**

1. , .
2. , ? .
3. “ ” .
4. - ? .
5. ‘ ’ .
6. : .
7. / / .
8. , ........ .
9. ! ; .
10. , ^ ^ .

### සුභාෂිත

උට්ඨාන වීර්යය සාර්ථකත්වයේ රහස යි.

### සුචින්තන

කාර්ය බහුල මීමැස්සාට ශෝක වීමට හෝ පසුතැවීමට කාලයක් නැත.

# 12

# ප්‍රායෝගික ලේඛන

දෛනික ජීවිතයේදී විවිධ අවස්ථාවල, විවිධ අරමුණු මත භාවිත කෙරෙන නා නා විධ ලේඛන පවතියි. ප්‍රායෝගික ලේඛන ලෙස හැඳින්වෙන්නේ ඒවා ය. අප එදිනෙදා කටයුතු කරද්දී විවිධාකාර සන්නිවේදන කාර්යයන් සඳහා යොමු විය යුතු ය. ඒ බොහෝ අවස්ථාවන්හි භාවිත කරන ලේඛන විධිමත් ක්‍රමවේදයක් මත සම්මත ආකෘතියකට අනුව සැකසී තිබිය යුතු ය. එසේ නොවන්නේ නම් ඉදිරිපත් කරන දෙය නිවැරදි ආකාරයෙන් සන්නිවේදනය නොවේ. එවිට එයින් අපේක්ෂිත කාර්යය ක්‍රමවත්ව සිදු නොවේ.

අප එදිනෙදා භාවිතයට ගන්නා ප්‍රායෝගික ලේඛන අතරින් පෞද්ගලික ලිපි, සුබපැතුම්පත්, ආරාධනා පත්‍ර, න්‍යාය පත්‍ර, ආකෘති පත්‍ර, රාජකාරී ලිපි, ඔබ මූලික ශ්‍රේණිවලදී අධ්‍යයනය කරන්නට ඇත. මෙම පාඩමෙන් අපේක්ෂා කරන්නේ පුවත්පත් වාර්තා, දැන්වීම් සහ අත්පත්‍රිකා, කතුවැකි, තීරුලිපි සහ මෙමෝ පත් පිළිබඳව අවබෝධයක් ලබා දීම යි.

# පුවත්පත් වාර්තා

දේශීය මෙන් ම ජාත්‍යන්තර වශයෙන් වැදගත්කමක් ඇති දෛනික සිදු වීම් පිළිබඳව මූලික අවධානය යොමු කරමින් මුළු මහත් සමාජයට ම අදාළ සිදු වීම් සම්බන්ධ වාර්තා සහ ප්‍රවෘත්ති පදනම් කරගෙන විවිධ විශේෂාංග සංග්‍රහ කරන ලද, දිනපතා, සතිපතා, හෝ මාසිකව අඛණ්ඩව මුද්‍රණය කරනු ලබන ලේඛන විශේෂයක් ලෙස පුවත්පත් හැඳින්විය හැකි ය.

ප්‍රවෘත්ති ලෙස අදහස් කරන්නේ කුමන හෝ තැනකදී සිදු වන වැදගත් සිදු වීම් පිළිබඳ තොරතුරු ය. ප්‍රවෘත්ති යන්නෙහි ඉංග්‍රීසි වචනය “NEWS” යන්න යි. North (උතුර), East (නැගෙනහිර), West (බටහිර), South (දකුණ) යන වචනවල මුල් අකුරුවලින් එය සෑදී ඇත. එයින් අදහස් වන්නේ සතර දිශාවේ පැතිරුණු තොරතුරු, ප්‍රවෘත්ති නම් වන බව යි. පුවත්පතකින් සිදු වන්නේ මේ තොරතුරු, වාර්තා සංග්‍රහ කොට දැක්වීමකි.

පුවත්පතක සුවිශේෂ අංගය වන්නේ ප්‍රවෘත්ති වාර්තාව යි. එය කාලීන වැදගත්කමකින් යුක්ත විශේෂ සිදු වීමක් විය යුතු ය. "**සමාජයේ වැඩි දෙනාගේ අවධානයට ලක් විය යුතු නමුත් මෙතෙක් එවැනි අවධානයකට ලක් නොවූ වැදගත් තොරතුරක්**" ප්‍රවෘත්තියක් ලෙස සරලව නිර්වචනය කළ හැකි ය. ඒ අනුව කාලීන වශයෙන් වැදගත්, නවතාවෙන් යුක්ත තොරතුරක් වීම, ප්‍රවෘත්ති වාර්තාවක තිබිය යුතු මූලික ලක්ෂණයකි. එවැනි පුවත්පත් වාර්තාවක තිබිය යුතු මූලික ලක්ෂණ කීපයකි.

- විශ්වසනීයත්වය
- නිරවද්‍යතාව
- සංක්ෂිප්තභාවය
- මාතෘකාව හා ඒකාබද්ධතාව
- අපක්ෂපාතීව සත්‍ය කරුණු දැක්වීම ආදිය ඉන් ප්‍රධාන වේ.



## පරිපූර්ණ භික්ෂුවක් බිහි කිරීමේ වගකීම ඇත්තේ පිරිවෙණට.
(කෑගල්ල සමූහ වාර්තාකරු චම්පික මේසසූරිය)

2016 කෑගල්ල දිස්ත්‍රික් අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගාවලියේ ජයග්‍රාහකයින් වෙත ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය 2107 අප්‍රේල් මස 03 වන දින කෑගල්ල ගලිගමුව ශ්‍රී චන්ද්‍රානන්ද මහ පිරිවෙන් ප්‍රධාන ශාලාවේදී අතිශය උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. මෙදින ප.ව. 1.00 ට පමණ ඇරඹි උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ නායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ය. උන් වහන්සේ අදහස් දක්වමින් ප්‍රකාශ කළේ අනාගත ලෝකයට ගැළපෙන ආකාරයේ අධ්‍යාපනයකින් සහ හැකියාවන්ගෙන් පරිපූර්ණ භික්ෂු පරපුරක් ගොඩනැගීමේ වගකීම පිරිවෙණ සතු වන බව යි. ජාතියක ඉදිරිගමන සඳහා මගපෙන්වීම අතීතයේ සිට ම යතිවරයන් වහන්සේලාගේ වගකීම වුවත් වර්තමානයේදී භික්ෂු ප්‍රතිරූපයට හානි වන අන්දමේ මැදිහත් වීම් නිසා භික්ෂුව සතු සමාජ ගෞරවය හීන විය හැකි බැවින් සමාජ නායකත්වයට සුදුසු ප්‍රෞඪ යතිවරුන් බිහිකිරීමට පිරිවෙණ මුල් විය යුතු බව උන්වහන්සේ අවධාරණය කළහ.

පසුගිය වසරේ සමස්ත ලංකා ජයග්‍රහණ ලද අයගේ කථික, ගායනා ඉදිරිපත් කිරීම නිසා උත්සව සභාව ප්‍රබෝධවත් විය. මෙම අවස්ථාවට සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා, දිස්ත්‍රික් ලේකම්තුමා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ඇතුළු ගිහි පැවිදි ප්‍රභූ විශාල පිරිසක් පැමිණ සිටියහ.

## පුවත්පත් වාර්තාවකදී අනුගමනය කළ යුතු ප්‍රධාන කරුණු

මේ සඳහා ජනමාධ්‍යවේදීන් භාවිත කරන ජනප්‍රියතම ක්‍රමවේදයක් වන්නේ W5 සහ H සංකල්පය යි. එනම් W අකුරින් ආරම්භවන ප්‍රශ්න පහකට සහ H අකුරින් ආරම්භ වන එක් ප්‍රශ්නයකට පිළිතුරු ලැබෙන සේ වාර්තාව පෙළගැස්වී තිබීම යි. ඒ අනුව

| | | |
|---|---|---|
| 1. WHAT | (කුමක් ද?) | සිදු වී ඇත්තේ කුමක් ද? |
| 2. WHO | (කවුද?) | ඒ සඳහා මුල් වී ඇත්තේ කවුද? |
| 3. WHEN | (කවදා ද?) | එය සිදු වී ඇත්තේ කවදා ද? |
| 4. WHERE | (කොහේ ද?) | එය සිදු වූයේ කොහේ ද? |
| 5. WHY | (ඇයි?) | එය සිදු වූයේ ඇයි? කවර හෙයින් ද? |
| 6. HOW | (කෙසේ ද?) | එය සිදු වූයේ කෙසේ ද? |

ඇතැම් පුවත්පත් වාර්තාවල දිනය සඳහන් නොවන අතර එය කාලීන වශයෙන් උණුසුම් පුවතක් බව අවධාරණය වන සේ කරුණු ගළපා තිබිය යුතු ය.

## වාර්තාකරණයට සුදුසු විශේෂ අවස්ථා

- වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සව.
- කලා උළෙල.
- භාෂා හා සාහිත්‍ය තරග.
- ඒ ඒ විෂයයන් සඳහා පත්වන දින.
- විවිධ සැමරුම් උත්සව.
- වෙනත් සුවිශේෂ සිදු වීම්.

ශ්‍රී චන්ද්‍රානන්ද මහ පිරිවෙණේ පැවති ත්‍යාග හා සහතිකපත් ප්‍රදානෝත්සවය පිළිබඳ කරුණු රාශියක් ඉහත වාර්තාවෙන් කියැවෙයි.

- ඔබ පිරිවෙණෙහි පැවැත්වූ සිංහල භාෂා දින සැමරුම් උත්සවය පිළිබඳ පුවත්පතක පළකිරීමට වාර්තාවක් ලියන්න.

- විවිධ උත්සව හා සම්බන්ධ වාර්තා 5ක් එකතු කරගන්න. ඒවායේ අන්තර්ගත කරුණු අනුව W5 සහ H ආකෘතියට අනුව ඒ ඒ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


## දැන්වීම් පත්‍රිකා

කිසියම් තොරතුරක් පොදුවේ දැනුම් දීම සඳහා භාවිත කරන නිශ්චිත ආකෘතියකට අනුව සැකසූ ලිඛිත පණිවිඩය දැන්වීම් ගණයට අයත් වේ. වර්තමානයේ ප්‍රධාන වන්නේ වෙළෙඳ දැන්වීම් වුවත් කිසියම් කාලීන තොරතුරක් දැනුම් දීමේ අරමුණින් ද දැන්වීම් පළ කළ හැකි ය.

### දැන්වීම්




### අත්පත්‍රිකා



**දැන්වීමක, අත් පත්‍රිකාවක පොදු ආකෘතිය මෙසේ දැක්විය හැකි ය.**

1. ආකර්ෂණීය මාතෘකාවක් තිබිය යුතු ය.
2. ප්‍රධාන කරුණු අවධාරණය වන සේ සැකසිය යුතු ය.
3. දැන්වීම කරන්නේ කවුද යන්න අවසානයේ තිබිය යුතු ය.
4. සිත්කලු නිමාවකින් සමන්විත විය යුතු ය.
5. සිරස්තල, දින, ස්ථාන ආදි ප්‍රධාන කරුණු කැපී පෙනෙන ලෙස දක්වා තිබිය යුතු ය.
6. සියලු කරුණු සංක්ෂිප්තව, කෙටි කාලයක් තුළදී කියවිය හැකි ලෙස සංවිධානය වී තිබිය යුතු ය.

වර්තමාන දැන්වීම් කලාවේ බහුලව භාවිත වන **AIDA MODEL** අයිඩා ආකෘතිය මෙසේ ය.

| | | | | |
|---|---|---|---|---|
| **A** | - | **ATTENTION** | - | අවධානය / ආකර්ෂණය |
| **I** | - | **INTEREST** | - | ප්‍රයෝජන / ලාභය |
| **D** | - | **DESIRE** | - | උචිත බව / රුචිකත්වය |
| **A** | - | **ACTION** | - | ක්‍රියා කිරීම |

දැන්වීමක් හෝ අත් පත්‍රිකාවක් දුටු කෙණෙහි නැවතත් බැලිය යුතු යැයි හැඟෙන සේ එය ආකර්ෂණීය විය යුතු ය. එමෙන් ම එය කියවන, දකින කෙනාට ප්‍රයෝජනවත් විය යුතු ය. එසේ ම එය කියවීමට, දැකීමට කැමැත්තක් ඇති විය යුතු ය. ඒ සඳහා උචිත විය යුතු ය. අවසානයේ ඒ දැන්වීමට අනුව සාර්ථක ක්‍රියාකාරීත්වයක් ඇති විය යුතු ය.

## කතුවැකි

පුවත්පතක නම්, ප්‍රධාන කතුවරයා විසින් ද සඟරාවක නම්, සංස්කාරක මණ්ඩල ප්‍රධානියා හෝ සාමාජිකයකු විසින් ද කතුවැකිය හෙවත් කර්තෘ වාක්‍ය ලියනු ලබයි. කාලීන ප්‍රස්තුතයක් කේන්ද්‍ර කර ගෙන තම අදහස, ස්ථාවර හෝ ආකල්පය සමාජගත කිරීම මෙහි අපේක්ෂාව යි.

- සරල භාෂා භාවිතය
- ව්‍යක්ත සහ හරවත් අදහස් ප්‍රකාශනය
- අපක්ෂපාතී විවරණයක් වීම
- ප්‍රස්තුතය, සමාජමය අවශ්‍යතාවක් වීම, කතුවැකියක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ යි. විශේෂාංග ලිපි, තීරුලිපි පුවත්පතක හෝ සඟරාවක එකකට වැඩි ප්‍රමාණයක් ඇතුළත් වුව ද ඒවායේ ඇතුළත් විය යුත්තේ එක් කතුවැකියක් පමණි.


# මත් ටොෆි විකුණු වෙළෙන්දාට වෙළෙඳ සමාජයෙනුත් දඬුවම් ඕනෑ

ලංකාදීප

අන්තර්ජාලයේ ප්‍රථම සිංහල පුවත්පත

www.lankadeepa.lk

2017 ඔක්තෝබර් මස 18 වැනිදා බදාදා

# තීරුලිපි

කතුවැකියක ඉදිරිපත් වන්නේ අදාළ පුවත්පතේ හෝ සඟරාවේ සමස්ත ස්ථාවරය යි. නමුත් තීරුලිපියක අන්තර්ගත වන්නේ ලේඛකයාගේ පෞද්ගලික අදහස යි. කාලීන වශයෙන් වැදගත් සේ ම සමාජ ආකර්ෂණය දිනාගත් ප්‍රස්තුතයක් පදනම් ව තිබීම මෙහි මූලික ලක්ෂණයකි. මෙහි භාෂා ශෛලිය, වචන භාවිතය, රචනා ක්‍රමය ඒ ඒ තීරු ලිපියට ආවේණික ව සකස් වෙයි.


ජනතාවට දර්ශනය

කාලය හා අවකාශය

රුවන් ෆර්ඩිනැන්ඩු

දිනපතා හෝ සතිපතා හෝ මාසික පුවත්පතක දීර්ඝ ලිපිමාලාවක් ලෙස තීරුලිපි පළ වුව ද ඒවායේ අඛණ්ඩ සම්බන්ධතාවක් දැකිය නොහැකි ය. එහෙත් ඇතැම් තීරුලිපි එක විෂය පථයකට අයත් වුවත් සමහර ඒවා ඒ ලිපියට පමණක් ආවේණික වූ කරුණුවලින් යුක්ත වේ. තීරු ලිපියක ලේඛකයා කෙටි නමකින් හෝ ආරූඪ නාමයකින් පෙනී සිටීම දැකිය හැකි වුවත් ඇතැම් විට සම්පූර්ණ නමින් ම පෙනී සිටින අවස්ථා ද ඇත.

“කොලම්” Column යනු තීරුව යි. එය පුවත්පත් භාෂාවේ පාරිභාෂික පදයක් ලෙස “කොලම්” ලෙස භාවිත වේ. කොලම් යනු ද තීරුලිපියට යෙදෙන සමාන්‍ය ව්‍යවහාර වචනයකි. මෙය එලෙස හඳුන්වන්නේ තීරු වශයෙන් මුද්‍රණය වීම මීට ආවේණික ලක්ෂණ වන බැවිනි.

## මෙමෝ පත්

ඉංග්‍රීසි භාෂාවෙන් **Memorandom** ලෙස හැඳින්වෙන්නේ යම් ආයතනයක් තුළ භාවිත කරන ආභ්‍යන්තරික සන්නිවේදන ක්‍රමයකි. ව්‍යවහාරයේදී මෙය මෙමෝ පත/ සිහිපත යන නම්වලින් හැඳින්වේ. කිසියම් නිශ්චිත කොටසකට යම් තොරතුරක් දැනුම් දීම මෙහි මූලික පරමාර්ථය යි. සුවිශේෂ ගැටලුවක්, තීරණයක්, දිරිගැන්වීමක්, ඇගයීමක් මෙහි අන්තර්ගත විය හැකි ය.

වර්තමානයේ භාවිත කරන මෙමෝ පත ආකෘති කිහිපයක් තිබෙන අතර එයින් එක් ආකෘතියක් පහත දැක් වේ.

**<u>මෙමෝ පත.</u>**

යොමුව : (ලබන්නා, නම සහ තනතුර)

වෙතින් : (යවන්නා, නම සහ තනතුර)

කාරණය : ..............................................

දිනය : ..............................................

පිටපත් : (පිටපත් ලබන අයගේ නම් තනතුරු)

පණිවුඩය :

මෙහිදී අදාළ පණිවුඩය සරල ව, සංක්ෂිප්ත ව හා පැහැදිලි ව දැක්විය යුතු ය.

### ක්‍රියාකාරකම 1

1. පුවත්පත් කීපයක කතුවැකි එකතු කොට ඒවායේ සමාන අසමානතා සාකච්ඡා කරන්න.

2. ඔබ ආයතනයේ බිත්ති පුවත්පතට අඛණ්ඩව පළ කිරීමට තීරුලිපියකට සුදුසු විෂය පථයක් හෝ වෙනත් ප්‍රස්තුතයක් සාකච්ඡා කරන්න. ඊට සුදුසු නමක් සහ ප්‍රමාණය තීරණය කරන්න.

3. එම තීරු ලිපියේ කොටස් කීපයක් නිර්මාණය කරන්න.

4. ඔබ පිරිවෙණේ පැවැත්වීමට නියමිත ආධ්‍යාපනික ප්‍රදර්ශනය පිළිබඳ දැනුම් දෙමින් ප්‍රදර්ශනය කරන දැන්වීම නිර්මාණය කරන්න.

5. සුදුසු ප්‍රස්තුතයක් තෝරා ගෙන ඊට උචිත අත්පත්‍රිකාවක් නිර්මාණය කරන්න.

## සුභාෂිත

**"ආත්මනඃ ප්‍රතිකූලානි**
**පරෙශාං න සමාචරෙත්"**

තමන්ට පිළිකුල් දෑ අනුනට නොකරන්න.

## සුචින්තන

අතීතයේ කළ වරදට දිය හැකි හොඳ ම සමාව දීම නම් අනාගතය සඳහා නිවැරැදි මංපෙත් හෙළි කර ගැනීම යි.

# 13

# වාක්‍ය රචනය

ලේඛන කාර්යයේ ඒකපාර්ශ්වීය අවශ්‍යතාවක් වන්නේ ප්‍රකාශ කරන කරුණු මනා සංවිධානයකින් යුතුව පැහැදිලිව ඉදිරිපත් කිරීම යි. එහිදී ශිෂ්‍යයාගේ කරුණු විශ්ලේෂණ ශක්‍යතාව මැන බැලීමක් ද කළ හැකි ය. එමෙන් ම වියත් ලේඛකයකු බිහි කිරීමේ පූර්වාදර්ශ සැපයෙන එක් අංශයක් ලෙස ද වාක්‍ය රචනය හැඳින්විය හැකි ය. තමා සතු සියලු භාෂා කුසලතාවන්ගේ සම්පිණ්ඩනය වාක්‍ය රචනය තුළින් පෙන්විය හැකි ය. එයින් ඔහුගේ භාෂා කෞශල්‍යය මනාව විශද වන අතර අදහස් නිරවුල්ව ප්‍රකාශ කිරීම සඳහා ඔහු තුළ ඇති හැකියාව පැහැදිලි වේ.

## වාක්‍ය රචනය

**ලේඛන මාධ්‍යයෙන් අදහස් ප්‍රකාශ කිරීමේදී එක් නිශ්චිත කාරණයක් අරභයා ප්‍රකාශ කළ යුතු සම්පූර්ණ අදහස් නියමිත ප්‍රමාණයකට සම්පිණ්ඩනය කොට මනා ඒකාබද්ධතාවකින් යුතු ව කරනු ලබන ගද්‍යමය නිර්මාණය වාක්‍ය රචනය යි.**

යම්කිසි විෂය පථයකට හෝ මාතෘකාවකට උචිත පරිදි පෙළගස්වනු ලබන කරුණු තර්කානුකූල පදනමක් සහිත ව ස්වීයත්වයකින් යුතු ව ලියා දැක්වීම සාර්ථක වාක්‍ය රචනයක ස්වභාවය වේ. යම් රචකයකු භාවිත කරන භාෂාවේ ප්‍රබලත්වය අනුව ඔහු ඉදිරිපත් කරන කරුණුවල සාර්ථකත්වය රඳා පවතියි. කොතරම් කරුණු ප්‍රමාණයක් තිබුණ ද වාග් ශක්තියෙන් හීන අයකු අතින් සාර්ථක රචනාවක් නිර්මාණය විය නොහැකි ය. එසේ ම වාග් චාතුර්යයෙන් සුනිශිත, පිරුණු වාග් කෝෂයකට උරුමකම් කියන පුද්ගලයා රචනා කාර්යයේදී සාර්ථක අයෙක් වේ. ඒ අතර ම නිර්මාණාත්මක, නිරවද්‍ය සේ ම නිරවුල් භාෂා භාවිතයකින්, ස්වාධීන භාෂා ශෛලියකින් තම රචනාව ඉදිරිපත් කළ යුතු වේ. මෙහිදී භාෂා භාවිතයේ ශිල්පීය ලක්ෂණ කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු වෙයි.

- **අක්ෂර වින්‍යාසය**
- **පිල්ලම් භාවිතය**
- **පද බෙදීම**
- **විරාම ලක්ෂණ**
- **ව්‍යාකරණානුකූල නිරවද්‍යතාව**
- **ඡේද වෙන් කිරීම**
- **නිර්මාණාත්මක බව** ආදිය ඉන් ප්‍රධාන වේ.

වාක්‍ය රචනාවකට අත්‍යවශ්‍ය සාධකය වන්නේ කරුණු ඒකරාශී කර ගැනීම යි. ඒ සඳහා විෂයාන්තර පොත පත කියවීම, කාලීන සිදු වීම් පිළිබඳ අවදියෙන් සිටීම, නිර්මාණාත්මක පරිකල්පනය දියුණු කර ගැනීම, උසස් නිර්මාණ පරිශීලනය කිරීම ආදිය කළ හැකි ය. සාර්ථක වාක්‍ය රචනය වනාහි රසවත් සේ ම හරවත් සාහිත්‍ය නිර්මාණයක් ද වේ. සාර්ථක රචනයක් ලිවීමට අත්වැලක් සැපයීම මෙම පාඩමේ අරමුණ යි.

වාක්‍ය රචනා වර්ග පිළිබඳ 4 ශ්‍රේණියේදී ඔබ අධ්‍යයනය කරන්නට ඇත. මෙම පාඩමෙන් අවධානයට යොමු කරන්නේ රචනා නිර්මාණය පිළිබඳ ව තවත් පැතිකඩකි.

### මාර්ගෝපදේශිත රචනා

**ලබා දී ඇති මග පෙන්වීමක් අනුව හෙවත් යම් උපදේශයක් අනුව ලිවිය යුතු රචනාව මාර්ගෝපදේශිත රචනාවකි.**

> "අතීතයේ ලංකාව සහලින් ස්වයංපෝෂිත ව පැවතුණි. පැරණි ගොවියා සිය වගා කටයුතු කළේ පරිසර හිතකාමී ආකාරයට යි. එහිදී රසායනික ද්‍රව්‍ය පිළිබඳ ඔහු දැන සිටියේවත් නැත. රෝග පළිබෝධ පාලනය සඳහා කෙම්පහන් ක්‍රම යොදා ගත් අතර කාබනික පොහොර භාවිතයෙන් පස සරුකර ගති. ඒ නිසා ම නීරෝගී ජන සමාජයක් එකල විසූහ. නමුත් වර්තමාන ගොවීන් බීජවල සිට අස්වැන්න නෙළන තැන දක්වා ම රසායනික ද්‍රව්‍ය භාවිතයට හුරු වී ඇත. එය විවිධ ලෙඩරෝගවලට පාදක වෙති යි ප්‍රබල මතයක් ගොඩනැගී ඇත. සෞඛ්‍ය සම්පන්න හෙටක් උදෙසා රසායනික ද්‍රව්‍යයන්ගෙන් තොර පරිසර හිතකාමී ගොවිතැනක් ඇති කරමු."

ඉහත දැක්වූයේ රචනා නිර්මාණයට පාදක කරගත හැකි මග පෙන්වීමකි.

මෙම මග පෙන්වීම ඔස්සේ වාක්‍ය රචනයකට කරුණු සංවිධානය කිරීමේදී ඊට අවශ්‍ය අනුපිළිවෙළ අදාළ විස්තරයෙන් ම ලබා ගත හැකි ය. ඒ අනුව

- ලංකාව සහලින් ස්වයංපෝෂිත ව තිබූ බව
- එකල කෘෂිකර්මාන්තය රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් තොර වූ බව
- වර්තමානයේ කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතයට නැඹුරු වී ඇති බව
- එය සෞඛ්‍යයට බලපාන අයුරු
- රසායනික ද්‍රව්‍ය වෙනුවට කාබනික ද්‍රව්‍ය භාවිත කළ යුතු බව
- නිගමනය සහ සමාලෝචනය

යන කරුණු ඔස්සේ ඉහත මග පෙන්වීම ඇසුරින් වාක්‍ය රචනය පෙළගැස්විය හැකි ය. නිර්මාණාත්මක භාෂා ශෛලියක් උපයෝගී කරගෙන මනා සංවිධානයකින් හා ඒකාබද්ධතාවකින් රචනය ගොඩනැගීමට මෙවන් මාර්ගෝපදේශන නො මඳ පිටිවහලක් සපයයි.

## වාක්‍ය රචනයේ දී සැලකිය යුතු කරුණු

**★ මාතෘකාවක් යෙදීම**

මාර්ගෝපදේශිත රචනයේදී බොහෝ විට මාතෘකාව යෙදීම රචකයාට පැවරෙයි. එහිදී දී ඇති කරුණුවලට අදාළ පරිදි මාතෘකාවක් යෙදිය යුතු අතර එමගින් ඒ සියලු කරුණු ආවරණය වී තිබිය යුතු ය. එවැනි මාතෘකාවක්

- නිර්මාණාත්මක සහ ආකර්ෂණීය විය යුතු ය.
- කුතුහලය ජනිත කරන්නක් විය යුතු ය.
- අනවශ්‍ය පරිදි දීර්ඝ නොවිය යුතු ය.
- ව්‍යක්ත විය යුතු ය.

දී ඇති විස්තරයකට අදාළ ව මාතෘකාවක් තීරණය කිරීම සඳහා පහත නිදසුන් අධ්‍යයනය කරන්න.

පොල්, ලංකාවේ ප්‍රධාන අපනයන භෝගයකි. දකුණු පළාත ආශ්‍රිත වෙරළබඩ තීරයේ සරුසාර පොල්වතු දැකිය හැකි ය. පොල්ලෙලි අපගේ වැඩි අවධානයට යොමු නොවන්නක් වුවත් එයින් බොහෝ ප්‍රයෝජන ලද හැකි ය. කොහු කර්මාන්තය බොහෝ ලාභ ඉපයිය හැකි ස්වයං රැකියාවක් ද වේ. අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථිකය ශක්තිමත් කිරීමට කොහු ආශ්‍රිත නිෂ්පාදන හඳුන්වා දිය හැකි ය. එය විරැකියා ප්‍රශ්නයට ද විසඳුමකි.

ඉහත විස්තරයට ''**පොල් කෙන්දෙන් පණ කෙන්ද රකිමු**'' යන මාතෘකාව කොතරම් නිර්මාණශීලි දැ යි සිතා බැලිය හැකි ය.

**★ වාක්‍ය රචනයේ ආකෘතිය**

ප්‍රවේශය හෙවත් ආරම්භය

↓

ස්කන්ධය හෙවත් මාතෘකාවට අදාළ කරුණු දැක්වීම

↓

නිගමන සමාලෝචන මගින් අවසානය

★ **ප්‍රවේශය හෙවත් ආරම්භය** → සමස්ත රචනාවේ ම අගය තීරණය කෙරෙන ප්‍රධාන සාධයකි, එහි ආරම්භය. එනිසා ආරම්භක වාක්‍ය කිහිපය එය නිර්මාණාත්මක මෙන් ම ආකර්ෂණීය වීම වඩාත් වැදගත් වේ. අවශ්‍ය නම් ආප්තෝපදේශ, මාතෘකාව හා සම්බන්ධ උද්ධෘත පාඨ, නිර්වචන මීට යොදා ගත හැකි ය.

''**පණ මෙන් සුරකිමු ගහ කොළ**'' යන මාතෘකාවට අදාළ රචනයේ ආරම්භය හෙවත් ප්‍රවේශය මේ අකාරයට දැක්විය හැකි ය.

අහස නිල්වන් ය; මහ සයුර ද නිල්වන් ය; අප අවට පරිසරය පලාවන් ය. සිත නිවන, නෙත සනසන ඒ හරිත වර්ණය රැකෙන්නේ අප අවට ඇති ගහකොළවලිනි......

★ **ස්කන්ධය හෙවත් කරුණු දැක්වීම** → රචනයක හරය රැඳී තිබෙන්නේ මෙම කොටසෙහි ය. මාතෘකාවට අදාළ කරුණු මනා ඒකාබද්ධතාවකින් යුතු ව අනුපිළිවෙළට ගැළපිය යුතු ය. ඡේද වෙන් කිරීමේදී අන්‍යෝන්‍ය සම්බන්ධයක් තිබිය යුතු ය. මෙහිදී ප්‍රමාණාත්මක බව කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර පුනරුක්තියක් ඇති නොවීමට වගබලා ගත යුතු ය.

★ **නිගමන සමාලෝචන මගින් අවසානය** → වාක්‍ය රචනයෙහි අවසාන ඡේදය මේ සඳහා වෙන් කර ගත හැකි ය. ඉදිරිපත් කළ සියලු කරුණු සමාලෝචනය කරමින් අදාළ මාතෘකාව පිළිබඳ තම ස්වාධීන නිගමන සහ විනිශ්චයන් දැක්වීම රචනයේ අගය වැඩිවීමට හේතු වෙයි. එහෙත් මෙහිදී පක්ෂග්‍රාහී නොවී කරුණු දැක්වීම සාර්ථක රචකයෙකුගේ ලක්ෂණයකි. ඔබ එළඹෙන නිගමන සඳහා තහවුරු කිරීම් රචනා ස්කන්ධය තුළ නිරවුල් ව අන්තර්ගත වී තිබිය යුතු ය.

## වාක්‍ය රචනය සාර්ථක කරගැනීමට අවධානය යොමු විය යුතු කරුණු.

★ මාතෘකාවට අදාළ බව
★ යොදා ගෙන ඇති භාෂා ශෛලියේ ගුණාත්මක භාවය
★ ශිල්පීය දක්ෂතා
★ ප්‍රමාණය

### මාතෘකාවට අදාළ බව

යොදා ගත් මාතෘකාවට උචිත කරුණු රචනයේ අන්තර්ගගත විය යුතු ය. ඒ සඳහා කරුණු උකහා ගැනීමට විෂයාන්තර පොත පත පරිශීලනය, උසස් නිර්මාණ ඇසුරු කිරීම, පුවත්පත්, සඟරා, රූපවාහිනී, අන්තර්ජාල ආදී ජනමාධ්‍ය මගින් තොරතුරු රැස් කිරීම, දේශන සාකච්ඡා, සම්මන්ත්‍රණ ආදියට සහභාගිවීම බෙහෙවින් ඉවහල් වේ. එසේ උපයාගත් කරුණු මනා ඒකාබද්ධතාවකින් යුතු ව ක්‍රමවත් ව පෙළ ගැස්විය යුතු ය. රචනා සැකිල්ලක් සකසා ගැනීම පුනරුක්තිය ඇති නොවීමට බලපාන අතර මනා සංවිධානයකට උපකාරී වේ.

### යොදා ගෙන ඇති භාෂා ශෛලියේ ගුණාත්මක භාවය

රචනයේ අගය හෙවත් වටිනාකම තීරණය කෙරෙන්නේ එහි උපයුක්ත භාෂා ශෛලියේ ස්වභාවය මත යි. රචනාවේදී අමුතු භාෂාවක් යොදා නොගැනෙන අතර භාෂාව අමුතු ආකාරයට යොදා ගැනීමෙන් වඩාත් ආකර්ෂණීය කර ගත හැකි ය. උපමා, පිරුළු, ඉඟිවැකි, ජනකවි, ගීත කොටස්, ශ්ලෝක, ගාථා ආදිය උචිත පරිදි උද්ධෘත කර ගැනීම රචනයේ භාෂා ශෛලිය විචිත්‍රවත් කරයි. මෙහි දී රචකයා සතු වාක්කෝෂය ප්‍රබල ව බලපෑමක් ඇති කරයි.

## ශිල්පීය දක්ෂතා

මෙහිදී අවධානය යොමු කළ යුත්තේ,

- නිවැරැදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම
- අත්අකුරුවල පැහැදිලි බව
- විරාම ලක්ෂණ යෙදීම
- ඡේද වෙන් කිරීම
- ලේඛනයේ පිරිසිදු බව සහ පැහැදිලි බව යන කරුණු පිළිබඳව යි.

## ප්‍රමාණය

වාක්‍ය රචනය අනවශ්‍ය පරිදි දීර්ඝ නොවිය යුතු ය. මෙම ශ්‍රේණියේ ශිෂ්‍යයකුගෙන් අපේක්ෂා කරන්නේ වචන 250-300 අතර ප්‍රමාණයේ රචනාවකි. එබැවින් ඒ ප්‍රමාණයට අඩුවෙන් හෝ අතිශය ඉක්මවා ලිවීම නො කළ යුත්තකි.

සාර්ථක වාක්‍ය රචනය සාහිත්‍ය නිර්මාණයක් ද වේ. එය පාඨක ආකර්ෂණය දිනා ගත හැකි, පාඨකයා වෙහෙසට පත් නොවන, දැනුම හා අවබෝධය ලබා දෙන රචකයාගේ ස්වීයත්වය ප්‍රකට වන ලේඛනයක් විය යුතු ය.

## ක්‍රියාකාරකම 1

**පහත සඳහන් මාතෘකාවවලට අදාළ රචනා සැකිලි සකස් කරන්න.**

- දේශයේ සංවර්ධනය උදෙසා සහජීවනය
- ආත්ම සංවර්ධනය සඳහා කලාවේ බලපෑම්
- ගුණනැණ බෙලෙන් යුතු පුතුම ය ඉතා ගරු
- පරිසරය සුරකිමු

2. පහත රචනා මාර්ගෝපදේශ 3ක් ඇතුළත් වේ. ඊට නිර්මාණාත්මක මාතෘකා සකස් කරන්න.

i. වර්තමානයේ අධ්‍යාපන ක්‍රමය බොහෝ විට විභාග ක්‍රමය පදනම් කරගෙන තරගකාරී ලෙස සකස් වූවකි. එබැවින් අද්‍යතන ශිෂ්‍ය ප්‍රජාව තුළ බලපවත්වන්නේ එකිනෙකා පරයා යාමේ ආත්මාර්ථකාමී හැඟීමකි. සියලු විෂයමාලා රැකියා අරමුණු කරගත් ඒවා වීම නිසා ඒවා හුදෙක් දැනුම පමණක් ලබා දීමට යොමුවන අතර ජනතාවගේ ආධ්‍යාත්මික සංවර්ධනයට හෝ ආකල්පමය සංවර්ධනයකට අධ්‍යාපන ක්‍රමය දායක වනවා ද යන්න වර්තමානයේ පැන නැගී ඇති ප්‍රධාන ගැටලුවකි. දැන උගත් බොහෝ අයගේ චර්යා පද්ධතිය ඇතැම් විට බොහෝ පහත් මට්ටමක පවතියි. ගුණ නැණ දෙකෙන් ම පෝෂණය වූ පුරවැසියන් පිරිසක් බිහි කිරීමට අධ්‍යාපන ක්‍රමය ක්‍රමවත් ව සැලසුම් කළ යුතු ය.

ii. ප්‍රශස්ත සාහිත්‍ය නිර්මාණය වනාහි භාව ප්‍රකෝපනයක් නොව භාව විශෝධනයක් ඇතිකරවන්නකි. එය හුදෙක් ජීවිත විවරණයක් සේ ම සමාජ විවරණයක් ද විය යුතු ය. නමුත් වර්තමාන රූපවාහිනී ටෙලිනාට්‍යයන්හි නූතන ප්‍රවණතාව වන්නේ විදේශ නිර්මාණ සිංහල හඬකවා රසිකයා ඉදිරියට ගෙන ඒම යි. එයින් සිදු වන්නේ දේශීය සංස්කෘතික හර පද්ධතීන් වියැකී ගොස් විදේශීය සංස්කෘතියක් අප රටෙහි ව්‍යාප්ත වීම යි. තව ද එම සංස්කෘතිකාංග අන්ධානුකරණයෙන් ආරූඪ කර ගැනීමට බාල පරපුර නැඹුරු වීම ද මෙහි

අනිටු ප්‍රතිඵලයකි. ඒ අතර ඇතැම් හරවත් නිර්මාණයන් ද නැත්තේ නොවේ. බොහෝ විට රසිකයා ආනන්දයෙන් ප්‍රඥාව කරා රැගෙන යන විදේශීය නිර්මාණ ද දැකිය හැකි ය.

iii. පැරණි ශ්‍රී ලාංකිකයා සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවකට උරුමකම් කීවේ ඔහුගේ දෛනික කටයුතු ඊට ගැළපෙන පරිදි සකස් ගත් නිසා ය. කය වෙහෙසා වැඩ කරමින් ඔවුහු ජීවිකාව සපයා ගත්තෝ ය. වසවිසවලින් තොර ආහාර තමා ම නිෂ්පාදනය කරගති. එසේ පැවති ස්වයංපෝෂිත අර්ථක්‍රමය වාණිජවාදී බලපෑම් නිසා අභිමිවනවාත් සමග වත්මන් ජන ජීවිතය කර්යබහුල, තරගකාරී තත්ත්වයකට හැඩගැසී ඇත. ඒ නිසා ම ක්ෂණික ආහාර, කෘෂි රසායන භවිතය ද නීරෝගීතාවට බලපෑම් ඇති කරයි. නිරායාසයෙන් ලැබෙන කායික ව්‍යායාම අද ඇත්තේ ම නැති තරම් ය. එහි ප්‍රධාන ප්‍රතිඵලය වී ඇත්තේ බෝ නොවන රෝග ව්‍යාප්තිය වැඩිවීම යි. එය රටෙහි සංවර්ධනයට ද ප්‍රබල බලපෑමක් ඇති කරන්නකි

3. පහත සඳහන් මාතෘකාවලින් කීපයක් සඳහා නිර්මාණාත්මක වාක්‍ය රචනා ලියන්න වචන 250-300 ක් පමණ සෑහේ.

- වර්තමාන ජනමාධ්‍ය සතු වගකීම
- වෙළෙඳ දැන්වීම් කලාව සහ පාරිභෝගික ජනතාව
- නූතන සමාජ අභියෝග හමුවේ පිරිවෙන් අධ්‍යාපනයේ කාර්යභාරය

## සුභාෂිත

**"උද්‍යෝගිනං පුරුෂ සිංහ මුපෛති ලක්ෂ්මීර්"**

උද්‍යෝගිවන්ත පුරුෂ සිංහයා වෙත නිතැතින් ම සම්පත් ළඟා වේ.

## සුචින්තන

අත්දැකීම් යනු නොදන්නා ලෝකයට එබී බලන්නට අවස්ථාව ලබා දෙන කවුළු ය.

# 14

# සාරාංශකරණය

එදිනෙදා ජීවිතයේ දී අප තොරතුරු ග්‍රහණය කරගන්නා මාධ්‍ය කීපයකි. එනම් දේශන, සාකච්ඡා, සංවාද, ලිපි ලේඛන ආදිය යි. ඒවායේ අන්තර්ගත සමස්ත කරුණු ඉතා දීර්ඝ සහ විස්තරාත්මක විය හැකි ය. එබැවින් එම සියලු කරුණු ධාරණය කර ගැනීම අසීරු කටයුත්තකි. එහි අන්තර්ගත මුඛ්‍යාර්ථයට අදාළ වන සාරවත් කරුණු පමණක් උකහා දැක්වීම සාරාංශකරණය නම් වේ. මෙය ද සංශ්ලේෂණ කාර්යයකි. මෙම පාඩමේ අපේක්ෂාව සාරාංශකරණය හඳුනා ගැනීම හා එහි භාවිතය පිළිබඳ අවබෝධය ලබාදීම ය.

**පහත සඳහන් ඡේදය කියවන්න**

සිංහල යනු අපගේ මාතෘ භාෂාව යි. සිංහලය බෙහෙවින් පෝෂණය වී ඇත්තේ සංස්කෘත හා පාලි යන ඉන්දු ආර්ය භාෂාවන්හි ආභාසයයෙනි. පාලි සංස්කෘත භාෂා හැදෑරීමෙන් සිංහල භාෂාවේ ප්‍රවීණයෙකු වීමට හැකිවනවා සේ ම සිංහල භාෂාව මැනවින් හැදෑරීම මගින් පාලි සංස්කෘත භාෂා පිළිබඳව ද අවබෝධයක් ලබාගත හැකි වේ.

වසර දෙදහසකටත් වඩා දිගු අතීතයක් ඇති සිංහල භාෂාව ගත වූ දීර්ඝ කාල පරිච්ඡේදය තුළ අනුක්‍රමයෙන් සංවර්ධනයට පත් ව ඇත. අද වන විට සිංහලය ලෝකය පිළිගත් සම්භාව්‍ය සාහිත්‍යයකින් හා විධිමත් ව්‍යාකරණ සම්ප්‍රදායකින් සමන්විත ඉතා දියුණු භාෂාවකි. එමගින් සිංහල දන්නා අය අතර ඉතා ගැඹුරු විෂයයක් පිළිබඳව වුව ද පහසුවෙන් හා නිවැරැදිව සන්නිවේදනය කරගත හැකි ය.

අපට භාෂාවක් අවශ්‍ය වන්නේ හුදෙක් අදහස් ප්‍රකාශ කිරීමට ම පමණක් නොවේ. භාෂාවක් මැනවින් ඉගෙන ගැනීමෙන් උගතෙකු හැටියට අපගේ පෞද්ගලික වටිනාකම් වැඩිකර ගත හැකි ය. භාෂාව නිවැරැදිව හසුරවන්නට සමත් වූ ඇතැමෙක් මිය ගිය පසු ව පවා ලෝක ප්‍රකට ලේඛකයන්, කවීකයන් හැටියට විශ්ව සම්භාවනා ලබති. භාෂාව හොඳින් උගත් දක්ෂ කවීකයෙකුට සවන් දීමට මිනිස්සු විශාල ගණනකින් මුදල් ගෙවති. දක්ෂ ලේඛකයෙකුගේ පොත් මිලියන ගණනකින් අලෙවි වෙයි.

- චිරන්තන ගද්‍ය සංග්‍රහය -<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## සාරාංශය

දිගු ඉතිහාසයකින් යුත්, පාලි, සංස්කෘත ආර්ය භාෂාවන්හි ආභාසයෙන් සංවර්ධනය වූ විශ්ව සම්භාව්‍ය සාහිත්‍යයකින් හා විධිමත් ව්‍යාකරණ සම්ප්‍රදායකින් සමන්විත සිංහලය දියුණු භාෂාවකි. සිය බසෙහි ප්‍රවීණත්වයෙන් මාතෘ භාෂා පිළිබඳ අවබෝධයක් ලැබිය හැකි අතර ඒවා හැදෑරීමෙන් සිය බසෙහි ප්‍රවීණත්වය ලබන්නෝ කවීකයන්, ලේඛකයන් ලෙස සර්වකාලීන විශ්ව සම්භාවනාවට ද පෞද්ගලික වටිනාකමට ද පාත්‍ර වෙමින් අගනා ප්‍රතිලාභ ද ලබති.

## සාරාංශකරණය සඳහා උපදෙස්

1. මනා අවබෝධයෙන් යුක්තව ඡේදය වරක් කියවන්න.
2. දෙවන වර කියවා ප්‍රධාන අදහසට අදාළ තවත් අදහස් තිබේ නම් ඒ සියල්ල ලකුණු කරන්න.
3. තුන්වෙනි වර කියවා ප්‍රධාන අදහසට අදාළ තවත් අදහස් තිබේ නම් ඒ සියල්ල නිවැරදි කරන්න.
4. තමා ලකුණු කරගත් වාක්‍ය ඛණ්ඩ පමණක් කියවා පුනරුක්ති, නොගැළපීම් ඇත්නම් ඒ සියල්ල නිවැරදි කරන්න.
5. උපමා, රූපක ආදී අලංකාර, විශේෂණ තිබේ නම් ඒ සියල්ල අත්හරින්න.
6. වාක්‍ය එකිනෙක අතර සම්බන්ධයක් ඇතිවන ලෙස ඔබට අභිමත පරිදි ගළපා සාරාංශය සකස් කරන්න.

7. වචන සංඛ්‍යාව දී ඇත්නම් එම ප්‍රමාණයට ද නැති නම් මුල් ඡේදයේ තුනෙන් එකක් වන පරිදි ද සාරාංශය ලියන්න.
8. පද බෙදීම, විරාම ලක්ෂණ, උක්තාඛ්‍යාත පද සම්බන්ධය ගැන සැලකිලිමත් වන්න.
9. ප්‍රකෘති කථනයෙන් ඇති ප්‍රකාශ ලේඛන ව්‍යවහාරයට ගළපා ලියන්න.
10. මුල් ඡේදය අන් අයකුගේ වන අතර සාරාංශය තමාගේ නිර්මාණයක් බව සලකා ලියන්න.
11. මුල් විස්තරය ඡේද කීපයකින් යුක්ත නම් සාරාංශය එක් ඡේදයක් වන සේ ලියන්න.

## ක්‍රියාකාරකම 1

**පහත සඳහන් ඡේද1/3 (තුනෙන් එකක්) වනසේ සාරාංශ කරන්න.**

i. බලංගොඩ ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ මහා පාණ්ඩිත්‍යය ප්‍රඥා මහිමය අබිමුව උගතුන් යැයි කියා ගන්නා බොහෝ දෙනා හිරු දුටු කදෝපැණියන් සේ ය. "පෙරදිගට ගියත් අපරදිගට ගියත් මට පිළිතුරු දෙන්නට බැරි දෙයක් කවුරුවත් නොඅසති" යන අභීත සිංහ නාදය උන් වහන්සේ මුවින් පිට වීමෙන් එය සාධනය වේ. තවදුරටත් මින් ගම්‍ය වන්නේ තමන් වහන්සේ අත්පත් කරගත් දැනුම් සම්භාරය පිළිබඳ ඇති ප්‍රත්‍යක්ෂ විශ්වාසය යි. ක්‍රමයෙන් වයෝවෘද්ධ වන විට වයෝවෘද්ධ වූ ආකාරය අසිරිමත් ය. කෙතරම් ශාස්ත්‍රීය ආගමික හා සමාජීය කටයුතුවල නිරත වුව ද දෛනික වතාවත් ඉටු කිරීම ද භාවනානුයෝගී ව ආධ්‍යාත්මික සැපත ළඟා කර ගැනීමට ක්‍රියා කිරීම ද කිසි විටකත් අතපසු නොවීමට වගබලා ගත් අයුරු විස්මිත ය.

ii. සාහිත්‍යකරුවා තමාගේ අත්දැකීම් පාඨකයාට ඉදිරිපත් කරන්නේ භාෂාව මගිනි. භාෂාව වූ කලී අදහස්, හැඟීම් ගෙන යන වාහනය යි. ලේඛකයා තම හදවත කම්පනය කළ අත්දැකීමක් ප්‍රතිනිර්මාණය කරන්නේ වචන අනුසාරයෙනි. කවියෙකු හා විචාරකයෙකු වන ''එස්රා පවුන්ඩ්'' ප්‍රකාශ කරන අන්දමට හැකිතාක් දුරට අර්ථාරෝපණය කරන ලද භාෂාව සාහිත්‍යය වශයෙන් හැඳින්විය හැකි ය.

iii. කවර සාහිත්‍යාංගයකට වුව ද පාදක වන්නේ අවටැති සමාජ ජීවිතයේ හරය යි. එහෙත් මෙකී ලක්ෂණය වඩාත් පැහැදිලි ලෙසත්, පරිපූර්ණ ලෙසත් දක්නට ලැබෙන්නේ නවකථාවෙහිය. කවියාටත්, නාට්‍යකරුවාටත් යම් යම් සීමාවන් ඇතුළත ක්‍රියා කිරීමට සිදුවන්නේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් අභිමුඛයෙහි ඇති විෂය ක්ෂේත්‍රය එක්තරා ප්‍රමාණයකට පටු වේ. එහෙත් නවකථාකරුවා බැඳ තබන සීමා නැත. ඇත්නම් අල්පයකි. එහෙයින් අවශේෂ ලේඛකයන්ට වඩා තියුණු වූත්, ගැඹුරු වූත් ආකාරයෙන් සමාජ ජීවිතය නිරූපණය කිරීමේ වරප්‍රසාදය නවකථා රචකයාට හිමි වන්නේ ය.

iv. සිංහල කාව්‍ය සාහිත්‍යයේ විද්‍යමාන ග්‍රන්ථ අතුරින් ආදි ම වශයෙන් අපට ලැබෙන ගී කාව්‍යත්‍රය මුවදෙව්දාවත, සසදාවත හා කව්සිළුමිණ යි. සීගිරි ගීයෙහි ඇති ප්‍රසාද හා සරල ගුණයන්ගෙන් බැහැර වුව ද කාව්‍ය වශයෙන් වීමංසනයට නිසි ලක්ෂණ කිහිපයක් ඒවායෙහි වෙයි.

මේ ගී කාව්‍යත්‍රයට ම වස්තු විෂය වී ඇත්තේ ජාතක කථා තුනකි. මෙම කවි පොත් තුනෙහි පළමුවැන්න සහ දෙවැන්න ඛණ්ඩ කාව්‍ය ලෙස සැලකිය හැකි අතර තුන්වැන්න මහා කාව්‍යයකි.

මුවදෙව්දාවත හා සසදාවත ගීයට නැගූ කවියන් ඇතැම් මහා කාව්‍ය ලක්ෂණ අනුගමනය කළ ද, මහා කාව්‍යයේ පූර්ණ ලක්ෂණ ගැබ් කරන්නට තරම් එම ජාතක කථා ප්‍රමාණවත් නොවී ය.

## සුභාෂිත

**අත්තනා කුරුතෙ ලක්ඛිං**
**අලක්ඛි කුරුතත්තනා**

තමාගේ යහපතත් අයහපතත් සලසා ගන්නේ තමාම ය.

## සුචින්තන

තනිව ම කළ හැකි දෙයට තවත් අයකුට කරදර නොකරන්න.

# 15

# සාම්ප්‍රදායික යෙදුම්

අදහස් ප්‍රකාශ කිරීමේ ප්‍රධාන මෙවලමක් ලෙස භාෂාව හඳුනා ගත හැකි වේ. එම භාෂාව සතු වූ විශේෂ උපාංග මගින් භාෂාවෙන් සිදුවන සන්නිවේදන කාර්යය වඩාත් ඵලදායි සහ අර්ථවත් කර ගත හැකි ය. භාෂාව සතු මෙම උපාංග අතර එක් අංගයක් ලෙස සාම්ප්‍රදායික යෙදුම් හඳුන්වා දීමට පුළුවන. එම සාම්ප්‍රදායික යෙදුම් අතර රූඪී හෙවත් ඉඟිවැකි, ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ, යුගල පද පිළිබඳ හැඳින්වීමක් මෙහිදී සිදු කෙරෙයි.

## ඉඟි වැකි හෙවත් රූඪි

<u>සත්‍යපාල මට්ටු වුණා</u>

**උපාසක බළලා** වගේ හිටියට සත්‍යපාල ඇද බාන්නෙම බේගල්. දවසක් මිනිහ කියපු කතාවකට අප්පුහාමි මාමාට **අසූහාරදාහට නැගලා** පහුවදා **කුකුළා අතින් අරගෙන** ආපු අප්පුහාමි සත්‍යපාලට හොඳට ම **දෙහි කැපුවා.** එතන හිටපු හේතුහාමි **හීන්නූල් කාරයා.** මිනිහ **කරබාගෙන** එතැනින් **ලිස්සලා** ගියේ ඒ හබයට **හොට දැම්මොත්** තමන්ගෙ **සායම යන** බව **සක්සුදක් සේ** දැනගත්ත නිසා. සත්‍යපාලත් එක්ක **දිවෙන් දිව ගාගෙන** හිටපු හේතුහාමි **සුටුස් ගාලා** මාරු වුණේ අප්පුහාමි **ලෙල්ලට කටුවට නැති** මිනිහ බව **සහසුද්දෙන්** දන්න හින්ද. ඒ වුණාට මොකද සත්‍යපාලයි අප්පුහාමියි **එක ඉත්තෙ පොල්.** හැබැයි සත්‍යපාල එතන තනිවුණා. මිනිහ හිතාගත්තා අප්පුහාමි නම් **එකට කතත් බොක්ක වෙනස්** අදින් පස්සෙ **අම්මෙ මුත්තෙ කීවත්** ඌ එක්ක ඇයි **හොඳයියක්** ඕනැ නෑ කියල. දැන් ඉතින් සත්‍යපාලට **උල්පන්දම් දෙන්න** කෙනෙක් නෑ. ඒ හින්ද මිනිහ **කට පරිස්සම් කරගෙන පාඩුවෙ ඉන්න** හිතාගත්තෙ ඒක ඇඟට **ගුණයි** කියල.

ඉහත කතාවේ අංකිත ප්‍රකාශ පිළිබඳ අවධානය යොමු කරන්න. ඒවායේ වචනාර්ථය ඉක්මවා ගිය සැඟවුණු අරුතක් ඇති බව ඔබට පැහැදිලි වනු ඇත.

> මෙසේ වචනාර්ථය ඉක්මවා යමින් සැඟවුණු අරුතක් ප්‍රකාශ කරන අර්ථය ඉඟියෙන් ගත හැකි යෙදුම් ඉඟි වැකි ලෙස හඳුන්වා දිය හැකි ය. රූඪි යනු ද ඉඟිවැකිවලට යෙදෙන පර්යාය පදයකි.

ව්‍යවහාරයේ දී බොහෝ සේ හමුවෙන ඉඟිවැකි පහත දැක්වේ.

| | ඉඟි වැකි | ඉන් පැවසෙන අර්ථය |
|---|---|---|
| 1 | ගල්පැලෙන බොරු | බරපතල අසත්‍යයක් |
| 2 | මූණේ දැලි ගෑවා | නින්දා ගෙන දීම |
| 3 | උපාසක බළලා | සුදන වෙස් ගත් දුදන අය |
| 4 | අනූනවයෙන් බේරුණා | යන්තමින් අනතුරකින් බේරීම |
| 5 | කජු කන්නා වාගේ | යමක් ඉතා පහසුවෙන් ඉටු කිරීම |
| 6 | කළු කඩ කාරයා | අයුතු ලාභ ලබන්නා |
| 7 | සායම ගියා | කීර්තිය නැති වී යාම |
| 8 | උල්පන්දම් දෙනවා | රහසින් අනුබල දීම |
| 9 | කුකුළු නින්ද | ඉතා කෙටි නින්ද |
| 10 | දිවෙන් දිව ගාගෙන | දැඩි මිතුරු බැවින් |
| 11 | කිඹුල් කඳුළු හෙළනවා | බොරුවට කණගාටු වීම |

| | | |
|---|---|---|
| 12 | ළිඳේ ඉන්න ගෙම්බා | අවට ලෝකය ගැන නොදන්නා තැනැත්තා |
| 13 | හෙම්බත් වුණා | අධික වෙහෙසට පත් වුණා |
| 14 | රජගෙදර පරවියා | අධික සැප සම්පත් විඳින්නා |
| 15 | ගොළුබෙලි ගමන | ඉතා සෙමෙන් ගමන |
| 16 | අකුල් හෙළනවා | බාධා කරනවා |
| 17 | ඉහේ මලක් පිපුණා | අධික ලෙස සතුටු වීම |
| 18 | හණ මිටි කාරයා | පරණ අදහස් දරන්නා |
| 19 | ඔළුව ඉදිමිලා | ආඩම්බර වීම |
| 20 | අවසන් නින්ද | සදහටම නෙත් පියා ගැනීම |
| 21 | පොර කුකුළා | නිතර සටනට එන්නා |
| 22 | ගැටයට අහුවුණා | උපායට හසු වීම |
| 23 | හමස් පෙට්ටියට දමනවා | යමක් ක්‍රියාත්මක නොකරන තැනට පත් කිරීම |
| 24 | කරල පැහිලා | අතමිට සරුවෙලා |
| 25 | දූපනෙ දා ගන්නවා | වසඟ කර ගන්නවා |

මේ අතර එක ම පදයක් විවිධාර්ථවත්ව යෙදෙන අවස්ථා ඇත.

| | **ඉඟි වැකිය** | **ඉන් පැවසෙන අර්ථය** |
|---|---|---|
| 26 | අං අදිනවා | එකඟතාවකට පත් නොවීම |
| 27 | අං හරස් කරනවා | බාධා කිරීම |
| 28 | අං ඇවිල්ලා | උඩඟු වීම |
| 29 | අං මතුවීම | මෝඩකම මතුවීම |
| 30 | අං ගිලීම | අධික කපටිකම |
| 31 | අං මැදීම | රණ්ඩුවකට සූදානම් වීම |
| 32 | මූණ ඇඹුල්වුණා | අසතුටට පත් වීම / අපහසුතාවකට පත් වීම |
| 33 | මූණ රතුවුණා | ලැජ්ජාවට පත් වීම |
| 34 | මූණෙ දැලිගෑව | කීර්තිය නැති කිරීම |
| 35 | මූණ පිම්බීම | නොරිස්සන ස්වභාවයෙන් සිටීම |
| 36 | මූණට කිව්වා | ඍජුවම ප්‍රකාශ කිරීම |
| 37 | මූණ හැංගුවා | පසු බැස්සා |

## ක්‍රියාකාරකම 1

❁ **පහත දැක්වෙන ඉඟිවැකිවල අර්ථය ප්‍රකාශ කරන්න.**

| ඉඟිවැකිය | අර්ථය |
|---|---|
| 1. ඇගේ මාළු නටනවා | ........................................................................ |
| 2. ලෑල්ලට පාගනවා | ........................................................................ |
| 3. දෙහි කපනවා | ........................................................................ |
| 4. කණ කොකා හැඬීම | ........................................................................ |
| 5. පොත් ගුල්ලා | ........................................................................ |
| 6. නරි අං සෙවීම | ........................................................................ |
| 7. පොර කුකුළා | ........................................................................ |
| 8. අත දෙනවා | ........................................................................ |
| 9. අඹ යාළුවා | ........................................................................ |
| 10. කුණු කොල්ලෙට | ........................................................................ |

## ක්‍රියාකාරකම 2

❁ **පහත දැක්වෙන ඉඟිවැකි අර්ථය පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.**

1. මුදුන් පෙත්තට ම
2. ඉස්පිල්ලක් පාපිල්ලක් නැර
3. පදයක් හදනවා
4. වහ කදුරු
5. කෝපි කාලෙ
6. ඇඟිලි ගහනවා
7. යල් පැන ගිය
8. බේගල් ඇදබානවා
9. මූණ රතුවුණා
10. හෙනහුරා ලබලා

## II ප්‍රස්තාව පිරුළු

පහත දැක්වෙන්නේ ශ්‍රී දන්තසාර ධර්මායතන පිරිවෙණේ දිනපතා පවත්වනු ලබන සමාරම්භක රැස්වීම අවසන් කරමින් පරිවේණාධිපති හිමියන් කළ දේශනයේ අවසන් කොටසයි.

"ඉතින් ඔය ළමයිනු යි පොඩි හාමුදුරුවරු යි හොඳින් හිතට ගන්න ඕනෑ <u>ලෙඩ කපුටො වැල කනව වගේ</u> නැතිව මේ අවසාන වාරයේ හොඳින් හිතට අරගෙන, උනන්දුවෙන් වැඩ කළොත් ලබන අවුරුද්දෙ අලුත් පන්තියකට යන්න පුළුවන්. හොඳ උත්සාහයකින් උනන්දුවකින් ඉගෙනීමේ කටයුතු කළොත් හැම දෙනාට ම ජීවිතය ජය ගන්න පුළුවන්. ඒක හරියට <u>කිරි ගහට ඇන්න වගේ</u> තමයි. ආයෙ දෙකක් නැහැ."

රැස්වීම අවසන් වී පන්තියට ගිය බෝ්ඹුවල අරියසීල පොඩි හාමුදුරුවො පන්ති භාර ගුරු හිමියන්ගෙන් මෙසේ ඇසූහ.

**අරියසීල හිමි :** මොකක්ද අපේ හාමුදුරුවනේ අර නායක හාමුදුරුවෝ ''ලෙඩ කපුටො වැල කනවා වගේ'' කිව්වෙ?

**පන්ති භාර ගුරු ස්වාමින් වහන්සේ :**
බොහොම හොඳ ප්‍රශ්නයක් පොඩි හාමුදුරුවො ඇසුවෙ. අද සිංහල පාඩමත් ප්‍රස්තාව පිරුළුවලට අදාළවනෙ.භාෂාවක රසය වැඩි කරන්න, අර්ථ තේරුම් කර දීමට, තැනට ගැළපෙන ආකාරයෙන් පවසන ප්‍රකාශ තිබෙනවා. එබඳු යෙදුම් හඳුන්වන්නේ ප්‍රස්තාව පිරුළු ලෙස යි. මුලින් නායක ස්වාමීන් වහන්සේ පැවසූ <u>ලෙඩ කපුටො වැල කනවා වගේ</u> කියූ ප්‍රකාශය එබඳු ප්‍රස්තාව පිරුළක් ලෙස හඳුන්වන්න පුළුවන්. ඉන් අදහස් කළේ කිසිදු ඕනෑකමක් නැතිව වැඩ කරනා බව යි. මෙබඳු ප්‍රකාශ රාශියක් භාෂාව සතුව පවතිනවා. අරියසීල පොඩි හාමුදුරුවන්ට එය පැහැදිලි වී ඇතැයි සිතනවා.

**අරියසීල හිමි :** එහෙමයි ලොකු හාමුදුරුවනේ මට දැන් ඉතා හොඳට පැහැදිලි වුණා. ප්‍රස්තාව පිරුළුවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මත ඒවා වර්ග කළ හැකි ය.

- **කතන්දර ආශ්‍රයෙන් ඇති වූ පිරුළු**

1. අන්දරේ සීනි කෑවා වගේ
2. අන්ධයන් ඇතාගේ හැටි කීවා වගේ
3. අබරා සිල් ගත්තා වගෙයි
4. ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ
5. කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ
6. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ
7. ගමරාල දෙව්ලොව ගියා වගේ
8. බල්ලාගේ වැඩේ බූරුවා කරා වගේ
9. කළුවා මාරපන් ගියා වගේ
10. වක්කඩේ හකුරු හැංගුවා වගේ

- **කිසියම් සත්‍යයක් පදනම් කරගත් පිරුළු**

1. අත්තෙන් අත්තට පනින කුරුල්ලා තෙමී නසී
2. කීවොත් සඟ නසී නොකීවොත් වෙහෙර නසී
3. අඬනකොටලු කිරි එරෙන්නෙ
4. ගහේ කටු උල් කරන්න ඕනැ නැහැ
5. ගලේ කෙටූ අකුරු වගෙයි
6. බුරන බල්ලෝ හපා නොකති

- **උපමා අර්ථයේ පිරුළු**

1. මඬේ සිට වූ ඉන්න වගේ
2. මිටිකිරි විසිකර දිය කිරි ගත්තා වගේ
3. ආචාරියා රවටා කැත්ත හැදුවා වගේ
4. අතරමගදි අත්වැල කැඩුණා වගේ
5. ඉත්තෑවගෙ ගෙට කබල්ලෑවා රිංගුවා වගේ
6. මුහුද හත්ගව්වක් තිබිය දී අමුඩ ගහනව වගේ
7. කොටිවලිගෙ අල්ලා ගත්තා වගේ

- **ශ්‍රැති සූචනාර්ථයේ ල, ලු නිපාත සහිත පිරුළු**

1. ගහට ගහක් මොරටුවේදී හමුවෙනවා ලු
2. බත් ඇතිදාට කොස් තිත්ත ලු
3. ගියලුලා මහ එකා ලු
4. එකට කතත් බොක්ක වෙනස් ලූ

## ක්‍රියාකාරකම 3

**පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවලට සුදුසු අර්ථ සපයන්න.**

1. ඉබ්බාගෙන් පිහාටු ඉල්ලුවා වගේ.

   ............................................................

2. ඉඳිකටු තුඩේ තපස් රැක්කා වගේ.

   ............................................................

3. හැට පිරුණත් වඳුරා බිම ගමන් නැත.

   ............................................................

4. ඇවිළෙන ගින්නට පිදුරු දැම්මා වගේ.

   ............................................................

5. පුහුල් හොරා කරෙන් දැනේ.

   ............................................................

6. ආතාට අටුකොස් දුන්නා වගේ.

   ............................................................

7. ඇඟෙන් ඇටයක් ගියා වගේ.

   ............................................................

8. කණා කිරේ පාට කිව්වා වගේ.

   ............................................................

9. කතාව දෝලාවෙන් ගමන පයින්.

   ............................................................

10. කබල් රෝදෙ සද්දෙ වැඩියි.

    ............................................................

## ක්‍රියාකාරකම 4

**(අ) කොටසේ ඇති ප්‍රස්තාව පිරුළුවලට ගැළපෙන අර්ථ (ආ) කොටසෙන් සොයා යා කරන්න.**

| (අ) | (ආ) |
|---|---|
| 1. ලූලා නැති වළට කණයා පණ්ඩිතයා | අවශ්‍ය වෙලාවට නැති දේවලින් පසු ව වැඩක් නැත. |
| 2. හිත ඇත්නම් පත කුඩා ද? | නිෂ්ප්‍රයෝජන ක්‍රියාවක් කිරීම. |
| 3. උඩින් මිතුරු යටින් හතුරු | උත්සහවන්තයාට කළ නොහැක්කක් නැත. |
| 4. පුස්ස බින්දා වගෙයි | සුදුස්සකු නැති තැන නුසුදුස්සා ඉස්මතු වීම. |
| 5. දත් නැති දා උක් දඬු ගිනි තපින්න ද? | හිතවත් කම පෙන්වා ද්‍රෝහි වීම. |

## ආප්තෝපදේශ

සාම්ප්‍රදායික යෙදුම් අතර වෙන් කොට හඳුනා ගත හැකි තවත් විශේෂ යෙදුම් වර්ගයක් තිබේ. ආප්තෝපදේශ ලෙස නම් කරන්නේ ඒවා යි. ආප්තෝපදේශයක, ආවේණික ලක්ෂණ

- එමගින් කිසියම් උපදේශයක් සපයයි.
- පඬිවරුන් උගතුන් අනුදත් නිගමන එම යෙදුම්වල අන්තර්ගත වේ.
- ආප්තෝපදේශ ප්‍රස්තාව පිරුළුවලට වඩා කෙටි ය.

එබඳු ආප්තෝපදේශ කීපයක් මෙසේය.

**නිදසුන් :**

1. පිරුණු කළේ දිය නොසැලේ
2. උඩ පැන්නොත් බිම වැටෙයි
3. පනින්ට පෙර සිතා බලනු
4. පෙරළෙන ගලේ පාසි නොබැඳේ
5. දිළිසෙන සියල්ල රත්තරං නොවේ

ප්‍රස්තාව පිරුළුවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මත ඒවා වර්ග කළ හැකි ය.

## III යුගල පද

"උගත් නූගත්කම නොතකා සමාජයේ වෙසෙන කොයි කවුරුත් හොඳ නරක හඳුනාගෙන ජීවත් වීම වටී"

ඉහත ප්‍රකාශයේ 'උගත් නූගත්', 'කොයි කවුරුත්', 'හොඳ නරක' යන යෙදුම්වල පද යුගල වී ඇත්තේ භාෂාවට අලංකාරයක් ගෙන දීමට සමත් වන පරිද්දෙනි.

> සන්නිවේදන කාර්යයේ කාර්යක්ෂමතාව උදෙසා භාවිත කෙරෙන භාෂා උපාංග අතර යුක්තාර්ථවත් පද දෙකක් එකිනෙක ගළපා ජීවයෙන් යුතු ව සංග්‍රහවීම යුගල පදයකි. සෑම යුගල පදයක් ම ද්කාරාර්ථ සමාස පදයක් ද වේ.

සිංහල භාෂාවේ මෙබඳු යුගල පද සෑදෙන රටා සමුදායකි. එම පද යුගලයේ ස්වභාවය අනුව ප්‍රභේදය තීරණය වේ.

- **පූර්ව ක්‍රියා පද සංග්‍රහය**

සොයා - බලා
කා - බී
කවා - පොවා
ගයා - වයා

- **අනුප්‍රාසාත්මක පද සංග්‍රහය (මේවායේ ඇතැම්විට එක පදයක පමණක් අර්ථය තිබෙන අතර අනෙක් පදය අනුප්‍රාසාත්මතකව යෙදේ.)**

අඟුර - දඟුර
නහින - දෙහින
ළමයි - බමයි
අහළ - පහළ

- **විරුද්ධාර්ථ පද සංග්‍රහය**

පින් - පව්
හොඳ - නොහොඳ
දුක - සැප
අඩු - වැඩි
ඇති - නැති

- **සමීපාර්ථවත් පද සංග්‍රහය**

වතු - පිටි
හරක - බාන
නඩු - හබ
ඉඳුම් - හිටුම්

- **පද දෙක ම අර්ථ රහිත යුගල පද සංග්‍රහය (පද යෙදෙන පරිසරය අනුව අර්ථය තීරණය වේ.)**

ලට්ට - ලොට්ට
අනං - මනං
වං - හුං
කඩි - මුඩි
අස් - පස්

- **සමානාර්ථ යුගල පද සංග්‍රහය**

රට - රාජ්‍ය
සමිති - සමාගම්
යාන - වාහන
ඉඳුම් - හිටුම්

- **සංඛ්‍යාර්ථ පද සංග්‍රහය**

සිය - දහස්
ශත - සහස්‍ර
කෝටි - ප්‍රකෝටි
හැට - හැත්තෑ

- **ඥාති නාම සංග්‍රහය**

නැන්ද - මාමා
නෑනා - මස්සිනා
අත්ත - මුත්ත
අයියා - මලෝ

- **සත්ත්ව නාම සංග්‍රහය**

බලු - කපුටු
ඇත් - අස්
අලි - කොටි
වග - වලස්

## ක්‍රියාකාරකම 5

- පහත දැක්වෙන යුගල පද සම්පූර්ණ කරන්න.

1. අතුරු ..................................
2. ඇහැ ..................................
3. අරුම ..................................
4. ඇඟ ..................................
5. ඉඟි ..................................
6. උස් ..................................
7. කඩ ..................................
8. ගේ ..................................
9. කී ..................................
10. ඕක ..................................

## ක්‍රියාකාරකම 6

- පහත දැක්වෙන යුගල පද එහි විශේෂ අර්ථ සලකා වර්ග කරන්න.

1. කුඩ - බුඩ
2. කැවිලි - පෙවිලි
3. කොට්ට - මෙට්ට
4. ගුණ - දොස්
5. ගරු - සරු
6. කල - දවස
7. කාලා - බීලා
8. එහෙන් - මෙහෙන්
9. අග - මුල
10. අඬා - දොඩා

### සුභාෂිත

**මනසවී මෘයතෙ කාමං**
**කාපීණ්‍යංතු නගච්ඡති**

උසස් සිතක් ඇති තැනැත්තා මිය යතත් බැගෑ බවට නොයයි.

### සුචින්තන

ඔබට යමක් වෙනස් කිරීමට අවශ්‍ය නම් මුලින් ම ඔබ වෙනස් විය යුතු ය.

# 16

# සාහිත්‍ය රසාස්වාදය හා විචාරය

විධිමත් වූ වර්ණ සංයෝජනයෙන් අලංකාර වූ සිතුවමක් නෙත් සිත්හි චමත්කාරයක් ඇතිකරලීමෙහි සමත් වෙයි. එසේ ම භාෂාව, විචිත්‍ර ලෙසත් අපූරු ලෙසත් ගැළපීමෙන් උපදින සාහිත්‍යය, මිනිසාගේ සිත් සතන්හි උපදනා ශෝකය සන්සිඳුවා ගන්නටත්, විවේකය විනෝදවත් කර ගන්නටත්, සිත සන්සුන් කර ගන්නටත් කරුණාව මෛත්‍රිය වැනි උසස් චින්තනයන් කරා ගමන් කරන්නටත් ඉවහල් වේ.

සිතුවමකින් මතු වන සැබෑ රසයත් හරයත් මතු කර ගන්නට නම් එය මනා ව පරිශීලනය කළ යුතු ව ඇත. ඊට අදාළ ක්‍රමවේද දැන සිටීම විශේෂිත ය. සාහිත්‍යයෙන් මතුවන රසය හා හරය උකහා ගන්නට හැකි වන්නේ ද එය මනා ව පරිශීලනයට අවශ්‍ය ක්‍රමවේද දැන සිටීමෙනි. සාහිත්‍ය රසාස්වාදය හා විචාරය යන මැයෙන් සිදු කෙරෙන්නේ සාහිත්‍ය පරිශීලනයට අදාළ ක්‍රමවේද සොයා යාම යි.

## සාහිත්‍ය රසය විචාරාත්මක ව සොයා යාම

ඉදුණු අඹ ගෙඩියක් අතට ලැබුණු විට එය දත්වලින් සපා පොතු ගලවා කුමන හෝ පැත්තකින් කෑම අරඹා කා දැමීම තුළ අඹ ගෙඩියක් රස විඳීමේ අරමුණ ඉටුකර ගත හැකි ය. එහෙත්, එය සෝදා, පිහියකින් විධිමත් ව පොතු ඉවත් කර ප්‍රමාණවත් කෑලිවලට කපා බඳුනක දමා පිළිවෙළකට අනුභව කිරීමෙන් ලැබෙන්නේ ඉහතින් කළ රස විඳීමට එහා ගිය රසයකි. සැබවින් ම අඹ ගෙඩියේ සැබෑ රසයත් ගුණයත් ලැබෙන්නේ ඒ පිළිවෙළ මත රසවිඳීම නිසා ය. සාහිත්‍යයට අදාළ දේ මතුපිටින් කියවීමෙන් හෝ ඇසීමෙන් යම් බඳු රසයක් ලැබිය හැකි බව සත්‍යයකි. එහෙත් එයින් සැබෑ රසයක් හෝ හරයක් උකහා ගැනීමට කෙතරම් දුරට හැකිවේ ද යි ගැටලුවකි. කියවීමෙන් හා ඇසීමෙන් සිතෙහි මිහිර උපදින රසය ආස්වාදය කළ හැක්කේ සහ එය විස්තර කළ හැක්කේ රසාස්වාද සංකල්ප හා එහි මූලධර්ම පිළිබඳ අවබෝධයක් ඇත්තෙකුට පමණි. එම නිසා සාහිත්‍ය රස විඳීමේ දී යම් ක්‍රමවේදයකට අනුගත ව සිදු කළහොත් ඉන් ලැබෙන්නේ සාහිත්‍යයේ සැබෑ රසය හා හරය බව පැහැදිලි ය.

සාහිත්‍ය නිර්මාණයක සමස්ත රසය දෙයාකාර යි. ඒ **අර්ථ රසය හා ශබ්ද රසය යි.** සාහිත්‍යය, කාව්‍යය ය යි සඳහන් කළ පමණින් ම එහි ශබ්දයත්, අර්ථයත් කැටි වී ඇති බව ප්‍රකට යි. පෙරදිග කාව්‍ය විචාරක රුද්‍රට, තම "කාව්‍යාලංකාර" යේ

**නනු ශබ්දාර්ථෞ කාව්‍යම්**

(එක්තැන් වූ ශබ්දය හා අර්ථය කාව්‍යය යි)

යනුවෙනුත් **වාග්භට**, තම "කාව්‍යානුශාසනා" නම් කෘතියේ

**ශබ්දාර්ථෞ නිර්දෝෂෞ සගුණෞ ප්‍රායඃ සාලංකාරෞ කාව්‍යම්**

(දොස් රහිත වූත් ගුණ සහිත වූත් අලංකාරවලින් ශෝභා සම්පන්න වූත් ශබ්දාර්ථ දෙදෙනා කාව්‍ය වන්නේ ය) යනුවෙනුත්

**ජගන්නාථ** තම "රසගංගාධර" නම් කෘතියේ

**රමණීයාර්ථ ප්‍රතිපාදකඃ ශබ්දඃ කාව්‍යම්**

(රමණීය අරුත් ප්‍රතිපාදනය කරන ශබ්දය කාව්‍යය යි.)

යනුවෙනුත් දක්වා ඇති නිර්වචනවලින් ඒ බව පැහැදිලි වේ. ඒ අනුව සාහිත්‍යය, වනාහි ශබ්දාර්ථ දෙකේ එකතුවක් නම් රසය එයට බද්ධ වී ඇත. සාහිත්‍යකරුවා සිය නිර්මාණ ඔස්සේ ශබ්දය රසවත් කරන්නටත් අර්ථය රසවත් කරන්නටත් වගබලා ගනියි. නිර්මාණය තුළ රසවත් අර්ථ නිෂ්පත්තියක් සඳහාත් රසවත් ශබ්ද නිෂ්පත්තියක් සඳහාත් සාහිත්‍යකරුවා භාවිත කරන්නේ භාෂාව යි. පාඩම ආරම්භයේදී **විචිත්‍රවත් භාෂාව** ලෙස දැක්වූයේ මෙම රසවත් වූ භාෂාව යි.

## දෙයාකාර රසයට පාදක වන භාෂාව යනු කුමක් ද?

සාහිත්‍යකරුවාට සිය නිර්මාණ සඳහා විශේෂ වූ භාෂාවක් නැත. සාහිත්‍යකරුවාගේ කාර්යය වන්නේ සිය අරමුණට සාධ්‍ය වන සේ භාෂාව විශේෂ ව යොදා ගැනී ම යි.

වීණාවක තත් පිරිමැදීමෙන් විවිධ නාද නිකුත් කළ හැකි ය. එය වීණාවේ ප්‍රකෘති ස්වභාවය යි. ඒ ප්‍රකෘති නාද එක් එක් අයුරින් ශබ්ද වීමට සලස්වන සංගීතඥයා කන්කලු

වූත් සිත්කලු වූත් ස්වරමාලාවක් නිපදවා අප වශී කරයි. එසේ, සාහිත්‍යකරුවා ද කරන්නේ සාමාන්‍ය ලෝකයේ භාවිත භාෂාව විශේෂ අයුරින් ගළපා ගද්‍ය හෝ පද්‍ය නිර්මාණයක් කිරීම යි. ඔහු ස්වකීය අත්දැකීම් සහෘදයා වෙත රැගෙන යන්නේ භාෂාව උපයෝගී කර ගෙන ය.

මෙය තවත් අයුරකින් දක්වතොත් සාහිත්‍යකරුවා සිය පුද්ගලානුභූතිය කාව්‍යානුභූතියක් බවට පත්කරන්නේ භාෂාවෙනි. වාච්‍යාර්ථය ඉක්මවා ගිය ව්‍යංග්‍යාර්ථය සහිත එම භාෂාව ශෝභාසම්පන්න බව පෙරදිග කාව්‍ය විචාරක **ආනන්දවර්ධන**, බටහිර කාව්‍ය විචාරක **අයි. ඒ.රිචර්ඩ්ස්** වැන්නන් දක්වා ඇත.

**උගුර වියළි හඬක් නොනගී**
**ගොරහැඩි ව යයි මුහුණ පිපිරී**
**නගින ගිනියම් හුස්ම පමණයි**
**විවර වූ මුව තුළින් එන්නේ**

මහාචාර්ය සිරිගුණසිංහ සූරීන්ගේ **"පේරාදෙණි නියගය"** පද්‍ය පන්තියේ සඳහන් මෙම පද්‍යයෙන්, දැඩි නියඟයකට හසු වූ මිනිසුන්ගේ ස්වභාවය, අනුභූතිය වශයෙන් තබා රචනා වී ඇත. දැඩි නියඟයකට හසුවූවකුගේ ගති ස්වභාවය, මෙහි යොදා ඇති භාෂා මහිමයෙන් අපූරු ලෙස මතු වී ඇත.

**උගුර වියළී**
**ගොරහැඩි**
**ගිනියම් හුස්ම**

වැනි වචන හැර මෙම අවස්ථාවට යොදන්නේ වෙනත් කුමන වචනදැ යි සිතේ. මෙහි භාෂා භාවිතය අර්ථාවබෝධයට පිටිවහලකි. පෙම්වතකුගේ හා පෙම්වතියකගේ ප්‍රථම හමුවීම පිළිබඳ කියා පාන පහත දක්වෙන ගීත ඛණ්ඩයෙන් සාහිත්‍යකරුවා පද්‍යකරණය සඳහා භාෂාව විචිත්‍ර ව භාවිත කර ඇති අයුරු දැකිය හැකි ය.

**විකසිත මුව කමලේ**
**නෙත් බමරුන් පැටලේ**
**බැල්මට නෙතු සඟලේ**
**සිත සිතිවිලි සසැලේ**

පෙම්වතා පෙම්වතියගේ මුහුණ දෙස බැලී ය. එවිට පෙම්වතිය පෙම්වතා දෙස බැලී ය. ඒ බැල්මෙන් පෙම්වතාගේ සිතිවිලි කැළඹීමට පත් විය. ඉහත අවස්ථාව සාමාන්‍ය භාෂාවෙන් සඳහන් කළ හැක්කේ එලෙස ය. එහෙත් සාහිත්‍යකරුවා එම අවස්ථාව ප්‍රකාශ කර ඇත්තේ භාෂාව ව්‍යංග්‍යාර්ථවත් ව හා විචිත්‍රවත් ලෙස ය. ඒ නිසා ම එම පද්‍ය කොටස කියවත් ම සහෘද සිතේ චමත්කාර ජනක සිතිවිලි සමුදායක් මැවී යයි.

සාහිත්‍යකරණයේදී පෙනෙන මේ ආකාර ව්‍යංග්‍යාර්ථවත් භාෂාව දෙයාකාර රස මවන්නේ මෙසේ ය.

1. **අර්ථයට පාදක වීමෙන්**
2. **ශබ්දයට පාදක වීමෙන්**

## අර්ථයට පාදක වෙමින් රස මවන්නේ කෙසේ ද?

ගද්‍යයේදී වේවා පද්‍යයේදී වේවා සාහිත්‍යකරුවා අත්දැකීම සහෘදයා වෙතට රැගෙන යන්නේ භාෂාවෙන් හැඩගන්වා ය. මෙහි අත්දැකීම හැඩගැන්වීම යනු අත්දැකීමෙහි සැඟවී ඇති අර්ථය හැඩගැන්වීම යි. එනම් අර්ථය අලංකාර කිරීම යි. අර්ථය රසවත් කිරීම යි. අර්ථය අලංකාර කිරීම සඳහා, අර්ථය රසවත් කිරීම සඳහා සාහිත්‍යකරුවා භාෂාව පැතිකඩ කීපයකින් හසුරුවයි. පහත දැක්වෙන්නේ ඒ අතරින් කීපයකි.

### භාෂාව ප්‍රතිභාපූර්ණව යෙදීම

සාහිත්‍යකරුවා අත්දැකීම සහෘදයා වෙත රැගෙන යන්නේ පෙර නොවූ විරූවක් ලෙස ය. සාහිත්‍යකරුවා තුළ ඇති ඊට අදාළ හැකියාව ප්‍රතිභාව යි.

### ප්‍රතිභා , අපූර්ව වසතු නිර්මාණක්ෂමා ප්‍රඥා

සාහිත්‍යකරුවා සිය අනුභූතිය, අත්දැකීම දෙස බලන්නේ සාමාන්‍ය ලෝකයා ඉක්මවා ගිය චින්තනයක් ඔස්සේ ය. එය විශේෂ සිතීමකි. මෙය සාහිත්‍යකරුවාගේ පරිකල්පනය යි. අත්දැකීම නවතාවකින් ඉදිරිපත් කරන්නේ පරිකල්පන ශක්තිය නිසා ය. නිර්මාණයක අර්ථ රසය සොයා යන සහෘදයාට ද ප්‍රතිභාපූර්ණ භාෂාවෙන් ලැබෙන්නේ සුවිශේෂ පිටු බලයකි. භාෂාව ප්‍රතිභාපූර්ණ ව යොදා ඇති මේ පද්‍යය දෙස බලන්න.

කො ම ළඟනක වුවනත උඩුකුරු කොට
ත ම මුහුලත් බැඳ පිහිනනු දිය පිට
හැ ම සියපත් හැකිලෙනු සොමි තරිඳුට
මෙ ම රඟයයි පානා වැනි දිනිඳුට

(ගිරා සන්දේශය)

දියෙහි පිහිනන කාන්තාවන්ගේ මුහුණ සඳ වැනි ය. අත් නෙළුම් වැනි ය. ඒවා මුහුළ මත එකට බැඳගෙන පිහිනන විට හැකිළුණු නෙළුම් මල් වැනි ය. එය සඳ ඉදිරියේ නෙළුම් හැකිළීම හා සමාන ය. එවිට මේ ක්‍රියාව සූර්යයාට පෙන්වන්නේ සූර්යයා නෙළුම්වල නෑයා නිසා ය. දියකෙළියකදී දැක ගත හැකි සාමාන්‍ය සිද්ධියක් නවතාවකින් අපූර්ව අත්දැකීමට සහෘදයා මුහුකර ඇති ආකාරය ඉහත නිර්මාණයෙන් දැකිය හැකි ය.

විද්‍යාචක්‍රවර්තීන්ගේ බුත්සරණේ එන වෙස්සන්තර ජාතකයේ අමිත්තතාපා බැමිණියට සෙසු බමුණු කාන්තාවන් ජූජක බමුණා පිළිබඳව කළ උපහාසාත්මක විස්තරය කතුවරයාගේ ප්‍රතිභාව ප්‍රකට වන අවස්ථාවකි.

> **"... එක් දවසක් අමිත්තතාපා නම් බැමිණිය තොටැ දී දැකැ එගමැ සෙසු බැමිණියෝ කියන්නාහු" පව්කිළිය, තෝ දත්හුණු නරමහල්ලකුට මෙහෙ කෙරෙයිද දෙමවුපියෝ තීට සතුරු වන්හ... එසේ හෙයින් වද තී මේ නර මහල්ලාට අඹු වූයේ? යෙහෙළි, මෙසේ වූ ජරහම් මහල්ලා හා එක් වැ පඤ්චකාම විෂයෙහි කවර නම් ඇල්මෙක් ද? ඔහු කඩදත් දල්වා ගෙණැ සෙන වේලෙහි තිට කවර නම් සමාධියෙක් ද? කිඹුල්පිටක් සේ කොරසැඩි වූ උගේ ශරීරයෙහි ගෑවි කවර ආස්වාදයක් ද? සොඳුර, තිගේ මොළොක් වූ ශරීරය මිරිකා ඒ බමුණු කණාටුවාට මෙහෙ කොට දුක් නොගෙණැ තී සේ වූ අභිරූප වූ ළඳරු සැමියකු සොය ගණැයි කීහ."**

- බුත්සරණ -

ජූජක බමුණා ගේ චරිතය නිරූපණය කිරීමේදී භාෂාව අපූර්ව ලෙස යොදා ගනිමින් පෙර නොවූ විරූ චිත්‍රයක් සහෘද සිතෙහි මවන්නට කතුවරයාට මෙහිදී හැකි වී ඇත. බීභත්ස රසය ද ඉස්මතු වන පරිදි වර්ණිත අවස්ථාව නවතාවකින් ඉදිරිපත් කර තිබීම සහෘදයා අපූර්ව අර්ථ රස වින්දනයක් කරා රැගෙන යන්නට ඉවහල් වී ඇත.

භාෂාව ප්‍රතිභාපූර්ණ ව යෙදීම අර්ථ රස නිෂ්පත්තියට ඉවහල් වන බව මේ නිදසුන්වලින් තහවුරු වේ. පෙරපර දෙදිග බොහෝ කාව්‍ය විචාරකයින්ගේ අදහසක් වන්නේ ප්‍රතිභානය නැතහොත් පරිකල්පන ශක්තිය කවර හෝ පුද්ගලයෙකු කවියකු, සාහිත්‍යකරුවකු බවට පත කරන බලවේගය ලෙස යි. මේ අදහස ඉදිරිපත් කිරීමෙහිලා විලියම් බ්ලේක්, විලියම් වර්ඩ්ස්වර්ත් වැන්නෝ පුරෝගාමී වූහ.

## භාෂාව රසාත්මක ව යෙදීම

නිර්මාණයක අර්ථ රසය ඉස්මතු වන්නට නම් එය විවිධාකාර රසයන්ගෙන් පරිපූර්ණ විය යුතු බව, **භරතමුනි** (නාට්‍ය ශාස්ත්‍ර) **විශ්වනාථ** (සාහිත්‍ය දර්පණ) වැනි රසවාදීන්ගේ අදහස යි. ඔවුන් තවදුරටත් දක්වූයේ භාෂාව විචිත්‍රවත් ව යෙදීම යනු රස මතුවන සේ යෙදීම යන්න යි. "රසය" සාහිත්‍ය නිර්මාණයකට කෙතරම් බලපෑමක් කරන්නේ ද යත්, කාව්‍යයක ආත්මය රසය වන බවට ඔවුන්ගේ අදහස විය.

**වාක්‍යං රසාතමකං කාව්‍යම්**

-විශ්වනාථ - (සාහිත්‍යදර්පණ)

රසයකින් තොර කාව්‍යයක් නැත. ඒ සඳහා නව විධ රසයක් රසවාදීහු පෙන්වා දුන්හ. සාහිත්‍යකරුවා භාෂාව යෙදිය යුත්තේ ඒ නව විධ රස ජනනය සිය නිර්මාණයෙන් මතු වන පරිදි ය. එවිට රසය හා මුසු වූ භාෂාව අපූර්ව අර්ථ රසයකට බඳුන් වෙයි.

සාහිත්‍ය රස විඳින්නා තුළ නව විධ රස ඇති වීමට නම් ඊට මූලික වන භාව (හැඟීම්) ඇති විය යුතු ය. ඒ ඔස්සේ සහෘදයා තුළ භාව ප්‍රකෝපයක් නො විය යුතු අතර භාව විශෝධනයක් සිදු විය යුතු ය. අවසානයේ ඊට අදාළ රස ඔස්සේ සිදු කෙරෙන්නේ ඒ භාව (හැඟීම්) සහෘදයාගේ හදවතට පිවිසෙමින් ඔහු තුළ ප්‍රකම්පනයක් ඇති කොට කරුණාව, හාස්‍ය ආදි උසස් චින්තනයක් කරා රැගෙන යාම යි.

ගුත්තිල කාව්‍යයේදී දේවදත්ත තෙරුන් පිළිබඳ සහෘදයා තුළ කරුණ රසය උපදවන්නේ ශෝකයෙන් හටගත් භාවය (හැඟීම) කරුණ රසයට පෙරළමිනි.

**ඉඳ ඉඳ එක වෙහෙර**
**විඳ විඳ දහම් මනහර**
**සිඳ බිඳ දුක් සසර**
**අනේ දෙව්දත් නොදිටි මොක්පුර**

මෙහි අවසන් පදය කියවෙත් ම දෙව්දත් තෙර පිළිබඳ ඒ කරුණ රසය උපදී.

සිංහල ථූපවංසයේ, දක්වෙන එළාර රජු පරදවා දුටුගැමුණු රජු ජය ලබන අවස්ථාව කියාපාන පහත ගද්‍ය පාඨය සහෘදයා වීර රසයෙන් රසවත් කරන අයුරු බලන්න.

**"එළාර රජ තෝමරය දමා මරම්'යි සිතා තෝමරය දැමීය. දුටුගැමුණු රජ එළාර රජ දැමූ තෝමරය වළහා පීය. එකෙණෙහි එළාර රජු නැගී පර්වත නම් ඇත්හු තමාගේ කඩොලැත්හු ලවා දළින් දළ අන්නවා එළාර රජහට තෝමරය දමාලීය.**

**ඒ රජු ළෙන් ඇනී පිටින් තෝමරය ගොස් අත් හා එක් කොට එතැන්හි ම හිණ. ඉක්බිති දිනන ලද සංග්‍රාම ඇති දුටුගැමුණු මහරජ චතුරංගිනී සේනාව සහිත වූයේ ලංකාද්වීපය එකඡත්‍ර කොට දෙදෙව්ලොව දේවතාවන් පිරිවැරූ සක්දෙව් රජහු මෙන් මහ පෙරහරින් අනුරාධපුරයට වන."**

- සිංහල ථූපවංසය -

උත්සාහ (වීර්ය) නම් භාවයෙන් (හැඟීමෙන්) උපදන වීර රසය නිසා ඉහත අවස්ථාව මනා අර්ථ රසයකට මං විවර කර ඇත. භාෂාව රසයට නතු කිරීම නිසා ඒ ප්‍රතිලාභය සහෘදයාට ලැබිණ. මේ ආදි භාවයන් හා ඊට අදාළ ව උපදින නව විධ රසයන් පිළිබඳ ව පහත සඳහන් සටහන ඇසුරෙන් හඳුනා ගනිමු.

| භාව | රස |
|---|---|
| රති | ශෘංගාරය -- පසිඳුරන් පිනවීමේ රසය |
| හාස | හාස්‍ය -- සිනහ උපදවන රසය |
| ශෝක/ අනුකම්පා | කරුණ -- හදවත මෘදු මොළොක් කරන රසය |
| ක්‍රෝධ | රෞද්‍ර -- රුදු බව පෙන්වන රසය |
| උත්සාහ | වීර - වීරත්වය මතුවන රසය |
| භය | භයානක - බිය උපදවන රසය |
| ජුගුප්සා | බීභත්ස - පිළිකුල උපදවන රසය |
| විස්ම/ ලෝක විෂය ඉක්මවා ගිය | අද්භූත - පුදුම උපදවන රසය |
| ශම | ශාන්ත - ගත සිත සන්සුන් කරන රසය |

**ශෘංගාර හාස්‍ය කරුණා**
**රෞද්‍රවීර භයානකඃ**
**බීභත්සාද්භූත ඉත්‍යෂ්ටෞ**
**රසාඃ ශාන්තස් තථා මතඃ**

## භාෂාව රීතියට අනුකූලව යෙදීම

සාහිත්‍ය නිර්මාණයක අර්ථ රසය මතුවෙන තවත් පැතිකඩකි භාෂාව රීත්‍යනුකූල ව යෙදීම. රීති වාදයේ පුරෝගාමියා ලෙස සැලකෙන **වාමනාචාර්යවරයා** රීතිය හඳුන්වා ඇත්තේ අපූර්ව ලෙස පද ගැළපීම ලෙස ය.

**"පදසටනා රීතිඃ"**

- කාව්‍යාලංකාර සූත්‍ර වෘත්ති -

එමෙන් ම විශිෂ්ට වූ පද රචනාව රීතිය වන බව ද ඔහුගේ අදහස යි.

**"විශිෂ්ටා පද රචනා රීතිඃ"**

- කාව්‍යාලංකාර සූත්‍ර වෘත්ති -

රීතිවාදීන් සලකන්නේ කාව්‍යයක ආත්මය රීතිය ලෙස යි.
**රීතිරාත්මා කාව්‍යස්‍ය** ඒ නිසා ම නිර්මාණයකට රීතිය අත්‍යවශ්‍ය බව ඔවුහු සැලකූහ.

වාමනාචාර්යවරයා දක්වන ආකාරයට භාෂාවේ පද අපූරු ලෙස ගැළපීම නම් වූ රීතිය හඳුනා ගන්නට පහත සඳහන් නිදසුන් පරීක්ෂා කර බලමු.

**දිලිහි දිලිහි**
**ආකාසේ**
**බබළන මල්**
**තාරකා**
**බැබළි බැබළි**
**අකාසේ**
**දිලිහෙන මල් තාරකා**

- තාරකා - ආනන්ද රාජකරුණා -

**සිලිලාරෙක හෙල්මැලි**
**පෙති අතරින් සැලි සැලි**
**ගතට නොයෙන සිතට දනෙන**
**සිලි සිලියක පැටලිලා**

- ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ -

**වක්කඩ ළඟ දිය වැටෙන තාලයට**
**තිත්ත පැටවු උඩ පැන නැටුවා**
**හත් දවසක් අමනාපෙන් සිටි කළු**
**නෝක්කාඩු බැල්මක් හෙළුවා**

- මහගම සේකර -

**"......දුමුවේ කසළ වුවත් කසළ දූමීමෙන් වන කුසලය නිකසළ වන බැවින්........."**

- නාගසේන වස්තුව - සද්ධර්ම රත්නාවලිය -

**"......ඇත බැලූ බැලූවන් "අනේ, අනේ" ' යි කියවන ඇත් රජයැ; මෑත බැලූ බැලූවන් "සාධු, සාධුයි" කියවන බුදුරජාණෝ ය. එවේලෙහි ඇතු ළංවත් ළංවත් සැදූහැත්තෝ ළෙහි අත් ගසන්නට වන්හැ. මුහුණෑ අත් දෙන්නට වන්හැ. බලා සිටිය නොහෙමියි මුහුණින් හෙන්නට වන් හැ.........."**

- නාලාගිරි දමනය -- බුත්සරණ -

මේ සෑම නිදසුන් පාඨයකින් ම පෙනෙන්නේ අපූර්ව ලෙස පද ගැළපීමකි. භාෂාව එසේ අපූර්ව ලෙස ගැළපීම නිසා අර්ථ රසය මනා ව මතු වී ඇත.

## භාෂාව අලංකාරවත්ව යෙදීම

භාෂාව අලංකාරවත් ව යෙදීම නිර්මාණයේ අර්ථ රසය පහසුවෙන් විඳගන්නට හේතු වන බව අලංකාරවාදීන්ගේ අදහස යි. ගද්‍ය හෝ පද්‍ය කාව්‍යය ශෝභාවත් කරන්නේ අලංකාරයන් ය යනු ශ්‍රීමත් දණ්ඩීන්ගේ අදහස යි.

**කාව්‍ය ශොභාකරන් ධර්‍මාන්**
**අලංකාරාන් ප්‍රචක්‍ෂතෙ**

- කාව්‍යාදර්ශය - (දණ්ඩින්)

අලංකාරවාදය ඉදිරිපත් කිරීමට දායක වන වාමනාචාර්යවරයාගේ අදහස වන්නේ කාව්‍යක සෞන්දර්යය සුරැකෙන්නේ අලංකාර හේතුවෙන් බව යි.

**සෞන්‍දර්‍ය්‍යමලංකාරඃ**

- කාව්‍යාලංකාර සූත්‍ර වෘත්ති -

අලංකාර යැයි සඳහන් කළ පමණින් ම විසිතුරු බවක් හැඟෙයි. කාව්‍යයක් විසිතුරු කරන්නේ අලංකාරවලිනි. අලංකාර මත කාව්‍ය විසිතුරු වන තරමට ම සහෘදයාට අර්ථ රසය විඳගන්නට අවස්ථාව සැලසේ.

**භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථයේ දැක්වෙන පරිදි මුල් යුගයේ පැවත ඇත්තේ**

**උපමා**

**රූපක**

**දීපක**

**යමක**

වශයෙන් අලංකාර හතරකි. පසුව මෙය වැඩී ගොස් ඇත. ශ්‍රීමත් දණ්ඩින් වැන්නන් පෙන්වා දෙන්නේ අලංකාර තිස්පහ (35)ක් ඇති බව යි. දැනට විද්‍යමාන ආදිතම සිංහල පද්‍ය නීති සංග්‍රය ලෙස සැලකෙන සේම කාව්‍යාදර්ශනයේ අනුවාදයක් ලෙස සැලකෙන සියබස්ලකරයෙහි අලංකාර තිස්පහ (35)ක් දක්වා ඇත.

යමෙකුගේ ශරීරය ආභරණවලින් බබළන්නේ යම් සේ ද කාව්‍ය ශරීරය බබළවන අබරණ "අලංකාර" නම් වේ. සහෘදයාගේ මනස ප්‍රබෝධවත් කොට තබා අපූර්ව වාග් චිත්‍ර මවන්නේ අලංකාරවලිනි. සාහිත්‍යකරුවන් බෙහෙවින් ප්‍රයෝජනයට ගන්නා අලංකාර කීපයක් හඳුනා ගනිමු.

### උපමාලංකාරය

යම්කිසි වස්තුවක් මේ ආකාර යැ යි තවත් වස්තුවක් හා සමාන කොට දැක්වීම උපමාලංකාරය යි. උපමේයයට සමීප කර දක්වන වස්තුව උපමානය යි. වර්ණනා කෙරෙන, වර්ණනාවට ලක් කළ යුතු වස්තුව උපමේයය යි. වස්තු දෙකේ සමීප බව මනින ලක්ෂණ සාධාරණ ධර්ම යි. එය බාහිර හා අභ්‍යන්තර ගති ලක්ෂණ මත සිදු වේ. වස්තු දෙක සම්බන්ධ වන්නේ උපමා වාචි නිපාත පදයකිනි. මෙම කරුණු හතරේ සමවායෙන් උපමාලංකාරය සිදු වේ.

**රූ රසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා**
**රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනූ පා තබ තබා**

- ගුත්තිල කාව්‍යය -

**මොහඳුරට ළහිරුවන් බව සයුරු පසුරුවන් ගුණ'ග මිණි සයුරුවන් එ දිවකුරු බුදුරුවන්**

- දළදා සිරිත -

### රූපකාලංකාරය

සාහිත්‍ය නිර්මාණයක සැඟවුණු උපමාව, රූපකය යි. මෙන්, සේ, වැනි ආදි උපමා වාචි පද ඉවත් කොට ඍජුව ම වස්තු දෙක සමාන කිරීම රූපකාලංකාරයේ ලක්ෂණය යි.

**හිමි තම නැණ නැ වින්**
සැදි සිප් තරඟ බෙහෙ වින්
වෙණ සිප් මහණ වින්
කළේ ඔහු පරතෙරට මැන වින්

### උත්ප්‍රේක්ෂාලංකාරය

වර්ණිත වස්තුවේ පවත්නා ස්වාභාවික ගුණය වෙනත් ආකාරයකින් දැක්වීම උත්ප්‍රේක්ෂාලංකාරය යි.

රැකු ලේනන් සාමුව කැන් පිනීමෙනි
නැගී බසින තුරු පෙත දුර පෙනීමෙනි
තොප කැඳවතී යන සැක සිතු දිනීමෙනි
ගොස් නොරුවට මග බැස යා තැනී තැනී

- තිසර සන්දේශය -

දඬු ලේනන්, වඳුරු සමූහයා පැනීමෙන් උස් ව පහත් වන්නා වූ ගස් පෙළ ඈත දැකීමෙන් තොපට ආරාධනා කරති යි යන සැක සිත ඉපදීමෙන් තැන් තැන්වල ගොස් නොරුවටී මාර්ගයට අවතීර්ණ ව යන්න. යන අර්ථය ඇති ඉහත පද්‍යයෙන් උත්ප්‍රේක්ෂාව මතු කොට අර්ථ රසය ඉස්මතු කොට දක්වා ඇත.

### ස්වභාවෝක්ත්‍යලංකාරය

වර්ණිත වස්තුවේ ඇති ස්වභාවය ඒ අයුරින්ම ඉදිරිපත් කොට අර්ථාලංකාර රසය මතු කිරීම ස්වභාවෝක්ත්‍යලංකාරය යි.

තුරු යටියෙන් හුණු පැටි ලෙහෙනුන් රැගෙන
සිත අටියෙන් පිඹ ඇඟ පිරිමැද සෙමෙන
මල ගෙටියෙන් පැන් පොවමින් අතිනතින
සිටි පැටියෙන් හෙරණුන්ගෙන් වෙයි සොබන

- ගිරා සන්දේශය -

### අතිශයෝක්ත්‍යලංකාරය

යම් වස්තුවක පවතින සැබෑ ස්වභාවය ඉක්මවා පෙනෙන සේ වර්ණනාවට ලක්කිරීම අතිශයෝක්ත්‍යලංකාරය යි.

සිසිවන වුවන ඉඟ සුග ගත හැක මිටින
නිසි පුළු'ලු'කුළ රිය සක'යුරු තිසර තන
දිසි රනලි'යෙව් රුසිරු යුත් මෙපුර ගන
ඇසි පිය හෙළන පමණින් නොවෙති දෙවගන

- සැලලිහිණි සන්දේශය -

කාන්තාවකගේ රූ සපුව පවතින ආකාරය ඉක්මවා ගිය වර්ණනාවක් සහිත ව මෙහි ඉදිරිපත් ව ඇත. එයින් විචිත්‍ර වර්ණනාවක් සහෘද මනසෙහි තැන්පත් කරවීමට නිතැතින් සමත් වීම නිසා අර්ථ රසය උද්දීපනය වෙයි.

මේ ආකාරයට කාව්‍යාලංකාර ඔස්සේ භාෂාව විචිත්‍ර ලෙස යෙදීම නිසා අර්ථාලංකාර රස නිෂ්පත්තිය සිදුවන බව දැක්විය හැකි ය.

## භාෂාව ධ්වනිතාර්ථවත්ව යෙදීම

භාෂාව ධ්වනිතාර්ථවත් ව යෙදීම නිසා සාහිත්‍ය නිර්මාණයක අර්ථ රසය ඉස්මතු වන බව ධ්වනිවාදීන්ගේ මතය යි. ධ්වනිය යනු ශබ්දයේත් අර්ථයේත් දෝංකාරය යි. මෙය කාව්‍ය නිර්මාණයක අභ්‍යන්තරය ඇසුරු කරගෙන උපදී.

ධ්වනිය කාව්‍යයක අර්ථ රසය ඇති කරලීමෙහි ලා අතිශය ප්‍රබල ව දායක වන බව ධ්වනිවාදීන් පිළගෙන ඇත. ධ්වනිවාදයේ පුරෝගාමියා ලෙස සැලකෙන ආනන්දවර්ධන ධ්වනිය කාව්‍යයක ආත්මය බව සඳහන් කිරීමෙන් ඒ බව තහවුරු වේ.

**කාව්‍යස්‍යාත්මා ධ්වනිඃ**

- ධ්වන්‍යාලෝකය -

හුදෙක් වචනවල කැටි වී ශබ්ද හා මුසු වූ දෙය මෙහි ධ්වනිය ලෙස නොගැනේ. කාව්‍යෝක්තීන්හි අන්තර්ගතයෙන් ව්‍යංග්‍යාර්ථවත් ව අඟවා ගත හැකි දේ ධ්වනිය යි. භාෂාව ධ්වනිතාර්ථවත් ව යෙදූ විට අර්ථ රසයට කෙතරම් නම් සහයක් ලැබෙන්නේ ද යන්න පහත නිදසුනෙන් තහවුරු වේ.

**සන් නන් සිහින්ගෙඳි සෙවණලු වැලි තෙලෙන**
**තැන් තැන් වල ම සැතපී සියුමැලි බැවින**
**රන් වන් කරල් ගෙන එන ගිරවුන් අතින**
**යන් මන් තොසින් මග තොරතුරු නියම දූන**

- සැලළිහිණි සන්දේශය -

(ඔබ) සියුමැලි වූ නිසා, නොයෙක් ආකාරයට සෙවණ වැටුණු හීන්ගෙන්ද ගස් සහිත වැලිතලාවේ තැන්තැන්වල විවේක ඇරගෙන, රන් පැහැ වී කරල් රැගෙන එන ගිරවුන්ගෙන් නිවැරදි ව මග තොරතුරු අසා සිත් සතොසින් යන්න.

යන භාවාර්ථයක් සහිත ඉහත පද්‍යයේ ධ්වනිතාර්ථය අනුව පහත කරුණු අඟවා ගත හැකි ය.

* **සන්දේශ රැගෙන යන්නේ වසන්ත කාලයක බව**
* **ප්‍රදේශයේ අස්වනු නෙළන කාලය බව**
* **ප්‍රදේශයේ අස්වැන්න සශ්‍රීක බව**
* **ගිරවුන්ට කරල් රැගෙන යාමට අවස්ථාව සැලසී ඇති නිසා ගොවියන් ධාර්මික බව**

## භාෂාව වක්‍රෝක්තියෙන් යෙදීම

අද්දැකීම තුළින් වක්‍රාකාර වාග් චිත්‍රයක් මැවිය හැකි නම් එහි ඇත්තේ වක්‍රෝක්තිය යි. ඒ අනුව අද්දැකීමට අදාළ ව කිසියම් වචන මාලාවක් කෙසේ හෝ ගැළපීමෙන් සාහිත්‍ය නිර්මාණයක් ජනිත නොවන බව මෙයින් තහවුරු වේ.

වක්‍රෝක්තිය ගැබ් වූ නිර්මාණය අර්ථ රසය උද්දීපනය කරමින් සහෘදයාට රසවින්දනය සඳහා දායක වෙයි. මීට කදිම නිදසුනක් පහත දැක්වේ.

**කෝං ගහේ කොළ හැලුණා**
**වැව උතුරා වාං දැම්ම**
**මහ රෑ වැව ඉස්මත්තෙන්**
**උලමෙකුගේ හඬ ඇහුණා**

- සිට්ටම්මා - විමල් දිසානායක -

නිර්මාණකරුවා මෙහිදී සංකේත රාශියක් ඇසුරෙන් මරණය පිළිබඳ අදහස වක්‍රාකාර ව දක්වා ඇත. එමෙන් ම,

**ඇළ දොළවල බඩගාන්නෙ**
**මහපොළොවේ ලෝදිය යි.**

- පේරාදෙණි නියඟය - සිරි ගුණසිංහ -

යනුවෙන් සඳහන් කරන විට දැඩි නියගයක අපූර්ව චිත්‍රයක් වක්‍රාකාර ව මැවී යයි. වක්‍රෝක්තිය ද කාව්‍යක ආත්මය බව වක්‍රෝක්තිවාදයේ නිර්මාතෘ **කුන්තක** ආචාර්යවරයා තම "වක්‍රෝක්තිජීවිත" නම් ග්‍රන්ථයේ දක්වා ඇත.

මෙයින් තහවුරු වන්නේ භාෂාව ධ්වනිතාර්ථවත් ව යෙදීමට නිර්මාණකරුවා වගබලා ගත යුතු බවත් එසේ යෙදීම සාහිත්‍ය රස වින්දනයේදී සහෘදයාට මනා පිටිවහලක් බවත් ය.

## භාෂාව ඖචිත්‍යව යෙදීම

සාහිත්‍යකරුවා සිය අනුභූතියට අනුව භාෂාව හැසිරවීමේදී පද, වාක්‍ය, ප්‍රබන්ධාර්ථ, රස, ක්‍රියා, ලිංග, වචන, කාල, දේශ ආදියට උචිත වන ලෙස සිදු කළ යුතු ය. ඒ උචිත බව ගිලිහුණු විට කාව්‍යයේ රසය නැති වේ. ඖචිත්‍යවාදයේ පුරෝගාමියා වන **ක්ෂේමේන්ද්‍ර** ආචාර්යවරයා ඒ බව පිළිගෙන ඇත.

**අනෞචිත්‍යදෘතෙනාන්‍යත්**
**රස භංගස්‍ය කාරණම්**

- ඖචිත්‍ය විචාරචර්චා -

සියලු ආකාරයෙන් ම උචිත බවින් පිරිපුන් නිර්මාණයක් අර්ථ රසය මතුකරලීමට සමත් වෙයි. වැස්ස අනුභූතිය කොට ගත් මේ නිදසුන දෙස බලන්න.

**චිචිරි චිරි චිචිරි චිරි උදේ සිට ඇදහැලෙන**
**පොද නොකැඩී තෙත බරි ව හිරිකිතෙන් කිළිපොළන**
**පාර තොට ගහ කොළ ද වසාගෙන හැම අතින**
**වහින වැහි වහින වැහි නොපායන මුළු දවස**

- ගුණදාස අමරසේකර -

එහෙත් පහත දක්වෙන අනෞචිත්‍ය බවින් පිරිපුන් පදවැලක් කෙසේ නම් කාව්‍යයකට නිදසුනක් වන්නේ ද?

**අනේ සුසානෝ**
**මම කොළඹ යන කොට**
**බල්ලොත් නොකන**
**වැල වරකා ගල්කිස්සේ**
**නැව් නැගලා යනවා වංගෙඩිය**
**හැම දෙවියනේ**
**මගෙ වාහේ රකෝ රකෝ**

- රංචාගොඩ ළමයා -

මේ ආකාරයෙන් දක්වූයේ භාෂාව අර්ථයට පාදක වෙමින් රස මැවූ විවිධාකාර පැතිකඩයන් ය.

## ශබ්දයට පාදක වෙමින් රස මවන්නේ කෙසේ ද?

අත්දැකීම, භාෂාව උපයෝගී කර ගෙන අර්ථයෙන් පමණක් හැඩගැන්වීම ප්‍රමාණවත් නැත. සාහිත්‍යකරුවා නිරන්තරයෙන් උත්සුක වන්නේ භාෂාව හරහා නිර්මාණය ශබ්දයෙන් ද හැඩගැන්වීමට ය. සාහිත්‍ය බිහිවන්නේ එසේ හැඩ ගැන් වූ ශබ්ද සහ අර්ථ දෙකේ එකතුවෙනි.

මෙහි ශබ්දය හැඩගැන්වීම යන්නෙන් අදහස් කෙරෙන්නේ ශබ්දය අලංකාර කිරීම යි. නිර්මාණයක ශබ්ද රසය මතුවන්නේ එවිට ය. සාහිත්‍ය නිර්මාණකරුවා ශබ්ද රසය ඉස්මතු කිරීම සඳහා භාවිත කරන උපක්‍රම කිහිපයක් පහත දැක්වේ.

## භාෂාව වෘත්තකට අනුව යෙදීම

කාව්‍යකරණයේදී වෘත්ත යනුවෙන් හැඳින්වෙන්නේ අක්ෂර නියමය යි. නැතහොත් මාත්‍රා නියමය යි. ඒ ඒ මාත්‍රා නියමයන් සහිත වෘත්ත අවස්ථෝචිත ව යොදා ගැනීමෙන් සාහිත්‍යකරුවා අර්ථානුකූල ශබ්ද රසය ඇති කරයි.

නැටුමකට උචිත අපූරු වෘත්තක් යොදා ගනිමින් ගුත්තිල කතුවර වෑත්තෑවේ හිමියන් සහෘද සිතෙහි නැටුමක සිතුවමක් මවා ඇති අයුරු යි මේ.

**පුන් මදාරා මල් දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා**
**මන්මඳා කිතු ලිය ලෙසින් උර තුර සරා දිලි මුතු ලතා**
**මන් නඳා වන මිණි මෙවුල් නද වෙණ නදින් එක් කොට ඉතා**
**උන් එදා දුන් රඟ දුටොත් තව සක් සැපත් කවරෙක් පතා**

- ගුත්තිල කාව්‍යය -

## භාෂාව රිද්මානුකූලව යෙදීම

නිර්මාණයක් ශබ්දයෙන් අලංකාර කොට රස නිපදවිය හැකි තවත් උපක්‍රමයකි රිද්මය, ලය, තාලය යනුවෙන් ද මෙය හැඳින්වේ. සහෘදයා නිර්මාණය තුළ සාමාධිගත කරවනු ලබන්නේ රිද්මය විසිනි. එය ඔහුගේ අර්ථ රස වින්දනයට බෙහෙවින් උපකාරී වෙයි.

**ලකල පුළුලුකුළ බඳ මිණිමෙවුල්ලා**
**සමග රන් සළඹ රැවු දී වෙවුල්ලා**
**වයන පදට තබමින් පද කමල්ලා**
**රඟන ළඳුන් බල රූසිරි සියල්ලා**

- සැලළිහිණි සන්දේශය -

මෙම පද්‍යය කියවත් ම නැටුමක රිද්මය සහෘද මනසෙහි කා වැදී යන්නේ අවස්ථෝචිත ව භාෂාව රිද්මානුකූල ව යොදා ඇති බැවිනි.

## භාෂාව අනුප්‍රාස සහිතව යෙදීම

අනුභූතියට අනුගතව අර්ථ රසයට බාධා නොවන සේ අකුරු, පද නැවත නැවත යෙදීමෙන් අනුප්‍රාස රසය මතු කර ගත හැකි ය.

වෙරළ ඉගිළ තුළ රළ වැළ ලෙස උලෙළ
නැබළ පටළ පෙළ ලෙළ වමිනි කෙළ කෙළ
කරළ කෙරළ මොළ බළ දළ දප පහළ
පුවළ සිහළ දළ බළ මුළු නිති ඔසළ

- ගිරා සංදේශය -

## භාෂාව එළිසමය සුරැකෙන සේ යෙදීම

පද්‍යයක එක් එක් පාදයෙහි මුල මැද අග වශයෙන් හෝ මුල අග වශයෙන් හෝ අග පමණක් හෝ සමාන අකුරු යෙදීම එළිසමය රැකීම යි. මෙය එළිවැට රැකීම ලෙස ද සඳහන් වේ.

කුන්දා පෙති හර සෙ දිළි දළ දසනීය
රන්දා හස පැටි සෙ දිළි යුග දෙතනීය
නන්දා සුර ලිය සෙ දිළි එම තරුණීය
කැන්දා ගෙන එන සෙ යළි මට සිතුනීය

සාහිත්‍ය නිර්මාණයක ශබ්ද රසය ඇති කිරීම සඳහා මේ ආකාර ප්‍රයෝග භාවිත කිරීමට නිර්මාණකරුවා උත්සුක වෙයි. එවිට අර්ථ රසයත් ශබ්ද රසයත් එක සේ ලබන සහෘදයා සාහිත්‍යකරණයේ සැබෑ ඵලය නෙළා ගත්තකු බවට පත් වෙයි.

## සාහිත්‍ය රසාස්වාදය හා විචාරයට ආකෘතියක්

ඉහත සඳහන් සාහිත්‍ය රසාස්වාදයට හා විචාරයට අදාළ තොරතුරු ඔස්සේ නිර්මාණයක් රසාස්වාදයට හා විචාරයට ලක් කිරීමේදී පහත සඳහන් ආකෘතිය ඇසුරු කිරීම වැදගත් වේ.

1. **සාහිත්‍ය නිර්මාණකරුවාගේ අරමුණ සෙවීම**
2. **අරමුණ මුදුන් පමුණුවා ගැනීමට භාවිත කළ රචනෝපක්‍රම සොයා බැලීම. (ඉහතින් දක්වූයේ ඒ රචනෝපක්‍රම යි)**
3. **නිර්මාණය ඇගයීමට ලක්කිරීම. (නිගමනාදිය සහිතව)**

## ක්‍රියාකාරකම 1

**පහත සඳහන් පද්‍ය පාඨවල, රචකයාගේ අරමුණ කුමක් දැ යි වෙන් වෙන් ව ලියා දක්වන්න.**

★ සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි
ඇඹරෙමි එහෙත් පසු නොබසිමි නො නවතිමි
කවදා කොතනක දී හෝ මහ මුහුද හිමි
හමුවුණ කෙණෙහි මා සතු බර ඔහුට දෙමි

★ ජාතිය රන් විමනක් වේ
ආගම මිනි පහනක් වේ
එය රැක ගන්නට මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

★ උණුසුම් ගතිය ඇතිමුත් සිය කැදැල්ලෙ හි
පැටවා අකමැතිය හිර වී ඉඳිල්ලෙ හි
දෙනෙතට නිල් අහස යොමුවන ඇසිල්ලෙ හි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙ හි

★ මම කවියෙකි හදැති  සසල
ලො සත සියලු දුක  වළඳන
එදුක ලොවට කියනු  විනා
නොමැති මසතු අන්  යුතුකම

★ පුංචි පැලේ
මං තනි වුණු වෙලාවේ
පමා වෙලා
වැහැපන් වැහි වලාවේ

## ක්‍රියාකාරකම 2

❁ **ඉහතින් දැක්වූ සාහිත්‍ය රසාස්වාද ආකෘතියට අනුව පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් පිළිබඳ විචාරාත්මක රසාස්වාද ඉදිරිපත් කරන්න.**

I **වෙණ වැයුමක අසිරිය**

කන් කලු වෙණ නද ඇසුමෙහි  ලොබිනේ
රන් රසු දැල් කොලහල වන  බියෙනේ
සන් සල නොව එහි පිළි රූ  ලෙසිනේ
නන් හය සෙන් සිටියෝ සිටි  මතිනේ

නිති නිරිඳුගෙ රැකවලෙහි  නියුත්තෝ
රුති ලෙස රුපුනොද බිඳ ජය  ගත්තෝ
පැතිරෙන වෙණ නද බැඳුණු  සිතැත්තෝ
අතිනව් ගිලිහෙන බව නොම  දත්තෝ

මන් මත් කරවන දන මුළු  දෙරණා
රසවත් වන වෙණ නද නද  කරණා
සවනො’ත් සඳ සුරඟන ලොබ  දියුණා
නොදනිත් දරුවන් ඇකයෙන්  වැටුණා

පන්සිළු වීණා නද පසු  බැස්වූ
මන් පිනවන වෙණ නදයෙන්  තොස්වූ
නන් දන කැන් දුටුව ද බිය  සිස්වූ
මින් රළ’වුත් ගං වෙරළට  රැස්වූ

- ගුත්තිල කාව්‍ය -

II **නැළැවිල්ල**

තොටිල්ල සැම සුව  පිරි
පැද්දෙයි තාලෙට  සරි
අසමින් ගී  සුමිහිරි
නිදන්න පුත රන්  කිරි

උණු වැඩි යැයි හිරුගෙ  රැස්
තෙමා නැවත ගෙනෙන  ලෙස්
ගියේ යැ වැද මුහුදු  කුස්
පෙනේ ද ආදර  වෙසෙස්

සිහිල් වෙති යි සඳ ඉතා
සාවා එහි පැන ගතා
රැසින් අඩක් නොනවතා
සිටී ද ඒ හොඳ සතා

සුරතල් දරු බිය වෙතී
කුරුලු පැටව් නොනැවතී
නැළැවිල්ලෙන් කම් නැතී
කිරිල්ලෝ ද සැතපෙතී

දරු නැළවිල්ල - මුනිදාස කුමාරතුංග

III
ඒ මිහිරි රුව ඇසැහෙත් මැ, ඒ මිහිරි හඬ කණැ හෙත් මැ දකුණතින් ගත් කඩුව බිමැ වැටී හෙන බැව් නොදනැ, වමතින් ගත් පලඟය වැටී හෙන බව් නොදනැ, දෙක දෙඅතින් හෙළා ශ්‍රී පාදයෙහි වැඳැ වැතිර ගොස් "දතිම් ස්වාමිනී, හැඳින්නෙමි ස්වාමීනි, මහාමායා දේවීන් වහන්සේගේ පුතණුවන් වහන්සේ නුඹ ද? සුද්ධොදන රජ්ජුරුවන් වහන්සේගේ පුතණුවන් වහන්සේ නුඹ ද? ගැත්තවු කරන පව් ස්වාමින් ඇසට පැනිණි ද? මෙතෙක් තැන් වැඩියේ හුදකළා ගැත්තවු කෙරෙහි කළ කරුණායෙන් ද? දිවි පමණින් සරණ වන්මි. ඇස නිවී ගියේ, සිත සැනහී ගියේ, කළ පව් ගෙවී ගියේ, ගැත්තවුට කරුණා කොට වදාළ මැනවැ යි..."

- බුත්සරණ - අංගුලිමාල දමනය -

## ක්‍රියාකාරකම 3

**I පහත සඳහන් ගේය පද රචනා පිළිබඳ ව විචාරාත්මක රසාස්වාද ඉදිරිපත් කරන්න.**

මේ භවයෙදි මුළු දිය දායේ
එකතු නොවෙනු ඇත අප ආයේ
පවස නිවන දිය පොදක් නොවී ඔබ
ඇයි මහ සාගරයක් වූයේ

ඔබ ගැන ඉපදෙන සිතුවිල්ලේ
අවසන මුල වේ ළතැවිල්ලේ
වෙරළෙහි ගල් පරයක් විය හැකි නම්
තෙමුණත් ඇත කරදිය රැල්ලේ

සුදු මුදු වැල්ලෙහි නතර වෙලා
රල පස රල ලුහු බඳිනු බලා
සුසුම් වළලු උඩු ගුවනට යවනෙමි
පැතුම් සඳුන් හද ගලෙ හි උලා

- කරුණාරත්න අබේසේකර -

II කවුරුදෝ අර කවුළුවෙන්
හිනා වී එබී කම් කළේ
ඒ හිනාවෙන් මා වෙළන්නද
මා වෙළාගෙන මට තලන්න ද
ඇ සිනාවෙන්නේ

ඉතිං මට බැහැ ඈත යන්නට
ඒ නුවන් රැහැනින් මිදීලා
කවුළුවේ දොර හදෙන් ඇරගෙන
නෙත් ළඟින් ඉන්නම්

කතා නොකරන තාරකාවක්
පාර කීවත් මම නොයන්නෙමි
කවුළුවේ දොර හදෙන් ඇරගෙන
නෙත් ළඟින් ඉන්නම්

- ඩෝල්ටන් අල්විස් -

III
දවසක් පැල නැති හේනේ
අකාල මහ වැහි වැස්සා
තුරුලේ හංගා ගෙන මා
ඔබ තෙමුණා අම්මේ
පායන තුරු හිටි පියවර
හිටියා ඔබ අම්මේ

නුවර වීදි යටකරගෙන -- නින්දා වැහි වැගිරුණදා
බිරිඳකගේ සෙනෙහෙ ගියා -- යෝධ ඇළේ නැම්මේ
ඔබෙ සෙනෙහස සුවඳ දි දී -- දැනුණා මට අම්මේ

කොළඹ අහස කළු කරගෙන
මුහුදු හුළඟ අඬලන කොට
ඔටුන්න බිම දා දුවගෙන
එන්න ද එක පිම්මේ
මං එනතුරු ඉදිකඩ ළඟ
ඉන්නවා ද අම්මේ

- අධිනීතිඥ රන්බණ්ඩා සෙනෙවිරත්න -

## සුභාෂිත

**"යතෙන කෘතෙ යදි න සිද්ධ්‍යති කොත්‍ර දොෂඃ"**

උත්සාහවත් වී, ප්‍රතිඵල නොලැබුණ ද කම් නැත

## සුචින්තන


පෙනෙන දෙයට වඩා යමක් ඔබට දැකිය හැකි නම් ඔබ බුද්ධිමත් ය.

# 17

# වාක්කෝෂය පෝෂණය

භාෂාවකින් සන්නිවේදනය වන්නේ අදහස් ය. අදහස් සැකසෙන්නේ වාක්‍යවලිනි. වාක්‍ය සම්පූර්ණ වන්නේ වචනවලින් ය. භාෂාවක වචන මාලාව පොහොසත් වන්නේ යම් තරමකට ද එම භාෂාව ඒ තරමට ම පොහොසත් ය. සිංහල භාෂාව ද ලෝකයේ පවතින භාෂා අතර පොහොසත් භාෂාවකි. සිංහල වචන මාලාවේ පොහොසත්කම ඊට හේතුව යි. ඒ පොහොසත්, සිංහල වචන මාලාව කෙසේ සකස් වී දූ යි, කෙසේ පෝෂණය වී දූ යි සොයා බැලීම **වාක්කෝෂය පෝෂණය** පාඩමෙන් අපේක්ෂා කෙරේ.

# අපූරු ඉගෙනීමක්




"ආ....... මෙන්න පොඩි නමට ලියුමක් එවල, අරක්ගහ නායක හාමුදුරුවො......."

සිරි ධම්මවාස මහ පිරිවෙණේ කෘත්‍යාධිකාරි පූජ්‍ය පඹුරේ ආනන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ තම ශිෂ්‍ය පීතිපුර සුනන්ද පොඩි හාමුදුරුවන් අමතා උන්වහන්සේ නමට ආ ලිපියක් එසේ බාර දුන්හ.

ප්‍රීතිපුර සුනන්ද පොඩි හාමුදුරුවෝ සිරි ධම්මාවාස පිරිවෙණේ 5 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යවරයෙකි. පිරිවෙණේ ගුරු-ශිෂ්‍ය දෙපිරිසේ ම ආදරය, ගෞරවය දිනා සිටි උන්වහන්සේ, ආයතනික වත්පිළිවෙත්වලත් විෂය බාහිර ක්‍රියාකාරකම්වලත් මැනවින් නිරත වෙමින් ඉගෙනීමට ම අවධානය යොමු කර සිටින ශිෂ්‍ය හිමිනමකි. ඉගෙනීමේදී උන්වහන්සේට ඇතිවන ගැටලු නිරාකරණය කර ගන්නේත්, යම් අලුත් තොරතුරක් දැනගැනීමට අවශ්‍ය වූ විට එය දැනගන්නේත් පූජ්‍ය අරක්ගහ දේවින්ද හාමුදුරුවන් වහන්සේගෙනි. නායක හාමුදුරුවෝ මුළු සාමපුර පළාතේ ම සිටින රාජකීය පණ්ඩිත උපාධිය හිමි කර ගත් එක ම යතිවරයාණෝ ය. සාමපුර පළාතේ ඕනෑ ම අයෙකුගේ ආගමික, ජාතික ආධ්‍යාපනික අවශ්‍යතාවක් ඇතොත් ඒවා සපුරාලන්නේ නිහතමානීව ම ය.

ප්‍රීතිපුර සුනන්ද පොඩි හාමුදුරුවෝ "**වාක්කෝෂය පෝෂණය**" පිළිබඳ තොරතුරු විමසා අරක්ගහ නායක හාමුදුරුවන්ට යවන ලද ලිපියට පිළිතුරු ලිපිය යැයි සිතා තමන්ට ලොකු හාමුදුරුවන් වහන්සේ ලබා දුන් ලිපිය විවර කළේ අතිශය සතුටිනි. එය කියවා අවසන් වන තුරු උන්වහන්සේට ඉවසුම් නැති විය. උන්වහන්සේ ඒ ලිපිය මෙසේ කියවන්නට පටන් ගත්හ.

2017-07-08

සුනන්ද පොඩි නම වෙත මෙත් සිතිනි,

ඔය නම අසා එවල තිබුණා නේද **වාක්කෝෂය පෝෂණය** කියන්නෙ මොකක්ද කියලා?

පොඩිනම, ඕනෑ ම ජාතියක් තම අදහස් සන්නිවේදනය කර ගැනීම සඳහා භාෂාව යොදා ගැනීමේදී වචන මාලාවක් පාවිච්චි කරනවා. වාක්කෝෂය කියන්නෙ ඒ වචන මාලාවට. එය, යම් ජාතියක් පහළ වීමත් සමග සම්පූර්ණ වී සැකසෙන්නක් නොවේ. ජාතියක් අන්‍ය ජාතීන් හා ඇතිකර ගන්නා සංස්කෘතික, සමාජ, ආර්ථික, දේශපාලනික සම්බන්ධතා මත ක්‍රමයෙන් වර්ධනය වී සකස් වන දෙයක්.

මුලින් තමන් භාවිත කළ වචන මාලාවට වෙනත් භාෂාවන්ගෙන් විවිධාකාරව වචන එක් වී භාවිතයට ඒම **වාක්කෝෂය පෝෂණය** හැටියට සඳහන් කරන්න පුළුවනි. ඕනෑ ම ජීව භාෂාවක මෙය දකින්න තිබෙන දෙයක්.

ඒ ආකාර කුමන හෝ භාෂාවක පවතින වාක්කෝෂය නැත්නම් වාග්මාලාව කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය.

1. නිෂ්පන්න
2. තත්සම
3. තත්භව

## 1. නිෂ්පන්න

නිෂ්පන්න යනු දේශයෙහි උපන් යන අර්ථය යි. ජාතියක සන්නිවේදන අවශ්‍යතාව උදෙසා ඒ ඒ දේශයන්හි හටගෙන පැවත එන වාග්මාලාව නිෂ්පන්න වාක්කෝෂය යි. දේශජ වාග්මාලාව ලෙස ද මෙය හැඳින්වේ. ''**කිසි අන්බසින් නුමුසු හෙළ දිවැ පළ නිපන් නම්**'' කිසියම් අන්‍ය භාෂාවකින් මිශ්‍ර නොවී හෙළ දිව ම පහළ වූ වදන් නිෂ්පන්න වේ යනුවෙන් සිදත් සඟරාවේ දැක්වූයේ මෙය යි. ලෝකයේ සෑම භාෂාවක ම පාහේ නිෂ්පන්න වාක්කෝෂයක් දකින්න තිබෙනවා.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ආදියේ (මුල් කාලීන) සිට පැවත ආ **යක්ෂ, රාක්ෂස, දේව, නාග** වශයෙන් වූ ගෝත්‍රික ජන කොටස් භාවිත කළ වාග්මාලාව ලංකාවේ නැත්නම් සිංහල දේශයේ නිෂ්පන්න වාක්කෝෂයට අයත් වෙනවා.

ඒ අතීත ශ්‍රී ලාංකිකයින් සරල ජීවන රටාවක් මෙන් ම සීමා සහිත ව පැතිර ගිය සමාජ සංස්කෘතික හර පද්ධතියක් ඇති ව සිය ජනජීවිතය පවත්වාගෙන ගිය පිරිසකි. ඒ නිසාම ඔවුනට සන්නිවේදන කාර්යය සඳහා එතරම් පැතිර ගිය වාක්කෝෂයක් අවශ්‍ය වූයේ නැත. ඔවුනගේ වාක්කෝෂය සීමිත වූයේ ඒ නිසා ය. එහෙත් ඔවුනගේ දෛනික අවශ්‍යතා සියල්ල ඉටු කර ගැනීම සඳහා ඒ වාක්කෝෂය ප්‍රමාණවත් විය. පහත සඳහන් වන්නේ ඒ ආදි සිංහලයන් භාවිත කළ වාක්කෝෂයට අයත් නිදසුන් කිහිපයක්.

### නොයෙක් වස්තු හා ස්ථාන කියවෙන නාම

| | | |
|---|---|---|
| විල | තැන්න | ළැම |
| වෙල | ගොඩ | රුවල |
| කන්ද | සුළඟ | ළිප |
| ලන්ද | එළිය | ගෙඩිය |
| කැලෑව | වතුර | ලෑල්ල |
| බැද්ද | ඔරුව | පිහිල්ල |
| නාය | පාරුව | වැය |
| | ළිඳ | බඩ |
| | පැල | කට |

### වෘක්ෂලතා නාම

| | | |
|---|---|---|
| කොස් | කොබෝලීල | දෙල් |
| කොහොඹ | පොල් | දිවුල් |
| කඳුරු | මුරුත | හොර |
| වෙරළු | මොර | ගොරක |

### තිරිසනුන්ගේ නාම

| | | |
|---|---|---|
| අලියා | උරුලෑවා | කොටියා |
| ඉත්තෑවා | බල්ලා | කැනහිලා |
| රිළවා | ලෙහෙනා | ගෙරියා |
| කබල්ලෑවා | උගුඩුවා | කලවැද්දා |
| මුගටියා | හම්බාවා | |

### උරග නාම

| | | |
|---|---|---|
| පිඹුරා | පොළඟා | ගැරඬියා |
| මාපිලා | කටුස්සා | හූනා |

### පක්ෂි නාම

| | | |
|---|---|---|
| උකුස්සා | කොබෙයියා | උලමා |
| බටගොයා | කොරවක්කා | බස්සා |

### කෘමි සතුන්ගේ නාම

| | | |
|---|---|---|
| පළඟැටියා | වේයා | සමනලයා |
| කඩියා | දෙබරා | කෝඳුරුවා |
| මදුරුවා | | |

### මත්ස්‍ය නාම

| | | |
|---|---|---|
| ලූලා | මගුරා | කොරලියා |
| කාවයියා | තෝරා | මෝරා |
| හුරුල්ලා | | බෝල්ලා |
| පරවා | | |

**ක්‍රියාවාචික ශබ්ද (ධාතු)**

| | | | |
|---|---|---|---|
| අඬ | (ඇඬීමෙහි) | අන | (ඇනීමෙහි) |
| ඇද | (ඇදීමෙහි) | ඉල්ව | (ඉල්ලීමෙහි) |
| උසුල | (ඉසිලීමෙහි) | රවට | (රැවටීමෙහි) |
| පෙර | (පෙරීමෙහි) | දවට | (දැවටීමෙහි) |
| කොඳුර | (කෙඳිරීමෙහි) | එළඹ | (එළඹීමෙහි) |
| එළව | (එළවීමෙහි) | ඔරව | (එරවීමෙහි) |

**වෙනත් විවිධ නාම**

| | | |
|---|---|---|
| පොරය | හටන | රැහැන |
| උරණ | බොළඳ | ළමයා |
| ළඳ | ලුහුඬු | ලෙහෙසි |
| බිළිඳා | බුරුල් | සිහින් |
| එරෙහි | හුඟ | තරහ |
| හපනා | නැඹුල් | |

## 2. තත්සම

සුනන්ද පොඩි නම,

මම මෙතෙක් විස්තර කරල දුන්නෙ ආදි ශ්‍රී ලාංකිකයින් (ස්වදේශිකයන්) භාවිත කළ මූලික වාක්කෝෂය යි. එය පෝෂණයට බලපෑ වාග්කෝෂ දෙකක් තිබෙනව, **තත්සම** හා **තත්භව** කියලා.

මෙහි **තත්සම** වාක්කෝෂය යනු වෙනත් භාෂාවලින් ලැබී ඒ අයුරින් ම භාවිත කරන වාක්කෝෂය යි. තත්සම යන්නෙහි තිබෙන්නේ ඊට සමාන යන අර්ථය යි. මේ වාක්කෝෂයට ප්‍රධාන වශයෙන් ගැනෙන්නේ අපේ මාතෘ භාෂා ලෙස හැඳින්වෙන **පාලි, සංස්කෘත** භාෂාවන්ගෙන් ලැබුණු වාක්කෝෂය යි. "**මග ද සකු ඈ බණ සම වූ බස තසම නම්**" පාලි සංස්කෘත ආදි භාෂාවන් හා සමාන වූ වචන තත්සම නම් වේ යනුවෙන් එය සිදත් සඟරාවේ සඳහන් වේ. එම භාෂාවන්හි භාවිත වචන අපේ රටේදී ඒ අයුරින් ම පාවිච්චියට ඇවිත් තිබෙනවා. පාලි සංස්කෘත භාෂා හැඳින්වෙන්නේ **ආර්ය භාෂා** කියල යි. මේ නිදසුන් ටික බලන්නකො.

| | | |
|---|---|---|
| ධර්ම | ශක්ති | භය |
| අමාත්‍ය | වචන | ශල්‍ය |
| ආහාර | මන්ත්‍රි | දේශනා |
| කර්ම | විශේෂ | හෘදය |
| පුරුෂ | හස්ත | ශිල්ප |
| ගෞරව | ගෘහය | පාද |
| ශාස්ත්‍ර | ලෝක | ස්ත්‍රී |
| ජීව | අධිපති | භූමි |
| කථා | උත්සව | අධිකාරි |
| වර්ෂා | | |

**අනාර්ය** භාෂාවක් ලෙස හැඳින්වෙන **ද්‍රවිඩ** භාෂාවෙන් ලැබුණු වචනවලින් ද නිෂ්පන්න වාක්කෝෂය පෝෂණය වෙලා තිබෙනවා.

| | | |
|---|---|---|
| අත්තිවාරම් | තුවක්කු | ඉලක්කම් |
| උඩැක්කි | කොත්තමල්ලි | තක්කඩි |
| තුට්ටු | හෙප්පු | තලප්පා |
| අච්චු | කිට්ටු | කට්ටකම් |
| පංගු | කුරුම්බා | පන්දම් |
| සුරුට්ටු | සීට්ටු | පිට්ටු |
| මුට්ටු | කොට්ට | කුට්ටම් |
| ආප්ප | ඉඩම් | |

ඒ වගේ ම පොඩි නම,

යුරෝපීය ජාතීන් වන පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ජාතිකයින් ලංකාවට පැමිණීමත් සමග ඔවුන් භාවිත කළ වචන ද ඒ අයුරින් ම අපේ භාෂාවට එක්වෙලා තිබෙනවා. අපේ වාක්කෝෂය පෝෂණය වීමට එම වචනත් තත්සම වශයෙන් බලපෑවා.

**පෘතුගීසි භාෂාවෙන් ලැබුණු වචන**

| | | |
|---|---|---|
| කරත්ත | කෝප්ප | පාන් |
| කසාද | ජනේල | පෙනේර |
| කලිසම් | ගෝවා | පෝරක |
| බෝනික්කා | කාමර | තුරුම්පු |
| රේන්ද | කාසි | තුවාය |
| විනාකිරි | | |

**ලන්දේසි භාෂාවෙන් ලැබුණු වචන**

| | | |
|---|---|---|
| ඉස්ත්‍රික්කය | බක්කිය | සොල්දරේ |
| ඉස්තාලය | බක්කරේ | බූදලේ |
| ඉස්තෝප්පුව | බේකරි | සූකිරි |
| කන්තෝරුව | බොයිලේරුව | බාල්ක |
| කොමසාරිස් | තප්පුව | දොයිතුව |

**ඉංග්‍රීසි භාෂාවෙන් ලැබුණු වචන**

| | | |
|---|---|---|
| ටෙලිෆෝන් | ඇපල් | ටෙලිග්‍රෑම් |
| ටොෆි | ග්‍රැමෆෝන් | බයිසිකල් |
| බස් | කාර් | |

## 3. තත්භව

අපේ වාක්කෝෂය පෝෂණය කළ අනිත් වාග්මාලාව වන්නේ **තත්භව වාක්කෝෂය යි.** තත්භව යනු එයින් බිඳුණු යන අර්ථය යි. වෙනත් භාෂාවන්ගෙන් බිඳී ඇති වචන මේ කොටසට ඇතුළත්. ''**බිඳුණේ තබව නම් වේ**'' යනුවෙන් සිදත් සඟරාවේ මෙය දක්වේ. මේ වචනවලින් ද වැඩි කොටසක් සැකසී තිබෙන්නේ පාලි, සංස්කෘත භාෂාවන්ගෙන් බිඳී ආ වචන ලෙස යි. මේ තිබෙන්නේ ඊට උදාහරණ ටිකක්.

| **සංස්කෘත** | | **පාලි** | | **සිංහල** |
|---|---|---|---|---|
| ධර්ම | > | ධම්ම | > | දහම්/ දම් |
| දේශනා | > | දෙසනා | > | දෙසුම් |
| කර්ම | > | කම්ම | > | කම් |

| | | | | |
|---|---|---|---|---|
| දන්ත | > | දන්ත | > | දත් |
| කෙශ | > | කෙස | > | කෙස් |
| පුස්තක | > | පොත්තක | > | පොත් |
| පෘථිවි | > | පඨවි | > | පොළොව |
| අද්‍ය | > | අජ්ජ | > | අද |
| ආකාශ | > | ආකාස | > | අහස් |
| භූමි | > | භූමි | > | බිම් |
| චෛත්‍ය | > | චෙති | > | සෑ |

පාලි, සංස්කෘත භාෂා හැරුණු කොට ද්‍රවිඩ භාෂාවෙන් බිඳී ආ වචන මාලාවකින් ද අපේ වාක්කෝෂය පෝෂණය වී තිබෙනවා. මේ වචන ටික බලන්න.

| ද්‍රවිඩ | | සිංහල |
|---|---|---|
| කරවාඩු | > | කරවල |
| තෝඩෙයි | > | දොඩම් |
| පුවාලෙයි | > | පුවාලු (කෙසෙල්) |
| කඤ්ජි | > | කැඳ |
| වාවල් | > | වවුල් |
| පිංගාන් | > | පිඟන් |
| කුඩෙ | > | කුඩ |

**ඉංග්‍රීසි භාෂාවෙන් බිඳී ආ වචන.**

| | | | | |
|---|---|---|---|---|
| Kettle | - | කෙට්ල් | > | කේතලය |
| Bottle | - | බොට්ල් | > | බෝතලය |
| Department | - | ඩිපාර්ට්මන්ට් | > | දෙපාර්තමේන්තුව |
| Conductor | - | කන්ඩක්ටර් | > | කොන්දොස්තර |
| Pencil | - | පෙන්සිල් | > | පැන්සල |
| Pen | - | පෙන් | > | පෑන |
| Parliament | - | පාර්ලිමන්ට් | > | පාර්ලිමේන්තුව |
| Engineer | = | ඉංජිනියර් | > | ඉංජිනේරු |
| Dish | = | ඩිෂ් | > | දීසිය |

මේ තොරතුරු සියල්ල ලියා අවසානයේ පොඩි නමට විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් තියෙනවා. ඒ තමයි පොඩි නම,

වර්තමානය වන විට විද්‍යා හා තාක්ෂණ ඥානයේ දියුණුවත් සමග අපූරු ලෙස ලෝකය එකට එක්වෙලා තිබෙන එක. විද්‍යා හා තාක්ෂණ ඥානයේ දියුණුවත් සමග ජාත්‍යන්තරයේ ඇති වූ නව නිර්මාණ නව සංකල්ප පාදක කර ගෙනත් අපේ වාක්කෝෂය පෝෂණය වීමට වචන රාශියක් එකතු වුණා. පොඩි නමට ඒ වචන මේ වන විට ඕන තරම් ඇහිලා ඇති. බලන්න මේ වචන හුරු ද කියලා. ඒවා ඉංග්‍රීසි භාෂාවේ බලපෑමෙන් ඇවිත් සිංහල වාක්කෝෂය පෝෂණය කර තිබෙන බව යි පෙනෙන්නේ.

| | | |
|---|---|---|
| Internet | > | අන්තර්ජාලය |
| Globalization | > | ගෝලීයකරණය |
| Computer | > | පරිගණකය |
| Face book | > | මුහුණු පොත |
| Millennium | > | සහස්‍රකය |
| Selfy | > | සෙල්ෆිය |

| | | |
|---|---|---|
| Global Village | > | විශ්ව ගම්මානය |
| Soft ware | > | මෘදුකාංග |
| Hard ware | > | දෘඪාංග |
| Web site | > | වෙබ් අඩවි |
| Hybrid | > | දෙමුහුන් |

ඉතිං පොඩි නම ඔන්න ඔය විදියට තමයි අපේ වාක්කෝෂය පෝෂණය වෙලා තිබෙන්නේ. ජාත්‍යන්තරකරණයේ නොයෙක් නොයෙක් විපර්යාස ඉදිරියේදී මීටත් වඩා වෙන්න පුළුවන්. එහෙම වෙන කොට අපේ වාක්කෝෂයටත් එය බලපාලා අපේ වාක්කෝෂය තව තවත් පෝෂණය වෙන්න හේතු වෙනවා.

මම හිතනවා පොඩිනම අහලා ඒවා තිබුණු කරුණට ගොඩාක් විස්තර ලිව්වා කියලා. මේ කරුණු හොඳින් කියවලා බලලා ඉගෙන ගෙන පොඩිනමගේත් වාක්කෝෂය පෝෂණය කරගන්න ඕනෑ.

පොඩි නමට ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය වේවා!



.................................................

අරක්ගහ දේවින්ද නායක ස්ථවිර
සාමපුර විජයන්ත පිරිවෙණේ දී

## ක්‍රියාකාරකම 1

- පහත සඳහන් වගු සම්පූර්ණ කරන්න.

| | පෘතුගීසි තත්සම වචන | ලන්දේසි තත්සම වචන | ඉංග්‍රීසි තත්සම වචන |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

- නිෂ්පන්න වාක්කෝෂය ඇසුරෙන් වචන සොයා සම්පූර්ණ කරන්න.

| | නානා වස්තු නාම | සත්ත්ව නාම | වෘක්ෂලතා නාම | ක්‍රියා මූල |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |

## ක්‍රියාකාරකම 2

I. මාතෘ භාෂාගත තත්සම වචන විස්සක් (20) ලියන්න.

II. මාතෘ භාෂාගත තත්භව වචන විස්සක් (20) ලියන්න.

## ක්‍රියාකාරකම 3

- **පැරණි ගද්‍ය පද්‍ය කෘති පරික්ෂා කොට තත්භව වචන යෙදී ඇති නිදසුන් පාඨ තෝරා එකතුවක් සකස් කරන්න.**

### සුභාෂිත

**න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො**

- ධම්ම පදය -

අධර්මයෙන් තමන්ගේ වැඩි දියුණු ව නොපතනු

### සුචින්තිත

අප සැලකිලිමත් විය යුත්තේ කවුරු හරි ද යන්න පිළිබඳ ව නොවේ.
කුමක් හරි ද යන්න පිළිබඳව යි.

# 18

# සිංහල සාහිත්‍ය ඉතිහාසය

ලිඛිත සිංහල සාහිත්‍යයේ ආරම්භය අනුරාධපුර යුගය දක්වා ම ඈත අතීතයට දිව යන්නකි. ඉතා දියුණු මෙන් ම සම්භාව්‍ය සාහිත්‍යයකට උරුමකම් කීමට ශ්‍රී ලාංකිකයන් යන අපි වාසනාවන්තයෝ වෙමු. "සහිතස්‍යභාවං සාහිත්‍යම්" ලෙස හඳුන්වා ඇති සාහිත්‍යය සමස්ත මානව වර්ගයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීමෙහි ලා සෘජුව බලපාන්නක් බව අවිවාදයෙන් හැඳින්විය හැකි ය. සාහිත්‍යයෙන් තොර ජීවිතයක් නැති තරමට අපට එය බැඳී පවතියි.

දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා සිංහල සාහිත්‍යය පෝෂණය කළ සාහිත්‍ය කෘති පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක් මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ. ඒ ඒ යුගවල පුරෝගාමී ගත් කතුවරුන්, ඔවුන්ගේ නිර්මාණ සඳහා පාදක වූ වස්තු විෂයයන් මෙන් ම තත් කෘතීන්හි විශේෂ ප්‍රවණතා පිළිබඳ ඒකදේශික හැඳින්වීමක් සිදු වන අතර ඒ ඔස්සේ සාහිත්‍යය ඉතිහාසය කෙරෙහි ස්වයං අධ්‍යයනයකට යොමු කිරීමක් ද මෙමගින් අපේක්ෂා කෙරේ.

# සිංහල සාහිත්‍ය ඉතිහාසය

සිංහල රාජධානි පදනම් කර ගෙන සාහිත්‍ය, යුග වශයෙන් බෙදා දැක්වීම වර්තමාන ව්‍යවහාර ක්‍රමවේදය යි. ඒ අනුව සිංහල සාහිත්‍ය ඉතිහාසයේ යුග කිහිපයකි. එනම්,

| | | | | |
|---|---|---|---|---|
| අනුරාධපුර යුගය | - ක්‍රි.පූ. 543 | - | ක්‍රි.ව 1056 |
| පොළොන්නරු යුගය | - ක්‍රි.ව. 1056 | - | ක්‍රි.ව 1236 |
| දඹදෙණි යුගය | - ක්‍රි.ව. 1232 | - | ක්‍රි.ව 1283 |
| කුරුණෑගල යුගය | - ක්‍රි.ව. 1292 | - | ක්‍රි.ව 1347 |
| ගම්පොළ යුගය | - ක්‍රි.ව. 1347 | - | ක්‍රි.ව 1410 |
| කෝට්ටේ යුගය | - ක්‍රි.ව. 1415 | - | ක්‍රි.ව 1521 |
| සීතාවක යුගය | - ක්‍රි.ව. 1521 | - | ක්‍රි.ව 1593 |
| මහනුවර යුගය | - ක්‍රි.ව. 1593 | - | ක්‍රි.ව 1815 |
| කොළඹ යුගය | - ක්‍රි.ව. 1815 | - | මේ දක්වා |

මෙසේ සාහිත්‍ය යුග බෙද ගන්නා විට සාහිත්‍ය හැදෑරීමට කිසියම් පහසුවක් ඇති වන්නේ ග්‍රන්ථයක් පිළිබඳ ව අධ්‍යයනය කිරීමට තත් යුගය පිළිබඳ යම් අවබෝධයක් තිබිය යුතු නිසා ය. මෙසේ යුග බෙදීමේදී යම් බඳු අසාධාරණයක් ද ඇති වේ. කිසියම් රාජධානියක නැගීම සහ බැසීම යන තත්ත්වයන් එකාකාරව සිදු නොවේ. නමුත් මෙහිදී පිළිගත හැකි සත්‍යයක් නම් රාජ්‍යය නැගීමත් සමග ම සාහිත්‍යය ද නැගීම යි. එහෙත් ඒ නිසා ම සාහිත්‍යයේ උන්නතියක් ඇති වන බව කිව නොහැකි ය. එසේ ම රාජ්‍යයක පරිහානියත්, සමග ම සාහිත්‍යයක් පිරිහෙන්නේ ද නැත. එනිසා මෙසේ යුග බෙදීම එක් අතකින් අවාසියක් ලෙස පෙනී යයි.

එක සාහිත්‍ය යුගයක් ස්වර්ණමය යුගයක් ලෙස ගැනීම පහසු කාර්යයක් නොවේ. රජවරුන් කිහිපදෙනෙකු රාජ්‍ය කළ කාලවලින් එක් අයෙකු හෝ දෙදෙනෙකු සිටි කාලය පමණක් සාහිත්‍යය දියුණු විය හැකි ය. එ නිසා සම්පූර්ණ රාජ්‍ය යුගය ම අළලා සාහිත්‍ය දියුණුව දැක්වීම එතරම් සාධාරණ නොවේ. තවත් විටෙක රාජ්‍යයේ බලපෑමක් නැති ව සාහිත්‍ය දියුණු වූ යුග තිබේ. සෙංකඩගල රාජ්‍ය පැවැති යුගයේ දකුණේත් සාහිත්‍යය දියුණු විය. තවත් සමහර රාජ්‍ය යුගවල එකදු සාහිත්‍ය කෘතියක්වත් ලියවී නැත. නිදසුනක් ලෙස යාපහු යුගය දැක්විය හැකි ය. නමුත් මෙලෙස සාහිත්‍ය යුග බෙදීමේ දී ඒ ඒ යුගවල සාහිත්‍යයට බලපෑ ප්‍රවණතා දැනගැනීමට හැකි වේ. එබැවින් මෙලෙස යුග බෙදීමේ වාසි අවාසි දෙක ම පෙන්වා දිය හැකි ය.

කිසියම් රාජ්‍යයක නැගීම හෝ වැටීම සමග තත්කාලීන ව සාහිත්‍යයේ නැගීමත් වැටීමත් එක හා සමාන ව සිදු නොවේ. ඒ ඒ යුගවල රචිත කෘතිවල යම් බඳු ප්‍රවණතා දක්නට ඇත. එබැවින් ඒ ඒ පරමාර්ථයන්ට නොහොත් අනුභූතීන්ට අනුව යුග බෙදා දැක්වීම ද කළ හැකි ය. අනුරාධපුර යුගයේ ලියැවුණු බොහෝ ග්‍රන්ථ ධර්ම ව්‍යාඛ්‍යාන හෝ විනය නීති හෝ කාව්‍ය නීති මුල් කරගත් ඒවා ය. හෙළටුවා ග්‍රන්ථ, ධම්පියා අටුවා ගැටපදය, සියබස්ලකර, සිඛවළඳ හා සිඛවළඳ විනිස මීට නිදසුන් වේ.

පොළොන්නරු යුගයේ ලියන ලද ග්‍රන්ථ බෙහෙවින් ම ලියවී ඇත්තේ පාඨකයා/ශ්‍රාවකයා තුළ භක්තිය දනවීමට යි. අමාවතුර, බුත්සරණ, දහම්සරණ, ධර්මප්‍රදීපිකාව ඊට නිදසුන් වේ. සන්දේශ කාව්‍ය බහුල වූ කාලයක් ලෙස කෝට්ටේ යුගය පෙන්වා දිය හැකි ය. එහෙත් මාතර වැනි යුගවල ශෘංගාර පද්‍ය බහුල විය.

මෙලෙස රාජධානි අනුව යුග බෙද දැක්වීමේ දී එක්තරා වාසියක් වන්නේ භාෂාවේ ක්‍රමික විකාසනය ගැන ද අවබෝධයක් ලද හැකි වීම යි. නිදසුනක් ලෙස පොළොන්නරු යුගයේ සංස්කෘත ආභාසය බහුල වශයෙන් විද්‍යමාන වේ. අනුරාධපුර යුගයේ පාලි භාෂාවේ බලපෑම වැඩි බව පෙනේ. කෙසේ වෙතත් වර්තමානයේ සම්මත ක්‍රමය වන්නේ රාජධානි අනුව සාහිත්‍ය යුග බෙදා දැක්වීම යි. එයින් දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය අවසානය තෙක් සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් මෙහි ඇතුළත් වේ.

## දඹදෙණි යුගය

තුන්වැනි විජයබාහු රජු නිසා ඇති වූ දඹදෙණි යුගයේ සමෘද්ධිමත් අවධිය උදාවන්නේ ඔහු පුත් දෙවැනි පරාක්‍රමබාහු සමයේ ය. එතුමා විදග්ධ සාහිත්‍යධරයෙකු වූ අතර "නන්බඹර කලිකාල සංගීත සාහිත්‍ය සර්වඥ පණ්ඩිත" නම් උපාධිය ද ලද්දේ ය. එ නිසා ම තවත් තැනක මෙතුමා "සකල කලා සාහිත්‍ය සර්වඥ පණ්ඩිත" යන ගරු නාමයෙන් ද හැඳින්වේ. මෙතුමාගෙන් අනතුරුව ඔහුගේ පුත් හතරවැනි විජයබාහු රජු ද එතුමාගේ ඇවෑමෙන් පසු පළමුවැනි බුවනෙකබාහු රජු ද රාජ්‍ය කළේ ය.

තුන්වැනි විජයබා රජුගෙන් සහ දෙවැනි පැරකුම්බා රජුගෙන් අනුග්‍රහය ලත් ගිහි පැවිදි වියත්හු භාෂා සාහිත්‍ය පෝෂණයෙහිලා කැප වී කටයුතු කළහ. ඒ අතර විජයසුන්දරාරාමාධිපති සංඝරක්ඛිත හිමි, මහනෙත්පාමුල සුමංගල හිමි, දිඹුලාගල වනවාසී මේධංකර හිමි, අත්තනගල්ලේ පතිරාජ පිරිවෙන්පති අනවමදර්ශී හිමි, පඤ්චමූල පරිවේණාධිපති, පළාබත්ගල පතිරාජ පිරිවෙණෙහි වේදේහ හිමි, මයුරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍ර හිමි චෝළිය බුද්ධප්පිය හිමි, ධර්මසේන හිමි, ගෝතම හිමි, සිද්ධත්ථ හිමි, දෙවැනි පරාක්‍රමබාහු රජතුමා ද වූහ. මීට අමතර ව ශ්ලෝක සිද්ධාර්ථ, සාහිත්‍ය විල්ගම්මුල, දීපංකර යන හිමිවරුන් ද ශූරපාද, ධර්මකීර්තිපාද ධීරනාගපාද, කවිරාජශේඛර, ආගම චක්‍රවර්තී, පරාක්‍රමපණ්ඩිත, අග්‍රපණ්ඩිත ආදි ගිහි පඬිවරුන් ද මෙකල විසූ බව සාහිත්‍ය වංශයේ සඳහන් වේ.

විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ පොත්පත් රාශියක් මෙකල ලියැවී ඇත. සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, දඹදෙණි කතිකාවත මෙන් ම අර්ථ ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ ලෙස ධම්මපද සන්නය, රූපසිද්ධි සන්නය, විරිත සන්නය, කසයින් සන්නය, අටදා සන්නය, විශුද්ධිමාර්ග මහා සන්නය, කුදුසික පදර්ථ සන්නය, පද සාධන සන්නය, කංඛාවිතරණී පිටපොත, සිළි පිටපොත ආදිය ද ව්‍යාකරණ ග්‍රන්ථයක් ලෙස සිදත් සඟරාව ද මෙකල කැපී පෙනේ. කෝෂ ග්‍රන්ථ ගණයෙහිලා සැලකිය හැකි පියුම්මල ද සිංහල ඡන්දස් ග්‍රන්ථ වන එළුසඳැස් ලකුණ ද ලකුණු සර ද විශේෂ වේ.

පොළොන්නරු යුගයේ මාඝ ආක්‍රමණයෙන් පසුව විනාශ වී ගිය සිංහල බෞද්ධ සාහිත්‍යය යළි ගොඩනැගීමට බුත්සරණ, අමාවතුර ආදී භක්තිකාව්‍යකරුවන් පෙලඹුණු අතර එමග යමින් සිත්හි නිපන් භක්තිය ශ්‍රද්ධාවක් බවට පත්වන ආකාරයේ ධර්ම ග්‍රන්ථ රචනාවීම මෙන් ම ඒවා සමස්ත ශ්‍රාවකයාගේ රසවින්දනයට උචිත ලෙස නිර්මාණය වීම මෙවක කැපී පෙනෙන ප්‍රවණතාවක් වේ.

### විශේෂ ග්‍රන්ථ

**සිදත් සඟරාව** - සිංහල ව්‍යාකරණය පිළිබඳ දැනට විද්‍යමාන ආදිත ම ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ මෙය යි. ග්‍රන්ථාවසානයේ එන පරිදි මෙය පතිරාජ පිරිවෙන්පති වේදේහ හිමියන් විසින් රචිත බව පිළිගැනේ. ග්‍රන්ථාරම්භයේදී වියරණ විදි විස්සක් දක්වයි. එනම්,

එබැවින් සන් සඳ - ලිඟු විබත් සමස් පියෙවි
පස කිරිය ලොප 'දෙස' ගම් - පෙර රූ දෙරූ පෙරළී

වැඩි අඩු නිපා නියම් - අනියම් අවිදුමන් විදි
වී විසි වැදෑරුම් - වියරණ විදි සපයා යනු යි.

මේ විසි වැදෑරුම් වියරණ නැවත
**සන්, සඳ, ලිඟු, විබත්, සමස්, වෙසෙසුන් වෙසෙස්, කිරිය, පස රුත්, වුත් අවුත්, කිරිය කරු පද සබඳ ඉටු, නිටු, ලකර** යනුවෙන් අදියර දෙළහකට අනුව විග්‍රහ කර දක්වයි. මෙහි විග්‍රහයක් සහ නිදසුන් ගෙනහැර පැමි අනුව පද්‍ය සඳහා ම කළ වියරණයක් බව පැහැදිලි ව පෙනෙන්නකි.

**එළුසඳැස්ලකුණ** - හද නම් යතිවරයෙකු විසින් රචිත මෙය සිංහල ඡන්දස් ශාස්ත්‍රයට අදාළ විස්තරවලින් යුක්ත වූවකි. පද්‍ය බන්ධයේ දී ලඝු - ගුරු අක්ෂර යෙදිය යුතු පිළිවෙළ හෙවත් විරිත, ඡන්දස් අෂ්ට විධ ගණ, එළිසම, යවහන්දෝෂ, යති පිහිටීම් මෙන් ම සිව්පද, ගී හා සිලෝ විරිත් ආදිය විග්‍රහකර දක්වා ඇත.

**පූජාවලිය** - දේව පතිරාජ අමාත්‍යවරයාගේ ආරාධනයෙන් මයුරපාද පරිවෙණාධිපති හිමියන් විසින් රචිත මාහැඟි ධර්ම ග්‍රන්ථයක් ලෙස මෙය සම්භාවිත කෘතියකි. බුදුන් වහන්සේගේ "අරහං" බුදු ගුණය පදනම් කරගත් මෙහි පරමාර්ථය වූයේ දෙවැනි පැරකුම් රජු බුද්ධත්වය ප්‍රාර්ථනා කිරීම සඳහා උනන්දු කරවීමත් සත්පුරුෂ ජනයා ශ්‍රද්ධා බුද්ධි වර්ධනය සඳහා උනන්දු කරවීමත් ය.

පරිච්ඡේද තිස්හතර (34)කින් සමන්විත මෙය බුදුගුණ වර්ණනාවකින් ආරම්භ වේ. අනතුරුව එන පූජාමාලාව ආරම්භවන්නේ සුමේධ තාපසයන් දීපංකර බුදුන්ට කරන පූජාවලිනි. ඉක්බිති ව ගෞතම බුදධ චරිතය හා සම්බන්ධ විවිධ සිදුවීම් හා චරිත විවරණය වන අතර 33, 34 පරිච්ඡේද ශාසන ඉතිහාසය පිළිබඳ විස්තර කරයි. ශ්‍රැති ගෝචර ශෛලියට අනුව ශ්‍රද්ධා බුද්ධි වර්ධනයට යෝග්‍ය පරිදි මිශ්‍ර සිංහල බස් වහරක් උපයෝගී කරගෙන රචිත පූජාවලිය එදා මෙදා තුර සමස්ත ජනයාගේ රසඥතාව වර්ධනය කරන්නකි.

**සද්ධර්මරත්නාවලිය**

"සද්ධම්මඨිතිමිච්ඡන්තෝ - ධම්මසේන යතිස්සරෝ
අකාසි පවරං ඒතං - සද්ධර්මරතනාවලිං"

මේ සද්ධර්මරත්නාවලිය කතුවරයා මෙන් ම පරමාර්ථය ද කතුහිමියන් දක්වූ අයුරු යි. ඒ අනුව ධර්මසේන නම් යතීශ්වරයාණන් විසින් දහමේ තිර පැවැත්ම උදෙසා මෙම කෘතිය කළ බව සඳහන් වේ. පාලි ධම්මපදට්ඨකථාව ප්‍රධාන මූලාශ්‍රය කරගත්ත ද මෙය එහි පදානුගත පරිවර්තනයක් නොවන බව කතුහිමියන් ම පවසන පරිදි මෙහි කථා වස්තු තුන්සියය (300) ක් පමණ අන්තර්ගත වේ. මීට අමතර ව, පූර්විකාව, සූවිසිවිවරණ හා බුද්ධචරිතය පිළිබඳ විසතර, මංගල සූත්‍ර අටුවාදි කතා, මංගල කාරණා, අනාගත වංශදේශනාව, සංක්ෂිප්ත අටවිසි බුද්ධ චරිත කථා ද ඇතුළත් වේ. පාලි සංස්කෘත නොදත් සිංහල පමණක් දන්නා ජනයා වෙනුවෙන් රචිත මෙය සරල බස් වහරක් මෙන් ම රසවත් උපමා භාවිතය යොදා ගැනීම අතින් අන් කිසිදු කෘතියකට දෙවැනි නොවේ.

# කුරුණෑගල යුගය

සිංහල සාහිත්‍යයේ දඹදෙණි යුගයෙන් අනතුරුව එළඹෙන්නේ කුරුණෑගල යුගය යි. මෙහි ආරම්භය සනිටුහන් කරන්නේ දෙවන බුවනෙකබා රජතුමා ය. අනතුරු ව හතරවන පැරකුම්බා, හතරවන විජයබා, පස්වන විජයබා යන රජවරු පිළිවෙළින් රාජ්‍යත්වයට පත් වූහ. එවක සාහිත්‍ය පෝෂණය සඳහා දායකත්වය සැපයුවේ හතරවන පැරකුම්බා රජු පමණක් යැයි කීම අතිශයෝක්තියක් නොවේ.

මෙවක විසූ ලේඛකයන් අතර විල්ගම්මුල සංඝරාජ හිමි, වීරසිංහ පතිරාජ, පරාක්‍රමපණ්ඩිත, දෙව්රදදම්පසඟිනා යන ගිහි පැවිදි පඬිවරු වූහ. ගද්‍ය ග්‍රන්ථ රචනයට ප්‍රධාන තැනක් දුන් අතර පාලි ග්‍රන්ථ සිංහලයට පරිවර්තනය වීම මෙහිදී කැපී පෙනෙන ප්‍රවණතාවකි. විවිධ රචනා ශෛලීන් අත්හදා බැලීම මෙවක පැවති බවට කදිම නිදසුනක් වන්නේ වෘත්තගන්ධී ශෛලියෙන් යුතු දළදා සිරිත රචනා වීම යි. තව ද එතෙක් ජනප්‍රිය ව පැවැති ගී කාව්‍ය ආකෘතියට අමතරව සිව්පද ආරෙන් පද්‍ය රචනා කිරීම ඇරඹෙන්නේ ද මෙවක රචිත සඳකිඳුරු දා කවෙනි.

## විශේෂ ග්‍රන්ථ

**පන්සිය පනස් ජාතක පොත** - පාලි ජාතකට්ඨ කථාවේ ඇතුළත් කථා සිංහලයට නගමින් කර්තෘ මණ්ඩලයක් විසින් සංගෘහිත කෘතියක් සේ සැලකේ. සිංහල සාහිත්‍ය ඉතිහාසයෙහි මෙතෙක් සංගෘහිත විශාලතම බණකතා පොත ලෙස එදා මෙදාතුර සමස්ත ජනතාවගේ සම්භාවනාවට පත් මෙම කෘතිය කොතරම් පූජනීයත්වයෙන් සලකනවාද යතහොත් "වහන්සේ" යන ගෞරව නාමයෙන් හඳුන්වන එක ම කෘතිය ද මෙය යි. බෝසතාණන් වහන්සේගේ පූර්ව ආත්ම කතා සහ දසපෙරුමන් පිරූ අයුරු අන්තර්ගත වීම නිසා මේ ගෞරවය ලැබෙන්නට ඇත. මෙහි අන්තර්ගත වීම නිසා මේ ගෞරවය ලැබෙන්නට ඇත. මෙහි අන්තර්ගත කතාවස්තු ප්‍රමාණය පන්සිය හතළිස් හත (547) කි. මේ සෑම කතාවක් ම පොදු ආකෘතියකට අනුව රචනා වී ඇත. එනම්,

**වර්තමාන කථාව**
**අතීත කථාව**
**සමෝධානය හෙවත් පූර්වාපර සන්ධි ගැළපීම** යනු යි.

එකිනෙක කතාවන්හි රචනා ශෛලියේ විශේෂත්වයක් දක්නට ලැබෙන්නේ මෙය ඒක කර්තෘක නොවන බැවිනි. මිහිපිට ජීවත්වන සියලු සතුන්ගේ චිත්ත චෛතසික ස්වභාවයක් විවරණය කිරීමට මේ හා සමාන වෙනත් කෘතියක් නොවන තරම් ය.

**සිංහල ථූපවංශය** - සකල විද්‍යා චක්‍රවර්තී පරාක්‍රම පණ්ඩිත නම් අයෙකු විසින් රචිත මෙය අනුරාධපුරයේ මහා ථූපය හෙවත් රුවන්වැලිසෑය පිළිබඳ ඉතිහාස කථාව දක්වීමේ පරමාර්ථයෙන් ලියවුණකි. මෙය ආරම්භ වන්නේ ගෞතම බෝසතාණන් වහන්සේගේ සූවිසි විවරණ පිළිබඳ කෙරෙන විස්තරයකිනි. අනතුරුව බුද්ධ චරිතය විස්තර වන අතර ධර්මාශෝක රාජ චරිතය, එතුමාගේ ධර්මදූත කාර්යය, ලක්දිව බුදුසසුන පිහිටුවීම ආදි විස්තර ද ඇතුළත් වේ. අනතුරුව ලාංකේය ශාසන ඉතිහාසය දුටුගැමුණු රාජ්‍ය කාලය අවසානය තෙක් විස්තර කෙරේ. ඒ අතර දුටුගැමුණු රාජ චරිතය උපතේ සිට අවසානය දක්වා සවිස්තර ව දක්වා ඇත. විවිධ ස්තූප කරවීමත් එමගින් සිදු වූ ශාසනික සේවාවන් ප්‍රබලව විස්තර කරන අතර ගැමුණු රජු වීරත්වයෙහිලා වර්ණනා කරයි.

මෙහි රචනාශෛලිය තත්සම පද මිශ්‍ර සංකීර්ණ වූවකි. පූජාර්හ වස්තු සඳහා රසික ජනයාගේ සිත්හි ශ්‍රද්ධාභක්තිය ජනිත කිරීම එවන් භාෂා රටාවක් යොදා ගැනීමේ පරමාර්ථය වූවා විය හැකි ය.

**සිංහල බෝධිවංශය** - කුරුණෑගල යුගයේදී සිංහල සාහිත්‍යයට එක් වුණු තවත් වැදගත් කෘතියකි. කුරුණෑගල හතරවන පැරකුම්බා රජුගේ ආරාධනයෙන් විල්ගම්මුල සංඝරාජ හිමියන් විසින් මෙය රචනා වූ බව ග්‍රන්ථාවසානයේ සඳහන් වේ. මෙහි අන්තර්ගත වන්නේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අනුපිළිවෙළ කථාව යි. මෙය ඉතා ක්‍රමානුකූල ව සකස්කළ ග්‍රන්ථයකි. මෙහි අන්තර්ගත කරුණු අනුමාතෘකා පහ (5) ක් යටතේ සංවිධානය කොට ඇත.

කවර අර්ථයකින් බෝධිය නම් වේද?
කවර කෙනෙකුන්ගේ බෝධියක් ද?
මෙය කුමක් සිද්ධ කරයි ද?
කවරෙකු විසින් ස්තුති කරන ලද්දේ ද?
පිහිටියේ කොතැනක ද? යනාදි වශයෙනි.

මේ ප්‍රශ්න පහ විසර්ජනය කරමින් පරිච්ඡේද දොළහ (12) කින් සමන්විත කෘතිය නිමවා තිබේ.

i. අභිසම්බෝධි කථා
ii. ආනන්ද බෝධි කථා
iii. ප්‍රථම සංගීති කථා
iv. ද්විතීය සංගීති කථා
v. තෘතීය සංගීති කථා
vi. ලංකාවතරණ කථා
vii. නගරප්පවේසන කථා
viii. මහා විහාර පටිග්ගහන කථා
ix. චේතිය ගිරි පටිග්ගහන කථා
x. දසබල පරිනිර්වාණ කථා
xi. ධාත්වාගමන කථා
xii. දුමින්දගමන කථා

මෙහිදී කතුවරයාගේ වර්ණනා චාතුර්යය මැනවින් කැපී පෙනේ. තත්සම පද බහුල මිශ්‍ර සිංහල භාවිතය දැකිය හැක්කේ ශ්‍රාවකයාගේ භක්තිය වර්ධනය කරවීම සඳහා ය.

**අනාගත වංශය** - මෛත්‍රී බෝසතාණන් වහන්සේගේ චරිත කථාව විස්තර කිරීම සඳහා මේ කෘතිය රචනා වී ඇත. "මෙතේ බුදු සිරිත" යන නමින් ද මේ කෘතිය හැඳින්වේ. අනාගත වංස පාලිය සහ සමන්තභද්දිකා යන කෘති මේ සඳහා මූලාශ්‍ර කරගෙන ඇත.

ප්‍රධාන කරුණු 5ක් යටතේ මෙහි කරුණු ඉදිරිපත් කොට ඇත. එනම්,

අනාගත වංස දේශනාව කවරෙකු විසින් දෙසන ලද්දේද?
එය කොතැනකදී දෙසන ලද්දේ ද?
කවර කාලයක දෙසන ලද්දේ ද?
කුමක් පිණිස දෙසන ලද්දේ ද?
කාගේ ඇරයුමින් දෙසන ලද්දේ ද? යනාදී වශයෙනි.

ධර්ම විස්තරය ද පාරමිතා සහ කල්ප පිළිබඳ විස්තර ද දෙතිස් මහා පුරුෂ ලක්ෂණ පිළිබඳ විස්තර ද මෙහි අන්තර්ගත වේ. විල්ගම්මුල සංඝරාජ හිමියන් මෙහි කතුවරයා වෙයි.

**දළඳා සිරිත** - දෙව්රද දම්පසඟිනාවන් විසින් පාළි දඨාවංසය මූලාශ්‍ර කරගෙන මෙය රචනා කර ඇත. දීපංකර පාද මූලයෙහි නියත විවරණ ලැබූ සුමේධ තාපස අවස්ථාවේ සිට බෝධිසත්ව චරිතය පිළිබඳ විස්තරයකින් කෘතිය ආරම්භ කරයි. මෙහි පරිච්ඡේද හත (7) කි.

සිදුහත් කුමාර උපත, අභිනිෂ්ක්‍රමණය, බුද්ධත්වය සහ පරිනිර්වාණය මෙහිදී විස්තර වෙයි. අනතුරුව සර්වඥ ධාතු පිළිබඳ විස්තර වේ. බුදුන් වහන්සේගේ ශ්‍රී දේහය ආදහනයෙන් පසු ධාතු බෙදීම පිළිබඳ තොරතුරුවලදී ඛේම තෙරුන් එක් දළදාවක් දන්තපුරයට වැඩමවා එහිදී පූජා පැවැත් වූ ආකාරය, එය පඬු රජු අතට පත්වීම, නිවටුවන් එය නැසීමට වෙර දැරීම එහිදී දළදාව පෑ පෙළහර ගැන අනතුරුව විස්තර වෙයි. පඬුරජුගෙන් පරදින ගුහසීව රජු ඔහුගේ දියණිය වූ හේමමාලා හා බෑනණුවන් වූ දන්ත කුමරු අත දළදාව ලක්දිවට එවූ පුවතත් කිත්සිරිමෙවන් රජු එය පිළිගෙන පුද පූජා පැවැත් වූ ආකාරයත් වශයෙන් හතරවන පැරකුම්බා රජ දවස දක්වා ලක්දිව රජවරු දළඳා පූජා සිදු කළ ආකාරයත් විස්තර කරන අතර අවසානයේ දළඳා පූජා පැවැත්වීම පිළිබඳ ව්‍යවස්ථා මාලාවක් ඇතුළත් කර ඇත. මෙය රචනා කර ඇත්තේ වෘත්තගන්ධි ශෛලියෙන් වීම විශේෂත්වයකි.

## ගම්පොළ යුගය

ගම්පොළ රාජධානිය ආරම්භවන්නේ හතරවන බුවනෙකබා රජතුමාගෙනි. අනතුරුව පස්වන පැරකුම්බා පස්වන විජයබා, තුන්වන වික්‍රමබාහු යන රජවරු පිළිවෙළින් රජකම් කළහ. අනතුරුව පස්වන බුවනෙකබා වීරබාහු සහ සෙංකඩගල රජකළ පරාක්‍රමබාහු ගම්පොළ රාජ්‍යත්වයට පත්වූහ. සාහිත්‍යකරණයේ විවිධ නව ප්‍රවණතා මෙම යුගයේදී දක්නට ලැබුණි. ගද්‍ය පද්‍ය දෙපක්ෂයේ ම ග්‍රන්ථ මෙවක රචනා විය. මෙතෙක් සිංහල පද්‍ය සාහිත්‍යයේ පැවති "පෙදෙන් බුදු සිරිතැ" යන සියබස්ලකර නියමය මෙවක රචනා වූ තිසර මයුර සන්දේශ දෙක නිසා නව ආරකට පිවිසුණි. කුරුණෑගල යුගයේ ස්ථාපනය වුණු සිව්පද ආකෘතිය පද්‍යකරණය සඳහා ජනප්‍රිය ව භාවිත විණි. පද්‍ය සාහිත්‍යයේ වස්තුවිෂය අතින් මෙන් ම ආකෘතිය අතින් ද මේ නව නැමියාව පසුකාලීන පද්‍ය සාහිත්‍යයේ උන්නතියට හේතු වන්නට ඇත. සද්ධර්මාලංකාරය සද්ධර්මාමෘත මංජුසය හෙවත් පරිච්ඡේද පොත එය අත්තනගලු වංශය, නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය, බාලාවතාර සන්නයහෙවත් ගඩලාදෙණි සන්නය, තිසර හා මයුර සන්දේශ මෙකල විශේෂයෙන් කැපී පෙනෙන්නේ ධර්මකීර්ති සංඝ පරම්පරාව විසින් ඉටු කරන ලද ශාසනික සාහිත්‍ය සේවාව යි.

### විශේෂ ග්‍රන්ථ

සද්ධර්මාලංකාරය, හුදී ජනයාගේ දනාධ්‍යාංශය ඇති කිරීම මූලික පරමාර්ථය කරගෙන මෙය රචනා කර ඇත. සසර දුකට මූලික හේතුව වන තෘෂ්ණාව මැඩලීමට පළමු පියවර වන්නේ දානය යි. එබැවින් යහපත් සමාජයක් බිහිකිරීමේ මූලික පියවර ලෙස සියලු දෙනා දානයට යොමු කිරීම කතුවරයාගේ මූලික අභිප්‍රාය විය. එහි දී දනයේ වටිනාකම, ප්‍රමාණය හෝ ගුණාත්මය නොව එය දෙන ආකාරයේ ඇති ශ්‍රද්ධාව මත ප්‍රතිඵල තීරණය වන බවත්, සියලු දනයට වඩා ධර්ම දනය උතුම්වන බවත්, කතුවරයා නිතර නිතර සිහිපත් කරයි. දෙවැනි ජයබාහු ධර්මකීර්ති හිමියන් විසින් රචිත මෙය කථා එකසිය පනහ (150) කින් යුතු අතර එය පරිච්ඡේද හෙවත් වර්ග විසි හතර (24) කි. පාලි රසවාහිනිය පදනම් කරගෙන රචිත මෙය තත්කාලීන සමාජ ආර්ථික ඉතිහාසය ද ගෙනහැර දක්වන නිසා ධර්ම ග්‍රන්ථයක් සේම ඓතිහාසික ග්‍රන්ථයක් ලෙස ද අගය කළ හැකි ය.

**එළු අත්තනගලු වංසය** - පාලි හත්ථවනගල්ල විහාර වංසය මූලාශ්‍ර කරගෙන ශත්‍රුසිංහ කුංජරාජාභිධාන සේනානායක මන්ත්‍රීවරයාගේ ආරාධනයෙන් මෙය රචනා වී ඇති බව සඳහන් වේ.

සිරිසඟබෝ රජ චරිතයත් අත්තනගලු විහාර විස්තරයත් මෙහි අන්තර්ගත ය. ගද්‍ය සහ පද්‍ය මිශ්‍ර ව රචිත මෙය චම්පූ කාව්‍යයක් සේ සැලකේ.

**ශාසනාවතාරය** - නිකාය සංග්‍රහය ලෙස හඳුන්වන්නේ ද මෙය යි. මෙහි අරමුණ වී ඇත්තේ පස්වන බුවනෙකබා රජුගේ පසළොස්වන රාජ වර්ෂය තෙක් ශාසන ඉතිහාසය විස්තර කිරීම යි. එය ආරම්භ කරන්නේ බුද්ධ පරිනිර්වාණයේ සිට ය. දඹදිව මෙන් ම ලක්දිව ඇතිවූ නිකාය භේද සහ සංගායනා, සංඝ සංශෝධන පිළිබඳ විස්තර මෙහි අන්තර්ගත ය. සද්ධර්මාලංකාර කතු හිමියන්ගේ ම කෘතියක් ලෙස සැලකෙන මෙය ද ශාසන ඉතිහාසය හැදෑරීමට උපකාර වන ඉතිහාසය ග්‍රන්ථයක් ලෙස ද අගය කළ හැකි ය.

**සන්දේශ කෘති** - දනට විද්‍යමාන සන්දේශ කෘති අතරින් ආදිතම සන්දේශ දෙක තිසර සන්දේශය හා මයුර සන්දේශය යි. මෙයින් වඩාත් පැරණිතර කුමක් ද යන්න මතභේදාත්මක ය. නමුත් වැඩිදෙනා පිළිගන්නේ තිසරය වඩාත් පැරණි බව යි. දැදිගම විසූ පරාක්‍රමබාහු රජුට උපුල්වන් දෙවියන්ගේ අශීර්වාදය ප්‍රාර්ථනා කළ බව දැක්වීමට රචිත තිසර සන්දේශයේ ගමන් මාර්ගය දෙවිනුවර සිට දැදිගම දක්වා ය.

කවීශ්වර පණ්ඩිත නම් අයෙකු විසින් රචිත මයූර සන්දේශය ගම්පොළ සිට දෙවිනුවර උපුල්වන් දෙවියන් වෙත යවන ස්වරූපයෙන් රචනා කර ඇත. ගම්පොළ පස්වන බුවනෙකබාහු රජු ඇතුළු රජ පවුලට සහ සෙන්පතිවරුන්ට දේවාශිර්වාදය ප්‍රාර්ථනා කිරීම මෙහි අරමුණ වී ඇත. පසුකාලීනව සන්දේශ කෘතිවලට බලපා ඇත්තේ මෙම සන්දේශ කෘතින්හි ආභාසය යි.

**කෝට්ටේ යුගය** - හයවන පරාක්‍රමබාහු රජුගෙන් ඇරඹෙන මේ යුගය වසර එකසිය හැටපහ (165) ක් පමණ කාලයක් පැවතෙයි. ගද්‍ය පද්‍ය කෘති රාශියක් මෙකල ලියවී ඇත. මෙහිදී සාහිත්‍ය උනන්තිය සඳහා විශාල සේවයක් ඉටුකොට ඇත්තේ vi පරාක්‍රමබාහු රජතුමා ය. මෙවක රචිත ගද්‍ය ග්‍රන්ථ අතර,

සද්ධර්මරත්නාකරය
එළු අත්තනගලු වංශය (ගම්පොළ යුගයේ ද මෙනමින් කෘතියක් ඇත.)
කඨිනානිශංසය
චූල බෝධි වංශය
කුවේණි අස්න (උත්තර මූල තෙරිඳු)

පංචිකාප්‍රදීප - තොටගමුවේ රාහුල හිමි
කව්ලකුණු මිණිමල්දම
රුවන්මල් නිඝණ්ඩුව - vi පැරකුම්බා රජු
නාමාවලිය - නන්නූර්තුනෙයාර් මිණිසන්නස්

යන කෘතින් ද පැරකුම්බා සිරිත, එළුසිලෝ ශතකය, බුදුගුණ අලංකාරය, ලෝවැඩසඟරාව, දහම්ගැටමාලාව, කාව්‍යශේඛරය, ගුත්තිලකාව්‍ය සහ පරෙවි, සැළලිහිණි, ගිරා, හංස, කෝකිල යන පංචමහා සන්දේශ කෘති ද පද්‍ය සාහිත්‍ය බබළවන මිණිබරණ වැන්න.

වීදාගම මහා මෛත්‍රේය හිමි ආදි වෑත්තෑවේ හිමි, ඉරුගල්කුලතිලක පිරුවන්පති හිමි ආදි යතිවරු ද මෙවක කැපී පෙනෙති. මෙවක වඩාත් ප්‍රකට ව සිටියේ තොටගමුවේ ශ්‍රී රාහුල සංඝරාජ හිමියෝ ය. මේ යුගය සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ ද එවක කවීන්ගේ ඇති සුවිශේෂ හැකියාව නිසා ය.

## සුභාෂිත

**"සාහිත්‍ය සංගීත කලා විහීනඃ - සාක්ෂාත් පශුඃ පුච්ඡ විෂාණ හීනඃ**
**තෘණං න ඛාදන්නපි ජීවමානඃ - තද්භාගධෙයං පරමං පශූනාම්"**

සාහිත්‍ය සංගීත කලාව ආදියෙන් තොර වූ පුද්ගලයා වලිගය සහ අං නැති තිරිසනකු වැනි ය. ඔහු තණකොළ නොකෑම සැබෑ තිරිසනුන්ගේ වාසනාවකි.

## සුචින්තන

ඔබ ඉහළ නගින විට අතරමග හමු වන අය අමතක නොකරන්න. ඒ, ඔබ පහළ බසින විට ද ඔවුන් හමු විය හැකි බැවිනි.